# යුගතර

## ශාස්ත්‍රීය සඟරාව

දෙවන වෙළුම

2019

උරුම අධ්‍යයන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රකාශන අයිතිය © දෙසැම්බර් 2019
උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

යුගතර ශාස්ත්‍රීය සඟරාව දෙවන වෙළුම
උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**ISSN 2682-7123**

මෙහි සඳහන් කර ඇති කරුණු සහ මත පිළිබඳ වගකීම අදාළ කතුවරුන් සතුය.

මුද්‍රණය

**Mega E Cafe නුවර පාර, දළුගම, කැලණිය**

ප්‍රකාශනය

**උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.** **chs@kln.ac.lk**

කංචුක නිර්මාණය

**ඩී. ටී. එච්. දර්ශා**
තොරතුරු ප්‍රදර්ශක, තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය

# යුගතර

## ශාස්ත්‍රීය සඟරාව

දෙවන වෙළුම
2019

ප්‍රධාන සංස්කාරක
**අනුර මනතුංග**

සංස්කාරකවරු
**නදීරා හේවාවසන්**
**ධම්මිකා කුමාරි මනතුංග**
**පියුමි ඇඹුල්දෙනිය**
**දිල්ශානි දාබරේ**
**හසිතා යසරත්න**
**තෂිලා යොහානි**

**උරුම අධ්‍යයන කේන්ද්‍රය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

අනුශාසකවරු

**මහාචාර්ය ඩී. එම්. සේමසිංහ**
උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න**
නියෝජ්‍ය උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය

උපදේශකවරු

**මහාචාර්ය ඩී. ජේ. ආරියරත්න**
පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය පැට්‍රික් රත්නායක**
පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
පීඨාධිපති, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අබේරත්න**
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

උපදේශක සංස්කාරකවරු

**ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක**
අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ඩබ්ලිව්. කේ. එම්. එම්. කේ. වීරසිංහ**
පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ඩබ්ලිව්. ඒ. වීරසූරිය**
පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය මාපා තිලකරත්න**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය මාලිංග අමරසිංහ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# පෙරවදන

කැලණිය විශ්වවිද්‍යාලයේ උරුම අධ්‍යයන කේන්ද්‍රය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන යුගතර ශාස්ත්‍රීය සඟරාව පුරාවිද්‍යාව, මානවවිද්‍යාව, සංස්කෘතිය, කලාව, භාෂාව, ආගම සහ අධ්‍යාපනය මූලික කොටගත් උරුම කේන්ද්‍රීය ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත් කරනු ලබන්නකි. ශ්‍රී ලංකාව ලෝකයෙහි පෙරමුණේ සිටින අංශයන් අතර සාක්ෂරතාව ඉහලම රටක් ලෙස හැඳින්විය හැක. ඒ සඳහා මෙරට පවතින අධ්‍යාපනික ක්‍රමවේදය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. මෙරට ජන්මය ලත් සියලු ශ්‍රී ලාංකේය පුරවැසියන් හට අකුරු කිරීමට හැකිවන සේ නිදහස් අධ්‍යාපනය 1945 වසරේ සිට අද දක්වා ද අදින් මතුවට ද පවතිනුයේ එකී උදාරතර සිංහල පුත්‍රයකුගේ පුරෝගාමීත්වයෙනි. ඔහු නමින් සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර වන අතර ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුදාවලියෙන් ද පිදුම් ලද්දේය. මතු උපන් නූපන් පරපුරක් උදෙසා එවන් සේවයක් සිදු කළ ඔහු වෙත කෘතගුණ සලකනු වස් මෙවර යුගතර ශාස්ත්‍රීය සඟරාව දෙවන කලාපය සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර අනුස්මරණ විශේෂ කලාපයක් ලෙස එළි දක්වනු ඇත.

සංස්කාරකවරු
යුගතර ශාස්ත්‍රීය සඟරාව

## පටුන

ශ්‍රී ලාංකේය අතීතය ඔස්සේ අනාගතයට ගමන් කිරීම හා කන්නන්ගර අධ්‍යාපන චින්තනය 1

මහාචාර්ය පැට්‍රික් රත්නායක

පහේ ශිෂ්‍යත්වය හා මධ්‍ය විද්‍යාල 7

මහාචාර්ය උක්කු බණ්ඩා කරුණානන්ද

වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය 11

එච්.එච්.එන්.එස්. හේවාවසන්

මධ්‍ය විද්‍යාල සංකල්පය හා තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලය 17

එල්. ඒ. ජයතිස්ස

කන්නන්ගර මහතාගේ සංකල්පයෙන් බිහිවූ සඳලංකා මධ්‍ය විද්‍යාලය 23

අනුරුද්ධිකා දිල්හානි

ශ්‍රී ලංකේය දරු පරපුරට උරුම වූ නිදහස් අධ්‍යාපනය සඳහා කන්නන්ගරයන්ගේ දායකත්වය 29

නිලන්ති බණ්ඩාර, ආචාර්ය දම්මි බණ්ඩාර, ආචාර්ය නලින් වර්නජිත්, ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අධ්‍යාපන දර්ශනය 33

ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර, නිලන්ති බණ්ඩාර, ආචාර්ය දම්මි බණ්ඩාර, අසංක කෝදාගොඩ

නිදහස් අධ්‍යාපනයේ මුදුන් මල්කඩ වූ මධ්‍ය විද්‍යාලඃ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය හෙවත් පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය 39

ආචාර්ය නලින් වර්ණජිත්, ආචාර්ය දම්මි බණ්ඩාර, නිලන්ති බණ්ඩාර, ආචාර්ය මනෝජි හරිස්චන්‍ද

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය 47

ආර්.එම් නදීකා රත්නබාහු

සී. ඩබ්. ඩබ්. කන්නන්ගර යුගය දක්වා ලංකාවේ බටහිර අධ්‍යාපනය 59

සංජීව පතිරණ

අධ්‍යාපන දර්ශනය එදා සහ අද : සී.ඩබ්.ඩබ්. කන්නන්ගරගේ දායකත්වය 67

ඒ. හරිනි නවෝදා ද සොයිසා, කෞෂල්‍යා යටිගම්මන, ගාමිණී විජයරත්න

අධ්‍යාපනය හා සංස්කෘතිය පිළිබඳ කන්නන්ගර චින්තනය පිළිබඳ විමසුමක් 75

ඩබ්. එම්. ජී. එන්. පනම්පිටිය

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී බෞද්ධ අධ්‍යාපනයට භික්ෂූන් වහන්සේගෙන් සිදු වූ මෙහෙය 83

ඩබ්ලිව්. එම්. හිරාන් මධුසංක වීරබාහු

කන්නන්ගර චින්තනය පිළිබඳ හැඳින්වීමක් 89

කඩවලවැවේ කල්‍යාණ හිමි

නිදහස් අධ්‍යාපනයෙන් ජීවය ලද මහව විජයබා මධ්‍ය මහා විද්‍යාලය 101

ඒ.එච්.එම්. ජනක අතපත්තු

නාලන්දා (පිරිමි) ජාතික පාසල මිනුවන්ගොඩ 105

එච්.ඒ.එස්.එන්.හංචාපොල, එන්.ඒ.ඩී.එම්.නිශ්ශංක

නිදහස් අධ්‍යාපනයේ පහස ලත් හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය 107

එම්.පී. හංසමාලි, එච්.විතානගේ

කන්නන්ගර සංකල්පයෙන් නව ජීවයක් ලද පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය 113

තෂිලා යොහානි, පී. ජී. ටී. එන්. පෙරේරා

සබරගමුවේ නූතන අධ්‍යාපන කේන්ද්‍රස්ථානය "පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය" 119

විරාත් ඉන්දුම දිගෝආරච්චි

කන්නන්ගර සංකල්පයෙන් නැවුම් මාවතකට පිවිසි තක්ෂිලා ගමන් මග.... 127

ඉසුරු ගුණතිලක, පේෂිකා මධුෂි, මහේෂී සමරවික්‍රම

අධ්‍යාපන සමාජ විද්‍යාව හා "ගුරු භූමිකාව" 133

එච්. සචිනි නිසංසලා සිල්වා

නිදහස් අධ්‍යාපනයේ තිඹිරිගෙය සී.ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මධ්‍ය විද්‍යාලය - මතුගම 141

ඩී. සෂික අනුශාන් මුණසිංහ

# ශ්‍රී ලාංකේය අතීතය ඔස්සේ අනාගතයට ගමන් කිරීම හා කන්නන්ගර අධ්‍යාපන චින්තනය

**මහාචාර්ය පැට්‍රික් රත්නායක**
පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ඕනෑ ම රටක දේශයක ජාතික අධ්‍යාපන සැළසුම්, ප්‍රතිපත්ති සහ එහි ක්‍රියාකාරී නියාමනය සකස් විය යුත්තේ අදාළ රටේ සාරධර්ම, සංස්කෘතිය, ආගම් භාෂා දර්ශන එහි ජීවත්වන ජාතීන් යන නානාවිධ කරුණු කෙරෙහි අවධානය යොමු කරවමින් බව මාගේ පිළිගැනීමයි.

ඒ සඳහා එම රටේ, ඓතිහාසික පසුබිම, භූගෝලීය පසුබිම, ආර්ථික පසුබිම සහ විවිධ සංස්කෘතිමය කරුණු මෙම ඉහත කී අධ්‍යාපන සැළසුම් ප්‍රතිපත්ති කෙරෙහි හේතු කරගත යුතුව තිබේ. විශේෂයෙන් රටක ඔවුන්ගේ අතීතය පිළිබඳ මනා අවබෝධයක් ඒ පිළිබඳ විශ්වාසයක් හැඟීමක් එවගේ ම අතීත තොරතුරුවලට අනුව අප විසින් වර්තමානය තුළ කෙසේ ජීවත් විය යුතු ද, කුමනාකාර ප්‍රතිපත්ති මත අන් ජාතීන් හා කටයුතු කළ යුතු ද ආදි වශයෙන් වෙනස් වූ සංස්කෘතික රාමුවක් අපට නිතැතින් ලැබෙනවා.

ඒවගේ ම අප අනාගතය සැළසුම් කරනු ලබන්නේ අපගේ ඓතිහාසික පසුබිම අනුව ගමන් කරන එකී ක්‍රමවේදයන්ට අනුව ද, එසේ නොමැති නම් සම්පූර්ණයෙන් වෙනස් වූ ප්‍රතිසංස්කරණ මත අධ්‍යාපනය සංස්කෘතිය ආර්ථික වැනි දෑ හැඩ ගස්වන්නේ ද යන්න අප විසින් සිතා බැලිය යුතු ව තිබේ.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අතීත උරුමය ලෙස අප සළකනු ලබනුයේ බුදුසමය හා බැඳුණු බෞද්ධාගමික පිළිගැනීම් එවගේ ම බෞද්ධ සංස්කෘතික, බෞද්ධ දාර්ශනික වටපිටාවක් තුළ සකස්වුණු සිංහල බෞද්ධ සංස්කෘතික පදනමක් යන්න මූලික ප්‍රත්‍යක්ෂ සාධකයක් ලෙස අමතක කළ නොහැකිව පවතී. ඒ අනුව මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට පැමිණීමේ සිට ඇතිවුණු නව ප්‍රතිසංස්කරණවාදී සංස්කෘතිය හා අධ්‍යාපනය එමෙන් ම ආගම පිළිබඳව අප කාගේත් අවධානය යොමුවිය යුතු ව තිබේ. එසේ ම අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ පැමිණීම නොවුණා නම් ඒ දක්වා අතීතයේ සිට පැවත ගෙන ආ නානාවිධ සංස්කෘතික ශක්‍යතා හා ක්‍රමවේදයක් අනුව අපට වෙනත් පසුබිමක් ගොඩනැගෙන්නට ඉඩකඩ තිබෙන්නට ඇති යැයි විශ්වාස කළ හැකිය.

නමුත් අපට බුදුදහම හා බැඳුණු අපූර්ව සංස්කෘතිය අපූර්ව සිතුම් පැතුම් පද්ධතියක් ආකල්ප පද්ධතියක්, බුදුදහම හා ගැමි ආගමික, දේව ඇදහිලි විශ්වාස මත පදනම් වූ ආගමික මතිමතාන්තර එමෙන් ම කුඹුර බැත කෙත මධ්‍ය වූ කෘෂිකාර්මික සංස්කෘතියක් සමග බැඳුණු වත්පිළිවෙත් හා ගොඩනැගුණු දේවඇදහිලි විශ්වාස මත ගමන් කෙරෙන එහෙත් බුදුදහම හා බැඳුණු අපූර්ව සංස්කෘතියක් දායාද වී ඇති බව අප සියලු දෙනා විසින් පිළිගනු ලබන තත්ත්වයකි.

එමෙන් ම දේශානුරාගී දේශාභිමානි හැඟීම් සමග යහපත් ආකල්ප ඇති කිරීම පිළිබඳව නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිඳුන්ගේ 128 වන ජන්ම දිනය නිමිත්තෙන් ආචාර්ය ජයන්ති ගුණසේකර මහත්මිය දේශනයේ දී පළ වූ අදහස් පහත උපුටා දක්වමි.

## දේශානුරාගී, දේශාභිමානී හැඟීම් සමඟ යහපත් ආකල්ප ඇති කිරීම

දේශපාලන සහ විවිධ බලවේගයන්ගෙන් පිළුණු හෝ ඔද්දල් නොවුන සාමකාමී නිදහස් පරිසරයක පාසලේ දී ලබන ඉගෙනුම් අත්දැකීම් සමඟ නිවැරදි මඟ පෙන්වීම් තුළ සාර්ථක පාසල් දිවියක් ගත කරන්නට එදා කන්නන්ගර මැතිඳු ඇති කළ මධ්‍ය මහා විද්‍යාලවල උගත් සිසු දරු දැරියෝ වාසනාවන්ත වූහ. එය 'නිදහස් අධ්‍යාපනය' උපරිම ලෙස භුක්ති විඳිනු ලැබූ ස්වර්ණමය යුගයකි. ජාතික හා ආගමික උත්සව, ක්‍රීඩා උත්සව, ත්‍යාග බෙදා දීමේ උත්සව ඇතුළු විවිධ ක්‍රියාකාරකම් වාර්ෂික ව ඉතා සාර්ථක අන්දමින් පාසල්වල පැවති අතර, දේශානුරාගී, දේශාභිමානී හැඟීම් ඇති කරන ගීත හා සංගීතයෙන් ද, විවිධ සෞන්දර්යාත්මක අංග වලින් ද මෙම උත්සව වර්ණවත් විය. ස්වාභාවික සම්පත් වලින් අනූන, "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" ලෙස විරුදාවලි ලත් අප කුඩා රටෙහි අසිරිමත්භාවය විෂය

කරුණුවලින් පමණක් නොව සියලු ම බාහිර කටයුතුවලදී ද මතු කර පෙන්වීම නිසා සිසු හදවත්වල රට කෙරෙහි ආදරයක් හා අභිමානයක් නිතැතින් ම ඇති විය.

එකල මධ්‍ය මහා විද්‍යාලවල ඉතා දක්ෂ විදුහල්පතිවරයෙකු සමඟ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් සේවය කලහ. විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය සැබවින් ම ආදර්ශවත් වූහ. බුදුන් වහන්සේ වදාළ පරිදි "අවවාදයට වඩා ආදර්ශය උතුම්" යන ආදර්ශ පාඨයට අනුව විදුහල්පති හා ගුරු මණ්ඩලය සිසු විනය ගොඩනැගීමේ දී ක්‍රියා කලහ. ඉගැන්වීම යන්න රැකියාවකට පමණක් සීමා නොකළ ඔවුහු ඉතා කැපවීමෙන් සිසු ප්‍රජාව දැනුමෙන්, හැකියාවෙන් හා යහපත් ආකල්ප වර්ධනයෙන් පෝෂණය කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගත් හ. අද මෙන් උපකාරක පන්ති එකල නොතිබුණු බැවින් ඉගෙනුමක් ලබා ගැනීමට සිසුනට තිබූ එකම මාර්ගය ද පාසල් අධ්‍යාපනය පමණක් ම විය. තම උතුම් ගුරුවර ගුරුවරියන් වෙතින් ලද ශාස්ත්‍රීය ඥානය මෙන් ම ජීවිතය හැඩ ගසා ගැනීමට ලද මාර්ගෝපදේශනයන් ද සිසුන්ගේ චරිතායනයට රුකුලක් වූයේ විදුහල්පති හා ගුරුභවතුන්ගේ ජීවන චරිත ද සැබවින් ම ආදර්ශවත් වූ නිසාම ය.

ජාති, ආගම්, කුල භේදයකින් තොර ව සමාජයේ ජීවත්වන සෑම පුද්ගලයෙකු සමඟ ම එකට ජීවත්වීමේ හැකියාව සිසුන් තුළ ඇති කිරීමට එදා මධ්‍ය මහා විද්‍යාලවලින් ලබාදුන් අධ්‍යාපනයෙන් මනා මඟ පෙන්වීමක් ලැබුණි. විශේෂයෙන් ම "මිශ්‍ර පාසල් සංකල්පය" අනුව ගැහැණු සහ පිරිමි ළමුන් එකම පාසලේ අධ්‍යාපනය ලැබීම තුළින් පාසල් ජීවිතය තුළ මානසික හා ශාරීරික සංවර්ධන අවධිය පසුකරන සිසු, සිසුවියනට ස්ත්‍රී, පුරුෂභාවය පිළිබඳ ව හොඳ අන්‍යෝන්‍ය අවබෝධයක් ලබා ගැනීමටත්, ස්ත්‍රී/ පුරුෂ භේදයකින් තොරව සමානාත්මතාව පවත්වා ගෙන යාමටත්, ස්ත්‍රී/ පුරුෂ භේදයකින් තොර විවිධ කාර්ය කිරීමේ කුසලතා ලබා ගැනීමටත්, එකිනෙකා කෙරෙහි ගෞරවාන්විත හැඟීම් ඇති වීමටත් අවස්ථාව ලැබේ.

පාසැල් අධ්‍යාපනය තුළින් ස්වදේශීය චින්තනය ඇති කරලීම සඳහා පූර්වෝක්ත ව සඳහන් කළ අපගේ ඓතිහාසික උරුමය පමණක් අවබෝධ කරගැනීම නොසෑහේ.

සෑහෙන පමණ දැනුමක් ලබාගැනීම සඳහා ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතිය පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීම මෙන් ම මෙම දායාද වී ඇති ස්වභාවික දේශගුණික තත්ත්වයන් මෙන් භූගෝලීය සාධක පිළිබඳ අවබෝධය ද ඉතාමත් වැදගත් වන්නේ රටක අනාගත අභිවෘද්ධිය සඳහා හරවත් ආකල්ප ඇති කර ගැනීම උදෙසාය.

අද්‍යතන අවදියේ අප රට මුහුණ පා ඇති ප්‍රධාන ඓන්ද්‍රීය සාධකය වී ඇත්තේ විදේශවලට ගෙවීමට ඇති අධික ණය බර ය. වර්තමානයේ හෝ නුදුරු අනාගතයේ දී මේ ණය බරින් නිදහස් කිරීම ශ්‍රී ලාංකේය සංවර්ධනය ප්‍රථම ඉලක්කය විය යුතු ය. මේ රටට, සංස්කෘතියට, දේශගුණික තත්ත්වයන්ට නොගැලපෙන දෑ මේ රට තුළ ස්ථාපිත කිරීමට ගත් උත්සාහයක් නිසා මේ අධික ණය බර දැරීමට සිදුව ඇත.

සැබෑ නිදහස් කන්නන්ගර අධ්‍යාපන චින්තනය ඔස්සේ දැනුම පුළුල් කිරීම සිදුවුණි නම් මෙවන් අද්‍යතන අර්බුදකාරී ශ්‍රී ලංකාවක් ගොඩනැගෙනු ඇත.

පූර්වෝක්ත ව සඳහන් කළ බිහිසුණු තත්ත්වයෙන් රට මුදවා ගැනීම සඳහා සිදුවිය යුතු සැබෑ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොවීම බරපතල ගැටලුවලට පාදක වී තිබේ.

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර චින්තනය මගින් උරුම වූ "නිදහස් අධ්‍යාපන චින්තනය" නොමිලයේ අධ්‍යාපන චින්තනයක් නොවිය යුතුය. නොමිලයේ අධ්‍යාපන චින්තනයක් ලෙස එය භාරගතහොත් යටත් විජිත යුගයේ මේ රටට උදාකළ ස්වදේශීය ආකල්ප ගොඩනැංවීමට වහල් භාවයෙන් මිදුණු නිදහස් නිවහල් චින්තනයක් ඇති කිරීමේ උත්සාහය ව්‍යර්ථ වනු ඇත.

කන්නන්ගර චින්තනයේ තිබුණු ප්‍රාථමික ශ්‍රේණිවල ප්‍රථම අධ්‍යාපන දැනුම ලබාදීම සඳහා වූ ඉගැන්වීම් සියල්ලක් මව්බසින් සිදුවිය යුතුය යන්න ඉතා වැදගත් සංකල්පයකි. මෙකී නියාමනය අද වනවිට ඉතා දරුණු ලෙස පුද්ගල කේන්ද්‍රීය නියාමනයකට යටත් වී හමාරය. ළමා මනසට කුඩාකළ සිට දේශීය චින්තනය වෙනුවට විදේශීය හර චින්තනයක් හිස මතට ඇතුල් කිරීමට දෙමාපියන් විසින් ම ගන්නා ලද තීන්දු තිරසාර සංවර්ධන ඉලක්කයන් ජයගැනීමට හේතු නොවනු ඇත. වයස අවුරුදු 5 සිට 14

දක්වා ළමුන්ට අධ්‍යාපනය අනිවාර්ය වීම වැනි කන්නන්ගර යෝජනා අද දක්වා ම ක්‍රියාත්මක වීම සතුටට කරුණකි.

කන්නන්ගර මැතිඳුන් ඇතුළු කමිටුව ජාතික අධ්‍යාපනය වෙනුවෙන් කරන ලද එම මහඟු සත්කාර්යය හේතුකාර්යය හේතු කොට ගෙන වර්තමානය වන විට අපි අධ්‍යාපනික දර්ශක අතින් දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් අභිභවා ඉතා ඉහළ මට්ටමකට පැමිණ සිටින්නෙමු. ලෝකයේ ඉතා දියුණු රටවල පවතින අධ්‍යාපන දර්ශක හා සම තත්ත්වයට පැමිණීමට නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වීමත් සමඟ ගැනුණු අනෙකුත් සුබ සාධන පියවරවල් සුබවාදී ව බලපෑ බව අපි දනිමු. ලොව නමක් සනිටුහන් කිරීමට හැකියාව ඇති විශිෂ්ඨ ගණයේ ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, ගණකාධිකාරීවරුන්, වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ව්‍යවසායකයන්, විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන්, සමාජ විද්‍යාඥයන්, කලාකරුවන්, දේශපාලඥයන් අප රටෙන් බිහි වුයේ ද අධ්‍යාපනයේ නවතාව, ගුණාත්මක බව හා විශිෂ්ටතාව වෙනුවෙන් ඉටු කරන ලද විශිෂ්ට කර්තව්‍යය නිසා ම ය.

මෙම ලිපිය සම්පාදනය කරන අප වැන්නන් මේ දේශයට අල්පමාත්‍රාව සේවය කිරීමට නිවැරදි ආකල්ප හා නිර්මාණශීලී චින්තනයකට යොමු වූයේ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අධ්‍යාපන සැළසුම්කරණයේ මධ්‍ය මහා විද්‍යාල සංකල්පයෙන් බිහි වූ දරුවන් ලෙස ය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක රජය යටතේ ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කන්නන්ගර ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ මගක් ගත්තේ ය. ඒ අනුව නව කෘෂිකාර්මික අධ්‍යාපන සැළසුම් ඒ අනුව යමින් ප්‍රාග් වෘත්තීය විෂයයන් ජනකලා, කොන්ක්‍රීට්, වඩුකාර්මික වැනි ව්‍යාපෘති විෂයයන් සහ "රටේ සම්පත්" වැනි විෂයයන් හඳුන්වා දීම අගය කළ යුතු ය.

ඒ අනුව බද්උද්දීන් මහමුද් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නියාමනය අනුව මේ රටේ සැබෑ කලා අධ්‍යාපනය නිසි වැඩපිළිවෙලක් ලෙස සෞන්දර්ය විෂය ධාරාව හඳුන්වා දීම අගය කළ යුතුය. ඒ අනුව අද පවතින නාට්‍ය හා රංගකලා විෂය ප්‍රාරම්භව හඳුන්වා දෙන ලද්දේ නාට්‍යකරණය යනුවෙනි.

සැබවින්ම කලා අධ්‍යාපනය කිසියම් අධ්‍යාපන පද්ධතියක් කෙරෙහි බල පවත්වන අනු පද්ධතියක් ලෙස ගිණිය හැකිය. පින්නදුව මහතාගේ පොතට ප්‍රස්තාවනාවක් සපයන යුනෙස්කෝවේ කලා අධ්‍යාපනය පිළිබඳ විශේෂඥයෙකු වූ ඔසාමු මියුරෝ (Osamu Muro) මහතා කලාව හා අධ්‍යාපනය අතර පවත්නා සම්බන්ධය හුදෙක් කේවල ස්වරූපයක් නොදරන අතර, එය අති විශේෂ හැඟීම් දනවන්නක් බව මෙලෙස සඳහන් කරයි. "... මා හිතන්නේ කලාව අධ්‍යාපනයේ විශ්ෂ්ට ස්ථානයක් ගතයුතු බවයි. එයට හේතුව සැම සිසුවෙකුටම කලාව මගින් තමාගේ සංකල්පන ශක්තිය අති විශේෂව වර්ධනය කරගැනීමට අවස්ථාව සැලසෙන නිසායි. එමෙන්ම තමාගේ කටයුතු සඳහා තම වගකීම් හා තම ස්ථිරත්වය බලපවත්වන සැටි ඔවුන්ට අවබෝධ කරගැනීමට ඉඩකඩ සැලසේ. මේ කරුණු සියල්ලම සමාජයේ පුද්ගලිකත්වය, අති විශේෂත්වය තහවුරු කර ගැනීමට ඉවහල් වන සාධකයෝය. එහෙයින් කලාව, කලාව නිසාම බිහිවූවන් නොවේ. මින් සිදුවන්නේ ශිෂ්‍යයාගේ පෞද්ගලිකත්වය ගොඩනංවා ගැනීමට මහත් උදව්වකි. අනාගතයේදී අවශ්‍යවන අධ්‍යාපන ක්‍රමය ලබාදිය හැක්කේ කලාව මගින් පමණකි... විශේෂයෙන්ම විද්‍යාත්මක හා යාන්ත්‍රික අංශයෙන් සීඝ්‍ර දියුණුවක් ලබා ඇති රටවල චිත්තවේගික හා ප්‍රකාශන අංශයේ ඇතිවී තිබෙන අඩු පාඩු පිරිමසා ගැනීමට කලා අධ්‍යාපනය බෙහෙවින් උපකාරීවේ."

ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනයේ ප්‍රථම කණ්ඩායමේ විද්‍යාර්ථියෙකු ලෙස පින්නවල මධ්‍ය මහා විද්‍යාලයේ දී "නාට්‍යකරණය" විෂය අද අප සතුව තිබෙන නිර්මාණශීලිත්වය උද්දීපනය කිරීමට හේතු වූ බව පැවසිය යුතුය. එම විෂය සතුව පවත්නා සාමූහිකත්වය, ජනප්‍රියත්වය, විනෝදාස්වාදය ආදිය නිසා අප විදුහලේ විද්‍යා විෂයයන් හදාල සිසුන්ගේ ද දැඩි අවධානයට ලක් වී ඔවුන් අතරින් ද නාට්‍ය නිර්මාණ බිහි වූ බව සඳහන් කළ යුතුය.

නාට්‍ය දාර්ශනිකයෙකු වන බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් සඳහන් කරනු ලබන "වෙනස්වන ලෝකය වෙනස් කළ යුතුය" යන්න ලෝකය නිර්මාණශීලීව වෙනස් කළ යුතුය යන්න අප කෙරෙහි ආකල්ප වර්ධනය වීමට නව විෂය හේතු විය.

නාට්‍ය කලාවේ ආවේණිකව පවත්නා මෙම සාමූහිකත්වය ප්‍රයෝජනයට ගෙන කවර අධ්‍යාපන අරමුණු ඉටුකර ගත හැකිවේදැයි විමසා බැලිය යුතුය. ළමයා සමාජයට හුරු කිරීම හෙවත් සමාජානුයෝගී කිරීම

(Socialization) නූතන පාසල් අධ්‍යාපන ක්‍රමයේ විශේෂ පරමාර්ථයක් වශයෙන් ද සඳහන් කළ හැකිය. පාසලේදී ලබන මේ සමාජානුයෝගය අනුව ළමයා ක්‍රමයෙන් වයසින් වැඩෙත්ම සමාජයම පරිනතියක් ද (Social Maturity) චිත්ත වේග පරිනතියක් ද (Emotional Maturity) ලැබිය යුතුය. සාමාන්‍ය පාසල් ක්‍රියවලියේදී හෙමින් හෙමින් ලබන මේ සමාජානුයෝගී පරිනතිය වේගවත් ව හා වඩාත් තහවුරු වන ලෙසින් ලබා දීමට නාට්‍ය අධ්‍යාපනයට හැකියාවක් තිබේ. එනම් සමාජානු යෝගය තහවුරු වීමට වඩාත් ඉවහල් වන්නේ ව්‍යවහාරික ඉගැන්වීමේ ක්‍රමයන්ය. මේ අනුව පාසල් විෂය මාලාව තුළ කෙරෙන නාට්‍යාකාර ඉගැන්වීම් හා නාට්‍ය නිෂ්පාදනය තුළින් සහෝදර හා සමූහික ආක්ලප වර්ධනය කරගන්නා ළමයි වඩාත් තෘප්තිමත් සමාජ හුරුවක් ද ලබති.

අද්‍යතන අවදියේ මේ රට මුහුණ පා ඇති බොහෝ වෘත්තීය ඉලක්ක සහගතව ඇති ඇතැම් විෂය ප්‍රවීණත්වයෙන් බිහිවන පුරවැසියන් තුළ නිවැරදි මානවීය ගුණාංගවලින් බිහිවීම බරපතළ ගැටලුවකි. නිදසුනක් ලෙස වෛද්‍යවරයෙකු බිහිකිරීමේ උදාර පරමාර්ථය වනුයේ රෝගීභාවයට පත් පුරවැසියන් නීරෝගී භාවයට පත්කිරීමේ අරමුණ ය.

මෙම විෂය සතුට පවත්නා මානවීය ගුණය ද බොහෝ දුරට රෝගියෙකු නීරෝගි වීමට බලපානු ලබන එක් ප්‍රධාන සාධකයකි. ඒ අනුව "වෙද හෙදකම්" "බෙහෙත් හේත්" යන යෙදුම් භාවිත වේ. අද්‍යතන අවදිය වන විට වෛද්‍යවරයෙකු බිහිකිරීමේ පළමු පරමාර්ථය හැකිතාක් මුදල් ඉපයීම බවට පත්ව තිබේ.

ඇතැම් විශේෂඥ වෛද්‍යවරු දවසේ පැය 24 ම අදාල රෝහල්වල නේවාසිකව හිඳිමින් මෙම මුදල් ඉපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින්නේ ජාතික අධ්‍යාපනය තුළ මානවීය ආකල්ප පෙරදැරිව ක්‍රියාකිරීමේ සාමූහික පරමාර්ථවලින් ගිලිහී තිබීම හේතුවෙනි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ යෙදී සිටින විද්‍යාර්ථීන්ගේ ආකල්ප හා පෞරුෂ වර්ධනය සිදුකළ යුත්තේ ජාතික පාසැල් අධ්‍යාපනය තුළ පාසැල් සිසුන්ට ය. "සිටවා ඇත්තේ වට්ටක්කා ඇට නම් බිහිවන්නේ වට්ටක්කා වැලකි. හටගන්නේ ද වට්ටක්කාය. එල නෙලීමට වන්නේ ද වට්ටක්කාය. හොඳින් පොහොර යෙදීමෙන් කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ හොඳ වට්ටක්කා ලබා ගත හැකිය." එහෙත් අප විසින් සිදුකරනුයේ වට්ටක්කා වැලෙන් පැණි කොමඩු කැඩීමේ එලක් නොව අනවරත ව්‍යායාමයකට ය.

එනිසා ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ඉදිරි අනාගතය සඳහා දශක දෙක නව සැළසුම් සමග ශ්‍රී ලාංකේය අධ්‍යාපනය තුළින් මේ රට සංවර්ධන ඉලක්ක කරා ගෙන යා යුතුය.

ජාතික අධ්‍යාපනය තුලින් අනාගත ශ්‍රී ලාංකේය තිරසාර සංවර්ධනයක් සලසුම්කිරීමට නිර්මාණාත්මක චින්තනය හා අදහස් ප්‍රකාශ කිරීමේ ශක්ති වර්ධනය සිදු කළ යුතු ය. මේ පිළිබඳව මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා දක්වන අදහස් මෙහි දී මහෝපකාරී වේ.

සෞන්දර්ය අධ්‍යාපනය මඟින් මිනිසා නිර්මාණාත්මක චින්තනය උදෙසා යොමු කළ හැකිය. ලෝකය දෙස අලුත් දෘෂ්ටියකින් යුතුව බැලීමට මේ චින්තනය ඉවහල් වේ. එමෙන්ම අද අධ්‍යාපනය නිෂ්පාදනයට උපයුක්ත විය යුතු යයි අදහස් වේ. මේ අනුව නිර්මාණාත්මක බවද අධ්‍යාපනය මඟින් පුද්ගලයා තුළ රෝපණය කළ යුතුව තිබේ. කලාව විෂයයෙහි නිර්මාණය, අදහස් ප්‍රකාශ කිරීම හා රස වින්දනය යන සංකල්ප තුනම, අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක මහත්සේ බැඳී පවතී. වින්දනයෙන් තොර නිර්මාණයක් හෝ නිර්මාණයෙන් තොර වින්දනයන්ද ඇතිවිය නොහැක. එමෙන්ම නිර්මාණය යනු එක අතකින් අදහස් ප්‍රකාශකිරීමක් වන අතර අනෙක් අතට රස වින්දනයය අදහස් උරාගැනීමකි. මෙලෙස සමෝධානිතව පවත්නා මේ ස්වරූපය කලාකෘති නිෂ්පාදනයේදී ඇති මහත්සේ බලපවත්වනවා මෙන්ම ජීවිතයේ දෛනික අවශ්‍යතා හා ප්‍රශ්න හමුවේ ඒවාට සාර්ථකව මුහුණ දීමට, ඒවා තරණය කිරීම හා ජයග්‍රහණය කිරීමට පුද්ගලයාට අවශ්‍ය වේ. නිෂ්පාදනය හෙවත් නිර්මාණය එහි මුල් ස්වරූප අනුව අදහස් ප්‍රකාශ කිරීමකි. අනුන්ට තේරුම් ගැනීමට පහසුවන ලෙස ව්‍යක්තව හා පරිනත භාවයෙන් යුතුව අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තියක්ද පුද්ගලයෙකුට අවශ්‍ය වේ. මෙලෙස නිර්මාණාත්මක චින්තනය ඇතිවීමත්, ප්‍රකාශන ශක්තිය වර්ධනයවීමත් අරමුණුකොටගෙන සෞන්දර්ය අධ්‍යාපනය ලබා දිය යුතුය.

**මූලාශ්‍රය**


- සෞන්දර්යය හා නාට්‍ය අධ්‍යාපන ප්‍රවේශය. අබේපාල රෝලන්ඩ්. කතෘ ප්‍රකාශන. 1977
- "සමරු දේශනය" කන්නන්ගර චින්තනය තුළ ජනිත වූ නිදහස් අධ්‍යාපනය 60 දශකයේ මධ්‍ය මහා විද්‍යාලවල ක්‍රියාකාරිත්වය සහ වර්තමානයට ගත හැකි ආදර්ශ.
- ආචාර්ය ජයන්ති ගුණසේකර. 2012.10.15 අධ්‍යාපන අමාත්‍යාංශය.
- නිදහස් අධ්‍යාපනයේ පුනරාවලෝකනය, ජනාධිපති කාර්යාලය, ජාතික විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාලය. 2019 සංස්. යටගම්මන කෞශල්‍යා.
- පැරණි ලංකාවේ ගිහි අධ්‍යාපනය - විමලවංශ බද්දේගම හිමි. 1988. එස් ගොඩගේ සහ සහෝදරයෝ.


**පාදක සටහන්**

1. "සමරු දේශනය" කන්නන්ගර චින්තනය තුළ ජනිත වූ නිදහස් අධ්‍යාපනය 60 දශකයේ මධ්‍ය මහා විද්‍යාලවල ක්‍රියාකාරිත්වය සහ වර්තමානයට ගත හැකි ආදර්ශ
   ආචාර්ය ජයන්ති ගුණසේකර. 2012.10.15 අධ්‍යාපන අමාත්‍යාංශය. පිටු අංක 23, 24
2. එම පිටු අංක 25
3. සෞන්දර්යය හා නාට්‍ය අධ්‍යාපන ප්‍රවේශය. අබේපාල රෝලන්ඩ්. කතෘ ප්‍රකාශන. 1977 පිටු අංක 31, 32
4. එම පිටු අංක 61
5. එම පිටු අංක 33, 34

# පහේ ශිෂ්‍යත්වය හා මධ්‍ය විද්‍යාල

**මහාචාර්ය උක්කු බණ්ඩා කරුණානන්ද**

පහේ ශිෂ්‍යත්වය අවලංගු කිරීමට අවධානය යොමු කොට ඇති බලධාරීන්ගේ අවධානය පිණිස කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට සුදුසු යැයි සිතමි. ඒ සඳහා ඉදිරිපත් කරන ප්‍රධාන තර්කය වන්නේ මේ තුළින් දරුවන්ට අත්විඳීමට ඇති පීඩනයයි. පහේ ශිෂ්‍යත්වය අහෝසි කිරීමෙන් මෙම පීඩනය නැතිවන්නේ යැයි සිතීම මුලාවකි. ඒ වෙනුවට අටවන ශ්‍රේණියේදී විභාගයක් පැවැත්වීමෙන් සිදුවන්නේ ඒම පීඩනය තවත් අවුරුදු තුනකින් දීර්ඝ වීම පමණි. අද පාසල් යන දරුවෝ පහේ ශිෂ්‍යත්වය, අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සඳහා දැඩි තරඟයක යෙදී සිටිති. ඒ නිසා දරුවන්ගේ පීඩනය නැති කිරීම සඳහා මෙම සියලුම විභාග අවලංගු කරන ලෙස දරුවන්ගේ මතයක් ගොඩනැගීමටද හැකියාව ඇත.

දෙමාපියන් දරුවන් පීඩනයට ලක්කරන්නේ මක්නිසාද? කෙටියෙන් කිවහොත් දරුවා උසස් පාසලකට ඇතුලුකරවා ගැනීම උදෙසාය. එනම් දිවයිනේ පාසල්වල ඇති අධ්‍යාපන මට්ටම්වල විෂමතාවයි. උසස් යැයි සම්මත පාසල් පන්තියක් දිවයිනේ ඇත. ඒවායේ හොඳ ගුරුවරුමෙන්ම විවිධාකාර පහසුකම් දක්නට ඇත. මේවා බොහෝ දුරට පිහිටා ඇත්තේ ප්‍රධාන නගරවලය. ඇත්ත වශයෙන් ගමේ පාසල හොඳම පාසල නොවීම මීට ප්‍රධාන හේතුවයි. එසේ නම් විසඳුම ඇත්තේ දිවයිනේ උසස් ගණයේ පාසල් සංඛ්‍යාව වර්ධනය කිරීමය. නගරයෙන් පිටත ප්‍රදේශවල උසස් පාසල් බිහි කිරීමය. උසස් බව හැඟවෙන නම් සහිත පුවරු පාසල්වලට දැමීම ඊට පිළියම නොවේ. දක්ෂ ගුරුවරු සහ පහසුකම් ඇති පාසල් පද්ධතියක් ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම නාගරික ප්‍රදේශවලද බිහි කළ යුතුය.

අද පාසල් දරුවෝ සතියේ දින පහේම වරුවක් පාසල් යති. දවසේ ඉතිරි කාලයේත් සති අන්තදිනවලදීත් උපකාරක පන්තිවලට යති. මෙයයි දරුවන්ට අත් විඳින්නට සිදු වී ඇති පීඩනය. දින පහක් සේවය කරන රජයේ සේවකයන්ට දින දෙකක් නිවාඩු දෙන්නේ විවේකය අවශ්‍ය නිසාය. එසේ නම් දරුවන්ට තවත් විවේකයක් ලබා දීමට ක්‍රම වේදයක් සකස් නොකරන්නේ ඇයි? අඩුම වශයෙන් ඉරිදා දිනවල සහ රජයේ නිවාඩු දිනවල පාසල් සිසුන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම නතර කිරීමේ හැකියාවක් ආණ්ඩුවට නැත්ද? ඒ දිනවල පාසල් දරුවන් උපකාරක පන්තිවලට යැවීම තහනම් කිරීමේ නීතියක් පැනවිය යුතුය. හැබැයි එය බස්රථවල ටිකට්පතක් අනිවාර්යය කිරීම වැනි නීතියක් නොවිය යුතුය. ප්‍රායෝගික වැඩපිළිවෙලක් අවශ්‍යය. එනම් ඒ දිනවල උපකාර පන්ති හෝ පෞද්ගලිකව ගෙවල්වලට ගොස් පන්ති පැවැත්වීම තහනම් කළ යුතු අතර එය කඩ කරන ගුරුවරුන්ට මෙන්ම දෙමාපිය භාරකාරයන්ට ද දඬුවම් දිය යුතුය. සැලකිය යුතු දඩයක් නියම කළ හැකිනම් දඩයෙන් ප්‍රතිශතයක් තොරතුරු සපයන්නන්ට ද ගෙවීමේ ක්‍රමයකුත් ඊට ඇතුළත් කළහොත් මෙම පියවර සාර්ථක වනු ඇත.

ඇත්ත වශයෙන් ආචාර්ය කන්නන්ගර මැතිතුමා මධ්‍ය විද්‍යාල මෙන්ම ශිෂ්‍යත්ව ක්‍රමයක් ආරම්භ කළේ ඇයි දැයි පරීක්ෂා කිරීම මෙහිදී වැදගත් වෙයි. එම අවධියේදී දිවයිනේ ඉහළම අධ්‍යාපන ආයතන වූයේ කොළඹ පිහිටි වෛද්‍ය විද්‍යාලය, නීති විද්‍යාලය හා යුනිවර්සිටි කොලීජියයි. රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ඉහළ නිලතල ලබා ගත හැකි වූයේත් දේශපාලනයේ ඉදිරියට පැමිණිය හැකි වූයේත් මෙම ආයතනවල ඉගෙනගත් අයටය. මේවායේ උගැන්වීමේ මාධ්‍ය ඉංග්‍රීසි විය. ඒවායේ පාඨමාලා සඳහා ගාස්තුවක් ගෙවිය යුතු විය. එම අවධියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වූ පාසල් ගාස්තුවක් අය කළ නගරවල පිහිටි ඒවා විය. ආණ්ඩුවේ එකම ඉංග්‍රීසි පාඨමාලාව වූයේ රාජකීය විද්‍යාලය පමණි. සෙසු ආණ්ඩුවේ පාසල් සිංහල මාධ්‍ය පාසල් විය. රාජකීය විද්‍යාලය එවකට එක්තරා පන්තියකට සීමා වී තිබිණි. ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ගැන සලකා බලන විට දිවයිනේ විශාලතම පළාත වූ උතුරු මැද පළාතේ ඉංග්‍රීසි මාධ්‍යයේ උගැන්වූ පාසල් දෙකක් වූ අතර ඒවා පිහිටා තිබුණේ අනුරාධපුරයේය. ගාස්තු ගෙවා නගරයේ දරුවන්ට නවාතැන් පහසුකම් සලකා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය හැකිවූයේ ඇතිහැකි අයට පමණි. එනම් ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ඇති හැකි අයට පමණි. ඉංග්‍රීසි මාධ්‍ය පාසල් සියල්ලටම වාගේ පෞද්ගලික ගාස්තු අය කරන ඒවාය. මෙම තත්ත්වය අනුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසලකට හෝ ඉන් අනතුරුව උසස්

අධ්‍යාපනය ලබා දෙන ආයතනයකට දරුවන් යැවිය හැකි වූයේ බොහෝ දුරට ඇති හැකි අයට පමණි.

කන්නන්ගර මැතිතුමාගේ මධ්‍ය විද්‍යාල හා ශිෂ්‍යත්ව ක්‍රමය මගින් ආරම්භ කළේ නැතිබැරි ගම්වල සිටි දක්ෂ ශිෂ්‍යයන්ට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාසල් අධ්‍යාපනය ලැබීමට මග පෑදීමකි. නිදහස් අධ්‍යාපනය හඳුන්වාදීමෙන් අනතුරුව තම දරුවන්ට නොමිලයේම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව උදා කෙරිණ. මෙම දවසේ ඉතිරි කාලයේත් සති අන්තදිනවලදීත් උපකාරක පන්තිවලට යති. දවසේ ඉතිරි කාලයේත් සති අන්තදිනවලදීත් උපකාරක පන්තිවලට යති. ඊට පෙර එක්තරා පන්තියකට සීමා වූ උසස් අධ්‍යාපනය ගැමි දරුවන්ට විවෘත කිරීමකි. ගැමි දරුවන්ගේ මෙම වරප්‍රසාදය අහිමි කිරීමට වරප්‍රසාදලත් පන්තිය සූක්ෂම ක්‍රමවේදයක් ආරම්භ කළහ. එය 1945 දී රජයේ පාසල් මාධ්‍යය සමභාෂා කිරීමයි. එය රටට හඳුන්වා දුන්නේ බටහිර ජාතීන් යටතේ අහිමි වූ වරප්‍රසාදයක් ලබාදීමේ න්‍යායෙනි. ඇත්ත වශයෙන් මෙම පියවරින් සිදුවූයේ මධ්‍ය විද්‍යාලවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීම නතරවීම පමණි. මක්නිසාද යත් ඒ වන විට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගැන්වූ ආණ්ඩුවේ පාසල් වූයේ රාජකීය විද්‍යාලය සහ මධ්‍ය විද්‍යාලයන් පමණි. රාජකීය විද්‍යාලයේ ඉංග්‍රිසි මාධ්‍යයෙන් උගැන්වීම නතර වූයේ නැත. නතර වූයේ මධ්‍ය විද්‍යාලවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම පමණි. නැවතත් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් අධ්‍යාපනය 1940 ට පෙර තත්ත්වයට පත් විය. එනම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පන්ති පැවැත්වූයේ රාජකීය විද්‍යාලය සහ පෞද්ගලික ගාස්තු අයකළ පාසල්වල පමණි. මෙම පාසල් විවිධ මිෂනාරි සමාගම්, බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගමික ආයතන හෝ පුද්ගලික පාසල් විය.

1945 ස්වභාෂා අධ්‍යනය හඳුන්වා දීම ඇත්ත වශයෙන්ම ජයග්‍රහණයක් නොව ගැමි දරුවන් විඳි වරප්‍රසාදයක් අහිමි කිරීමකි. මෙම කාර්යයේලා පෙරමුණ ගත්තේ එක්කෝ රාජකීය විද්‍යාලයේ ඉංග්‍රීසි මාධ්‍යයන් උගත් අයය. නැතහොත් ඉහත කී ගාස්තු අයකල පෞද්ගලික පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයන් උගත් අයය. එවකට රාජ්‍ය මන්ත්‍රණ සභා මන්ත්‍රීන් වූයේ මෙම පාසල්වල ඉගෙන ගත් අය බව අප අමතක නොකළ යුතුය. ඔවුන්ගේ සූක්ෂම උගුලට හසු වූ ඇතැම් සිංහල මාධ්‍යයන් ඉගෙන ගත් පුද්ගලයෝ ද මෙම ව්‍යාපාරයට අනුග්‍රහ දැක්වූහ. පාසල් මාධ්‍ය ස්වභාෂා කළ අවධියේ සිට 1960 පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීම දැක්වා කාලය තුළ ඉංග්‍රීසි අධ්‍යයනය මධ්‍ය විද්‍යාලවලින් ඉවත් වී පෙර පරිදි ගාස්තු ගෙවන පාසල්වලට සීමා විය. ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේදී දේශප්‍රේමීන් කළයුතු වූයේ රාජ්‍ය භාෂාව බහුතරය භාවිත කරන සිංහලය කිරීමය. එහෙත් ඊනියා දේශප්‍රේමීන්ට එය අවශ්‍ය නොවීය.

1960 දී පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන ගිය උසස් පාසල් රාශියක් රජයේ පාසල් බවට පත්විය. ඊට පෙර ආණ්ඩුවේ උසස් පාසල් ලෙස සැලකූ මධ්‍ය විද්‍යාලයන්ට වඩා මෙම පාසල්වල අධ්‍යාපන මට්ටම ඉහළ තත්ත්වයක විය. මෙම තත්ත්වය යටතේ පහේ ශිෂ්‍යත්වයෙන් තෝරාගත් දරුවන් මෙම ආණ්ඩුවට පවරාගත් උසස් පාසල්වලට ඇතුළත් කරවීමට ආණ්ඩුව පියවර ගත් අතර දරුවන් පීඩනයට ලක් කිරීමට පදනම වැටුණේ එතැනදීය. ඒ හැර අනෙක් එක්තරා පන්තියකට සීමා වූ මෙම පවරාගත් උසස් පාසල්වලට ශිෂ්‍යත්ව ක්‍රමය නිසා ගමේ දරුවන් පැමිණීම ඇතැමුන්ට ගැටලුවක් විය. අවහිරයකින් තොරව තම දරුවන් යැවීමට ඔවුන්ට තිබූ ඉඩකඩ ඇහිරිණ. ඔවුහු පහේ ශිෂ්‍යත්වය අහෝසි කිරීමට තර්ක විතර්ක සම්පාදනයට සූක්ෂ්ම ලෙස සම්බන්ධ නොවූවා නොවේ. 1960 ට පෙර ආණ්ඩුවේ පාසල් අතර ඉහළ තැනක තිබුණ ශිෂ්‍යත්වධාරීන් ගිය මධ්‍ය විද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමං විය. උසස් පාසල්වලට ශිෂ්‍යත්ධාරීන් ඇතුළත් කිරීමට ලකුණු නියම කිරීමේදී පෙරමුණ ගෙන ඇත්තේ ඉහත කී පාසල් වන අතර මධ්‍ය විද්‍යාලවලට ලැබී ඇත්තේ දෙවැනි තැනකි. එමනිසා මධ්‍ය විද්‍යාලවලට ඇතුළත්වූයේ උසස් පාසල්වලට ඇතුල්වීමට නොහැකි වූ ශිෂ්‍යත්වධාරීන් පමණි.

ශිෂ්‍යත්ධාරීන් උසස් විභාගවලින් සමත් වීම මෙන්ම විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීම ගැන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් ශිෂ්‍යත්වය හෑල්ලු කිරීමේ උත්සාහයක් ද පෙනෙන්නට ඇත. බොහෝ දුරට පෞද්ගලික පන්තිවලට දරුවන් යවා අතිරේක දැනීමක් ලබා දීමට හැකියාව ඇත්තේ සීමිත පිරිසකටය. ශිෂ්‍යත්වය ලැබූ දුප්පත් දෙමාපියන්ගේ දරුවන්ට එම වරප්‍රසාදය සමහරවිට අහිමි වීම මෙම තත්ත්වයට බලපාන්නට ඇත. එය සමීක්ෂණ කොට බැලිය යුතු කරුණකි. පසුගිය දිනක

සාමාන්‍ය පෙළ ප්‍රතිපල නිකුත් විය. එහිදී ඉහළම ලකුණු ලබා ගත්තේ කොළඹ උසස් පාසල් දරුවන්ය. එහෙත් විෂයන් සියල්ලෙන්ම අසමත් ශිෂ්‍යයින් වැඩිපුර සිටින්නේ බස්නාහිර පළාතේ බව හෙළිවිය. උසස් පාසල් ඇති බස්නාහිර පළාතේ ශිෂ්‍යයින් මෙවන් තත්වයකට පත් වූයේ ඇයි දැයි කිසියම් නිලධාරියෙක් සොයා බැලුවේ ද නැත. සාමාන්‍ය පෙළ උසස් ප්‍රතිඵල ලැබූ දරුවන් පිළිබඳව මාධ්‍යයෙන් ඉදිරිපත් කළ තොරතුරු පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන කාරණයක් නම් එම දරු සියල්ලන්ම වාගේ හොඳ ආදායම් ඇති දෙමව්පියන්ගේ දරුවන් බවය.

එම දෙමාපියන්ගේ දරුවන්ට අධ්‍යාපනයට ඇති පරිසරයට වඩා සමහර විට අසමත් වූ දරුවන්ගේ සමාජ හා ආර්ථික මට්ටම පහළ තත්ත්වයේ තිබීම බලනොපාන්නේ යැයි කිව නොහැකි ද? එසේනම් වර්තමානයේ දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක වීමට දෙමාපියන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය බලපාන බව මාගේ හැඟීමයි. මේ ගැන සොයා බැලීම අධ්‍යාපනඥයන්ගේ වගකීමකි. එසේ නොමැතිව විට විභාග අවලංගු කිරීම තුළින් දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ දැමිය හැකි යැයි සිතීම නුවණට හුරු නොවන බව මාගේ හැඟීමයි. මෙයින් අන්තිමට සිදුවන්නේ එක්තරා පන්තියක පරමාර්ථ සූක්ෂම ලෙස මුදුන්පත්වීම පමණි.

තවත් අමතක නොකළ යුතු කරුණක් ඇත. වර්තමානයේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළම ලකුණු ලැබූ දරුවන් නගරවල ඇති උසස් යැයි සම්මත පාසල්වලට තෝරා ගැනේ. එයින් සිදුවූයේ ග්‍රාමීය ප්‍රදේශවල දක්ෂයින් නගරයේ උසස් පාසල්වලට ඇතුළු වීමය. මුල් අවධියේදී ශිෂ්‍යත්ව විභාගය සමත් වූවන් යොමු කරවන ලද්දේ ආසන්නයේම ඇති මධ්‍ය විද්‍යාලවලටය. එම තත්වය යටතේ ග්‍රාමීය දක්ෂ දරුවන් මධ්‍ය විද්‍යාලවලට ඇතුළු විය. අද මෙම යාන්ත්‍රනය බිඳවැටී ඇත. නගරයේ උසස් පාසල්වලට නොතේරුණ ශිෂ්‍යත්වධාරීන්ට මධ්‍ය විද්‍යාල සීමා වී ඇත. මෙම තත්ත්වය ද මධ්‍ය විද්‍යාලවල පිරිහීමට බලපා ඇත. වැඩි පහසුකම් ඇති නගරයේ පාසල්වලට ඇතුලත් වීම අද රටේ තත්ත්වය අනුව වැලැක්වීම ද පාපයකි. එසේ නොකරන්නේ නම් උසස් පාසල් නගරයේ දරුවන්ටත් නොදියුණු පාසල් ගමේ දරුවන්ටත් වෙන්වනු ඇත. ග්‍රාමීය දරුවන්ට උසස් අධ්‍යාපනයක් විශේෂයෙන් ඉංග්‍රීසි මාධ්‍යයන් ලබා දෙන්නේ නම් පළමුව කළ යුත්තේ වර්තමානයේ පාසල්වල ඉංග්‍රීසි භාෂාව උගැන්වීමේ ක්‍රමවේදයන් නවීකරණය කිරීමය. ද්විතීය භාෂාවක් ලෙස ප්‍රංශ හා ජර්මන් වැනි භාෂා ඉගෙන ගන්නා දරුවන් අවුරුදු දෙක තුනකට හොඳ දැනුමක් ලබා ගනී. එහෙත් අවුරුදු 10කට වැඩි කාලයක් පාසල්වල ඉංග්‍රීසි විෂය ඉගෙනගන්න දරුවන්ට එම දැනුම නොමැත. හේතුව ඉංග්‍රීසි භාෂාව උගැන්වීමට අප රටේ ක්‍රියාත්මක කරන ක්‍රමවේදයේ වරදයි. ආචාර්ය කන්නන්ගර මහතා කළා මෙන් මධ්‍ය විද්‍යාල හෝ තෝරාගත් පාසල්වලට දක්ෂ ශිෂ්‍යයන් ඇතුළත් කොට ඉංග්‍රීසි මාධ්‍යයට ප්‍රමුඛත්වය දෙන්නේ නම් වර්තමාන පාසල් දරුවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කළ හැකිය. මක්නිසාද යත් සියලුම පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අප රටට නොමැත. එපමණක් නොව සියලු දෙනාටම ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීමට උත්සහ කිරීමද සාර්ථක නොවන හෙයිනි. එහිලා මූලිකම පියවරක් ලෙස කන්නන්ගර මහතා කලාක් මෙන් මධ්‍ය විද්‍යාලවල නැවතත් ඉංග්‍රිසි මාධ්‍යයෙන් උගැන්වීම ආරම්භ කිරීම වඩාත් සුදුසුය. එය මධ්‍ය විද්‍යාලවල පැවැත්මටත් උපකාරයක් වනු ඇත.

# වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය

**එච්.එච්.එන්.එස්. හේවාවසන්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nhewawasan@kln.ac.lk

## හැඳින්වීම



ඡායාරූපය 01 - වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රධාන ශාලාව
මූලාශ්‍රය : https://en.wikipedia.org/wiki/Bandaranayake_Central_College,_Veyangoda

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය අනුව පළමු මහමැතිවරණය පවත්වා වර්ෂ 1931 ජූලි මස 08 වනදා ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාව රැස්විය. එහිදී පත් කරන ලද පළමු අධ්‍යාපන විධායක කමිටුවට ඇතුළත් වූයේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර, ආර්.ඩබ්. අමරසූරිය, ඩබ්.ටී.බී. කරලියද්ද, ඒ. රත්නායක, ජී.ආර්. ද සොයිසා, පී.ඊ. මඩවල සහ ඇස්.එස්. වික්‍රමසිංහ යන මහත්වරුන් ය. වර්ෂ 1931 ජූලි මස 09 වනදා සිට සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා එම කමිටුවේ සභාපති ධුරයට පත් කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන ඇමති ධුරයට පත් කන්නන්ගර මහතා වර්ෂ 1931 සිට වර්ෂ 1947 දක්වා එම ධුරය හෙබවීය. වර්ෂ 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග රාජ්‍ය මන්ත්‍රණ සභා පාලනය අවසන් විය (රුබේරු, 1994:05).

සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනයට ඉමහත් සේවාවක් ඉටු කළ පුද්ගලයකු විය. සොළොස් වසරක් වූ කන්නන්ගර මහතාගේ අධ්‍යාපන ඇමති ධුර කාලය තුළ අධ්‍යාපන විධායක කමිටුව උත්සහ ගත්තේ ඒ වන විට පැවති අධ්‍යාපන ක්‍රමය රටේ ජාතික හා ආගමික පරමාර්ථවලට අනුකූල වන අයුරින් ප්‍රතිසංවිධානය කිරීමට ය. මේ අවධිය වන විට සාර්ථක අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාව හිමිව තිබුණේ නාගරික ප්‍රදේශවල පිහිටි ගාස්තු අය කළ පාසල්වල සිසුන්ට හා ක්‍රිස්තියානි මිෂනාරි පාසල්වල සිසුන්ට ය. මෙනිසා බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදාකර දෙනු වස් 'නිදහස් අධ්‍යාපන ක්‍රමය' හඳුන්වාදීමට කන්නන්ගර මහතා පුරෝගාමී විය. අනතුරුව ගම්බද ප්‍රදේශවල ජීවත් වූ ඉගෙනීමෙහි දක්ෂ දරුවන්ට උසස් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් යුතුව පළාත්බද මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කෙරිණි. ඒ එක් ඡන්ද කොට්ඨාසයකට එක් මධ්‍ය මහා විද්‍යාලය බැගිනි (*ලංකාවේ අධ්‍යාපනය* - සියවස ප්‍රකාශනය, 1969:599).

වර්ෂ 1936 දී අධ්‍යාපන විධායක කමිටුව විසින් පවත්වන ලද සමීක්ෂණයේ අරමුණ වූයේ දිවයිනේ විවිධ ප්‍රදේශවලට ගැලපෙන පරිදි පිළියෙල කළ විෂයමාලා සහ අධ්‍යාපනික අවස්ථා සැපයීම ය.

මධ්‍ය මහා විද්‍යාල ඇතිකිරීමේ වැදගත්කම පිළිබඳ විමසා බැලීම ද මෙම සමීක්ෂණයේ තවත් එක් අරමුණක් විය (රුබේරු, 1994:27).

ප්‍රාදේශීය වශයෙන් මධ්‍ය මහා විද්‍යාල පිහිටුවීමේ එක් අරමුණක් වූයේ ප්‍රාදේශීය වශයෙන් රැකියා සපයාදීමට සෑහෙන අධ්‍යාපනයක් මෙම විද්‍යාල මගින් ලබාදීමට ය. මෙම සමීක්ෂණයේදී මධ්‍ය මහා විද්‍යාල සිසුන්ට ශාස්ත්‍රීය විෂයයන්, ග්‍රාමීය විද්‍යාව, කෘෂිකර්මය, කාර්මික අධ්‍යාපනය, වඩුවැඩ මෙන්ම අනෙකුත් ප්‍රායෝගික විෂයයන් ඉගැන්වීම කෙරෙහි ද අවධානය යොමු කෙරිණි.

අධ්‍යාපනයට ප්‍රාදේශීය ඌරුවක් ගෙනදුන් මධ්‍ය මහා විද්‍යාල අදාළ ප්‍රදේශය තුළම පිහිටුවීමට උත්සහ ගනු ලැබීය. ඒ අනුව එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා එක් පාසලක් බැගින් ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ සංවිධානය වූ ඡන්ද කොට්ඨාස 50 තුළම මධ්‍ය මහා විද්‍යාල 50 ක් ගොඩනැගීම රජයේ අරමුණ විය (රුබේරු, 1994:28).

හයවන ශ්‍රේණියෙන් ඉහළ පශ්චාත් ප්‍රාථමික පන්ති පැවැත්වූ මධ්‍ය මහා විද්‍යාල සඳහා ආචාර්යවරුන් ලෙස උපාධිධාරීන් මෙන්ම පුහුණු ගුරුවරු පත් කිරීමටත්, විද්‍යා, කලා, වාණිජ, කෘෂිකර්මය, චිත්‍ර, වඩුවැඩ, යකඩ වැඩ, රෙදි විවීම වැනි විවිධ විෂය මාලා යටතේ පුහුණුවක් ලබාදීමටත් අපේක්ෂා කෙරිණි. මධ්‍ය මහා විද්‍යාලවල අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රය පුළුල් කොට බාහිර වැඩ සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමට තීරණය විය. ශාස්ත්‍රීය අධ්‍යාපනය පොතපතින්ම උගැන්මට අමතරව චිත්ත වේග වර්ධනය පිළිබඳ පුහුණුවක් ලබාදීමට අපේක්ෂා කරනු ලැබීය. මෙම විදුහල්වල ක්‍රීඩා හා මලල ක්‍රීඩා ද ආරම්භ කරන ලදී (*ලංකාවේ අධ්‍යාපනය* - සියවස ප්‍රකාශනය, 1969:599).

පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් සමත්ව මධ්‍ය මහා විද්‍යාලවලට පැමිණ අධ්‍යාපනය ලැබීමේ හැකියාව මෙන්ම මාසිකව ශිෂ්‍යත්ව ආධාර මුදලක් ලබාගැනීමේ හැකියාව ද සිසුන්ට හිමිව තිබිණි. ඊට අමතරව ඔවුන්ට විද්‍යාල තුළ නේවාසික පහසුකම් ද හිමිවිය. නේවාසිකාගාර සහිත මධ්‍ය මහා විද්‍යාල ඉදිකිරීම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාගේ තවත් වැදගත් යෝජනාවක් වශයෙන් හඳුනාගත හැකිය. අධ්‍යාපනය නොමිලේ ලබාදුන්න ද, යමෙකුට ඒ පහසුකම තමා අවට පරිසරයෙන් ලබාගන්නට හැකියාවක් නොමැති හෙයින් ඉගෙනුම සඳහා නගරයේ පාසලකට යන්නට සිදු වේ. එබැවින් ගම්බදව අංගසම්පූර්ණ අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීමේ වැදගත්කම අවබෝධ කරගත් ඒ මහතා විසින් සෑම ඡන්ද කොට්ඨාසයකටම අවම වශයෙන් එකක් බැගින් නේවාසිකාගාර, අත්කම් හා ශිල්පීය පුහුණු පහසුකම්, ක්‍රීඩාපිටි, පුස්තකාල ආදී සියලු පහසුකම්වලින් හෙබි මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කරන ලදී (ඇඳගම, 2014:13). මෙම පහසුකම් හා නිදහස් අධ්‍යාපන වරප්‍රසාද හේතුවෙන් අඩු ආදායම්ලාභී ගම්බද දක්ෂ දරුවන් රැසක් මධ්‍ය මහා විද්‍යාලවලින් අධ්‍යාපනය ලබා රටේ නොයෙකුත් ක්ෂේත්‍රවල ප්‍රධානීන් ලෙස කීර්තියට පත්ව ඇති බව නොරහසකි.

**වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ ආරම්භය**

ඡායාරූපය 02 - වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ නිල ලාංඡනය
මූලාශ්‍රය : https://en.wikipedia.org/wiki/Bandaranayake_Central_College,_Veyangoda

සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාගේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ ඇති කළ මධ්‍ය මහා විද්‍යාල අතර වර්ෂ 1941 දී ඇරඹි නියාමක මධ්‍ය මහා විද්‍යාල තුන අතරින් එකක් වූයේ වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයයි. වර්ෂ 1941 ජනවාරි මස 06 වන වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය (Veyangoda Central College) ආරම්භ කරන ලද්දේ වේයන්ගොඩ ස්වභාෂා පාඨශාලාව, ඉංග්‍රීසි පාඨශාලාව සහ පත්තලගෙදර පාඨශාලාව යන පාසල් එකාබද්ධ කිරීමෙනි. වර්තමානයේදී වේයන්ගොඩ ජනාධිපති විද්‍යාලය පිහිටා ඇති භූමියේ ප්‍රථමයෙන් ස්ථාපනය කරන ලද මෙම විද්‍යාලයේ ආරම්භක ශිෂ්‍ය සංඛ්‍යාව 70 ක් වූ අතර ප්‍රථම විදුහල්පතිතුමාවරයා වූ එස්. සමරසූරිය මහතා ඇතුළු ගුරුවරුන් 13 දෙනෙක් ආරම්භයේදී සේවය කළහ.

1943 වර්ෂය අවසාන වන විට වේයන්ගොඩ, අකරම්බඩ, මතුගම, වීරකැටිය, ඉබ්බාගමුව, කට්ටන්කුඩි හා දික්වැල්ල යන මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කර තිබිණි. වර්ෂ 1944 දී පිළියන්දල, ගලහිටියාව, හේනේගම, හික්කඩුව, කරන්දෙණිය, වඳුරඹ, නුගවෙල, නාරම්මල, දෙනියාය, හැවන්ගම, ඉරුකිලන්පිඩ්ඩි හා යාපනය යන ප්‍රදේශවල මධ්‍ය මහා විද්‍යාල 13 ක් ආරම්භ කරන ලදී (විමලානන්ද හිමි, 2019:20).

වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ දෙවන විදුහල්පතිවරයා වශයෙන් වර්ෂ 1943 දී ඩබ්.කේ. ඉද්දවෙල මහතා පත් කෙරිණි. විද්‍යාලයේ කාර්මික අංශය ආරම්භ වූයේ එතුමන්ගේ කාලසීමාවේදී ය. එපමණක් නොව සිසුන්ගේ නිෂ්පාදන අලෙවි කර විද්‍යාලයට අමතර ආදායමක් ලබාගැනීමේ ක්‍රමවේදයක් ද එකල හඳුන්වා දී තිබේ. වර්ෂ 1943 ජූලි මස 29 වනදා විද්‍යාලයේ ප්‍රථම ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වන ලද අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගිවූයේ කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ය.

වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය නිල වශයෙන් මධ්‍ය මහා විද්‍යාලයක් වශයෙන් නම් කිරීම වර්ෂ 1944 දී සිදු වූ අතර එකල විදුහල්පතිවරයා වූයේ සී. ද එස්. සිරිවර්ධන මහතා ය. වර්ෂ 1945 දී සිසුන් දසදෙනෙකුගෙන් යුත් බාලක නේවාසිකාගාරය ආරම්භ කෙරිණි. වර්ෂ 1946 වන විට ශිෂ්‍ය සංඛ්‍යාව දහස දක්වා ඉක්ම වූ හෙයින් එම වර්ෂයේදීම උසස් පෙළ පන්ති ආරම්භ කිරීමට ද සිදුවිය. ඒ අනුව වර්ෂ 1948 දී වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් සිසුන් හතරදෙනෙකු උසස් පෙළ විභාගය සමත් වූ අතර වැඩිම සිසුන් පිරිසක් විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ සුදුසුකම ලත් මධ්‍යම මහා විද්‍යාලය ලෙස වාර්තාවක් ද තැබීමට එම විද්‍යාලයට හැකිව තිබේ. විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වීමත් සමග වර්ෂ 1946 ජනවාරි 11 වනදා සිට එය දෙවරු පාසලක් වශයෙන් පැවැත්වීමට තීරණය කෙරිණි.

මෙතෙක් වේයන්ගොඩ නගර මධ්‍යයේ පිහිටි විද්‍යාලය නගරයට නුදුරින් පිහිටි මාලිගාතැන්න නම් ග්‍රාමයේ අක්කර 28 කින් යුත් සුන්දර භූමි භාගයක ස්ථාපිත කිරීම සිදුවන්නේ වර්ෂ 1951 දී ය. එවකට අත්තනගල්ල මන්ත්‍රීවරයා මෙන්ම පළාත් පාලන අමාත්‍යවරයා වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ පුරෝගාමීත්වයෙන් විශාල භූමි භාගයක පැතිර යන ලෙස දේශීය ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව ඉදි කරන ලද සකලාංග පරිපූර්ණ නව ගොඩනැගිලි සංකීර්ණය වර්ෂ 1951 සැප්තැම්බර් මස 03 වන දින නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා අතින් විවෘත විය.* එවකට විදුහල්පතිවරයා වශයෙන් කටයුතු කරන ලද්දේ ඩී.එස්. කළුගම්පිටිය මහතා ය. නව විද්‍යාල පරිශ්‍රයේ වර්ෂ 1954 අගෝස්තු මස 20 වනදා දෙමාපියන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදි කළ බුදුමැඳුර මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා විසින් විවෘත කරන ලදී.

වර්ෂ 1964 ඔක්තෝබර් මස 15 වනදා වේයන්ගොඩ මධ්‍ය විද්‍යාලය, බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය යනුවෙන් හැඳින්වීමට යෝජනාවක් එවකට අධ්‍යාපන අමාත්‍ය පී.ජී.බී. කළුගල්ල මහතා සහභාගි වූ උත්සවයකදී ඉදිරිපත් කෙරිණි. එම උත්සවය පවත්වන ලද්දේ පන්ති කාමර 05කින් යුතු තනි මහල් ගොඩනැගිල්ලක් විවෘත කිරීම සහ පන්ති කාමර 07කින් යුත් ගොඩනැගිල්ලක් සඳහා මුල්ගල

* වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ 66 වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කළ විශේෂ සමරු කවරය සඳහා ආදි ශිෂ්‍ය සංගමය මගින් ප්‍රකාශයට පත් කරන ලද පත්‍රිකාව ඇසුරෙනි.

තැබීමට අරමුණු කොටගෙන ය. එවකට විදුහල්පතිවරයා වශයෙන් කටයුතු කරන ලද්දේ කේ.ඒ. ප්‍රඥාරත්න මහතා ය.

වර්ෂ 1974 දී එවකට අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයකදී විද්‍යාලයීය සමූපකාර ගොවිපොල සහ එයට සම්බන්ධ අලෙවි මධ්‍යස්ථානය විවෘත කෙරිණි. එවකට විදුහල්පති ජී.ආර්. ප්‍රේමවර්ධන මහතාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන යටතේ අක්කර 28 ක් පමණ වූ විද්‍යාලයීය භූමියේ විශාල කොටසක් වගා කටයුතු සඳහා යොදාගන්නා ලදී. වර්ෂ 1976 වන විට උසස් අධ්‍යාපනය සඳහා බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයෙන් සරසවි ප්‍රවේශය ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ විශාල වර්ධනයක් දක්නට ලැබිණි.

**වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම්**

අධ්‍යාපනික අංශයෙන් පමණක් නොව ක්‍රීඩා සහ බාහිර ක්‍රියාකාරකම්වලින් ද බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ සිසුහු පෙරමුණ ගත්හ. වර්ෂ 1941 දී ජේ.බී. ඔබේසේකර අභියෝගතා බොක්සිං ශූරතාවය දිනාගැනීමට විද්‍යාලයේ බොක්සිං කණ්ඩායමට හැකිවිය.

වර්ෂ 1955 දී විද්‍යාලයේ මල්ලවපොර ක්‍රීඩා පුහුණුකරු වශයෙන් මේජර් බැසිල් රුද්‍රිගු මහතා සේවයට එක්වීමත් සමග එම වර්ෂයේ සිට 1962 දක්වාම පිට පිටම අට වරක් සමස්ත ලංකා අන්තර් පාඨශාලීය මල්ලවපොර ශූරතාවය දිනාගැනීමට ද විද්‍යාලයීය මල්ලවපොර ක්‍රීඩකයෝ සමත් වූහ. 1960 දශකයේ මුල් භාගයේදී විද්‍යාලයේ දීප්තිමත් මල්ලවපොර ශූරයා වූයේ නිමල් ජයසිංහ මහතා ය. එසේම පී.ඒ. කරුණාතිලක, එච්.එච්.කේ. විජේතරන් හා ආර්.ඒ. ගුණසේකර යන මහත්වරුන් ද සමස්ත ලංකා තරගවලදී විද්‍යාලයට කීර්තියක් ගෙනදීමට කටයුතු කර තිබේ. පසුකලෙක විශ්‍රාමික මේජර් ජෙනරාල් පී.ඒ. කරුණාතිලක මහතා සහ විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ජගත් කීනවින්න මහතා යන විද්‍යාලයීය මල්ලවපොර ශූරයන් විසින් ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ සභාපතිවරුන් ලෙස ද කටයුතු කරන ලදී. එසේම වර්තමානයේ විද්‍යාලයේ මල්ලවපොර සහ බොක්සිං ක්‍රීඩාව නගා සිටුවීමට කැප වූ තවත් අයෙකු ලෙස ආදි ශිෂ්‍ය තිලක් පෙරේරා මහතා සඳහන් කළ හැකිය (විමලානන්ද හිමි, 2019:98-99).

මීට අමතරව ශිෂ්‍ය භට ක්‍රියාකාරකම් අතින් ද විද්‍යාලය පෙරමුණට පැමිණ සිටි අතර වර්ෂ 1966 දී විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භට බණ්ඩය හර්මන් ලෝස් අභියෝගතා ශූරතාවය ද, කණිෂ්ඨ ශිෂ්‍ය භට බණ්ඩය ද සොයිසා අභියෝගතා ශූරතාවය ද දිනාගැනීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය (මංචනායක, 2014:36-37). වර්ෂ 2012 සැප්තැම්බර් මස 26 වනදා දිවයිනේ පාසලක් සතු පළමු හා එකම ගෘහස්ථ වෙඩි පිටිය බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේදී විවෘත කරන ලදී.

වර්ෂ 1983 දී විද්‍යාලයට ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩාව හඳුන්වාදෙන ලද අතර උඩුගම්පොල මහා විද්‍යාලය සමග පැවැත්වූ ප්‍රථම තරගයෙන්ම ජය වාර්තා කිරීමට බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාල කණ්ඩායමට හැකිවිය. ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් විදුහල්පතිවරයා වශයෙන් කටයුතු කළ කාලසීමාවේදී චූෂු ක්‍රීඩාව විද්‍යාලයට හඳුන්වාදෙන ලදී. වර්ෂ 2013 දී පාපන්දු සහ බේස්බෝල් ක්‍රීඩාව සඳහා නව ක්‍රීඩා පිටියක් සකස් කිරීම ශ්‍රී ලංකා යුද හමුදාවේ අනුග්‍රහයෙන් ආරම්භ කරන ලද අතර එයට පුරෝගාමී වූයේ වත්මන් විදුහල්පති එස්.ඒ.එල්.බී. සිරිමාන්න මහතා ය. විද්‍යාලයේ සිසු දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයට කරන දිරිදීමක් වශයෙන් වර්ෂ 2015 දී විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මගින් දෙමහල් ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරයක් ඉදිකොට සිසු අයිතිය පත් කරන ලදී.

වර්ෂ 1985 දී ජාතික අධ්‍යාපන කොමිසම මගින් ජාතික පාසල් සංකල්පය හඳුන්වාදෙනු ලැබූ අතර වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය ද අදාළ නිර්ණායක සපුරා තිබූ පාසල් 35 අතරට තෝරාගන්නා ලදී. ඒ යටතේ බී කාණ්ඩයේ ජාතික පාසලක් බවට විද්‍යාලය නම් කෙරිණි.

විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා ඉමහත් සේවයක් සිදු කරන ආදි ශිෂ්‍ය සංගමය ස්ථාපිත කරන ලද්දේ වර්ෂ 1991 දී ය. එවකට විදුහල්පතිවරයා ලෙස කටයුතු කරන ලද්දේ විද්‍යාලයට සුවිසල් සේවාවක් ඉටු කරන ලද එම්.පී. අල්විස් මහතා ය.

වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයට සුවිශේෂී අනන්‍යතාවක් ලබාදෙන 'හරිත වන වැස්ම' නිර්මාණය කිරීමට මූලික වූ 'වන උයන' ආදර්ශන වන වගා ව්‍යාපෘතිය වර්ෂ 1987

සැප්තැම්බර් 01 වනදා ආරම්භ කෙරිණි (විමලානන්ද හිමි, 2019:77). විද්‍යාලයේ 10 වසර සිසුන්ගේ ශ්‍රම දායකත්වයෙන් වජිර සිරිමාන්න මහතා විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර ආචාර්ය මණ්ඩලයේ සහයෝගය ද මෙයට හිමිවිය.

එවකට පාසලේ ප්‍රධාන පිවිසුම් දොරටුව වූයේ ද එම වන උයන අසලින් ප්‍රධාන ශාලාව වෙත වැටී තිබුණු මාර්ගයයි. මෙනිසා සෑම උදෑසනකම වන උයනේ අසිරිය විඳින්නට ගුරු සිසු සැමට හැකිවිය. පසුව මධ්‍යම පරිසර අධිකාරිය මගින් ආරම්භ කරන ලද ජාතික පරිසර නියමු වැඩසටහන සඳහා විද්‍යාලය තෝරාගැනුනේ ද මෙම හරිත උයන හේතුවෙනි. වර්ෂ 1990 දී ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රථම පරිසර නියමු කණ්ඩායම ලෙස විද්‍යාලයේ පරිසර භටයන්ට නිල ලාංඡන පැළඳවීමේ උත්සවය පැවැත්වුණු අතර එවකට විදුහල්පතිවරයා වශයෙන් කටයුතු කරන ල්දදේ එම්.පී. අල්විස් මහතා ය (විමලානන්ද හිමි, 2019:78).

**වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයන්**

වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ ශිල්ප හදාරා විදු මවුන්ගේ නම දසත පතළ කරමින් විවිධ ක්ෂේත්‍රවල කීර්තියට පත්වූවෝ මෙන්ම වත්මනෙහි නෙක තනතුරු දරන්නෝ ද බොහෝ ය. ඒ අතර විශ්වවිද්‍යාල උපකුලපතිවරු, මහාචාර්යවරු, ආචාර්යවරු මෙන්ම වෛද්‍යවරු, ඉංජිනේරුවරු හා නීතීඥවරු පමණක් නොව ක්‍රීඩකයෝ මෙන්ම කලාකරුවෝ ද මෙතෙකැයි කියා ගිණිය නොහැකිය.

කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිවරුන් වූ මහාචාර්ය අබය ආර්යසිංහ සහ මහාචාර්ය තිලකරත්න කපුගමගේ මහතා බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ ආදි සිසුහු වෙති. එමෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය සිරිපාල විතාන, මහාචාර්ය ප්‍රභාත් හේවාගීගන යන මහත්වරුන් ද, මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරයකු වූ මහාචාර්ය සී.එල්.කේ. තෙන්නකෝන් මහතා, රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විදුරගෝමී විතාන මහතා, හන්තාන මූලික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය කීර්ති තෙන්නකෝන් මහතා වැනි විද්වතුන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ නම් දුරු මැදි විදු මවගේ දරුවන් ය. එමෙන්ම ජාතික කෞතුකාගාරයේ හිටපු අධ්‍යක්ෂ සිරිනිමල් ලක්දුසිංහ, ප්‍රවීණ සංගීතඥ ලයනල් අල්ගම, ප්‍රවීණ නාට්‍ය අධ්‍යක්ෂ දයානන්ද සිරිවර්ධන, ප්‍රවීණ සංගීත අධ්‍යක්ෂ රංජිත් බාලසූරිය, කලා අධ්‍යක්ෂ හේමපාල ධර්මසේන වැනි ප්‍රවීණයන් ද වේයන්ගොඩ මධ්‍ය විද්‍යාලයෙන් සිප් සතර හැදෑරුවෝ වෙති.

වේයන්ගොඩ මධ්‍ය විද්‍යාලයෙන් බිහි වූ රණවිරුවන් අතර විශ්‍රාමික මේජර් ජෙනරාල් පී.ඒ. කරුණාතිලක, විශ්‍රාමික මේජර් ජෙනරාල් ජයනාත් පෙරේරා, විශ්‍රාමික මේජර් ජෙනරාල් ප්‍රියන්ත නාපාගොඩ, විශ්‍රාමික බ්‍රිගේඩියර් පී. ඥාණවීර, විශ්‍රාමික බ්‍රිගේඩියර් නීල් දිලිප් කුමාර, විශ්‍රාමික බ්‍රිගේඩියර් අශෝක විජේනායක, බ්‍රිගේඩියර් ජයම්පති තිලකරත්න, විශ්‍රාමික මේජර් රුවන් බොතේජු ගුවන් කොමදෝරු අතුල කළුආරච්චි, නාවික කපිතාන් නයනා විජේදෝරු, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගාමිණී නවරත්න, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ජගත් කීනවින්න, විශ්‍රාමික පොලිස් පරීක්ෂක ජීවක ප්‍රසන්න වැනි නිලධාරීහු වෙති.

වයඹ පළාත් හිටපු ආණ්ඩුකාර සිරිපාල ජයවීර, බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මෙන්ම පිලිපීනයේ අන්තර්ජාතික සහල් පර්යේෂණ ආයතනයට අනුබද්ධ විද්‍යාඥයකු වන ආචාර්ය එම්.පී. ධනපාල, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ජල ජීව විද්‍යාඥයකු වූ ආචාර්ය කමල් බාලසූරිය, විශ්‍රාමික වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.පී. ජිනදාස වැනි විද්වතුන් ද වේයන්ගොඩ මැදි විදු මවගේ කීර්තිමත් දරුවෝ වෙති.

අධ්‍යාපනයෙන් පමණක් නොව විෂය බාහිර ක්‍රියාකාරකම් මගින් ද ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොව ලොව පුරා ජය දද නැංවූ සිසු දරුවන් රැසක් වේයන්ගොඩ මැදි විදු මවු ලොවට දායාද කොට ඇත. දක්ෂතා සපිරි ගැමි දරුවන්ගේ හැකියා ඔප් නංවන්නට මේ දක්වා වසර 78 ක් කාලයක් තුළ වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය මගින් සැලසුණු සේවාව අනන්ත ය, අප්‍රමාණ ය. නිදහස් අධ්‍යාපනය නොවන්නට බොහෝ සිසු දරුවන් මෙවන් ජයකෙහෙළි නොනංවන්නට ඉඩ තිබිණි. එහෙයින් සියනෑවේ අභිමානය රැකගනිමින් අනාගතයේදීත් රටට දැයට වැඩදායී බුද්ධිමතුන් තැනීමේ භාරදූර කර්තව්‍යය වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉටුවනු ඇත.

**මූලාශ්‍රය**


- ඇඳගම, පණ්ඩුල (2014), 'මධ්‍ය විද්‍යාල සංකල්පය', *අරුණළු* - කන්නන්ගර අණුස්මරණ විශේෂ කලාපය, ඌරුගොඩවත්ත, සවිමන් හා ගංගේ, ලයනල් (සංස්.), සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය, හෝමාගම.
- මංචනායක, කීර්ති (2014), 'දූයේ මෙහෙවරට උරදෙන බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය', *අරුණළු* - කන්නන්ගර අණුස්මරණ විශේෂ කලාපය, ඌරුගොඩවත්ත, සවිමන් හා ගංගේ, ලයනල් (සංස්.), සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය, හෝමාගම.
- රුබේරු, රංජිත් (1994), *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කන්නන්ගර සමය 1931-1948*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
- *ලංකාවේ අධ්‍යාපනය* - සියවස ප්‍රකාශනය (1969), අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ.
- විමලානන්ද හිමි, බෝලියද්දේ (2019), *වේයන්ගොඩ බණ්ඩාරනායක මැදි විදුහලේ තිස් වසරක ගුරු පිය සටහන්*, බෞද්ධ මහා විහාරය, රන්පොකුණුගම.

# මධ්‍ය විද්‍යාල සංකල්පය හා තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලය

**එල්. ඒ. ජයතිස්ස**
හිටපු පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය

විදේශීය ආධිපත්‍යයට යටත් වීමට පෙර මෙරට පැවතී ඇත්තේ පිරිවෙන් අනුසාරයෙන් ගොඩනැගුණු දේශීය අධ්‍යාපන රටාවකි. 1505 න් පසු විදේශීය ආක්‍රමණවලින් අනතුරුව බලයේ සිටි විදේශීය පාලකවරු එම ක්‍රමය මුළුමණින් ම අහෝසි කළහ. මේ පද්ධතිය වෙනුවට ආදේශ වී ඇත්තේ රජයේ පාසල් හා ක්‍රිස්තියානි මිෂනාරිවරුන් විසින් ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කිරීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක කරන ලද පාසල් පද්ධතියකි. ඒ සියලු පාසල් ගාස්තු අයකරමින් ක්‍රියාත්මක විය. (රුබේරු, 1971).

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයෙහි විශිෂ්ටතම අධ්‍යාපනඥයා ලෙස සැලකෙන ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ දේශපාලන ආගමනය සිදුවන්නේ ඉහත දැක්වූ සමාජීය පසුබිමක් තුළ ය. රටක සංවර්ධනයේ අඩිතාලම සියලු පුරවැසියන්ට එකසේ විවෘත හා සමානාත්මතාවෙන් යුත් නොමිලයේ සැපයෙන අධ්‍යාපන ක්‍රමයක් බව ඔහු පසක් කරගත්තේ ය. කන්නන්ගර මහතාට 1931 සිට 1947 දක්වා අධ්‍යාපන ඇමතිවරයා ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කටයුතු කිරීමට අවස්ථාව උදා විය.

සෙනෙවිරත්න (2019) විසින් සඳහන් කරන ලද පරිදි මේ වකවානුවේ සෝවියට් දේශයේ බලයට පත් ව සිටි ලෙනින් විසින් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා හුදෙක් මනුෂ්‍ය වර්ගයාට ඇති වරප්‍රසාද නොව මානව අයිතිවාසිකම් බවට පළ කරන ලද මතවාදය ද කන්නන්ගරගේ දැක්ම තීව්‍ර කිරීමට හේතු වන්නට ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැලකිය හැකි කන්නන්ගර යුගය තුළ යටත් විජිත අධ්‍යාපන ප්‍රතිපත්ති හා අධ්‍යාපන ක්‍රමවලට විරුද්ධ ව ජාතික සටනක් ඇරඹීම පමණක් නොව, ලාංකේය ජනතාවට උරුමයක් ව පැවති ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමේ කටයුතු ද සිදුවිය. 1932 වර්ෂයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කථා කරමින් කන්නන්ගර මහතා පවසා ඇත්තේ මහජනතාවට මූලික අධ්‍යාපනයක්වත් ලබා දීම නොකෙරෙන්නේ නම් එය මරණාත්මක පියවරක් බව ය. (රුබේරු, 1971 : 209).

දේශීය අධ්‍යාපන පද්ධතියේ දක්නට ලැබුණු විවිධ දුර්වලතා ඉවත් කිරීමේ අරමුණින් යුතු ව බහුවිධ ක්‍රියාවලියක් කන්නන්ගර මහතා විසින් ක්‍රියාවට නංවන ලදී. ඔහුගේ මේ ක්‍රියාවලිය තුළ දැක ගත හැකි සාධනීය ලක්ෂණ කීපයක් පහත පරිදි වේ.

- නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම
- රට තුළ අසමතුලිත ව ව්‍යාප්ත වූ පාසල් පද්ධතිය විධිමත් ව සංවර්ධනය කිරීමේ එක් මූලික පියවරක් ලෙස සෑම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රී කොට්ඨාසයකට ම එක බැගින් අලුතින් මධ්‍ය විද්‍යාල පිහිටුවීම
- ප්‍රදේශයේ ජීවත් වන පාසල් වියදම් දැරීම දුෂ්කර දක්ෂ දරුවනට මධ්‍ය විද්‍යාලවලට පිවිසිය හැකි පරිදි ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීම
- ඉංග්‍රීසි භාෂා මාධ්‍යය තවදුරටත් පාසල් තුළ භාවිතය
- න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ දෙකෙන් ම පෝෂිත අධ්‍යාපන ක්‍රමවේදයක් අනුගමනය කිරීම.

ඉහත කරුණු අතරින් පළමුවැන්න හැර සෙසු කරුණු පිළිබඳව මෙම ලිපියේදී සැකෙවින් සාකච්ඡා කෙරේ.

## මධ්‍ය විද්‍යාල පිහිටුවීම

අධ්‍යාපනය ප්‍රජාතාන්ත්‍රීකරණයේ වැදගත් සහ ආරම්භක පියවරක් ලෙස දිවයින පුරා සෑම මන්ත්‍රී කොට්ඨාසයකට ම එක බැගින් මධ්‍ය විද්‍යාල පිහිටුවීම නම් කළ හැකි බවත් මේ ක්‍රියාදාමය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රට පුරා පැවති විෂම තත්ත්වය සමනය කිරීමට ද යම් පමණකට හේතු වී

බවත් මධ්‍ය විද්‍යාල පිහිටුවීම පිළිබඳව කරුණු සාකච්ඡා කරමින් රුබේරු සිය ලේඛනයකදී පවසා ඇත. අධ්‍යාපනයට ප්‍රාදේශීය උරුවක් ගෙන දීම උදෙසා මධ්‍ය පාසල් ඇරඹීම කන්නන්ගර සමයට අමරණීය භාවයක් ගෙන දෙන්නක් වූ බව ද රුබේරු සඳහන් කර තිබේ. (රුබේරු, 1971 : 210).

කන්නන්ගර යුගයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විවරණයක් ඉදිරිපත් කරන ජයසූරිය විසින් " මේ ක්‍රමයෙන් අපේක්ෂිත එක් ප්‍රධාන අරමුණක් වී ඇත්තේ කිසියම් ප්‍රදේශයක වාසය කරන ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කළ සියලු ම ළමුන් එක්රැස්කොට ගෙන අති දක්ෂ ගුරුවරුන් යටතේ මධ්‍ය විද්‍යාල මගින් අධ්‍යාපනයක් ලබා දීම ය " යනුවෙන් සඳහන් කර තිබේ. (ජයසූරිය, 2011 : 19 - 35). නව මධ්‍ය විද්‍යාල පශ්චාත් ප්‍රාථමික පාසල් ලෙස හයවන ශ්‍රේණිය හා ඉහළ ශ්‍රේණිවලින් සමන්විත වනසේ පිහිටුවන ලදී.

ගුරු සේවය සඳහා ගෙවනු ලබන අඩු වැටුප් හේතුවෙන් ඉහත දැක්වූ අයුරින් අපේක්ෂා කළ පරිදි දක්ෂ ගුරුවරුන් බඳවා ගැනීම දුෂ්කර වූ බවත් ඒ සඳහා ක්‍රමෝපායයන් යොදා ගත් අයුරුත් ජයසූරිය විසින් වැඩිදුරටත් පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ. බ්‍රිජ් ක්‍රීඩාවේ යෙදීම පිණිස ඔරියන්ට් සමාජ ශාලාවට ගොස් සිටි කන්නන්ගර මහතා හා පී. ද. එස්. කුලරත්න මහතා මේ පිළිබඳව සාකච්ඡා කර ඇත. ඊට විසඳුම ලෙස ඔවුන් යෝජනා කර ඇත්තේ අලුතින් ස්ථාපිත පළමු මධ්‍ය විද්‍යාලය වන මතුගම මධ්‍ය විද්‍යාලයට එවකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දෙවන ශ්‍රේණියේ විශේෂ තනතුරු මට්ටමෙන් විදුහල්පතිවරයෙකු පත් කළ යුතු බව ය. එවකට එවන් මට්ටමේ විදුහල්පති තනතුරක් අනුමත ව පැවතියේ කොළඹ රාජකීය විද්‍යාලයට පමණි. අලුතින් ම පිටවූ ගණිත උපාධිධාරියෙකුට මේ තනතුර පිරිනැමූ බව ද ජයසූරිය විසින් සඳහන් කර ඇත.

මධ්‍ය විද්‍යාලවලින් ඉදිරිපත් කරන ලද විෂය ධාරාවන් විද්‍යා හා වාණිජ විෂයයන්ගෙන් මෙන් ම කෘෂිකර්මය, චිත්‍ර, සංගීතය, වඩුවැඩ, යකඩවැඩ, කුඹල්වැඩ, හා රෙදි විවීම ආදී ප්‍රායෝගික විෂයන්ගෙන් ද සමන්විත විය. (රුබේරු, 1971 : 210). මෙමගින් අපේක්ෂා කරන ලද්දේ සියලු සිසුනට වෛද්‍ය, ඉංජිනේරු, වාණිජ ආදී අංශවලින් විශ්වවිද්‍යාලවලට ඇතුලු විය නොහැකි පරිසරයක් තුළ සිසුනට තමන් දස්කම් දැක්වූ ක්ෂේත්‍රවලින් අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ලබා දියුණු වීමට මංපෙත් විවර කර දීමය. කිසියම් වෘත්තියක් සඳහා කිසියම් ප්‍රදේශයක් නම් දරා සිටි අවස්ථාවක එම ප්‍රදේශයේ පිහිටි මධ්‍ය විද්‍යාලයෙන් එම වෘත්තිය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව ද වාර්තාගත ය.

රුබේරු විසින් සඳහන් කර ඇති පරිදි මේ මධ්‍ය පාසල් ක්‍රමය එංගලන්තයේ තිබූ විස්තීරණ පාඨශාලාවලට තරමක් දුරට සමානාත්මතාවක් උසුලා ඇත. කෙසේ වුව ද, මධ්‍ය විද්‍යාල ඉදිකිරීමේ දී වූ දේශපාලන බලපෑම්, ඒ වැඩසටහන් සාධාරණ අයුරින් ආරම්භ නොවීම හා විෂය මාලාවේ විවිධත්වයක් ගෙන දීමේ දී මහජනයා තුළ ඇති වූ අවිචාරමත් හැඟීම් හේතුවෙන් මේ ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වූ බව රුබේරු සඳහන් කර තිබේ.

**ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

පාසල් අධ්‍යාපනය සඳහා ගාස්තු අයකෙරෙන ක්‍රමයක් තුළ දක්ෂතාවලින් යුත් දිළිඳු ග්‍රාමීය දරුවනට අහිමි වන ඉඩප්‍රස්ථා යම් පමණකට හෝ ලබා දීමේ අරමුණින් යුතු ව, මධ්‍ය විද්‍යාල සංකල්පයට සමගාමී ව ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළක් ද කන්නන්ගර මහතාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක විය. මෙමගින් සිසුනට නොමිලයේ අධ්‍යාපනයත්, නේවාසික පහසුකම් හා ආහාරපානත් ලබා දීම සිදුවිය.

පසුකාලීනව පස්වන ශ්‍රේණියේ සහ අටවන ශ්‍රේණියේ මට්ටම්වලින් ශිෂ්‍යත්ව විභාග දෙකක් පවත්වා ඇති අතර වර්තමානයේ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පමණක් පැවැත්වේ. වර්තමානයේදී පවා ග්‍රාමීය දරුවනට නාගරික ජනප්‍රිය පාසල්වලට ඇතුළු වීමට ඒකායන මාර්ගය වී ඇත්තේ ද පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් දස්කම් දැක්වීමෙන් ඉහළින් සමත්වීම බව මෙහිලා සිහිපත් කළ යුතු කරුණකි. මේ ලේඛකයා වුව ද, උසස් පෙළ විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා තෝලංගමුව මධ්‍ය විද්‍යාලයට ඇතුළුවන්නේ පස්වැන්නේ ශිෂ්‍යත්වධාරියකු වීම හේතුවෙනි. එවකට දිවයිනේ සෙසු පාසල්වල භාවිත කරන ලද භාෂා මාධ්‍යය වූ ඉංග්‍රීසි භාෂාව මධ්‍ය විද්‍යාලවල ද එලෙසින් ම භාවිත විය. එබැවින්, ඒ මුල් යුගය තුළ අධ්‍යාපනය ලැබූවන්ට කිසිදු අවහිරයකින්

තොර ව සිය උසස් අධ්‍යාපන කටයුතුවල හා රැකියාවල යෙදීමට අවස්ථාව සැලසිණි. මන්ත්‍රී අසුනකට එක බැගින් පිරිනැමුණ මධ්‍ය විද්‍යාල අතරින් පළමුවැන්න එම සංකල්පයේ නිර්මාතෘවරයාගේ දේශපාලන බල ප්‍රදේශය වූ කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි මතුගම පිහිටුවන ලදී. පසුකාලීන ව, කන්නන්ගර මහතාට උපහාරයක් ලෙස සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලය ලෙස නම් කර ඇත.

**තෝලංගමුව මධ්‍ය විද්‍යාලයේ ආරම්භය**

කොළඹ නුවර මහාමාර්ගයේ වරකාපොළ නගරය පසු කර කිලෝමීටර හතරක් පමණ මහනුවර දෙසට ගමන් කරන විට පාරේ වම් පසින් වූ කුඩා කඳුගැටයක ඇති මනරම් පරිසරයක ස්ථාපිත තෝලංගමුව මධ්‍ය විද්‍යාලය දිස්වේ. මධ්‍ය විද්‍යාලය නුවර පාරට යා කෙරෙන අතුරු මාර්ගය දෙපසත් නුවර පාරේ ඒ ආසන්න පෙදෙසේත් ඇති දැවැන්ත රොබරෝසියා වෘක්ෂ අප්‍රේල් - මැයි පමණ කාල වකවානුව තුළ මලින් පිරී යයි.

එහෙත්, දැදිගම ආසනයට පිරිනැමුණු මධ්‍ය විද්‍යාලය සඳහා මුලින් ම යෝජනා කරන ලද ස්ථානය එය නොවේ. ඒ වෙනුවෙන් යෝජනා වී ඇත්තේ දැදිගම එවකට පිහිටි කනිෂ්ඨ විද්‍යාල භූමියේ මධ්‍ය විද්‍යාලය පිහිටුවන ලෙස ය. එහෙත්, කිසියම් හේතු නිසා දැදිගම යෝජිත මධ්‍ය විද්‍යාලය පිහිටුවීමට ඒ ප්‍රදේශයේ විසූ ප්‍රභූ පැළැන්තිය විරුද්ධ වී තිබේ. ඊට හේතු වශයෙන් දක්වා ඇත්තේ මධ්‍ය විද්‍යාලය පිහිටුවීමට යෝජිත බිම් පෙදෙස ගංවතුරට යටවන බව ය. මේ අදහස පිළිගත් රජය ඒ සඳහා විකල්ප ස්ථාන සෙවීමේ දී මධ්‍ය විද්‍යාලය දැනට පිහිටි ස්ථානයේ වූ ග්‍රාමීය මිශ්‍ර පාසල් භූමිය ඒ සඳහා යෝජනා කර ඇත. ජන ප්‍රවාදය අනුව මේ භූමිභාගය ඓතිහාසික වශයෙන් ද වැදගත් ස්ථානයක් වේ. දන්ත කුමරු හා හේමමාලා කුමරිය දන්ත ධාතූන් වහන්සේ රැගෙන දැදිගම බලා යන ගමනේ දී රාත්‍රී කාලයේ දිනක් නැවතුම් ගෙන ඇත්තේ මෙහි බව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු ප්‍රකාශ කර ඇත.

ග්‍රාමීය මිශ්‍ර පාසල් භූමියේ මධ්‍ය විද්‍යාලය ස්ථාපනයේ දී එය සතු ව පැවති කුඩා බිම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවිණි. පාසලට යාබද ඉඩම හිමි විජේසුන්දර මහතා නොමිලයේ ම ඒ සඳහා අක්කර දෙකක බිම් ප්‍රමාණයක් ලබා දී තිබේ. පාසල් ගොඩනැගිලි ඉදිකර ගෙන යාමේ දී මේ ඉඩමට ද ප්‍රමාණවත් නොවූ බැවින් රජය විසින් විජේසුන්දර මහතා සතු ඉඩමේ ඔහුගේ නිවස හා ඒ අවට කුඩා බිම් ප්‍රමාණයක් ඔහුට ඉතිරිකර සෙසු සම්පූර්ණ භූමිය රජයට පවරා ගෙන ඇත. මේ සිදුවීම පිළිබඳ විද්‍යාලයේ මුලින් ම බඳවා ගත් ශිෂ්‍ය කණ්ඩායමේ නව වන ශිෂ්‍යයා ලෙස ඇතුළු වූ ආර්. ඒ. පියසේන රණවීර මහතා විසින් සඳහන් කරන ලද්දේ " විජේසුන්දර රාළහාමි " ලෙස ප්‍රචලිත මේ දානපතියාගේ සුවිශේෂී පරිත්‍යාගය නොවන්නට තෝලංගමුව මධ්‍ය විද්‍යාලය එහි ස්ථාපනය නොවන බව ය. එබැවින් ආදි ශිෂ්‍ය සංගම් ආදියේ දී වර්තමානයේ පවා ඒ ගැන කෘතගුණ පූර්වක ව සිහිපත් කෙරෙන බව ඔහු වැඩිදුරටත් පැවසී ය. (රණවීර, 2019).

මධ්‍ය විද්‍යාලයට පූර්වගාමී පාසල වූ ග්‍රාමීය මිශ්‍ර පාසලේ හයවන ශ්‍රේණියේ සිට ඉහළට අධ්‍යාපනය ලද සිසුන්ව මධ්‍ය විද්‍යාලයට බඳවා ගැණිනි. පෙ.ව. 10.00 තෙක් පාසල් භූමියේ ගොවිතැන් කටයුතු, පැල බද්ධ කිරීම ආදී කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ බවත් 10.00 ට ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද බවත් රණවීර මහතා පැවසීය.

විද්‍යාලයේ ආරම්භක විදුහල්පතිවරයා වී ඇත්තේ සිංහල භාෂාව පිළිබඳ ප්‍රාමාණික විද්වතකු වූ පී. තේනබදු මහතා ය. මධ්‍ය විද්‍යාලය ආරම්භක යුගයේ දී 6 වන ශ්‍රේණියේ සිට වර්තමානයේ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) සමාන්තර ශ්‍රේණිය දක්වා පංති පවත්වා තිබේ. එම අවසන් වර්ෂයේ සිසුහු එවකට පැවති රජයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූහ.

විද්‍යාලයේ ආරම්භක අවධියේ එහි අධ්‍යාපනය ලත් අතාවුද සෙනෙවිරත්න මහතා විසින් එවකට පැවති සමාජීය තත්ත්වය මෙන් ම විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳවද මනා විවරණයක් ඉදිරිපත් කරන ලදී. මධ්‍ය විද්‍යාලවලින් අරමුණු වූයේ කිසියම් ප්‍රදේශයක පාසල්වල ප්‍රාථමික අධ්‍යාපනය ලබන දක්ෂ දරුවනට යහපත් ද්විතීයික අධ්‍යාපනයක් ලබාදීමය. මේ සඳහා විද්‍යාල ගාස්තු හා වෙනත් වියදම් දැරීමට අපහසු දක්ෂ සිසුනට ඒ අවස්ථාව ලබා දීම පිණිස ශිෂ්‍යත්ව ලබා දීම සැලසුම් කෙරිණ. මධ්‍ය විද්‍යාලවල ඉගෙනුම ලබන දරුවනට දිවයිනේ සෙසු ප්‍රධාන පාසල්වල

අධ්‍යාපන මාධ්‍යය ලෙස භාවිත වූ ඉංග්‍රීසි භාෂාවෙන් ම උගැන්වීම සිදුකෙරිණ. එමගින් පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන දරුවාට ස්වකීය අනාගත අපේක්ෂා මව් රටට පමණක් සීමා කළ යුතු තත්ත්වයකින් මිදී අධ්‍යාපනය ලබා ලොව ම ජයගත හැකි මාර්ගයක් විවෘත විය. රාජ්‍ය අංශයේත්, පුද්ගලික අංශයේත් පරිපාලන හා වෙනත් උසස් තනතුරු දැරීම සඳහා ලැබුණු ඉඩ ප්‍රස්ථා ද වැඩි විය. සෙනෙවිරත්න හා රණවීර මහතුන් දෙපළ ප්‍රකාශ කර සිටි පරිදි මධ්‍ය විද්‍යාල අධ්‍යාපනය හුදෙක් පොතපත මූලික අධ්‍යාපන රටාවකට සීමා නොවිණ. එය යාන්ත්‍රික වැඩ, වඩු වැඩ, කෘෂිකර්මය සත්ත්ව පාලනය, කිරි ගවයන් හා කුකුළන් ඇති කිරීම, රෙදි විවීම, මැටි වැඩ ආදී ප්‍රායෝගික ක්‍රියාකාරී අංශ පැවතිණි.

එවකට සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයේ ශාඛාවක් තෝලංගමුව මධ්‍ය විද්‍යාලයේ පිහිටුවන ලදුව එහි ආරම්භක සභාපති ලෙස බරණගේ ආචාර්යවරයාත් ලේකම් ලෙස සෙනෙවිරත්න මහතා කටයුතු කර ඇත. එකී ශාඛා සමිතිය මගින් ශීල ව්‍යාපාර සංවිධානය කර ඇති අතර ඒ සඳහා විශේෂ ධර්ම සාකච්ඡා පැවැත්වීම සඳහා වජිරාරාමවාසී ව වැඩ විසූ පූජ්‍ය පියදස්සි හිමි, ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම් මහතා වැනි ප්‍රභූන් සහභාගී වී ඇත. මේ ධර්ම සාකච්ඡා බෙහෙවින් ප්‍රතිඵලදායක වී ඇති අතර එවකට විදුහල්පති වශයෙන් කටයුතු කළ සේරසිංහ මහතා දිනක් සෙනෙවිරත්න මහතා හමු වී මෙසේ ප්‍රකාශ කර තිබේ.

"අතාවුද, මේ සාකච්ඡා රැස්වීම් දේශන පවත්වන්න බොහෝ උගත්, නමගත් අය පිටපළාත්වලින්, ආයතනවලින් එනවා. පන්සල්වලිනුයි, වජිරාරාමයෙනුත් එනව. ඒ නිසා මේ ළමයි කැගහුවොත් හෙම මට හොඳ නෑ. මේ ළමයින්ගෙ මේ පැත්තෙ දියුණුවක් නැහැනේ. මාත් ඇවිත් ටිකක් ඉඳගෙන ඉන්නම්" මෙසේ පැවසූ සේරසිංහ විදුහල්පතිතුමා ධර්ම සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවක වේවැලක් ද පිටුපස සඟවා ගෙන බිත්තිවලට හේත්තු වී සිට ඇත. පානදුර ප්‍රදේශවාසී පාරම්පරික ක්‍රිස්තියානු පවුලකින් පැවත ආ ඔහු මේ ධර්ම සාකච්ඡාවලට සහභාගී වී ඇති අතර වර්ෂයක පමණ කාලයකට පසු බෞද්ධාගම වැළඳගෙන තිබේ. මුල් යුගයේ දී ටයි කෝට් පැළඳ විද්‍යාලයට පැමිණි ඒ මහතා බෞද්ධයකු වූ පසු සුදු කමිසයකින් හා වේට්ටියකින් සැරසී සුදු සාටකයක් ද පැළඳ විදුහලට පැමිණ සේවය කර තිබේ. (සෙනෙවිරත්න, 2009)

**මධ්‍ය විද්‍යාලයේ වර්තමාන තත්ත්වය**

තෝලංගමුව මධ්‍ය විද්‍යාලය විද්‍යා, කලා, වාණිජ තාක්ෂණ හා වෘත්තීය යන විෂයධාරා පහෙන් ම උසස් පෙළ අධ්‍යාපන පහසුකම් සපයනු ලබන ආයතනයකි. එහි වර්තමාන ගුරු මණ්ඩලය 176 කින් සමන්විත වන අතර ශිෂ්‍ය සංඛ්‍යාව 2,973 ක් වේ. විද්‍යාලයේ වර්තමාන විදුහල්පතිවරයා වන්නේ එහි ම ආදි ශිෂ්‍යයකු වන ජී.ඒ. අයි. යූ. ජයකොඩි මහතා වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යා උපාධියත්, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කළමනාකරණ උසස් උපාධි ඩිප්ලෝමාවත් සමත් ඔහු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වන පන්තියේ නිලධාරියෙක් වේ.



ජායාරූපය:
විද්‍යාලය නුවර මාර්ගයේ සිට දිස්වන අයුරු

විද්‍යාලයේ මෑත ඉතිහාසය විමසීමේ දී පෙනී යන කරුණක් වනුයේ එය බොහෝ අංශවලින් මනා ප්‍රගතියක් පෙන්වීම ඇරඹී ඇති බව ය. කිනම් හෝ පාසලක ප්‍රගතිය මැනෙන මූලික ම නිර්ණායකය වනුයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හා (සාමාන්‍ය පෙළ) විභාග සාමාර්ථ්‍යයයි. මෑත ඉතිහාසයේ උසස් පෙළ ප්‍රතිඵලවලින් උපරිම දක්ෂතා පෙන්වා ඇත්තේ පසුගිය වසරේ වීම මෙහි ලා දැකිය හැකි සුවිශේෂී තත්ත්වයකි. 2018 වර්ෂයේ දී විද්‍යාලයෙන් උසස් පෙළ විභාගයට සිසුන් 334 ක් පෙනී සිට ඉන් 238 ක් සාමාර්ථය ලබා තිබේ. මෙය ප්‍රතිශතයක් ලෙස 71 % ක් වේ. මේ අතරින් සිසුන් 100ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබේ. මින් 52 ක් විද්‍යා අංශයෙනුත්, 6 ක් ඉංජිනේරු අංශයෙනුත්, එක් අයකු වෛද්‍ය අංශයෙනුත් සුදුසුකම් ලබා තිබේ. උසස් පෙළ විභාග ප්‍රතිඵල අනුව තෝලංගමුව මධ්‍ය විද්‍යාලය දෙවන වන්නේ කෑගල්ල කන්‍යාරාමයට පමණි. (ජයකොඩි, 2019).

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල සැලකුව ද 2015 - 2018 කාල පරිච්ඡේදය තුළ විද්‍යාලය සැහෙන ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. මේ වකවානුව තුළ අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වූ ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය පහත වගුවෙන් දැක්වේ.

**වගුව: පසුගිය සිව් වසර තුළ අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වූ ශිෂ්‍යන්ගේ ප්‍රතිශතය**

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| සාමාර්ථය ලැබූ ප්‍රතිශතය | 89.1 | 87.39 | 89.13 | 90.35 |

මූලාශ්‍රය : විදුහල්පති විසින් ලබා දෙන ලද දත්ත

අධ්‍යාපන කටයුතුවලට පරිබාහිර ව සෙසු ක්ෂේත්‍රයන්හි දී ද විද්‍යාලය ප්‍රගතියක් අත්පත් කර ගෙන තිබේ. පසුගිය වසරේ සමස්ත ලංකා ක්‍රිකට් ශූරතාවලි තරගාවලියේ III වන කණ්ඩයේ තරඟවලදී පාසල් 184 ක් පරාජයට පත් කරමින් ශූරතාවය දිනා ගැනීමට විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම සමත් වී තිබේ. එම වර්ෂයේ ම, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුබද්ධිත විද්‍යාලයීය ශිෂ්‍ය භට කණ්ඩායම එම කඳවුරේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් වූහ.

මීට අමතරව 2018 වර්ෂයේ සමස්ත ලංකා නැටුම් තරගාවලියේ ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ හා කේවල යන අංශ තුනෙන් ම ජයග්‍රාහකයන්වීමට විද්‍යාලයීය නැටුම් කණ්ඩායම සමත් ව තිබිණි.

නව නිපැයුම්කරණයේ ද විද්‍යාලයීය සිසුවකු විසින් නිපදවන ලද ස්වයංක්‍රීය බිම්මල් නිෂ්පාදන පාලන යන්ත්‍රයක් සඳහා පේටන් බලපත්‍රය ද ලබා ගෙන ඇති අතර ඔහු සමස්ත ලංකා නව නිර්මාණකරුවන්ගේ තරගයේ දෙවන ස්ථානය දිනා ගැනීමට සමත්වූයේය. ජාත්‍යන්තර තත්ත්ව-කව තරගාවලියේ සමස්ත නව නිර්මාණ අංශයේ දෙවන ස්ථානය විද්‍යාලයීය සිසුවකු විසින් දිනාගන්නා ලද්දේ ඩ්‍රෝන (Drone) යානයක් වෙනුවෙනි.

විද්‍යාලයීය ආදි ශිෂ්‍යයන් අතර විවිධ ක්ෂේත්‍රයන්හි ජාතික තලයේ මෙන් ම ජාත්‍යන්තර තලයේ ද දක්ෂතා දැක්වූවෝ පිරිසක් වෙති. විශ්වවිද්‍යාල මහාචාර්යවරු හා අංශ ප්‍රධානවරු, විශ්වවිද්‍යාල ආයතනවල අධ්‍යක්ෂවරු, රාජ්‍ය හා පුද්ගලික බැංකුවල උසස් ම තලයේ නිලධාරීහු, ත්‍රිවිධ හමුදාවල හා පොලීසියේ උසස් නිලධාරීහු, රජයේ පරිපාලන නිලධාරීහු විද්‍යාලයෙන් බිහිවූහ.

**මූලාශ්‍රය**


- ජයකොඩි, ජී. ඒ. අයි. යූ. (2019) සමග 07.08.2019 -- 10.08.2019 අතර දුරකථන මාර්ගයෙන් පවත්වන ලද සාකච්ඡා.

  සටහන : ජයකොඩි මහතා විදුහලේ වර්තමාන විදුහල්පතිවරයා වේ.

- ජයසූරිය, ජේ. ඊ. (2011). අධ්‍යාපනයේ ප්‍රජාතාන්ත්‍රීකරණයේ ආරම්භය : සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමන්ගෙන් ඉටු වූ සේවය. ජාතික අධ්‍යාපන ආයතනය. (2011). අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල නොනිමි කර්තව්‍යය. මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය. පිටු 19-25.

- රණවීර, ආර්. ඒ. පී. (2019) සමග 14.07.2019 දින පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව
- රුබේරු, රංජිත්. (1971). ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය 1796 - 1947. කොළඹ, සීමාසහිත කොළඹ ඇපෝතිකරීස්.
- සෙනෙවිරත්න, අතාවුද. (2019) සමග 14.07.2019 දින පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව.
- විද්‍යාලයීය වෙබ් අඩවිය
- www.dscc.lk (ප්‍රවේශය 20.07.2019)

# කන්නන්ගර මහතාගේ සංකල්පයෙන් බිහිවූ සඳලංකා මධ්‍ය විද්‍යාලය

**අනුරුද්ධිකා දිල්හානි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
anu-hist@kln.ac.lk

## හැඳින්වීම

1884 ඔක්තෝම්බර් 13 වන දින උපත ලැබූ ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර හෙවත් සී. ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එම පාසලේ ම ගුරුවරයෙකු ලෙස සේවයට එක් විය. 1911 දී දේශපාලනයට පිවිසි ඒ මහතා 1923 පමණ පරිනත දේශපාලන නායකයෙකු බවට පත් විය. එනම්, මැනිං ඩෙවොංෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පැවති මැතිවරණයට ගාල්ල ඡන්ද කොට්ඨාසයෙන් ඉදිරිපත් වී ව්‍යවස්ථාදායක සභාවට පත්වීමයි. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ඇති කරන ලද විධායක කාරක සභා ක්‍රමය තුළින් අධ්‍යාපනය සම්බන්ධයෙන් වගකීම පැවරී තිබුනේ සී. ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාටය. අධ්‍යාපන කාරක සභාවේ අරමුණ වුයේ දිවයිනේ සෑම ඡන්ද කොට්ඨාශයකම මධ්‍ය විද්‍යාලය බැගින් පිහිටුවා නේවාසික ශිෂ්‍යත්ව ක්‍රමයක් යටතේ අධ්‍යාපනය ලබා දීමයි. කන්නන්ගර මහතා 1940 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී මධ්‍ය පාසල් පිහිටුවීමේ ක්‍රම සැලැස්ම පැහැදිලි කරන ලදී. (Hansard 1940, 2736 P) මධ්‍ය විද්‍යාල වශයෙන් ප්‍රතිසංවිධානය කිරීම සඳහා 1940 දී පාසල් 11ක් තෝරා ගනු ලැබූ අතර 1941 වන විට එයින් පාසල් 03ක් මධ්‍ය විද්‍යාල ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. (Hansard 1940, 2736 P) 1944 වන විටතවත් මධ්‍ය විද්‍යාල 22ක් පිහිටුවූ අතර 1945 ආරම්භ කළ මධ්‍ය විද්‍යාල 14 අතරට සඳලංකා මධ්‍ය විද්‍යාලය අයත් විය . 1946 වන විට මධ්‍ය විද්‍යාල 50ක් ආරම්භ වී තිබූ අතර ශිෂ්‍යයන් 11,879 ක් එම විද්‍යාලවල අධ්‍යාපනය ලැබීය. (Hansard 1946, 3589 P) කන්නන්ගර සංකල්පයෙන් බිහිවූ මධ්‍ය විද්‍යාල අතරින් තිස් පස් වන විද්‍යාලය සඳලංකා මධ්‍ය විද්‍යාලය යි.

## සඳලංකා මධ්‍ය විද්‍යාලයේ ආරම්භය




වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිටිගල් කෝරළයේ වැටකෙයියාව නම් ග්‍රාමය කේන්ද්‍ර කරගෙන සඳලංකා මධ්‍ය විද්‍යාලය පිහිටා තිබේ. සඳලංකා මධ්‍ය විද්‍යාලය පිහිටුවීමට මුල් වී ඇත්තේ වින්සන්ට් සුබසිංහ මැතිතුමා ය. සඳලංකාව ප්‍රදේශයේ විශාල ඉඩම් හිමියෙකු වූ සුබසිංහ අතපත්තු ලේකම් රාළහාමි මෙතුමාගේ පියා වූ අතර මව සීලවතී තෙලිසිංහ මැණිකේය. 1905 මාර්තු 29 වන දින උපත ලැබූ වින්සන්ට් සුබසිංහ මහතා හෙන්ඩියගල විදුහලෙන් මූලික අධ්‍යාපනය හදාරා වැඩිදුර අද්‍යාපනය සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වී ඇත. 1926 දී අධ්‍යාපනය නිමවා උපන් ගමට පැමිණි සුබසිංහ මහතා වර්තමාන විද්‍යාලය පිහිටි භූමියේ කුඩා පොල් අතු මඩුවක් තුළ ගමේ පිරිමි දරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාව නොමිලේ උගන්වා ඇත. මෙතුමා 1940 දී පොල් නිපදවන්නන්ගේ සමූපාකාර සමිතියත්, 1942 දී කඩ වෙළඳ සමිතියත් රෙදි වියන්නන්ගේ සමූපාකාර සමිතියත් ආරම්භ කරමින් ප්‍රදේශයේ ආර්ථික දියුණුවට මග පෑදීය. සඳලංකා සමූපාකාරය තුළින් ඇති කළ දියුණුව නිසා බණ්ඩාරනායක මහතාගේ රජය යටතේ සමූපාකාර තොග වෙළඳ ආයතනයේ සභාපති ධූරයට පත් විය.

සුබසිංහ මහතාගේ අපේක්ෂාව වුයේ ප්‍රදේශයේ ගැමි දරුවන් උදෙසා හොඳ අධ්‍යාපනයක් ලබාදීමට සඳහා පාසලක් පිහිටුවීමය. 1944 අප්‍රියෙල් 02 දින සඳලංකාපොල් නිපදවන්නන්ගේ සමිතියේ මාසික සභා රැස්වීමේදී ප්‍රදේශයට මධ්‍යම පාසලක් පිහිටුවීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් විය. (1944 කාරක සභා වාර්තාව, 54 පිටුව)

බාලාංශයේ පටන් විශ්වවිද්‍යාලය දක්වා නොමිලේ ඉගැන්වීම කරන උසස් පාඨශාලා වර්ගයට අයත් මධ්‍යම පාඨශාලාවක් මේ පළාත් වාසීන්ට ද ලැබිය යුතුය." යන යෝජනාව ඉදිරිපත් කළේය.

(1944 කාරක සභා වාර්තාව, 54 පිටුව) තවදුරටත් පැහැදිලි කරමින් මෙතුමා කියා සිටියේ අක්කර පහකට නොඅඩු ඉඩමක් සපයා දිය හැකි ගොඩනැගිලි ආදී අනෙකුත් වියදම් සඳහා රුපියල් දහදාහක් පමණ වියදමක් දැරිය හැකි පිරිසක් සිටින ප්‍රදේශයක පමණක් මෙම වර්ගයේ පාඨශාලා පැවැත්වීමට ආණ්ඩුව අදහස් කරගෙන සිටින බවද පැවසීය.

යෝජනාව සම්මත වීමත් සමග ම නැගී සිටි සුබසිංහ අතපත්තු ලේකම් රාළහාමි තමා සතු අක්කර පහක ඉඩම සහ මුදලින් රුපියල් දාහක් ලබා දීමට එකඟ විය. මෙයින් පසුව බොහෝ පිරිසක් ආධාර දීමට එකඟ වූහ. 1944 කාරක සභා වාර්තාව, 55 පිටුව) මෙම පරිත්‍යාගශීලි පිරිසකගේ එකමුතුවෙන් සඳලංකා මධ්‍ය විද්‍යාලයෙහි මූලාරම්භයට අඩිතාලම සකස්විය. ඒ අනුව 1945 මාර්තු 03 වන දින වින්සන්ට් සුබසිංහ මැතිතුමාගේත් සහ ප්‍රදේශයේ මන්ත්‍රී ආර්. එස්. තෙන්නකෝන් මැතිතුමාගේත් ආරාධනාව මත අධ්‍යාපන ඇමති සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන ශාලාවට මුල්ගල තබන ලදී. යෝජිත භූමියෙහි ගොඩනැගිලි ඉදිවෙන තෙක් තාවකාලිකව හෙන්ඩියගල ශාස්ත්‍රෝදය පිරිවෙණේ ධර්ම ශාලාවෙහි 1945 ජුලි 01 වන දින සිට ඉගැන්වීමේ කටයුතු කරගෙන යන ලදී. මෙම පරිශ්‍රය තුළ වසර දෙකක පමණ කාලයක් විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන ගොස් තිබේ. 1947 මාර්තු 18 වන දින 18 වන දින වර්තමාන භූමියට සඳලංකා මධ්‍ය විද්‍යාලය ගෙන එන ලදී. ඉගැන්වීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු කෙරිණි.

## සඳලංකා මධ්‍ය විද්‍යාලයෙහි ආරම්භයේ සිට වර්තමානය දක්වා සේවය කළ විදුහල්පතිවරු

### *ගරු හෙක්ටර් ජේ ප්‍රනාන්දු මහතා*

විදුහලේ ආරම්භක විදුහල්පතිවරයා ලෙස 1945 දී හෙක්ටර් ජේ ප්‍රනාන්දු මහතා පත් වූ අතර ඔහු 1951 දක්වා එම ධූරයේ කටයුතු කරන ලදී. විදුහල්පති ඇතුලුව ආචාර්ය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර සිසුන් ඇතුළත් කර ගැනීමේ උත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස කන්නන්ගර මැතිතුමාත් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වු ආර්.එස්. තෙන්නකෝන් මැතිතුමාත් සහභාගී වූහ. ප්‍රථම විදුහල්පතිවරයා වූ හෙක්ටර් ජේ ප්‍රනාන්දු මහතා විසින් තබන ලොග් පොතෙහි තබන ලද සමරු සටහන විද්‍යාලයේ ඉතිහාසය විමසා බැලීමේ ප්‍රබල සාධකයකි.

මෙතුමාගේ සේවා කාලය තුළ පාසල් උද්ධෘත පාඨය ලෙස " මානිවත්ත අභික්ඛම " ( නොනැවතී ඉදිරියට යන්න)යන පාලි වාක්‍ය භාවිත කෙරිණි. විද්‍යාලයට ආවේණික සම්ප්‍රදායක් ගොඩ නගමින් ඉතිහාසය විෂයය ඉගැන්වීම, ඉගැන්වීමේ කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කිරීම, විද්‍යාලය තුළ ක්‍රිකට් සහ වොල්බෝල් ක්‍රීඩාව ආරම්භ කිරීම, විද්‍යාලයට නිල ලාංඡනයක් නිර්මාණය කිරීම, 1950 දී ආදී ශිෂ්‍ය සංගමය ආරම්භ කිරීම, ඉංග්‍රීසි සාහිත්‍ය සංගමයක් ආරම්භ කිරීම යනාදී කාර්යයන් සඳහා කැපවීමෙන් කටයුතු කර ඇත.

### *ගරු ආර්.ඩී සිරිසේන මහතා*

සඳලංකා මධ්‍ය විද්‍යාලයේ දෙවන විදුහල්පතිවරයා ලෙස 1951 සැප්තැම්බර් 01 දින වැඩ භාර ගත් ආර්.ඩී සිරිසේන මහතා ශිෂ්‍යත්වධාරී සිසුන් සඳහා නේවාසිකාගාරයක් තිබීම මධ්‍ය විද්‍යාලයක තිබිය යුතු අංගයක් බව රජයට පෙන්වා දෙන ලදී. මෙතුමා විද්‍යාලයට ශිෂ්‍ය නායක මණ්ඩලයක් හඳුන්වාදුන්නේය. 1952 සැප්තැම්බර් 30 වන දින විදුහල්පති ධූරයෙන් සමුගත් මෙතුමාට ප්‍රධාන විභාග කොමසාරිස් ධූරයට උසස්වීමක් ලැබිණ.

ගරු ඩී.ඇල්.ඩබ්. අබේගුණසේකර මහතා

විද්‍යාලයේ තුන් වන විදුහල්පතිවරයා ලෙස වැඩ භාරගනු ලැබුවේ මෙතුමාය. ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම, විදුහල්පති නිල නිවාසය ඉදිකිරීම, ආරම්භ කිරීම හා ප්‍රථම වරට උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාලයට ශිෂ්‍යාවන් දෙදෙනෙකු ඇතුලත් වූයේ ද මෙතුමාගේ පාලන කාලයේදීය. කලක් අකර්මණ්‍ය තත්ත්වයේ තිබූ ආදී ශිෂ්‍ය සංගමය නැවත ආරම්භ කරන ලදී. 1955 බෞද්ධ ශිෂ්‍ය සංගමය ආරම්භ කළ අතර ශිෂ්‍යයන්ගේ මැදිහත්වීම ඇතිව විද්‍යාලීය භූමිය තුළ විහාර මන්දිරයක් ද ඉදිකරන ලදී.

ගරු ඩී. ඒ. ජයතිලක මහතා

මෙතුමා පත්වීම ලැබ වසර එක හමාරකින් පමණ විදුහල්පති ධූරයෙන් සමුගෙන ක්‍රියාකාරී දේශපාලනයට පිවිසුණි. 1977 දී ගම්පහ දිසා ඇමතිවරයා වශයෙනුත් පසුව පොල් කර්මාන්ත රාජ්‍ය ඇමති ධූරයටත් පත් විණි. එහෙත් තම සේවා කාලය තුළදී ක්‍රීඩා කටයුතු වර්ධනයට හා විද්‍යාගාර ගොඩනැගිලි ඉදිකිරීම තුළින් විද්‍යාලයේ සංවර්ධනයට කටයුතු උදෙසා කටයුතු කරන ලදී,

ගරු පැට්‍රික් ගුණවර්ධන මහතා

මෙතුමාගේ සේවා කාලය විද්‍යාලයේ ස්වර්ණමය යුගයක් ලෙස සලකනු ලබයි. එනම් 1960 දී විද්‍යාලීය ගීතය නිර්මාණය කිරීම, පාසල් නිල ලාංඡනයේ ආකෘතිය සහ අන්තර්ගතය වෙනස් කිරීම, කලා අංශයට පමණක් සීමා වී තිබූ විෂයය මාලාව විද්‍යා, වාණිජ්‍ය, කෘෂි විද්‍යා හා කාර්මික යන අංශ දක්වා පුළුල් කිරීම, 1960දී විද්‍යා අංශය ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 1966 දී ප්‍රථම වරට විද්‍යා අංශයෙන් විශ්වවිද්‍යාලයට සිසුවෙකු ඇතුළත් වීම, 1960 දී විද්‍යාලීය සමූපාකාර සංගමය ආරම්භ කිරීම, 1961 දී විශ්වවිද්‍යාල ප්‍රවේශයට පෙනී සිටි සිසුන් 13 කින් 10 දෙනෙකුම විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම, 1970 දී වානිජ හා ආර්ථික විද්‍යා සංගම් ආරම්භ කිරීම යනාදී කාර්යයන් රාශියක් විද්‍යාලයේ උන්නතිය උදෙසා සිදුකරන ලදී.

ගරු ක්ලීස්ටස් නානායක්කාර මහතා

මෙතුමාගේ පාලන කාලයේදී විද්‍යාල භූමියේ ප්‍රතිමා ද්වයක් නිර්මාණය කිරීම, කාන්තා පෙරදිග තූර්ය වාදක කණ්ඩායමක් නිර්මාණය කිරීම, 1976- 77 කාලයේ සමස්ත ලංකා පාඨශාලා නාට්‍ය තරගාවලියෙන් සුනබයා සහ වීනාව නම් වූ නාට්‍ය ප්‍රථම ස්ථානය ලැබීම, 1976 දී පාසල් සිසුන්ගේ නිල ඇඳුම විධිමත් ලෙස සකස් කිරීම, එහිදී ගැහැණු ළමුන්ගේ නිල ඇඳුම සුදු ගවුමත් කොළ පාට ටයි පටියත් වූ අතර කැන්වස් සපත්තු පැළඳීය. පිරිමි ළමුන් කොට කලිසම සහ උසස් පෙළ සිසුන් කමිසය අත්කොට හා දිග කලිසම පාට භේදයකින් තොරව ඇන්දහ. ඇතැම් පිරිමි ගුරු භවතුන් ජාතික ඇඳුමින් සැරසී පැමිණි බව සඳහන් වේ.



ක්ලීස්ටස් නානායක්කාර මහතා විසින් නිර්මාණය කිරීමට දායක වූ ප්‍රතිමා යුගලය

මෙයට අමතරව පහත සඳහන් විදුහල්පතිවරු සඳලංකා මධ්‍ය විද්‍යාලයේ වර්ධන උදෙසා සේවය කර ඇත.

| | |
|---|---|
| ගරු එච්. පී. විජේසූරිය මහතා | (1978. 01. 07 සිට 1982 06. 09 දක්වා) |
| ගරු සිරිවර්ධන අමරසිංහ මහතා | (1982. 06. 10 සිට 1985 05. 25 දක්වා) |
| ගරු එන්. වීරතුංග මහතා | (1985 05. 28 සිට 1987. 09. 10 දක්වා) |
| ගරු උපුල් වීරවර්ධන මහතා | (1987.02. 15 සිට 1987. 09. 10 දක්වා) |
| ගරු ජේ. කණ්ඩම්බි මහතා | (1987. 09. 11 සිට 1992. 07. 21 දක්වා) |
| ගරු ඩබ්.එම්.සී. වික්‍රමසූරිය මහතා | (1992.08. 01 සිට 1995.01.22 දක්වා) |
| ගරු එම්.ජී. එස්. රූපස් මහතා | (1995.02.06 සිට 2000.08.31 දක්වා) |
| ගරු ඩී. ඩී . එම්. ප්‍රනාන්දු මහතා | (2000. 09.01 සිට 2003 .12. 31 දක්වා) |
| ගරු එච්. පී. අමරසිරි මහතා | (2003. 12.31 සිට 2004. 10.27 දක්වා) |
| ගරු ඇස්. ඒ. සරණසේන මහතා | (2004.10.27 සිට 2011.09.13 දක්වා) |
| ගරු වයි. එච්. නන්දන යාපා මහතා | (2011.09.13 සිට 2014.09.13 දක්වා) |
| ගරු ජී. ඒ. අසංක චාමින්ද මහතා | (2014.09.13 සිට මේ දක්වා) |

ආරම්භක අවධියේ සිට මෙම කාලය දක්වා ගුරු භවතුන් 487ක් පමණ විද්‍යාලයේ සේවය කර ඇති අතර වර්තමානයේ 80ක් පමණ ගුරුවරු පිරිසක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වෙති.

**විද්‍යාලයේ ප්‍රථම ආදී ශිෂ්‍යයා සහ ප්‍රථමයෙන් විශ්වවිද්‍යාලයට තේරී පත්වූ ශිෂ්‍යයන්**

විද්‍යාලයේ ප්‍රථම ආදී ශිෂ්‍යයා වුයේ එන්. ඒ.එන්. ආරියරත්න මහතාය. 1945 07.02 දින හෙන්ඩියගල පිරිවෙණෙහි පැවති සිසුන් ඇතුළත් කර ගැනීමේ උත්සවයේදී අධ්‍යාපන ඇමතිතුමා සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා විසින් ඇතුළත් කිරීමේ පොතෙහි නම සටහන් කිරීමෙන් පසුව ප්‍රථම ආදී ශිෂ්‍යා බවට පත් විය.

1956 දී විද්‍යාලයෙන් ප්‍රථම වරට සිසුවියෝ දෙදෙනෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වූහ. 1956 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ අයි. එම්. විනීතා අයිරාංගනී දිසානායක මහත්මිය 1960දී උපගුරුවරියක ලෙස මෙම විද්‍යාලයේ ම සේවයට එක්වූවාය. එච්. එම්. පුංචිමැණිකේ හේරත් මහත්මිය 1956 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට තේරී පත් වූ අතර 1960 දී උසස්පෙළ සඳහා දේශපාලන විද්‍යාව විෂයය සඳහා උපගුරුවරියක ලෙස සඳලංකා විදුහලට පත්වීම ලැබිණ.

**සඳලංකා මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඉහළ තනතුරුවලට පත් වූ පුද්ගලයන්.**

යසා අලහකොන් මිය - ලංකාවේ පළමු රාජ්‍ය ක්‍රීඩා උපදේශිකාව ලෙස පත් වීම.

කේ.ඩී. විජේපාල මහතා - 2000 දී අධ්‍යාපන අමාත්‍යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්විය.

අශෝක ජයලත් මහතා - 1990 දී කුරුණෑගල පළාත් අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්විය.

කේ. ඒ. ජයනි ප්‍රියංගිකා මිය - 2005 දී පරිපාලන ක්ෂේත්‍රයට ඇතුළත් වූ අතර දැනට අධ්‍යාපන අමාත්‍යංශයේ ජාතික පාසල් නියෝජ්‍ය අධ්‍යක්ෂතනතුරට හොබවනු ලබයි.

සිරි රණසිංහ මහතා - විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු වූ මෙමහතා ලේක් හවුස් ආයතනයේ සේවය කර පසුව ලංකාදීප පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලෙස පත්වීම

ඩේ.ඒ. උපාලි මහතා - 1973 දී නාවික හමුදාවට බැදුණු මෙතුමා රියර් අද්මිරාල් තනතුර දක්වා උසස් වීම

විජිත හේරත් මහතා - ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධීක්ෂණ නිලධාරියකු වූ මෙම මහතා විශ්‍රාම ගන්නා විට සහකාර සාමාන්‍යාධිකාරවරයෙකු ලෙස කටයුතු කර තිබීම.

ධර්මසේන කහදව මහතා - 1978 දී ශ්‍රී ලංකා රේගු නිලධාරියෙකු ලෙස සෙවයට එක් වුණු අතර 2017 සිට අතිරේක රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙකු ලෙස සේවය කරයි.

කමල් උඩපොළ මහතා - 1999 දී පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සේවයට එක්ව 2016 සිට පාර්ලිමේන්තුවේ ප්‍රධාන නිලධාරී තනතුර හොබවයි.

මෙයට අමතරව දේශපාලන ක්ෂේත්‍රයට පිවිසි පුද්ගලයෝ ද බොහෝ සිටිති. ඩී. එම් චන්ද්‍රතිලක, රංජිත් විජේසිරි, නන්දසිරි වනිගසුන්දර, ගුණදාස කන්නන්ගර, කමල් හේරත් යන පිරිස 1950 - 1970 අතර දශකවල විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා පසුව වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරු ලෙස පත්වූහ. 1950 සිට වර්තමානය දක්වාම මළල ක්‍රීඩා අංශයෙන් ජාතික තලයේ දක්ෂතා දැක්වීමට විද්‍යාලයේ සිසුවියන් සමත්ව ඇත. වර්තමානය වන විට විද්‍යාලයතාක්ෂණ පීඨ, නවාංග සහිත විද්‍යාගර හා ක්‍රීඩා පීඨ යනාදී නවීකරණය වූ ගොඩනැගිලිවලින් සමන්විත අතර විශ්වවිද්‍යාල ප්‍රවේශ වරම් ලබා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රගතිය ද ඉහළ මට්ටමක පවතී. විවිධ කාල වකවානුවල අධ්‍යාපන අමාත්‍යංශය විසින් කරන ලද පාසල් වර්ගීකරණයට අදාළව ශ්‍රේණිගත කිරීම්වලට අනුව සඳලංකා මධ්‍ය විද්‍යාලය 1978 දී පර්ෂද පාසලක් වූ අතර 1990 දී 1 ඒ බී පාසලක් ලෙසද 1996 සිට ජාතික පාසලක් ලෙසද 2011 සිට දහසක් පාසල් ව්‍යාපෘතියට අයත් පාසලක් ලෙසද 2014 සිට තාක්‍ෂණ විෂයධාරා සහිත පාසලක් ලෙසද ලංකාවේ පාසල් පද්ධතිය තුළඉහළ ස්ථානයක් හිමිකරගෙන තිබේ. "ප්‍රශස්ත අධ්‍යාපනයක් තුළින් විශිෂ්ට දරුවෙක්" යන විද්‍යාලයීය සංකල්පය ක්‍රියාවට නැංවීමේ මහගු මෙහෙවරක යෙදෙමින් දැයට නිර්මාණශීලී දරු පරපුරක් සමාජගත කිරීමට මෙතෙක් ආ ගමනේදී සඳලක් මැදි විදු මාතාවට හැකිවිය.

**මූලාශ්‍රය**


- State Council of Ceylon: Hansard, 1940, Vol.II, Ceylon government press, Colombo.
- State Council of Ceylon: Hansard, 1944, Vol.I, Ceylon government press, Colombo.
- State Council of Ceylon: Hansard, 1946, Vol.II, Ceylon government press, Colombo.
- කාරක සභා වාර්තාව, සඳලංකා සමූපාකාර පොල් නිපදවන්නන්ගේ සමිතිය, 1944.
- සඳලංකා, රජත ජයන්ති කලාපය, 1970.
- සඳලංකා හතළිස් වසර, හතළිස් වසර සැමරුම 1985.
- ස්වර්ණ ජයන්ති සැමරුම, 2004.
- මැදි විදුහල් මව සඳලංකා, 72 වන සමරු කලාපය, 2018.

# ශ්‍රී ලංකේය දරු පරපුරට උරුම වූ නිදහස් අධ්‍යාපනය සඳහා කන්නන්ගරයන්ගේ දායකත්වය

**නිලන්ති බණ්ඩාර**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nilu@kln.ac.lk

**ආචාර්ය දම්මි බණ්ඩාර**
අභිලේඛන හා නාණකවිද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
dammibandara@yahoo.com

**ආචාර්ය නලින් වර්නජිත්**
මෘදුකාංග ඉන්ජිනේරු ඉගෙනුම් ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය
nwarnajith@kln.ac.lk

**ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර**
දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
manojisucharika@gmail.com

## හැඳින්වීම

අතීත ශ්‍රී ලාංකිකයින් අක්ෂර භාවිතය, හැසිරවීම, කියවීම මෙන්ම ඔවුන්ගේ බුද්ධිමය හැකියාව පිළිබඳ මහාවංසය, දීපවංසය වැනි ලිඛිත මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක සාධකවලින් පැහැදිලි වෙයි. අවුරුදු 2500ක් තිස්සේ පැවත ආ සමාජීය හා ආධ්‍යාත්මක විපර්යාසයන් ඇති කළ බෞද්ධ සංස්කෘතික කටයුතුවලටත්, ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා ඇති කළ නිදහස් අධ්‍යාපනයෙන් ලාංකේය ජනතාව උද්යෝගය ලැබූහ. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසින් යන විදේශීය ආධිපත්‍යයට ලක්වීම නිසා ශ්‍රී ලාංකේය බෞද්ධ අධ්‍යාපනය හා සංස්කෘතිය කඩා වැටීමට ලක්විය. මීට හේතු වූයේ විදේශීය ආධිපත්‍යධාරීන් ඔවුනොවුන්ගේ විවිධ අරමුණු පදනම් කරගෙන ආගම්, සංස්කෘතීන් අධ්‍යාපනය හරහා ලබාදීමට කටයුතු කිරීමයි. ලාංකීය ධනේශ්වර හා මධ්‍යම පාන්තිකයින්ට මින් යහපතක් වුව ද සාමාන්‍ය ජනයාට මින් අයහපතක් ම විය. නමුත් මෙකී ව්‍යවසනය දුටු ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ව්‍යවස්ථාපිතව කිරීමට සමත් වූයේය. ඒ පිළිබඳ කරුණු මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

## නිදහස් අධ්‍යාපනය ලැබීමට පෙර තත්ත්වය

අධ්‍යාපනය සමාජයෙහි විවිධ බලවේගයන් බිහි කරන අතර එය එවැනි විවිධ බලවේගයන්ගේ ක්‍රියාකාරීත්වයෙහි සහ ප්‍රතික්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵලයක් ද වේ. විදේශීය ආධිපත්‍යයට ලක් වූ මෙම යුගයේ දී ඔවුන් විසින් ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීම වස් ලංකීය සමාජය තුළ ඉංග්‍රීසි පාසල් නොහොත් මිෂනාරි පාසල් ආරම්භ කරන ලදී. ආගම පතුරවමින් ක්‍රියාත්මක වූ මෙම අධ්‍යාපනික පාසල් වලට අමතරව පිරිවෙන් ඇතුළු ස්වභාෂා පාසල් කිහිපයක් ද මෙකල දක්නට ලැබෙයි (ද සිල්වා, 1969: 597).

## ඉංග්‍රීසි පාසල් නොහොත් මිෂනාරි පාසල්

මෙම පාසල් ක්‍රිස්තියානි ආගමික සභාව විසින් පවත්වාගෙන යනු ලැබීය. පාසල්වල ප්‍රධාන ආචාර්ය ධුරය දැරුවේ බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලවල උපාධියක් ලැබූ ඊට ම පුහුණුවක් ලද තැනැත්තෙකි. එමෙන්ම එංගලන්තයේ පෞද්ගලික පාසල්වල ආකාරයෙන්ම මෙම පාසල්වල කාර්යයන් සිදුවිය. විභාග කටයුතු කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ විභාග කේන්ද්‍ර කරගනිමින් සිදුවිය. මීට අමතරව ක්‍රීඩාව, චරිත සංවර්ධනය කෙරෙහිද අවධානය යොමු කර ඇත.

නීති හා වෛද්‍ය සේවයක් ද සිවිල් හා පොදු සේවාවක් ආරම්භ කිරීම ඉංග්‍රීසි පාසල් මගින් සිදුකෙරිණි. මෙකී ඉංග්‍රීසි පාසල් තුළින් බිහි වූ පරිපාලන නිලධාරීහු නිදහසින් පසු රට පාලනයේ දී සහායකයෝ වූහ(ද සිල්වා 1969: 598). එමෙන්ම ඉංග්‍රීසි පාසල් පාලක පක්ෂය සඳහා ලිපිකරුවන්

නිර්මාණය කළේය. නමුත් මෙකී තත්ත්වය පසුකාලීනව පුද්ගලයාගේ නිදහස, පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය වැනි නූතන දේශපාලන සංකල්ප බිහිවීමට මූල බීජයක් විය. ශ්‍රී ලාංකේය සමාජයේ මුල් බැසගෙන පැවති කුලය මත පදනම් වූ වැඩවසම් ක්‍රමය විනාශ වීම ද මෙකී පාසල් නිර්මාණයවීමෙන් සිදුවිය (ආටිගල 2000).

මිෂනාරි පාසල් ආරම්භ වූයේ නාගරික ප්‍රදේශවලය. මෙයින් ප්‍රතිලාභ භුක්ති වින්දේ හුදෙක් නගර බද ජීවත් වූ ධනේශ්වර හා මධ්‍යම පාන්තික දරුවන් හා අතලොස්සක් වූ ගම්බද ධනේශ්වර පවුල්වල දරුවන් පමණි. මෙම පාසල් මගින් බිහි වූ ලාංකීය උගත්හු රාජ්‍ය පරිපාලන, සමාජ සේවා, සිවිල් හා වෛද්‍ය හා අධිකරණ සේවාවන් මගින් රටේ ආර්ථික හා සමාජ දියුණුව සඳහා පෙරටුගාමී වූහ. මේ නිසා ඉංග්‍රීසි පාසල් විශාල ආර්ථික අගයකින් යුක්ත විය (ආටිගල 2000).

**ස්වභාෂා පාසල්**

ස්වභාෂා පාසල් යන නමින් ම එම පාසල් පිහිටුවීමේ මූලික පරමාර්ථය පසක් වේ. එනම් ජනතාවට මවුබස පිළිබඳ දැනුමක් ලබාදීමයි. ලාංකේය බොහෝදෙනා ස්වභාෂා පාසල් අධ්‍යාපනයට යොමු වූයේ ඉංග්‍රීසි අධ්‍යාපනයට අධික වියදමක් දැරීමට සිදුවන නිසාය. මේ නිසා බොහෝ දෙනෙක් ස්වභාෂා පාසල්වලින් ප්‍රයෝජන ලැබූහ.

ස්වභාෂා පාසල්වල දක්නට ලැබුණු පොදු ලක්ෂණ කිහිපයක් විය. එනම් එක් ශාලාවක් තුළ විශාල පිරිසක් අධ්‍යාපනය ලැබීම, පන්ති කාමරයේදී භාවිත කරන උපකරණ සංඛ්‍යාව ඉතා සීමිත වීම, ක්‍රීඩා පිට්ටනි හා විද්‍යාගාර පහසුකම් නොවීම, පුස්තකාල පහසුකම් ද නොවීම ආදිය වේ. මේ නිසා අධ්‍යාපනය පොතට පමණක් සීමා වූ අතර (ද සිල්වා 1969: 598) ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීම සඳහා අවස්ථාවක් නොවීය. මේ නිසා ධනවත් දෙමාපියවරුන්ගේ දරුවන් පසුව ඉංග්‍රීසි පාසල්වලට යොමු කිරීමට ඔවුහු කටයුතු කළහ. ඊට හේතු වූයේ ස්වභාෂා පාසල් අධ්‍යාපනය ලැබීමෙන් සමාජයේ ඉහළ වෘත්තියක නියැලීමට තරම් සුදුසුකම් සපුරා නොතිබීමයි. ස්වභාෂා පාසලකින් අධ්‍යාපනය ලබන්නෙකුට හිමි වූ උසස් ම වෘත්තිය වූයේ ගුරු වෘත්තියයි.

එකී අඩු ලුහුකම් මධ්‍යයේ වුවද මෙම පාසල් මගින් යහපත් කරුණු ගණනාවක් සිදුවිය. එනම් මෙම පාසල් තුළින් මව් භාෂාව ඉගැනීම, රටේ සංස්කෘතික උරුමයේ ජීවය හා සාරය වූ සංස්කෘතිය හා සාහිත්‍ය පිළිබඳ උනන්දුවකින් ඉගැන්වීම, සැබවින් ජාතික පාසල් ලෙසින් බොහෝ බුද්ධිමතුන් හා කතුවරුන් බිහි කිරීම, ජනගහනයෙන් ඉහළ ප්‍රතිශතයකට අක්ෂර හැසිරවීමේ හා කියවීමේ හැකියාව ලැබීම යනාදිය වේ.

මිෂනාරී පාසල් හා ස්වභාෂා පාසල් අතර අධ්‍යාපනික වශයෙන් විශාල වෙනස්කම් පවතින බව උක්ත කරුණු අනුව පැහැදිලි වෙයි. මේ නිසා ම සමාජීය වශයෙන් ශ්‍රී ලංකාව පන්ති දෙකක් ලෙසින් වෙන්වීමට හේතු විය. ඡන්ද බලය වෙනුවට සර්වජන ඡන්ද බලය ගෙන එන අවස්ථාවේ එක් ජාතියක් ලෙස ගොඩ නැගීමට නොහැකි වීමෙන් මෙකී සමාජීය බෙදීම පසක් කරවයි. මෙකී තත්ත්වය හොඳින් වටහාගත් කන්නන්ගර මහතා ගමේ දරුවන්ට මීට වඩා හොඳ අධ්‍යාපනික අවස්ථාවක් ලබාදීම කෙරෙහි උනන්දු විය.

**නිදහස් අධ්‍යාපනයේ සමාරම්භය**

අධ්‍යාපනයේ වටිනාකම අවබෝධ කරගෙන, එකී ඥානය තමාට පමණක් නොව සමස්ත දැයේ දරුවන්ට නිර්ලෝභීව ලබාදීම සඳහා කන්නන්ගර වෙහෙසවූයේය. එහි ප්‍රතිඵලය වූයේ නිදහස් අධ්‍යාපනය ආරම්භ වීමයි. 1931 රාජ්‍ය මන්ත්‍රන සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙසින් තේරී පත් වූ ඒ මහතා පනත් දෙකක් ඉදිරිපත් කළේය. ඒ 1939 අංක 31 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය හා 1945 අංක 21 දරණ නිදහස් අධ්‍යාපන පනත යි. 1945 ජුලි මාසයේ දී නිදහස් අධ්‍යාපන පනත සම්මත වූ අතර ඔක්තෝබර් 01 වෙනි දා සිට එම පනත බලාත්මක විය. තවද නිදහස් අධ්‍යාපනය සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම හා ඊට සමගාමීව ගුරු විද්‍යාල පිහිටුවීමට ද කන්නන්ගර මහතා කටයුතු කළේය.

**මධ්‍ය මහා විද්‍යාල**

1945 අංක 21 දරණ නිදහස් අධ්‍යාපන පනත බලාත්මක වීම පදනම් කොටගෙන එක් ඡන්ද දායක දිස්ත්‍රික්කයකට එක බැගින් මධ්‍ය මහා විද්‍යාල පිහිටුවිය. එකී පාසල්වල ජාති, කුල, ආගම් සහ වත් පොහොසත්කම් නොතකා සෑම දරුවෙකුට ම බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපන ලබාගැනීමේ අවස්ථාව හිමිවිය.

කන්නන්ගරයන් නිර්මාණය කළා වූ මධ්‍ය මහා විද්‍යාලවල තත්ත්වය ගුණාත්මක කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන තිබේ. එනම්,

- මධ්‍ය මහා විද්‍යාල භාර නිලධාරී තනතුරක් ඇති කිරීම. (කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මින් අපේක්ෂාව වීම)
- ඉගෙනුම් විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීම. (ශාස්ත්‍රීය අධ්‍යාපනයට අමතරව විෂය බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීම. පෙරදිග සංගීතය, නැටුම් ගැයුම් වැයුම් ආදී විෂයයන් තුළින් චිත්තවේග වර්ධනය සඳහා පුහුණුවක් ලබාදීම)
- ද්විතීය ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම.
- පාසල් මට්ටමින් ක්‍රිඩා හා මළල ක්‍රීඩා තරඟ ආරම්භ කිරීම.
- ශිෂ්‍ය භට හමුදා ව්‍යාපාරය බිම් මට්ටමින් ආරම්භ කිරීම.
- ඒ ඒ පළාත්වලට උචිත අයුරින් ප්‍රායෝගික විෂයන් නිර්මාණය වීම. (වතු වැඩ, වඩු වැඩ, රෙදි විවීම ආදිය)

**නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ**

සැබවින් ම නිදහස් අධ්‍යාපනය හේතු කොටගෙන ප්‍රතිලාභ රැසක් ලාංකිකයින්ට හිමිවිය. එනම්,

- සෑම දරුවෙකුට ම අධ්‍යාපනය ලබාදීම. (පාසල් යන වයසේ පසුවන දරුවන් අතරින් 90% ක් ම මධ්‍ය මහා විද්‍යාලවල හෝ ද්විතීක අධ්‍යාපන ආයතනවල ඉගෙන ගැනීම)
- කිසිඳු අවස්ථාවක් නොලැබූ දරුවන්ට විශ්වවිද්‍යාල වරම් හිමිවීම. (කලා විෂය ධාරා යටතේ මුලින් විශ්වවිද්‍යාල වරම් ලැබුණ ද පසුකාලීනව විද්‍යා හා ඉන්ජිනේරු විද්‍යාව හැදෑරීමෙහි පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු විය)
- ගම්බද දරු දැරියන්ට ද ශිෂ්‍යත්ව දිනා ගැනීමට හැකිවීම. (මීට පෙර නාගරික මධ්‍යම පාන්තික දරුවන්ට පමණක් හිමි වූ වරප්‍රසාදයක් විය. සෑම අයෙකුට ම සිය දක්ෂතා මත විවිධ අංශයන්හි ශිෂ්‍යත්ව දිනා ගැනීමට හා විවිධ තාක්ෂණික පුහුණුවීම් ලබාගෙන පෙරළා මෙරටට පැමිණ ශ්‍රී ලංකාවට විශාල සේවයක් කිරීමට මොවුන්ට හැකිවීම. එනම් සහජ හැකියාවක් ඇති දරු දැරියන්ට තම හැකියාවෙන් උපරිම ඵල නෙළා ගැනීමට අවස්ථාව ලැබීම)

**ගුරු විද්‍යාල**

නිදහස් අධ්‍යාපනයේ සාර්ථකත්වය ඇති කිරීම සඳහා අභ්‍යාස විද්‍යාල නමින් ආයතන පිහිටුවීම සඳහා කන්නන්ගර ක්‍රියා කළේය. ගුරුවරුන් පෙරටත් වඩා කාර්යක්ෂම කිරීම හා පුහුණු කිරීම මේවා පිහිටුවීමෙහි පරමාර්ථය විය (ද සිල්වා 1969: 601).

මේවා ගුරු විද්‍යාල නමින් හැඳින්වූ ගුරු පුහුණු අභ්‍යාස විද්‍යාල වේ. මෙකී ආයතන බිහිවීමට පෙර ගුරුවරුන් ශිෂ්‍යයින් විභාගවලින් සමත් කිරීම මත ඒ ඒ ගුරුවරයාගේ දක්ෂකම මැනගත හැකිවිය. මේ නිසා පන්ති කාමරය තුළ සාර්ථක ගුරුවරු බිහිවිය. එහෙත් ගුරු විද්‍යාලවලින් ගුරුවරයාට පුහුණුවක් සේම ගුරුවරයාට අධ්‍යාපනය ලබාදීමක් ද සිදුවිය.

ගුරු විද්‍යාලවල පුහුණුව වර්ෂ දෙකක කාලයකට සිමා වී ඇති අතර නේවාසිකව එකී පුහුණු අවස්ථාව ලබාගත යුතු විය. ගම්බද ස්වභාෂා පාසල්වලින් පැමිණි ගුරුවරුන්ට විශාල දැනුමක් ලබාගැනීමට මෙන්ම නේවාසිකව සිටීමෙන් මුහුණ දෙන විවිධාකාර අත්දැකීම් අවබෝධ කර ගැනීමටත් අවස්ථාව හිමි විය.

ගුරු විද්‍යාලවල වෘත්තිය විෂයයන්වලට අමතරව සංගීතය, නැටුම්, නාට්‍ය කලාව, ගෘහ විද්‍යාව, හස්ත කර්මාන්ත නොහොත් අත් වැඩ, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය අනිවාර්යෙන් ඉගැනීමට සිදුවිය. මෙයින් හික්මීම, චිත්ත ශක්තිය, ධෛර්යය, ආත්ම පරිත්‍යාගය හා නිර්මාණාත්මක කෞශල්‍යලයකින් යුක්ත පරිපූර්ණ ගුරුවරයෙකු බිහිවෙයි. මැහුම් ගෙතුම්, ඉහුම් පිහුම් යනාදී විෂයයන් අධ්‍යයනය කිරීමට කාන්තා ගුරුවරියන්ට හැකි වූ අතර පිරිමි ගුරුවරුන්ට පිරිමි විද්‍යාලවල වතු වැඩ පිළිබඳ දැනුමක් ලබාගැනීමට අවස්ථාව හිමි විය.

ගුරු විද්‍යාලවලින් පුහුණුව ලැබූ ගුරුවරු තම පාසල් වෙත ගොස් එකී දැනුම හා පුහුණුවෙන් ලද අවබෝධය දරුවන්ට විවිධ ක්‍රියාකාරකම් හරහා ලබාදීම සිදු විය. මේ තත්ත්වය මධ්‍ය මහා විද්‍යාලවල සාර්ථකත්වයට මහත් හේතුවක් විය.

**සමාලෝචනය**

කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපනය තුළින් අපේක්ෂා කළේ දැයේ දරු කැළ බුද්ධියේ කොටස්කරුවන් කිරීම තුළින් ලෝකයේ ඉහළ තැනක ඔසවා තැබීමටය. ස්වදේශීකත්වය රැක ගනිමින් ඉංග්‍රීසි අධ්‍යාපනය ද ලබාදෙමින් ලෝකය හා සම්බන්ධතා ගොඩනගා ගැනීම ද ඉඩහසර ලබාදීම එතුමාගේ නිදහස් අධ්‍යාපනයේ අභිලාශය වූවාට සැක නැත. නිදහස් අධ්‍යාපන වරම් ලැබ මේ වනවිට දශක 60ක් සපිරෙයි. වෙනස්වන සමාජයේ ඔහු බිහි කළ අධ්‍යාපන ක්‍රමය ගතානුගතිකව නිමැවුණු අනම්‍ය ව්‍යුහයක් තුළට සිරකිරීම කළ හැක්කක් නොවේ. මේ නිසා කන්නන්ගර අපේක්ෂා කළ, මහත් වෙහෙසක් දරා දිනාගත් නිදහස් අධ්‍යාපනය අනාගත දරු පරපුරට ද සුරුකීම වගකීමක් වන්නේය. නිදහස් අධ්‍යාපනයේ පියා ලෙසින් විරුධය ලත් ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මහතාට දැයේ දරුවන් ණයගැති වියයුතුය.

**මූලාශ්‍රය**


- දීපවංසය 1959 කේ. ඤාණවිමල හිමි, (සං) කොළඹ: ගුණසේන සහ සමාගම.
- මහාවංසය 1994 පී. බුද්ධදත්ත හිමි, (සං) කොළඹ: ගුණසේන සහ සමාගම.
- ආටිගල, නිකලස් (සංස්.) 2000 ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1 වන කාණ්ඩය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.
- ආටිගල, නිකලස් (සංස්.) 2000 ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 11 වන කාණ්ඩය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.
- එල්ලාවල, හේම. 1968 පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ.
- ඉලංගසිංහ, මංගල 1990 රජය, ආගම හා අධ්‍යාපනය (බ්‍රිතාන්‍ය පාලන සමය), විශ්වවිද්‍යාලයීය මු දණාලය, මොරටුව.
- සිල්වා එස්.එෆ් 1969 *ආචාර්ය* සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නනන්ගර ජනතාවගේ අධ්‍යාපනයට ඔහුගෙන් ඉටු වූ සේවාව ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය 1,11, කාණ්ඩ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව. පිටු. 597-604
- Hettiarachchi, S.B 1988 Social and Cultural History of Sri Lanka, New Delhi.

# ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අධ්‍යාපන දර්ශනය

**ආචාර්ය මනෝජ් හරිස්චන්ද්‍ර**
දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
manojih@kln.ac.lk.

**නිලන්ති බණ්ඩාර**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

nilu@kln.ac.lk

**ආචාර්ය දම්මි බණ්ඩාර**
අභිලේඛන හා නාණකවිද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
dammibandara@yahoo.com

**අසංක කෝදාගොඩ**
නාට්‍ය හා රංගකලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

අධ්‍යාපනය ප්‍රාප්තියක් කරා පුද්ගලයා රැගෙන යයි. එසේ වුවද අධ්‍යාපනය සඳහා විශ්වසාධාරණ පරමාර්ථයක් දැක්වීමට කරන උත්සාහය සාර්ථක නොවේ. සෑම අධ්‍යාපන පරමාර්ථයක්ම එම රටේ ජීවන දර්ශනය හා සම්බන්ධ වී පැවතීම එයට හේතුවයි. ප්‍රඥාව බිහිකිරීම අධ්‍යාපනයෙහි පූර්ණ පරමාර්ථය වන්නේ නම්, එය පුද්ගල හා සමාජ ප්‍රාප්තිය කෙරෙහි උපයෝගීතාවකින් පූර්ණ වූවකි. ප්‍රඥාව බිහිකිරීමේ අරමුණින් ගොඩනැගෙන අධ්‍යාපන පරමාර්ථයන් රටක ආගමික, දේශපාලනික, ආර්ථික, සාමාජික හා සංස්කෘතික බලපෑම් අනුව සකස් වේ. පුද්ගල ශක්තීන් හා විභවතාවන් මෙන්ම සමාජමය පරමාර්ථයන් ද අධ්‍යාපනය තුළ ප්‍රමුඛ වීමේ අවශ්‍යතාව පවතී.

ඉතිහාසයේ මුල් වරට  මිනිස් පෞරුෂය සෑම ආකාරයකින්ම වර්ධනය කිරීමේ පරමාර්ථය ඉලක්ක කරගත් සෝවියට් දේශය දැනුම, කුසලතා හා සමාජවාදී ආකල්පයන්ගෙන් ප්‍රමුදිත කොමියුනිස්ට් සමාජයක් අරමුණු කරගති. මානසික හා කායික ශ්‍රමය අගයන, උගත් සමාජීය අදහස් සහිත මූලික පරමාර්ථයන්ගෙන් මහජන චීනයේ අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් වුණි. ජපානය සාමකාමී, ස්වාධීන ජීවයකින්  යුක්ත සත්‍ය හා සාධාරණත්වය ඇලුම් කරන ශ්‍රමාභිමානයෙන් යුතු කායික හා මානසික නිරෝගී හා මනා පෞරුෂයකින් හෙබිවූවන් බිහිකිරීමේ අරමුණින් අධ්‍යාපන පරමාර්ථ ගොඩනැගුවේය. ආත්ම සාක්ෂාත්කරණය ෑකේජඑම්කස'එසදබ), මානුෂීය සබඳතා. ආර්ථික කාර්යක්ෂමතාව හා ප්‍රජා වගකීම් ආශ්‍රිත අරමුණු පුළුල් පරමාර්ථ කරගනිමින් ඇමරිකා එක්සත් ජනපදයෙහි අධ්‍යාපන පරමාර්ථ ගොඩනැගුණු අතර, එක්සත් රාජධානිය වයස, හැකියාව හා අභියෝගතාවන්ට සුදුසු අධ්‍යාපනයක් ලබාදීමේ හා වෘත්තීය කුසලතා අගය කිරීමේ අරමුණින් අධ්‍යාපන පරමාර්ථයන් ගොඩනගා තිබේ.

අධ්‍යාපන පරමාර්ථ හඳුන්වා දෙමින් ඉදිරිපත් කළ ප්‍රථම වාර්තාව ශ්‍රී ලංකාවෙහි වර්ෂ 1944 මැයි මස 30 වන දින ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් තරන ලදී. එහිදී අධ්‍යාපන පරමාර්ථ ලෙස ඉදිරිපත් වූයේ චරිත පුහුණුවක් හා පුරවැසියෙකු මෙන් යහපත් පැවැත්මය. එසේම ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයකට යෝග්‍ය වූ අධ්‍යාපනයේ දියුණුව කවර ලෙසකින්වත් සීමා නොකරන බවට මතක් කිරීමක්ද එහි විය.[1] වර්ෂ 1964 ජාතික අධ්‍යාපන ක්‍රමයක් උදෙසා යෝජනා ඉදිරිපත් කළ අධ්‍යාපන ධවල පත්‍රිකාවද, වර්ෂ 1966 ඉදිරිපත් වූ සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන ලද කමිටු වාර්තාවද අධ්‍යාපන පරමාර්ථයන් වෙන් වෙන්ව දක්වා තිබේ.

"නිදහස් අධ්‍යාපනයේ පියා" යන විරුදාවලිය ලැබූ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා රාජ්‍ය සභාවේ අධ්‍යාපන ඇමතිවරයා විය. අධ්‍යාපනය යනු, පුද්ගලයෙකුගේ අනාගතය වෙනුවෙන්

---

[1] Dr. Upali,M.S.,Lec.27

කරන ආයෝජනයක් මෙන්ම ලෝකය වෙනස් කිරීම සඳහා පාවිච්චි කළ හැකි බලගතු ආයුධය ද වන බව පැවසූ ආචාර්ය කන්නන්ගර මහතා ප්‍රඥාව යනු, විනාශය නැතිකර දමන ආයුධය බවත් කෙතරම් බලගතු සතුරෙකුටවත් විනාශ කළ නොහැකි බලකොටුව වන්නේ ද එය බවත් පැවසූ අතර සරළව හඳුන්වන කල අධ්‍යාපනය යනු, සාක්ෂරතාව, ගණිත හැකියාව සහ පොදුවේ පිළිගන්නා කිසියම් දැනුම් සම්භාරයක් ලබා දීම බවත් පෙන්වා දෙන ලදී.[2]

සැමට සමාන අධ්‍යාපන අයිතියක් ලබාදීමේ අරමුණින් කටයුතු කළ ආචාර්ය කන්නන්ගරයන් අධ්‍යාපනය යනුවෙන් අරමුණු කරන ලද්දේ ද සාක්ෂරතාව දියුණු කිරීම පමණක් නොවේ. සාක්ෂරතාවෙන් පිරිපුන් පුද්ගල මිනිසුන්ගෙන් සමන්විත සමාජ පරිසරයක ඒ හා සාපේක්ෂවම සංවර්ධනය වියයුතු බොහෝ ස්වභාවයන්, තත්ත්වයන් හා අවශ්‍යතාවන් දෙස ඔහුගේ ව්‍යවහාරික පරිකල්පනය යොමුවුනි. අධ්‍යාපනය සැම මිනිසෙකුගේම අවශ්‍යතාවක් ලෙස හඳුනාගත් ආචාර්ය කන්නන්ගරයන් ඒ තුළින් සැම අයෙකුටම යහපත් ජීවන දර්ශනයක් හා පැහැදිලි ජීවන පටිපදාවක් ගොඩනංවා ගැනීමට අවශ්‍ය පදනම, ශක්තිය ලබාදීමේ අවශ්‍යතාව පිළිගති.

කාර්මීකරණයේ හා නාගරීකරණයේ බලපෑම් හේතුවෙන් පුළුල් සමාජීය පරිවර්තනයකටත් පශ්චාත් යුද සමයක පසු ප්‍රතිඵලයන්ටත් සමස්ත ලෝක ඉතිහාසයම මුහුණ දෙමින් සිටි සංක්‍රාන්තික විවිධත්වය හමුවේත් ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාණන් විශිෂ්ට වූ අධ්‍යාපන පරමාර්ථයක් හා මානුෂවාදී සමාජ මෙහෙවරක් ඉටුකළ අමරණීය චරිතාපදානයකි. එතුමා ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රියාවලිය අධ්‍යාපන ක්‍රියාවලිය මානුෂවාදී මගකට යොමුකළ නියමුවාණන්ය. ආචාර්ය කන්නන්ගර හා ඔහුගේ ආධාරකරුවෝ රට පුරා විශාල ව්‍යාපාරයක් ගෙනගියහ. එනම්, නිදහස් අධ්‍යාපනයේ අගය සාමාන්‍ය ජනතාවට පහදා දීමේ ව්‍යාපාරයයි. එකල රට තුළ ඉංග්‍රීසි කථාකරන ප්‍රභූ පන්තිය සඳහා එක් අධ්‍යාපන ක්‍රමයක් හා දේශීය භාෂාව කතා කරන අති බහුතරය සඳහා තවත් අධ්‍යාපන ක්‍රමයක් ද පැවති අතර, අධ්‍යාපනය තුළ පවතින මෙම පන්තිභේදය තුළින් දෙවැනි පන්තියේ ශිෂ්‍යයින් බිහිකිරීම තමාට අවශ්‍ය නොවන බව හා අධ්‍යාපන පරමාර්ථ සාධනයෙහි සමානත්ව අවශ්‍යතාව ඔහු සිය නිදහස් අධ්‍යාපන පරමාර්ථයන් තුළින් ප්‍රායෝගිකව සමාජගත කරන ලදී.

ප්‍රායෝගික අධ්‍යාපනය, ආගමික අධ්‍යාපනය, කෘෂිකාර්මික අධ්‍යාපනය, හස්තකර්මාන්ත පුහුණුව, සෞන්දර්ය අධ්‍යාපනය තුළ සවිබල ගැන්වූ ආවශ්‍යක අධ්‍යාපන පරමාර්ථයන් කන්නන්ගර අධ්‍යාපන දාර්ශනික ප්‍රතිපත්තීන් සතුවීම අද්විතීයය. ග්‍රීක මහා දාර්ශනික ප්ලේටෝ, ඇරිස්ටෝටල්, ස්වභාවවාදී අධ්‍යාපනික දර්ශනයක් හඳුවාදුන් ජීන් ජැක් රූසෝ, උපයෝගිතාවාදී අධ්‍යාපනික දාර්ශනික ජෝන් ඩුවී මෙන්ම කාල් මාක්ස්, මහත්මා ගාන්ධි චින්තනයන් ඇසුරින් ගොඩනගාගත් දාර්ශනික අධ්‍යාපන ක්‍රමවේදයක් කන්නන්ගර අධ්‍යාපන දර්ශනය තුළ පිළිඹිබු වේ.

රටෙහි අධ්‍යාපන අවශ්‍යතාව හා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ප්‍රවේශයන් මත ගොඩනැගිය යුතු සාඵල්‍ය අධ්‍යාපන (ැඉෙජඑසඩැ කැ්රබසබට) ක්‍රමවේදයක් දෙස ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ මෙතෙක් අවධානය යොමු කළ එකම ප්‍රායෝගික මිනිසා කන්නන්ගරයන්ය. න්‍යායාත්මක, සෛද්ධාන්තික දැනුම පෙන්වන හුදු බුද්ධිමතුන්, අධ්‍යාපනඥයින් අතර ඔහු ප්‍රායෝගික අධ්‍යාපන දාර්ශනිකයෙකි. අධ්‍යාපන මනෝවිද්‍යාඥයෙකි. අධ්‍යාපන අරමුණු සහ ජීවන අරමුණු අතර සමෝධායක් ගොඩනැංවෙන ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වාදුන් විශිෂ්ට අධ්‍යාපන නියාමකවරයා ඔහුය.

වර්ෂ 1944 මැයි මස තිස්වනදා හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපන යෝජනා ක්‍රමය තුළ කන්නන්ගර අධ්‍යාපන දර්ශනය මැනවින් ස්ඵුට වේ.

- කිසිදු භේදයකින් තොරව බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වාම කිසිදු අයකිරීමකින් තොර නිදහස් අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව සැලසීම
- ප්‍රාථමික, ද්විතීයික හා ප්‍රායෝගික ලෙස තෙවර්ගික පාසල් ක්‍රමයක් හඳුන්වා දීම
- මධ්‍ය විද්‍යාල හඳුන්වාදීම
- වැඩිහිටියන් සඳහා රාත්‍රී පාසල් ක්‍රමයක් හඳුන්වා දීම

[2] අබේපාල, ආර්.,2019,පි.86

- ආගම පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම
- පාසල් ගුරුවරුන් සඳහා ස්ථිර මාසික වේතන ක්‍රමයක් හඳුන්වා දීම
- විෂයමාලා අශ්‍රිත විභාග ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම
- ස්වාධීන විශ්වවිද්‍යාල ක්‍රමය හඳුන්වාදීම[3]

නිසි ප්‍රාථමික අධ්‍යාපනයේ අවශ්‍යතාව ප්ලේටෝ, රූසෝ වැනි දාර්ශනිකයන් විසින් ද සිය අධ්‍යාපන චින්තනයන් තුළදී පෙන්වා දී තිබේ. අධ්‍යාපනය තුළ සංගීතය හා ශාරීරික අභ්‍යාස අනිවාර්ය විය යුතු බව දක්වන ප්ලේටෝ සංගීතය යනුවෙන් සෞන්දර්යවාදය ද ශාරීරික අභ්‍යාස යනුවෙන් ශාරීරික ප්‍රාගුණ්‍ය හා නීරෝගීතාව සම්බන්ධ සියල්ලම ද අදහස්කර තිබේ.[4] ගාම්භීර බව, විනීත බව හා ධෛර්යය අධ්‍යාපනය මගින් පුරුදු පුහුණු කළ යුතු ගුණාංග බව ද ඔහු තවදුරටත් පෙන්වා දෙයි.[5] පරිසරය, මිනිසුන් හා ද්‍රව්‍යයන් ඇසුරින් අධ්‍යාපනය ලැබිය යුතු බව හා ශාරීරික ක්‍රියාකාරකම් මගින් මනස පුහුණු කිරීමේ අධ්‍යාපන අවශ්‍යතාවක් සම්පූර්ණ වියයුතු බව ජීන් ජැක් රූසෝ ප්‍රාථමික අධ්‍යාපනය ආශ්‍රිතව ඉදිරිපත් කරන අදහසයි.

ආචාර්ය කන්නන්ගර මහතා ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්තීන් කෙරෙහි කාල් මාක්ස්ගේ අධ්‍යාපන දර්ශනයේ පසුබිම ද බලපෑම්කාරී වූ බවට අභ්‍යුපගමනයන් ඉදිරිපත් කළ හැකිය. අධ්‍යාපන ආයතන සියල්ලම පාහේ කිසිදු අයකිරීමකින් තොරව ප්‍රජාව සඳහා විවෘත විය යුතුබව සේම පල්ලියේ හා රජයේ ඇඟිලිගැසීම්වලින් නිදහස් වියයුතු බව ද විශ්වාස කළ මාක්ස් ඒ මත පුද්ගලයා ගැති බවින් මුදවා ගැනීමටත් ශිෂ්‍යයාගේ පූර්ණ වර්ධනයක් ඇති කිරීමටත් අවකාශ ගොඩනැගෙන බව පෙන්වාදෙන ලදී. සියලු ළමුන්ට පොදු නිදහස් අධ්‍යාපනයක් හෙවත් ජාති, කුල, ගෝත්‍ර හෝ දුප්පත් පොහොසත් හෝ භේදයක් නොමැතිව මූලික අධ්‍යාපනය ලබාදීම වැදගත් වන බව මෙන්ම එවැනි අධ්‍යාපනයක් තුළින් මිනිසාට තම යථාස්වභාවය අවබෝධකර ගැනීමට හා ගැති බවින් මිදී විමුක්තිය ලබාගත හැකි බවත් එලෙස නොමිලයේ ලබාදෙන අධ්‍යාපනය මගින් මිනිසාගේ යටපත්ව ඇති සත්භාවය මතුකර ගැනීම සඳහා රුකුල් සපයන බව ද මාක්ස්ගේ අධ්‍යාපන දර්ශනයේ සාරයයි.[6]

කන්නන්ගර අධ්‍යාපන පරමාර්ථයන් තුළ "ආගමික අධ්‍යාපනය" (ඍැකසටසදම් ඉාමජ්එසදබ) අනිවාර්ය අධ්‍යාපන අවශ්‍යතාවක් වුවද, ආගමික නැඹුරුව සහිත මිෂනාරී පාසල් ක්‍රියාත්මක වීම ඔහු අනුමත නොකළේය. කන්නන්ගර දර්ශනයට අනුව රටපුරා ක්‍රියාත්මක වියයුත්තේ රජයේ පාලනයට යටත් එකම පාසල් පද්ධතියක් පමණි. කුමන හෝ ආගමික නැඹුරුතාවකින් යුතු පාසල් ජාතික අධ්‍යාපන ක්‍රමයට අවහිරයක් වන බැවින් ආගමික පාසල් ඔහු අනුමත නොකළේය. සියලු ආගමික පාසල් රජයේ පාලනය යටතට ගැනීමේ යෝජනාවක් ඔහු ඉදිරිපත් කළ ද අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව එම යෝජනාව අනුමත නොකළේය. රටපුරා ක්‍රියාත්මක වන එකම අධ්‍යාපන ක්‍රමයක් පිළිබඳ ඔහුගේ සිහිනය එලෙස බිඳ වැටුණි. ආචාර්ය කන්නන්ගරයන්ගේ බිඳවැටුණු එම සිහිනයෙහි අතුරු විපාකයන් රැසකට වර්තමානයේ අපි මුහුණ පා සිටිමු. රජයේ පාලනයෙන් වියුක්ත ආගමික පාසල් හි අධ්‍යාපන අරමුණු හා ප්‍රතිපත්තීන් සාමකාමී සමාජ ජීවිත බිඳදමා අන්තවාදීත්වයන් කර මෙහෙයුම් ලක්ෂයන් ක්‍රියාත්මක කිරීමේ පදනම් ව්‍යාප්තකර අසමගිතාවන්, ප්‍රචණ්ඩත්වයන් හා හිංසාකාරීත්වයන් සමාජගත කිරීමට වර්තමානයේ මිනිස් ආයුධයන් තනමින් සිටී.

කන්නන්ගර අධ්‍යාපන දර්ශනය ප්‍රාථමික අධ්‍යාපනය සේම ද්විතීයික අධ්‍යාපනය මිනිස් සමාජ ශෝධනයෙහි අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් ලෙස සලකන ලදී. ද්විතීයික අධ්‍යාපනය ලෙස සලකන ලද්දේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයයි. කන්නන්ගර දර්ශනය පෙන්වා දෙන ලද්දේ රටෙහි තරුණ ජනයා වැඩලෝකය සඳහා සූදානම් කිරීම අධ්‍යාපනයෙහි අරමුණු අතර වියයුතු බවයි.[7] ඔහු ඉදිරිපත් කළ ප්‍රායෝගික පාසල් තුළින් අරමුණු කරන ලද්දේ මෙම ප්‍රායෝගික සමාජ අවශ්‍යතාවයි. රටක

---

[3] Dr. Upali,M.S.,Lec.27
[4] රසල්, බී., 1970, පි. 127
[5] එම
[6] අධ්‍යාපනයේ දාර්ශනික පදනම, ජාතික අධ්‍යාපන ආයතන ප්‍රකාශන, පි. 105
[7] Dr. Upali,M.S.,Lec.27

කෘෂිකාර්මික සමෘද්ධිය ඉහළ ආර්ථික, පාරිසරික හා මානසික උපයෝගීතාවක් ලෙස අභ්‍යුපගමනය කළ හේතුවෙන් ඔහු ප්‍රායෝගික පාසල්, කෘෂිකාර්මික පාසල් ලෙස නම් කරන ලදී. "හන්දෙස්ස පාසල්" (ජ්බාි්‍රී ජයදදකි) හෙවත් "මධ්‍ය විද්‍යාල" (කැබඑර්ක කැකකැටිෑ) ලෙස නම්කළ මෙම පාසල් 243ක් හඳුන්වාදෙන ලදී.[8] කෘෂිකර්මය, ගෘහ කර්මාන්ත හා හස්ත කර්මාන්ත පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් මෙම පාසල් හරහා ලබාදුනි. මෙම පාසල් කොළඹ රාජකීය විද්‍යාලයේ මට්ටමින් පවත්වාගෙන යාම කන්නන්ගර මහතාගේ අරමුණ විය. පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත්වන සියලු සිසුන්ට මෙම මධ්‍ය විද්‍යාලයක ආහාරපාන, නේවාසික පහසුකම් සහිතව 6 වන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය දක්වාම නොමිලයේ අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමේ අවස්ථා ද සලසා දුනි.

ප්‍රායෝගික දාර්ශනික කාර්යාවලියක් පදනම්ව ගොඩනැගි කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිපත්තීන්හි අභිලාසය සාක්ෂරතාව මත පමණක් ගොඩනොනැගි වෘත්තීය, සමාජයීය හා මානසික සංවර්ධනයන් ද අරමුණු කරගත් ආදර්ශයන් වීම නිදහස් අධ්‍යාපනයෙහි උපයෝගිතාව පිළිබඳ සාක්ෂ්‍ය සැපයීමක් හා සමානය. අධ්‍යාපනයෙහි අවශ්‍යතාව මෙන්ම අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ඇතිකරගත යුතු කාර්යක්ෂමතාව, මානසික සංවර්ධනය කෙරෙහිද සී. ඩබ්. ඩබ්. කනනන්ගරයන්ගේ අවධානය යොමුවිය. වර්ෂ 1943 දී අධ්‍යාපනය සම්බන්ධ විශේෂ කොමිසම හරහා ඔහු පහත දැක්වෙන අධ්‍යාපනයෙහි සුවිශේෂ අරමුණු ත්‍රිත්වය ඉදිරිපත් කරන්නේ එම අදහස් සනාථ කරමිනි.

1 මානසික සංවර්ධනය හෝ මානසික සංයමය

2 සංස්කෘතියට අනුගත චරිතය

3 කාර්යක්ෂමතාව[9]

අධ්‍යාපනය තුළින් පොතපතින් ලබන දැනුම පමණක් නොව, මානසිකත්ව සංවර්ධනය, මානසික සංයමය ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබේ. මානසික ශක්තිය, අභිප්‍රේණය, නිවැරදි ප්‍රජානනය, මානසික ඒකාග්‍රතාව, චිත්තවේග කළමනාකරණය තුළින් තම ජීවිතයට ප්‍රශස්ථ ලෙස මුහුණ දීමේ හැකියාව පුද්ගලයා සතුවිය යුතු අත්‍යවශ්‍ය කුසලතාවන් ලෙස කන්නන්ගර දර්ශනයෙහි අවධානයට ලක්වුණි. සංස්කෘතියට අනුගත චරිතය යනුවෙන් අර්ථවත් කරන ලද්දේ තමා ජීවත්වන සමාජ සංස්කෘතික පරිසරයට ගැළපෙන ලෙස ගොඩනගාගත් සාධනීය පෞරුෂත්වය පිළිබඳ අදහසයි. සමාජානුගත පෞරුෂයන් පුද්ගලයා ලබන සාධනීය අධ්‍යාපනයෙහි ප්‍රායෝගික හා නිරෝගිමත් පිළිඹිබුවකි. කායික හා මානසික කාර්යක්ෂමතාව ජීවන නිපුණතාවක් ලෙස පුද්ගලයා විසින් ගොඩනගාගනිමින් පවත්වාගෙන යායුතු බව ද කන්නන්ගර අධ්‍යාපන දර්ශනය තුළින් අර්ථවත් වේ.

නූතන සමාජගත මිනිස් බහුතරයන් වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තීන් හා සමාජ තරගකාරීත්වය මත පීඩනයට පත්ව සිටිය ද නිදහස් අධ්‍යාපනය යනු ඔවුන් සැම ලද මහගු අවස්ථාවකි. විෂයමාලා පසුපස හඹායමින් අධ්‍යාපන අභිමතාර්ථයන් සාධනය කිරීමට යුහුසුලු වන නූතන පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට ආලෝකමත් ප්‍රවේශයක් ලබාදීමට ප්‍රායෝගික අධ්‍යාපනය, කෘෂිකාර්මික අධ්‍යාපනය, මානසික සංවර්ධනය, පෞරුෂ අනුගතතාව, කාර්යක්ෂමතාව ආශ්‍රිත උපයෝගීතාවන් පිළිබඳ යළි දැනුවත් කිරීමේ නූතන සමාජ අවශ්‍යතාවක ආවශ්‍යකතාව පිළිබඳ වර්තමානයේ දැනුවත් විය යුතුව ඇත. ඒ සඳහා මගපෙන්වීම් ලබාදෙන අධ්‍යාපන ක්‍රමවේදයක අවශ්‍යතාව පිළිබඳ අධ්‍යාපනඥයින්, අධ්‍යාපන මනෝවිද්‍යාඥයින්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නියුතු සියල්ලන්ගේ අවධානය යොමුවිය යුතු 21 වන සියවසට අප පැමිණ ඇත. ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා විසින් හඳුන්වාදුන් අධ්‍යාපන න්‍යායපත්‍රයට අනුව කුසලතා පදනම් කරගත් අධ්‍යාපන පරමාර්ථයනට ළමා සහ තරුණ පරපුර ප්‍රවේශ කිරීම සඳහා කන්නන්ගර නිදහස් අධ්‍යාපන අයිතියෙහි දයාද උරමකරුවන් වන ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්ෂේත්‍රයට දායක අපසැමට නැවතත් කාලය එළඹ ඇත.

[8] Dr. Upali,M.S.,Lec.27
[9] Dr.Sunethra,K., Lec.29

**මූලාශ්‍රය**


1 Dr. Upali,M.Sedere., Educational Reforms Beyond Kannangara for the 21st Century, Dr. C.W.W.Kannangara Memorial Lecturer; 27, 12/10/2016

2 අබේපාල, රෝලන්ඩ්.,2019, අධ්‍යාපන දර්ශනයේ පෙරදිග චින්තන පැතිකඩ, සාර ප්‍රකාශන, කොට්ටාව.

3 Dr. Upali,M.Sedere., Educational Reforms Beyond Kannangara for the 21st Century, Dr. C.W.W.Kannangara Memorial Lecturer; 27, 12/10/2016

4 රසල්, බර්ට්‍රන්ඩ්., 1970, බටහිරදර්ශන ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

5 එම

6 අධ්‍යාපනයේ දාර්ශනික පදනම,1989, ජාතික අධ්‍යාපන ආයතන ප්‍රකාශන, මහරගම

7 Dr. Upali,M.Sedere., Educational Reforms Beyond Kannangara for the 21st Century, Dr. C.W.W.Kannangara Memorial Lecturer; 27, 12/10/2016

8 Dr. Upali,M.Sedere., Educational Reforms Beyond Kannangara for the 21st Century, Dr. C.W.W.Kannangara Memorial Lecturer; 27, 12/10/2016

9 Dr.Sunethra,K., Educational Reforms Beyond Kannangara for the 21 st Century, Dr. C.W.W.Kannangara Memorial Lecturer; 29, 15/10/2018

# නිදහස් අධ්‍යාපනයේ මුදුන් මල්කඩ වූ මධ්‍ය විද්‍යාලඃ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය හෙවත් පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය

**ආචාර්ය නලින් වර්ණජිත්**
මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.
nwarnajith@kln.ac.lk

**ආචාර්ය දම්මි බණ්ඩාර**
අභිලේඛන හා නාණකවිද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
dammibandara@gmail.com

**නිලන්ති බණ්ඩාර**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
nilu@kln.ac.lk

**ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර**
දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
manojih@kln.ac.lk

## හැඳින්වීම

ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව මෑත ඉතිහාසයේ දී නිදහස් අධ්‍යාපන වරම් හිමිකර ගැනීමට තරම් ශ්‍රී ලාංකිකයෝ භාග්‍ය සම්පන්න වූහ. ශ්‍රී ලාංකිකයන් විසින් ඒ නිදහස් අධ්‍යාපන වරම් භුක්ති විඳින්නේ ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර නැතහොත් ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මහතා නිසා ය. ඒ නිසා ම මොහු නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුදයෙන් ද හඳුන්වයි.

ආචාර්ය කන්නන්ගර 1931 සිට 1947 දක්වා රජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා විය. තුන් කල් බැබළ වූ ඒ ශ්‍රේෂ්ඨ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නොයෙක් බාධාවන් හමුවේ ඉදිරිපත් කරන ලද පනත් දෙකක් මධ්‍යම පාන්තික ශ්‍රී ලාංකිකයන්ට අතිශයින් වැදගත් ය. ඒ 1939 අංක 31 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය හා 1945 අංක 21 දරණ නිදහස් අධ්‍යාපන පනත යි. ඒවා එතෙක් ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමය නව මාවතකට යොමු කළ අතිශය වැදගත් තීරණාත්මක සාධකය විය. එමගින් එතුමා අපේක්ෂා කළේ ජාති, ආගම්, කුල, වත් පොහොසත්කම් නොතකා සෑම දරුවෙකුට ම බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපන ප්‍රතිලාභ ලබාදීමටයි.

ඓතිහාසික නිදහස් අධ්‍යාපනය යෝජනාවලිය රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළ - පැය හයකට අධික දීර්ඝ කාලයක් තිස්සේ පැවති - කතාවේ ආරම්භයෙන් ම ආචාර්ය කන්නන්ගරගේ අපේක්ෂාවේ ප්‍රබලත්වය විශද වේ. එතුමා තම කතාව ආරම්භ කර ඇත්තේ "නොයෙනා හිරු රැස් සිඳු ගැබ පතුළට - අගනා මිණි කැට අඳුරෙම සැඟවෙ ද - පිපෙනා කුසුමන් වනයෙහි නිම නැත - හමනා සුළඟින් වනෙයෙම පරවෙත" යන තෝමස් ග්‍රේරේ නම් සුප්‍රකට කවියාගේ කවියකිනි. ඒ අප්‍රතිහාත කැපකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1945 ජුලි මාසයේ දී "අනගි මුතු ඇටය" නමින් හැඳින්වූ නිදහස් අධ්‍යාපන පනත සම්මත විය.

දූයේ දහසක් දූ දරුවන්ගේ හා දෙමාපියන්ගේ අපේක්ෂා මල්ඵල ගන්වමින් 1945 ඔක්තෝබර් මස පළවෙනි දා සිට එම පනත බලාත්මක විය. මධ්‍ය මහා විද්‍යාල සංකල්පය බිහි වූයේ මේ නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙසිනි. මේ අනුව ශ්‍රී ලංකාවේ බිහි වූ පළමු මධ්‍ය මහා විද්‍යාලය වන්නේ මතුගම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර විද්‍යාලයයි. ඉන්පසුව වීරකැටිය, කාත්තන්කුඩිය, මාවතගම, වේයන්ගොඩ සහ දික්වැල්ල යන ස්ථානවල මුල් ම මධ්‍ය විද්‍යාල බිහිවිය. මෙයට අමතරව හොඳම පාසැල් ගමට ගෙන ඒමේ අරමුණින් එක් ඡන්ද දායක කොට්ඨාශයකට එක් මධ්‍ය මහා විද්‍යාලයක් අයත් වන ආකාරයට මධ්‍ය විද්‍යාල ඉදිකරන ලදී. 1947 කන්නන්ගර යුගය අවසාන වන විට මෙවැනි මධ්‍ය මහා විද්‍යාල 54 ක් බිහිව තිබුණි.

කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපන පරිසරයට සෑම අතින් ම සමාන පහසුකම් මධ්‍ය විද්‍යාලවලට ලබා දීමට ආචාර්ය කන්නන්ගර උත්සුක විය. ද්විතීය ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදෙන පෝෂිත පාසැල් ලෙස කටයුතු කිරීම මධ්‍ය විද්‍යාලවලින් අපේක්ෂිත ඉලක්කය විය. එහෙයින් ඒවා හය වන ශ්‍රේණියෙන් ඉහළ පන්ති පමණක් පැවැත් විණි. පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් සහ ප්‍රවේශ පරීක්ෂණයනික් සමත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙම මධ්‍ය විද්‍යාලවලට බඳවාගන්නා ලදී. මධ්‍ය විද්‍යාලවල නොමිලේ නේවාසික පහසුකම් සපයා දෙන ලද හෙයින් බාහිර ක්‍රියාකාරකම් මගින් සමබර පෞරුෂත්වයක් ගොඩනගා ගැනීමට සිසුන්ට අවස්ථා සැලසුණි. ප්‍රස්තුතයේ කියැවෙන්නේ අධ්‍යාපනයේ මුදුන් මල්කඩ වූ මෙම මධ්‍ය විද්‍යාල අතරින් එකක් පිළිබඳ විස්තරයකි. මෙම විදුහල සබරගමුව පළාතේ මෙන් ම ශ්‍රී ලංකාවේ කීර්තිමත් පාසැල් අතරින් එකකි.

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 167 ගනේගම ග්‍රාම නිලධාරි වසමේ පැල්මඩුල්ල නගරයට ආසන්නව මෙම පාසැල පිහිටා තිබේ. වර්තමානයේ එය හඳුන්වන්නේ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය යන නමිනි. සියවසකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියන මේ විද්‍යාලය විවිධ සන්ධිස්ථානයන් පසු කරමින් අද ශ්‍රී ලංකාවේ කීර්තිමත් පාසැල් අතරින් එකක් ලෙස වැජඹෙයි.

#### ගන්කන්ද මැදි විදුහලේ සමාරම්භය

මුලින් ම මෙම විදුහලේ ආරම්භ සනිටුහන් වන්නේ 1929 වර්ෂයේ දී ය. පැල්මඩුල්ල රාජමහා විහාරයේ එවක විහාරාධිපති හාල්දෑවන ධම්මරක්ඛිත හිමියන්ගේ මැදිහත්වීම මෙහි දී කැපීපෙනුණි. මෙම විදුහල පිහිට වූයේ ප්‍රදේශයේ සිංහල බෞද්ධ දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ පරමාර්ථයෙනි. විද්‍යාලය සකස් කිරීමට භූමියක් මෙන් ම එහි කටයුතු කරගෙන යාම සඳහා ධනය ද පරිත්‍යාග කරන ලද්දේ ගන්නක්දේ මුහන්දිරම්ලාගේ පුංචිමහත්මයා, ගන්කන්දේ මුහන්දිරම්ලාගේ හීන්මහත්තයා සහ ගන්කන්දේ මුහන්දිරම්ලාගේ ඩිංගිරිමහත්තයා යන තුන් සොහොයුරන් ය. 1929 මාර්තු මස 3 වන දින "එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර විද්‍යාලය" යන නමින් මෙම විද්‍යාලය ආරම්භ විය. ශ්‍රීමත් ඩී.බී ජයතිලක මැතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් මේ පාසල විවෘත කිරීමේ මංගල අවස්ථාව සඳහා ප්‍රදේශයේ ගිහි පැවිදි බොහෝ දෙනෙක් සහභාගි වූහ.

ආරම්භක අවස්ථාවේ සිසුහු 40 ක් මේ මිශ්‍ර පාසලට ඇතුළත් වූහ. ඔවුන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා තිබුණේ තල්කොළ සෙවිලි කළ කුඩා ගොඩනැගිල්ලක් පමණි. මෙම කුඩා ගෙඩනැගිල්ලෙහි මාර්තු මස 7 වන දින පැවති සුබ මොහොතින් ඉගැන්වීමේ කටයුතු ආරම්භ කරන ලදි. එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාසල් සිසුන්ට සිප් නැණ ලබාදුන් ප්‍රථම ගුරුවරුන් වීමේ ගෞරවය හිමිවන්නේ ඩී.එච්. සුදසිංහ ගුරු පියාණන්ට සහ සෝමාවතී දරණගම ගුරු මෑණියන්ට ය. කේ.බී හේරත් ගුරුතුමා තම මාසික වේතනය මෙම විදුහලට උඩරට නැටුම් ගුරුවරයෙකු ගැනීම වෙනුවෙනු පරිත්‍යාග කළේය. මෙම විදුහලේ ඉංග්‍රීසි ගුරුවරයා මෙන් ම ඉහළ පන්තිවල සිංහල ගුරුවරයා වූයේ ද ඔහු ම ය. ඕ.එස් අර්සකුලසූරිය මහතා මෙහි ප්‍රථම මුල් ගුරුතුමා විය.අනතුරුව පී.එම් පෙරේරා, එස්. කරුණානායක, එම්. ලියනෝරිස් යන මුල් ගුරුවරුන් ද මෙම එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ දියුණුව වෙනුවෙන් ඉටු කළ සේවය පැසසුමට ලක්විය යුතු ය.

එවකට ප්‍රාථමික හා පශ්චාත් ප්‍රාථමික යන අංශ දෙකම මෙම විදුහලේ විය. එම නිසා දිනෙන් දින ඉහළ යන සිසු පිරිසට පාසැල් ඉඩකඩ මෙන් ම ගුරුවරුන් ලබා දීමේ ගැටළු ද ඇති විය. එකී අවශ්‍යතා සපුරාලීම සඳහා තම ධනය වැය කිරීමට ගන්කන්ද මුහන්දිරම්ලාගේ පුංචිමහත්තයා නොපසුබටව ඉදිරිපත් විය. ඔහු අනුව යමින් අනෙක් සහෝදරයන් දෙදෙනා සහ ගම්වැසියෝ කිහිපදෙනෙක් ද තම ගම් පියසේ වෙසෙන දරුවන්ගේ අධ්‍යාපනය කාර්යය සාර්ථක කර ගැනීමට දායක වූහ.

#### එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර විද්‍යාලය මධ්‍ය මහා විද්‍යාලයක් වීම

ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාගේ නිදහස් අධ්‍යාපන සංකල්පය යටතේ එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාඨශාලාව මධ්‍ය මහා විද්‍යාලයක් බවට පරිවර්තනය විය. පැල්මඩුල්ල රාජමහා විහාරයේ විහාරාධිපති ධූරන්දර හාල්දෑවන ධම්මරක්ඛිත හිමි, ගන්කන්ද තුන් සහෝදයෝ මෙන්

ම එවකට පාර්ලිමේන්තුවේ කථානායක වූ එච්.එෆ්. මොළමුරේ යන අය මෙම විදුහල මධ්‍ය විද්‍යාලයක් කිරීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරූහ. ඒ අනුව 1946 ජනවාරි මස 03 වන දින නිදහස් අධ්‍යාපනයේ පියා අතින් මෙම මධ්‍ය විද්‍යාලය විවෘත විය. ඒ වනවිට එහි ශිෂ්‍ය සංඛ්‍යාව 423 දක්වා වර්ධන වී තිබුණි. එහි පළමු විදුහල්පතිතුමා වූයේ ටී.සී.අයි. ඒකනායන මහතා ය. එදා එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාසලේ මුල්ගුරුතුමා වූ එස්. කරුණානායක මහතාගේ නොමසුරු සහාය ද එම්. ඩබ්. පී. ද සිල්වා, ඊවා ප්‍රනාන්දු යන ගුරු මහත් ම මහත්මීන්ගේ සහාය ද එතුමාට නොඅඩුව ලැබුණි.

මෙම විද්‍යාලයට නව ගොඩනැගිල්ලක් එක් විය. 1948 වන විට ගුරුමණ්ඩලයට බැඳුණු නන්දසේන ලබුතලේ මහතා විසින් සිසුන්ගේ පෞරුෂ වර්ධනය කිරීමේ අරමුණින් බාලදක්ෂ ව්‍යාපාරය හඳුන්වා දෙන ලදි. ටී.සී.අයි. ඒකනායක මැතිනිය බාලදක්ෂිකා ව්‍යාපාරයක් ද ආරම්භ කළාය. එසේ ම ශිෂ්‍යභට කණ්ඩායමක් ද සකස් කෙරුණි. මේවා ප්‍රදේශයට නැවුම් අත් දැකීම් විය. මෙයට අමතරව ලබුතලේ මහතා වැඩිහිටියන් සඳහා නොමිලයේ අධ්‍යාපනය සැපයීමට ද උත්සුක විය.

පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ දෙවන විදුහල්පති වූයේ ඒ.වී ගුණපාල මහතා ය. එතුමාගේ කාලයේ දක්ෂ චිත්‍ර ශිල්පියෙකු ලෙස විද්‍යාලය තුළ ප්‍රචලිත වූ වැ.දේ. ප්‍රඥාරත්න සිසුවා පාසල් ලාංඡනය නිර්මාණය කර පාසැල් ඉතිහාසයට සුවිශේෂිත්වයක් එක් කළේ ය. මුණිදාස සිරිවර්ධන හා නන්දසේන ලබුතලේ යන ගුරුමහතුන් විසින් පාසැල් ගීතය නිර්මාණය කරන ලදි. එසේ ම විදුහල්පතිතුමා පාසැල් ධජය නිර්මාණය කළේ ය. එසේ ම 1951 වර්ෂයේ ප්‍රාථමිකය මධ්‍ය විද්‍යාලයෙන් වෙන් විය. ඒ අවස්ථාවේ ප්‍රාථමිකයේ විදුහල්පතිතුමා වූයේ ඩී.ජේ.ඩයස් ජයසූරිය මහතා ය.

1954 වර්ෂයේ දී පැල්මඩුල්ල විද්‍යාලයේ නව විදුහල්පති ලෙස මහාචාර්ය කීර්ති දිසානායක පත් විය. හෙළ හවුලේ සාමාජිකයෙකු වූ මෙතුමා සිංහල භාෂාව සාහිත්‍ය මෙන් ම සෞන්දර්යය නාඟා සිටුවීමයත් මහත් කැපකිරීමක් කළේය. එසේ ම සිංහල මෙන් ම ඉංග්‍රීසි භාෂාව නගා සිටුවීමටත් ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීමේ කටයුතු දියුණු කිරීමත් ඔහු අතින් සිදු වූ සුවිශේෂි කාර්යයන් වේ. මේ නිසාම කලා, වාණිජ්‍ය හා විද්‍යා අංශවලින් වැඩි සිසුහු පිරිසක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සමත් වූහ.

පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ සිව්වන විදුහල්පති වූයේ විල්මට් සිල්වා මහතා ය. අධ්‍යාපන තත්ත්වය ගුණාත්මක අතින් ඉහළට ඔසවා තැබීමට මෙම විදුහල්පතිවරයා විසින් මහත් පරිශ්‍රමයක් දරන ලදී. එහි ප්‍රතිඵලය වූයේ කලා විෂය ධාරාවන් හා ඉංග්‍රීසි මාධ්‍ය විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයෙන් දිවයිනේ ප්‍රථමයන් බිහිවීමයි.

විලියම් තඹවිට මහතා 1962 ජනවාරි 01 දින මෙහි විදුහල්පතිවරයා බවට පත් විය. ඔහු පාසැල් ගොඩනැගිලි පිළිසකර කරමින් ඒවාට නව ජීවයක් ලබාදුන්නේය. ක්‍රීඩා පිටිය ද පුළුල් කළේය. එවක අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විද්‍යාලයට දෙමහල් ගොඩනැගිල්ලක් සකස් කරදුන්නාය. එසේ ම දන්ත චිකිත්සාගාරයක්, සමූපකාර වෙළෙඳසැලක් ආදී පාසලට අත්‍යවශ්‍ය අංග කිහිපයක් ම එක් වූයේ මෙම යුගයේ දී ය.

**පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය බවට පත් වීම**

ගන්කන්ද පරම්පරාව විද්‍යාලය සකස් කිරීමට එම ස්ථානයේ ඉතා සුළු ඉඩම් ප්‍රමාණයක් ඔවුන් සන්තකයේ තබා ඉතිරි සියල්ල පරිත්‍යාග කළේය. එසේ ඉතිරිව තිබුණේ ඔවුන්ගේ පරම්පරාවේ උදාරතරයන් මිහිදන් කළ සුසානයක් සහිත සුළු ඉඩම් කොටසකි. අවසානයේ එම ස්ථානයේ ද බුදු මැඳුරක් නිර්මාණය කර ඔවුන් විද්‍යාලයට පරිත්‍යාග කර තිබුණි. එම සත් කාර්යයන්ට කළගුණ දැක්වීම පිණිස 1967 දී එවක විදුහල්පති වූ සෙන්පති සී.වී.එස්. සේනාධිපතිරත්න මහත්මා මෙම විදුහලේ නිර්මාතෘවරුන්ට නිසි ගෞරවය දැක්වීම පිණිස"පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය" යන නම වෙනුවට "ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය" යන නම ආරෝපණය කළේය. එතැන් සිට අද (2019) දක්වා ම මෙම විදුහල ගන්කන්ද මධ්‍ය මහ විද්‍යාලය නමින් දෙස් විදෙස් කීර්තියට පත් සිසු පරපුරක් බිහි කරයි.

1988 අගෝස්තු මස 8 වන දින ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලක් බවට පත් වීම ද ඉතිහාසයේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් වේ. 1929 වර්ෂයේ එක් ගොඩනැගිල්ලකින් ආරම්භ කළ මෙම විද්‍යාලය වර්මානය වන විට භෞතික හා මානව සම්පත්වලින් සපිරි සබරගමුව පළාතේ කීර්තිමත් ම පාසැල් අතරින් එකක් වේ.

**වත්මන් ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය**

වර්තමානයේ මෙම විදුහලේ විදුහල්පති වරයා වන්නේ ඩබ්ලිව්. කුමාරතුංග මහතා ය. එසේ ම මෙහි 2500 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් අධ්‍යාපනය ලබයි. ඔවුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා ගුරුවරු 141 ක් වේ. මනා මෙහෙයවීම යටතේ මෙම සිසුන් අධ්‍යාපන ජයග්‍රහණ මෙන් ම විෂය බාහිර ජයග්‍රහණ බොහෝමයක් හිමිකර ගැනීමට හැකිවී තිබේ.

සිසුන් අ.පො.ස සාමාන්‍ය පෙළ මෙන් ම උසස් පෙළ විභාග සඳහා ඉතා උසස් ප්‍රතිඵල හිමිකර ගෙන ඇත. එසේ ම දෙමළ භාෂාව සඳහා 2018 වර්ෂයේ අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල විශිෂ්ට ය. ප්‍රතිශතයක් වශයෙන් එය 100% කි. එය රත්නපුර දිස්ත්‍රික්කයේ දමිළ භාෂාව සඳහා වූ විශිෂ්ට ම ප්‍රතිඵල සටහන මෙය විය. දමිළ විද්‍යාල ද අභිබවමින් ලබාගත් මේ ප්‍රතිඵලය නිසා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් සම්මානයක් ද හිමිකර ගැනීමට මෙම විද්‍යාලය සමත් වී ඇත. මෙවැනි ජයග්‍රහණවලින් පැහැදිලි වන්නේ විදුහල්පතිතුමාගේ මනා මෙහෙයවීමත් ගුරුවරුන්ගේ නොමඳ කැපවීමත් ය. එසේ ම විවිධ ක්‍රීඩා, චිත්‍ර, නැටුම්, සංගීත තරඟවලින් කලාප, පළාත් මෙන් ම සමස්ත ලංකා ජයග්‍රහණ හිමිකරගත් විශාල සිසු පිරිසක වේ. 2012 වර්ෂයේ "ලෝක ළමා චිත්‍ර තරඟයෙන්" ප්‍රථම ස්ථානයත් 2016 වර්ෂයේ "17 වන ජාත්‍යන්තර ළමා චිත්‍ර තරඟයෙන්" ප්‍රථම ස්ථානයත් දිනා ගැනීමට සමත් ව ඇත්තේ මෙම විදුහලේ සිසුවියන් දෙදෙනෙකි. මෙවැනි විවිධ ජයග්‍රහණ හිමිකරගත් සිසු සිසුවියන්තේ නම් "රන් පොතේ" සටහන් ව තිබේ. මෙම රන් පොත මනාව පවත්වාගෙන ය අතර එය ඉතා සිත්කලු ආකාරයෙන් නිර්මාණය කර තිබේ.

සබරගමු පළාත් ඵලදායිතා තරඟයෙන් පිට පිට වසර තුනක් (2016, 2017, 2018) මෙම විදුහලට රන් සම්මානය දිනා ගැනීමට හැකි වී තිබේ. පරිසරිය රමණීය ආකාරයෙන් නිර්මාණය කිරීම, පරිසරයේ සැකැස්ම, සිසුන්ගේ බාහිර ක්‍රියාකාරම් සහ අධ්‍යාපන ජයග්‍රහණවල මෙම සම්මානය දිනා ගැනීමට උපකාරී වන්නට ඇති බව නො අනුමානය.

මෙම විද්‍යාලයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා විදුහල්පතිවරුන් 27 ක් මෙම විද්‍යාලයේ අභිවෘද්ධිය සඳහා ඇප කැප වී ඇත. ඉහත නම් සඳහන් විදුහල්පතිවරුන්ට අමතරව එන්.කේ. අමරසිංහ, ඩබ්.ජ්.ජී. වික්‍රමසිංහ, පි.ඩී.එස්.ගුණසේකර, එස්. අබේවික්‍රම, ස්ටැන්ලි වලිසිංහ, පී.එච්. ප්‍රේමසිරි, එච්.යූ.කේ. වීරවර්ධන, ඒ.කේ.ඩී. පියදාස, විමල් ජයසේකර යන අය ද මෙහි කැපීපෙනෙන විදුහල්පතිවරු වූහ.

පැල්මඩුල්ල සුවහසක් දරු දූරියන්ට නිදහස් අධ්‍යාපනයේ අග්‍රඵල භුක්ති විඳීම සඳහා ඉදිකරන ලද පැල්මඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය නොහොත් ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාල සිසු දරු දූරියන් විසින් නිදහස් අධ්‍යාපනයේ පියාගේ උදාරතර ක්‍රියාව සඳහා කෘත ගුණ දක්වා ඇත්තේ මෙසේ ය.

වනපස මල් පුබුදු කරනට හිත්ලාන
ඉස සැන් පොදක් සෙනෙහස මුසු කරවාන
ගම් දොර ඇවිද ඔබ විදිමුත් වෙහෙසාන
මැතිඳුනි අදත් සුවඳයි ඒ මල් රැන

දුක් පිරිපන ම වළදා ගම් බිම් රැඳුණු
දරුවන් පෙරට ගන්නට ගුණ නැණ පිරිණු
සිප්හල් විවර කර උන්හට පුද කෙරුණු
මැතිඳුන් පුදන්නට වෙන කුමටද කරුණු

**මූලාශ්‍රය**


- ගන්කන්දාවලෝකනය ශාස්ත්‍රීය සංග්‍රහය. 2015. නීල් ධම්මික වතුකාරවත්ත (ප්‍රධාන සංස්). රත්නපුරයඃ චින්තන ඩිජිටල් ග්‍රැෆික්ස්.
- http://www.gankanda.com/History.aspx


**ඡායාරූප**



වර්ෂ 1929 - තලකොළ සෙවිලි කළ ගොඩනැගිල්ලකින් ආරම්භ කළ එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ ආරම්භක අවස්ථාව



වර්ෂ 1938 - එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ ගුරු මණ්ඩලය සහ සිසු පිරිස



වර්ෂ 1946 - පැලමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ගුරු මණ්ඩලය සහ සිසු පිරිස



වර්ෂ 1953 - ගැමුණු නිවාසයේ ජයග්‍රාහී සොසර් කණ්ඩායම



වර්ෂ 1960 - පැල්මඩුල්ල මධ්‍ය විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය





පැල්මඩුල්ල මධ්‍ය විද්‍යාලය ගන්කන්ද යනුවෙන් නම වෙනස් කළ විදුහල්පති මේජර් සී.වී.එස්. සේනාධිපතිරත්න මහත්මා



වර්තමාන (2019) විදුහල්පති ඩබ්ලිව්. කුමාරතුංග මහතා





වර්තමාන ප්‍රධාන ඇතුළුවීමේ දොරටුව හා ගොඩනැගිලි  සහ පරිසරය කළමනාකාරිත්වය



බුදු මැදුර ආසන්නයේ ඇති එගොඩවත්ත බෞද්ධ මිශ්‍ර පාසලේ නිර්මාතෘ ගල්කන්දේ පුංචි මහත්මයාගේ සොහොන



විදුහලේ ඇති ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර සමාධිය

# ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය

**ආර්.එම් නදීකා රත්නබාහු**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
(ආදිශිෂ්‍ය, ඉබ්බාගමුව මධ්‍යවිද්‍යාලය,ඉබ්බාගමුව)
rathnabahu@kln.ac.lk

## පාසල ඇරඹීමට පූර්ව ඉතිහාසය

1931 වර්ෂයේ සිට ලාංකේය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීමට විවිධ අත්හදා බැලීම් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ජනතාවට අවශ්‍ය රැකියා පිළිබඳ පුහුණුවක් පාසලින් ලබා දීම අරමුණු කොටගෙන 1931 වර්ෂයේදි ග්‍රාමීය අධ්‍යාපන යෝජනා ක්‍රමය ආරම්භ විය. මෙම ක්‍රමය "හන්දෙස්ස ක්‍රමය" නමින් හැඳින්වූ අතර එය යථාර්ථයක් බවට පත්කිරීම දුෂ්කර විය. ඒ අනුව 1931 සිට 1941 දක්වා මෙරට පැවතියේ පොතට පමණක් සීමා වී, සමාජයේ සුළු පිරිසකට පමණක් සීමා වූ වරප්‍රසාද අධ්‍යාපනය ක්‍රමයකි. ඒ යුගය වන විට මෙරට සාක්ෂරතාවය 50% ක් විය.

මෙම යුගයේදි අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීම පාදක කොටගත් ආචාර්ය සී.ඩබ්.ඩබ් කන්නන්ගර මහාතාගේ සහභාගීත්වයෙන් යුතු අධ්‍යාපන විධායක කාරක සභාව තීරණාත්මක සාධකයක් බවට පත්විය. කන්නන්ගර මහාතාගේ අදහස වුයේ "විවිධ දුෂ්කරතා මධ්‍යයේ තමන් අධ්‍යාපනය ලැබූ බවත් තමන්ට අහිමි වූ පහසුකම් ගම්බද දුප්පත් දරුවන්ට ලබා දිය යුතු බවත් ය" (හැටවස් පූර්ණ සමරු කලාපය,2002).

ඒ අනුව, 1940 වර්ෂයේ සී.ඩබ්.ඩබ් කන්නන්ගර මහාතාගේ සහභාගීත්වයෙන් යුතු අධ්‍යාපන විශේෂ කාරක සභාවෙන් ප්‍රධාන යෝජනා හතරක් ඉදිරිපත් විය. ඒ නම් නිදහස් අධ්‍යාපනය, ස්වභාෂා අධ්‍යාපනය, දෙවන භාෂාවක් ලෙස හැම දෙනාටම ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම සහ පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ක්‍රමයයි.

ඉහත යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම මත 1943 දී මධ්‍ය විද්‍යාල 8ක් ආරම්භ විය. ඒවා නම් අකුරම්බොඩ, මතුගම, ඉබ්බාගමුව, නුගවෙල, තෝලංගමුව, කාන්තන්කුඩි, දික්වැල්ල සහ මාවතගොඩ මධ්‍ය විද්‍යාල ය. 1948 වනවිට මෙරට ඇරඹි මධ්‍ය විද්‍යාල ප්‍රමාණය ගණනින් 54කි. එහි මුල් අදියරේ තුන්වන පාසල බවට පත්වූයේ ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලයයි.

## පාසලේ ඉතිහාසය

කන්නන්ගර නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ 1948 දක්වා ඇරඹි ප්‍රධාන පාසල් 54 අතරින් තෙවැනි මධ්‍ය විද්‍යාලය ලෙස ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය පිහිටුවන ලදී. ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය ආරම්භ වන්නේ ඉබ්බාගමුව රජයේ පාඨශාලාවේ එක් අංශයක ය. එනම්,එවකට අධ්‍යාපන ඇමති ධූරය හෙබ වූ ආචාර්ය සී.ඩබ්.ඩබ් කන්නන්ගර මහතා 1941 පෙබරවාරි 03 දින (ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය 75 වසරක ප්‍රගතිය,2017) එය ආරම්භ කෙරිණි. කෙසේ වෙතත් පාසැලේ ආරම්භක වර්ෂය ලෙස නිල පිළිගැනීම සිදුවන්නේ 1942.07.01 දිනයයි.

## භූගෝලීය පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව අධ්‍යාපන කොට්ඨාසයේ ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ පාසල් අතරින් ඉතා මනස්කාන්ත පරිසරයක පිහිටි පාසලක් ලෙස ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය හඳුන්වාදිය හැකිය. බතලගොඩ වැව හාත්පස වටකර ගනිමින් පිහිටි පාසලේ සුන්දරත්වය ඒ හා සමගාමීව පවතින තුරු වියන හේතුවෙන් එය තව තවත් අලංකාර වී ඇත (වාර්ෂික වාර්තාව,2018,පි.4).

## ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය තොරතුරු

1. පාසලේ නම : කු/ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය

2. ලිපිනය : කු/ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය, ඉබ්බාගමුව

3. පාසල් අංකය :18112

4. පාසල් සංගහන අංකය : 17119

5. පාසල් වර්ගය : 1AB

6. පාසල් අයත් පළාත : වයඹ

දිස්ත්‍රික්කය : කුරුණෑගල

කලාපය : ඉබ්බාගමුව

කොට්ඨාශය : ඉබ්බාගමුව

7. පාසල් දුරකතන අංකය : 037 -2259684

8. පාසල් ෆැක්ස් අංකය : 037-2259684

9. ඊ මේල් : centralibbagamuwa@gmail.com

10. වෙබ් ලිපිනය : www.ibbagamuwacentral.lk

11. වත්මන් විදුහල්පති පිළිබඳ තොරතුරු : පී.එන්.එක්.ඩී. අබේවික්‍රම මිය

ශ්‍රී. ලං. අ. ප. සේ (11)

0718164243

nirodha73@hotmail.com

**පාසලේ දැක්ම**

"යහගුණෙන් නැණ බෙලෙන් අබිමනෙන් පෙරටම"

**මෙහෙවර ප්‍රකාශය**

ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව, පූර්ණ විෂය මාලාව ක්‍රියාත්මක කිරීම තුළින් අනාගත ලොව ජය ගැනීමට සමත් කායික මානසික, චිත්තවේගික හා අධ්‍යාත්මික ශක්තියෙන් පිරිපුන්, ප්‍රඥාවෙන් ලොව දකින්නට හැකි පරපුරක් බිහිකිරීම.


**ආදර්ශ පාඨය**

"චරථ සංගාම සීසෙ නාගොව"

"යුධ පෙරමුණෙහි සිටින හස්ති රාජයා සේ හැසිරෙව්" යන්න ඉහත ආදර්ශ පාඨයේ අර්ථයයි.

**සූරිය වංක ආරුක්කුව**

පී.එම්.ජයතිලක ශාලාව, බුදුමැදුර සහ පුස්තකාල ගොඩනැගිල්ලේ දැකිය හැකි පාසලට ආවේණික ගුණාත්මක ලක්ෂණයකි.



## පාසල් ලාංඡනය

ඉබ්බා යනු ඇතාට කියන තවත් නාමයකි. ඒ අනුව පාසල් ලාංඡනයේ ඇති ඇත්රූපය "ඉබ්බාගමුව" යන්න සංකේතවත් කරයි. පහන් සිළු දෙකෙන් ශිල්ප සහ කලාව යන ශාස්ත්‍ර ද්විත්වය නිරූපණය කරයි. පොල්තෙල් පහනින් ස්වජාතික කර්මාන්තද පලාපෙති මෝස්තර මගින් චිත්‍ර,නැටුම්, සංගීතය යන කලාවන් ද නිරූපණය කරයි. ඒ අනුව මෙම ලාංඡනයේ අර්ථය ලෙස ගම්‍ය වන්නේ නවීන ශාස්ත්‍රඥානය ජාතික සංස්කෘතියට අනුව ඉබ්බාගමුවේදී දෙනු ලැබේ." යන්නයි. (වාර්ෂික වාර්තාව,2018)

## පාසල් ගීතය

විදුහල අපේ
වැජඹේවා ඉබ්බාගමු විදුහල අපේ //
හිමු හෙළුම් පිපුන විලින් අත පෙහෙග කඳු හෙළින් //
හමා එන මඳ සුළඟේ ඇසේ කිරල් සේරුන්ගේ
රාව සංගීතේ.........
වැජඹේවා ඉබ්බාගමු විදුහල අපේ //
සුසිරි කුසුම් පැළඳ අපි සොයුරු පෙමින් බැඳී වෙලී
ගුණ ගීතා ගයමි ඔබේ පෙම්බර මාතා //
ඔබ අප හැමගේ මිණි පව ජීවන ගෙන දෙමිනී //
දිගන්තරේ පැතිරේවා වීර දූ පුතුන් තනමින් ඔබ ගුණ රාසී //
වැජඹේවා ඉබ්බාගමු විදුහල අපේ //
පෙරපර දෙදිගේ භාෂා ගණිත මිණිය දහම් පෙළා
රසායනදු අත්සිත්කම් ගොවිකම් හා ගීත කලා //
ඉගෙන ගනිමු අපි සැමෙවමා සමඩිලේ වී නොපමා //
ගතින් සිතින් හා කිරියෙන් පුරුදු පුහුණු වෙමු යන්නට
දියුණු වේ මගේ
වැජඹේවා ඉබ්බාගමු විදුහල අපේ //
ඉදිරියට යමුව සැමෝ අපේ ධජය නගාලමෝ
යුතුකම් දිවි පුරා රකිමු සතර අගති බැහැරලමෝ //
එක පාටැති රුධිරය වේ එක මවගේ දරුවෝ වම් //
ගුණින් නැණින් දියුණු වෙමින් අප විදුහල් ඔවට පතමි
දිගා ආසිරි
වැජඹේවා ඉබ්බාගමු විදුහල අපේ //

පදමාලාව හා තනු නිර්මාණය
නිමල් වෙල්ගම

## පාසලේ නිවාස



නිල් ප්‍රීති | කහ දීප්ති | දම් ශාන්ති | කොළ කීර්ති

## පාසල් කර පටිය හා කොඩිය

මෙරූන් පැහැය පිරිමි ළමුන් සංකේතවත් කරන අතර රෝස පැහැයෙන් ගැහැණු ළමුන් සංකේතවත් කරයි. එයින් ගම්‍ය වන අර්ථය නම් මිශ්‍ර පාසැලක් වන ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලයේ එඩිතර පිරිමි ළමුන් විසින් ගැහැණු ළමුන් ආරක්ෂා කිරීම යන අර්ථයයි.







**පාසලේ දියුණුව උදෙසා කටයුතු කරන ලද විදුහල්පතිවරුන්**

ආචාර්ය සී.ඩබ්.ඩබ් කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කරන ලද පාසල් අතරෙන් ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය විවිධ සංවර්ධනයන්ට ලක්ව ඇත. 1954 වසරේ ප්‍රථම වරට ශිෂ්‍යයන් සරසවි වරම් හිමිකර ගැනීම,"GientKillers of Ibbagamuwa" යන නාමවලින් ක්‍රීඩාවේ දස්කම් දැක්වීම මෙන් ම කාන්තා ක්‍රිකට් ආරම්භ කිරීම, වාණිජ අංශයෙන් ප්‍රථමයා බිහිකිරීම, නව නිපැයුම් වලදී ජාත්‍යයන්තර ජයග්‍රහණ ලද සිසුවකු බිහිකිරීම ආදි විවිධ සුවිශේෂී ජයග්‍රහණ විවිධ විදුහල්පතිවරුන්ගේ කාල තුළ සිදුවිය. ඒ අනුව 1942.07.01 දින සිට 2019 වර්ෂය දක්වා වන විදුහල්පතිවරුන් මෙන් ම වැඩබලන විදුහල්පතිවරුන්ගේ ලැයිස්තුව පහත දැක්වේ.

| **වර්ෂය** | **විදුහල්පතිවරුන්ගේ නම** |
|---|---|
| 1942.07.01 | වැඩබලන මුල් ගුරු කේ. එම්. ඩී. බංඩා මහතා සිංහල ගුරුවරයෙක් වීම නිසා ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ ආරම්භ කිරීමට පී. එම්. වෙලගෙදර මහතා පත් කිරීම. |
| 1944.01.31 - 1944.06.30 | පී. එම්. වෙලගෙදර මහතා උසස් වීමක් ලැබ ඉවත් ව ගිය පසු කේ. ජී පෙරේරා මහතා මුල් ගුරුවරයා ලෙස වැඩ භාර ගැනීම (මාස 05ක් ගතවීමට ප්‍රථම ස්ථාන මාරු වීම් ලබා ගියේ ය.) |
| 1944.07.01 -1944.09.01 | එච්. ධර්මදාස මහතා මුල්ගුරුවරයා ලෙස වැඩභාර ගැනීම (මාස 2ක් ඇතුළත ස්ථාන මාරු ලැබ ගියේ ය.) |
| 1944.11.01 - 1949.09.16 | ආරම්භක විදුහල්පති ලෙස සැලකෙන වී.එම්. ජයතිලක මහතා කටයුතු කිරීම. |
| 1949 - 1951 | ඩී. ඩී. ජී. සමරවීර මහතා විදුහල්පති ධූරය හෙබවීම |
| 1951 | පී. එම් ජයතිලක මහතා නැවත විදුහල්පති ධූරයට පත්විම |
| 1967 - 1970 | ඊ. ඩබ්. හෙලපිට මහතා විදුහල්පති ධූරය භාර ගැනීම |
| 1970. 02. 15 - 1981 | කේ. ජී. රත්නායක මහතා විදුහල්පති ධූරය |
| 1982 - 1991 | කේ. ඒ. ඩී. සී නානායක්කාර මහතා විදුහල්පති ධූරය දැරීම |
| 1991 -08 | උදයරත්න වීරබාහු මහතා විදුහල්පති ධූරය භාර ගැනීම.(1992-11-01 දින ස්ථාන මාරුවක් ලැබිණ.) |
| 1992. 11. 02 - 1993.06.31 | යූ. පතිරාජ මහතා විදුහල්පති ලෙස වැඩ භාර ගැනීම (මාස 08කින් පසු විශ්‍රාම යන ලදි.) |
| 1993. 07. 01 - 1994.10.25 | ඒ. එම් විතාන මහතා නැවත විදුහල්පති ලෙස වැඩ කටයුතු කිරීම |

| | |
|---|---|
| 1995 - 1998 | උදයරතන වීරබාහු මහතා නැවත විදුහල්පති ලෙස වැඩ කටයුතු කිරීම |
| 1998.06.27-1999.09.07 | එම්. එම්. එම්.බී. හේරත් මහතා විදුහල්පති ලෙස කටයුතු කිරීම |
| 1999.11.17 - 2011.09.05 | යූ. එම්. සමරවික්‍රම මහතා විදුහල්පති ලෙස කටයුතු කිරීම |
| 2011.09.05 | එච්.එම් වීරසිංහ මහතා වසරක කාලයක් විදුහල්පති ලෙස කටයුතු කිරීම |
| 2012-2014 | එච්. එම් ප්‍රේමරතන මහතා විදුහල්පතිවරයා ලෙස කටයුතු කිරීම |
| 2014.09.05 සිට මේ දක්වා | නිරෝධා අබේවික්‍රම මහත්මිය විදුහල්පතිධූරයේ කටයුතු කරමින් සිටී. ඇය පාසලේ ප්‍රථම විදුහල්පතිනියයි. |

**පාසලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක වී ඇති ආකාරය**

**අරමුණ 01: සිසුන්ගේ විභව්‍යතා හඳුනාගෙන ජාතික විෂය මාලා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර එහි සඳහන් නිපුණතා ළඟාකරගැනීමට සැමට සමසාධාරණ අධ්‍යාපන අවස්ථා සැලසීම.**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය 6 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා පන්ති පවත්වාගෙන යන පාසලකි. 6 ශ්‍රේණිය සඳහාසිසුන් බඳවා ගැනීමේදි නිර්ණායක කිහිපයක් ක්‍රියාත්මක කරයි. එනම් 1). 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා සිසුන්ගේ 85%ක ප්‍රතිශතයයක් සහ 2). ආදි ශිෂ්‍ය, සහෝදර හා අධ්‍යයන කාර්යමණ්ඩලය පදනම් කොටගෙන ඉතිරි 15% ඇතුළත් කර ගනී.

තවද, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ අභ්‍යන්තර සිසු සිසුවියන් උසස්පෙළට ඇතුළත් වන අතර අ.පො.ස (සාමාන්‍ය පෙළ) ඉහළ ප්‍රතිඵල ලබාගත් ශිෂ්‍යාවන් බාහිර පාසල්වලින් ඇතුළත් කර ගැනීම ද සිදුවේ.

ඒ අනුව 2018 වසරේ පංති මට්ටම් අනුව ශිෂ්‍ය සංඛ්‍යා විශ්ලේෂණයේ දී විද්‍යාලයේ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා වන සිසුන් ප්‍රමාණය 1676 කි. එසේම උසස්පෙළ සිසු සිසුවියන් 1268ක් 2018 වර්ෂය වන විට අධ්‍යාපයනය ලබා ඇත. ඉන් 37.6% ක ප්‍රතිශතයක් විද්‍යා,ගණිත විෂය ධාරාව හදාරන සිසු සිසුවියන් ලෙස හඳුනාගත හැකි ය. මීට අමතර ව කලා (25.09%), වාණිජ (25.2%) හා තාක්ෂණ විෂය ධාරාව (12.05%) යටතේ ද අධ්‍යාපනය හදාරා ඇත(වාර්ෂික වාර්තාව,2018). එසේම සිංහල මාධ්‍යයෙන් සිසුන් 1432 ක් හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිසුන් 244 ක් 6 ශ්‍රේණිය සිට අධ්‍යාපනය හදාරා ඇත.

ඉහත සිසුන්ගේ ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම මෙන් ම යහගුණ සහිත දරු කැලක් බිහිකිරීම උදෙසා උපාධිධාරී මෙන් ම විද්‍යාපීඨ පුහුණු ගුරුවරුන් 149ක් කටයුතු කරමින් සිටී (වාර්ෂික වාර්තාව,2018). අධ්‍යයන කාර්ය මණ්ඩලයට අමතරව පාසලෙහි අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා සහාය වන අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද 40කට ආසන්න ප්‍රමාණයක් කටයුතු කරයි(වාර්ෂික වාර්තාව,2018).

ඒ අනුව සිසුන්ගේ කාර්ය සාධනය මැනීමේ මූලික මිනුම් දණ්ඩ වන්නේ ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵලයි. 2018 වසරේදි අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගවලින් දක්ෂතා දැක්වූ සිසු සිසුවියන් පිළිබඳ විශ්ලේෂණය කිරීමේදි පහත කරුණු නිරීක්ෂණය කළ හැකි ය.

***අ.පො.ස (සා.පෙළ) - 2018***

ඉංග්‍රීසි (97.8%), ගණිතය (99.3%), ප්‍රංශ (66.7%) ඉංග්‍රීසි සාහිත්‍යය (98.4%) විෂයන් හැරුණු කොටගෙන අනෙක් සියලුම සිසුන් විභාගයෙන් සමත් වී ඇත. එය 100% ක ප්‍රතිශතයකි. විෂයන් නවයටම විශිෂ්ඨ සාමාර්ථ ලැබූ සිසුන් ප්‍රමාණය 21කි. එය 7.81%ක ප්‍රතිශතයකි. පසුගිය 2014 හා 2018 වසර කාල සංසන්දනය කිරීමේදි එය 3.43%ක වර්ධනයකි.

***අ.පො.ස (උ.පෙළ) -2018***

උසස් පෙළ විභාගය සඳහා 2018 වසරේ සිසු සිසුවියන් 872 ක් ඉදිරිපත් වූ අතර එයින් 642 දෙනකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇත. ප්‍රතිශතයක් වශයෙන් එය 74.31%ක ඉහළ අගයකි.

තවද, ප්‍රථම වරට තාක්ෂණ අංශයෙන් සිසුන් 45ක් උසස් පෙළට ඉදිරිපත් වී එයින් 43ක් විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබීම විදුහලේ සුවිශේෂී ජයග්‍රහණයකි. එසේම, පසුගිය වසරවල ප්‍රතිඵල සංසන්දනාත්මක ව බැලීමේ දී 2004 වර්ෂයේ 60%ක සමත් ප්‍රතිශතය 2018 වර්ෂය වන විට 75%ක ප්‍රතිශතයකට ආසන්න වී ඇත. එය පාසල විසින් සිසුන්ගේ විභව්‍යතා හඳුනාගෙන ජාතික විෂයමාලා නියමාකාරව ක්‍රියාත්මක කර ඉතා උසස් නිපුනතාවයක් ළඟාකර ගැනීමට සිසුන් උදෙසා දක්වන ලද දායකත්වයේ ප්‍රතිඵලයයි. එහි ගෞරවය වත්මන් විදුහල්පතිනිය වෙත ලැබිය යුතුම ය. මෙවැනි ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පාසල විසින් ක්‍රියාත්මක ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය හා ඇගයීම සාර්ථක ව භාවිත කර ඇති බව පෙනේ. තවද, පාසල තුළ ඉගෙනුම් පරිසරයක් ඇති කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග අගය කළ යුතු ය.

**අරමුණ 02 : මධ්‍යම රජය, පළාත් සභාව හා පරිත්‍යාගශීලීන් විසින් සපයනු ලබන මූල්‍ය, මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කරමින් යහපත් පුරවැසියන් වීමට අවශ්‍ය හසුරු කුසලතා සිසුන්ට ලබාදීම.**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය ඉතා ශකතිමත් පසල් සංවර්ධන සමිතයකින් යුතු ය. එහි 2018 අයවැය වාර්තාව නිරීක්ෂණය කිරීම තුළින් පෙනී යන්නේ රජය මෙන්ම ආදි විද්‍යාර්ථීන්, රාජ්‍ය නොවන සංවිධාන මෙන් ම වෙනත් විවිධ ක්‍රම මඟින් පාසලේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා දායකත්වය සපයන බව ය. එසේම එම මුදල්, මානව හා භෞතික සම්පත් සංවර්ධනය සඳහා ඵලදායිව භාවිත කර ඇති බව ද නිරීක්ෂණය කළ හැකි ය.

තව ද, විවිධ අධ්‍යාපන සම්මන්ත්‍රණ, පරීක්ෂණාගාර සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම, විවිධ විෂය සමගාමී මෙන් ම විෂය බාහිර ක්‍රියාකාරකම් (නායකත්ව පුහුණු වැඩසටහන්, පාසැල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන්, පරිසර වැඩසටහන්, සිසු නිර්මාණය හා ක්‍රියාකාරකම්, බාලදක්ෂ, ශිෂ්‍යනායක නිල පදක්කම් ආදිය), සුභසාධන කටයුතු, අලුත්වැඩියා කටයුතු මෙන් ම විෂයමාලා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය (සෞන්දරය, ක්‍රීඩා, විද්‍යාගාර ආදි අංශ) ප්‍රාග්ධන සැපයීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සැපයුම පාසල ඉටු කරමින් සිටී.

**අරමුණ 03 : පාසල හා ප්‍රජාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනගා ගනිමින් පාසල පිළිබඳ ධනාත්මකව සිතිය හැකි ප්‍රජාවක් ගොඩනැගීම.**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය ප්‍රජාව සමග ඉතා ධනාත්මක සම්බන්ධතාවයන් පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා පොදුවේ පාසල මෙන්ම එක් එක් පන්ති වල සිසු සිසුවියන් විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය කළ හැකි ය. ඒ අතරින් පාසල් බස්රථ රියැදුරන් දැනුවත් කිරීම, දෙමාපියන් සඳහා කාලීන ප්‍රවණතාවයන් පිළිබඳ දැනුවත් කිරීම, මත්ද්‍රව්‍යය නිවාරණ වැඩසටහන් පැවැත්වීම, වන්දනාවේ යන බැතිමතුන් සඳහා පොසොන් දන්සල පැවැත්වීම, මාපිය වන්දනා වැඩසටහන් පැවැත්වීම, විද්‍යාලයීය ආදි ශිෂ්‍ය වෛද්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් සායන පැවැත්වීම පාසල හා ශිෂ්‍යයන්, ආචාර්යය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය මූලික ව පවත්නා සමාජ ක්‍රියාකාරකම් ය.

තව ද 13Rපන්තියේ පංතියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ජූනි මස දි වැඩිහිටි සත්කාර වැඩසටහන් වැඩිහිටි නිවාසය ආශ්‍රිතව සිදු කිරීම,13L පංතියේ සිසුන ලේ දන්දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා 12M පංතියේ සිසු සිසුවියන් ලෝක ළමා දිනයට පාසැල් උපකරණ බෙදා දීම, පංති මට්ටමෙන් සිදුකරන සමාජ සත්කාරක වැඩසටහන් ය (වාර්ෂික වාර්තාව,2018). මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සිසුන්ගේ කළමණාකරණ කුසලතා කණ්ඩායම් ක්‍රියාකාරීත්වය හොඳින් වර්ධනය වේ. එමඟින් සිසුන් වෙත ලැබෙන "තෘප්තිමත් භාවය" පිළිබඳ මනෝභාවය ඔවුන්ගේ ඉදිරි ජීවන සාර්ථක කිරීමට ද ඉවහල් වනු ඇත.

පාසැලෙන් ප්‍රජාවට ලබා දෙන සත්කාර මෙන් ම ප්‍රජාවෙන් පාසලට හිමිවන සත්කාරයන් ද ඇත. ඒ අනුව සිසුන්ගේ සෞඛ්‍යය ඉහළ නැන්වීම සඳහා ශ්‍රමදාන හා ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. වර්තමාන ශිෂ්‍ය පරපුර ගිලගත් මත්ද්‍රව්‍යය වලින් සිසුන් බේරා ගැනීම සඳහා ගොකරැල්ල පොලීසිය විසින් ගැටුම් නිරාකරණය මෙන්ම, මත්ද්‍රව්‍යය නිවාරණය සම්බන්ධ වැඩසටහන් සිසුන් සඳහා පැවැත්වේ. මීට අමතරව පාසැලට අවශ්‍ය උපකරණ ලබාදීම, ත්‍යාග ලබාදීම, සිසුන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම ද ප්‍රජාවෙන් පාසලට ලැබෙන සත්කාර වැඩසටහන් ය.

**අරමුණ 04 : අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලවල වෘත්තිය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන, ඔවුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නංවාලමින් සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.**

පාසලක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අඛණ්ඩකාර්ය මණ්ඩල වෘත්තිය සංවර්ධනය අත්‍යවශ්‍ය සාධකයකි. එය ප්‍රත්‍යක්ෂ කරමින් ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය විසින් මානව සම්පත් ප්‍රවර්ධනයට කටයුතු කරමින් සිටී. විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය සම්බන්ධ කරගනිමින් පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, **නවීන තාක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහාභාවිත කිරීම පිළිබඳ පුහුණු** වැඩසටහන් පැවැත්වීම අධ්‍යයන කාර්යය මණ්ඩලය**සඳහා වන වෘත්තිය සංවර්ධන අවස්ථා කිහිපයක් සඳහා නිදසුන් ය.** එසේ ම අනධ්‍යයන සේවක මහත්ම මහත්මීන් මෙන් ම කළමණාකරණ මණ්ඩලය සඳහා ද පුහුණු වැඩසටහන් මාලා ක්‍රියාත්මක කෙරේ. මෙම **වෘත්තිය සංවර්ධන ක්‍රියාවලි වල අවසන් ඉලක්කය වන්නේ යහපත් ශිෂ්‍ය පරපුරක් නිර්මාණය කිරීම ය.**

**අරමුණ 05 : පරිසර හිතකාමී පාසල් භූමියක් සැකසීම, පිළිසකර කිරීම, ස්වාභාවික කුසලතා වලින් පරිපූර්ණ හා කසලින් තොර පරිසර පද්ධතියේ නිර්මාණය කිරීම.**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය යැයි කියූ සැණින් මතකයට නැගෙන්නේ ඉතා මනස්කාන්ත පරිසරයක පිහිටි ලංකාවේ අග්‍රගන්‍ය පාසලකි. හරිත පරිසරයට මුල් තැන දෙමින් විදුහල ආරම්භ කළ යුගයේ පටන් ඉතා විශිෂ්ඨ ලෙස පරිසර සංරක්ෂණය මෙන් ම ඒවා නඩත්තු කිරීමට සුවිශේෂී අවධානයක් ලබා දී ඇත. උද්‍යාන අලංකරණය සඳහා මල්වැවීම, ඇව්දින මංතීරු සැකසීම මෙන් ම කැළිකසළ විධිමත් ලෙස බැහැර කිරීම මඟින් පරිසර හිතකාමී පාසැලක් පවත්වාගෙන යාමට විදුහල්පතිනිය ඇතුළු කාර්ය මණ්ඩලය කටයුතු කරමින් සිටී. පාසැල් භූමිය කොටස් කර එක් එක් පංතියකට එක්කොටස බැගින් වෙන් කර පිරිසිදු කිරීමේ අවස්ථාව සලසා දී ඇත. එසේම පාසල කලාප වලට බෙදා සේවකයින් මඟින් ද පිරිසිදු කිරීම සිදුකෙරේ. සෑම වාරයක ආරම්භයේදි හා අවසානයේ දි දෙමාපියන් හා සිසුන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන පැවැත්වීම මගින් පාසල පවිත්‍ර කිරීම සිදුකෙරේ. ලෝක පරිසර දිනයට සමගාමීව පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වේ. මෙවැනි පරිසරයක් තුළ කටයුතු කරන විට ශිෂ්‍ය මනස ඉතා සාමකාමී වන අතර පරිසරයට ආදරය, කරුණාව දක්වන සිසුන් පිරිසක් රටට දැයට දායාද කිරීමේ අවකාශයද හිමි වේ.

**අරමුණ 06 : ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු බල ගැන්වීම සඳහා උනන්දුව හා සහයෝගීතාව වර්ධනය කිරීම**

පාසල තුළ ඉගෙනුම් පරිසරයක් ඇති කිරීමට සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග;

- එළිමහන් පංති කාමර ස්ථාපනය
- සුහුරු පංති කාමර ස්ථාපනය කිරීම
- පාසැල් උපකරණ නවීකරණය කිරීම
- හරිත අරණ භූමිය සංවර්ධනය
- නිර්මාණාත්මක අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය සැලසීම
- වයිෆයි කලාප ඇති කර අන්තර්ජාලය හරහා ඉගෙනුම් පහසුකම් ඇති කිරීම
- පුස්තකාලය සඳහා පොත් පත් මිලදී ගැනීම
- ක්‍රීඩා, සෞන්දර්ය අංශ හා විද්‍යාගාර සඳහා අවශ්‍ය සම්පත් සැපයීම

- සෑම දිනයමකම උදෑසන භාවනා වැඩසටහන මගින් මානසික සෞඛ්‍ය වර්ධනය කිරීම
- විවේක කාලය අවසානයේ දිවා සිතුවිලි තුළින් යහපත් සිතුවිලි ඇති කිරීම
- පන්ති පුස්තකාල ක්‍රියාත්මක කිරීම

(වාර්ෂික වාර්තාව,2018)



සුහුරු පංතිකාමර



එළිමහන් පංති කාමර

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බල ගැන්වීම සඳහා පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය යොදා ගනී. මෙම ඇගයීම් ක්‍රියාත්මක කිරීම අංශ ප්‍රධානින් වෙත පවරා ඇති අතර අධ්‍යාපන සංවර්ධන නියෝජ්‍ය විදුහල්පතිවරු විසින් අධීක්ෂණය කරනු ලැබේ.

2018 වසරේ දි සිදු කරන ලද ඇගයීම් අනුව ඉහළම ඇගයීම් ප්‍රමාණයක් ප්‍රායෝගික ක්‍රියාකාරකම් යටතේ සිදුකර ඇත. දෙවනුව පැවරුම් භාවිතා කර ඇති අතර තෙවන ඉහළ ඇගයීම් ක්‍රමවේදය ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතා කර ඇත. කෙටි ලිඛිත ඇගයීම් හා විවෘත ග්‍රන්ථද එකම ප්‍රමාණයකින් ඇගයීම් ක්‍රමවේද ලෙස භාවිතා කර ඇත.

තව ද ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු බල ගැන්වීම සඳහා ශිෂ්‍ය විභව්‍යතා ප්‍රවර්ධනය ද සුවිශේෂී දායකත්වයක් දක්වනු ලබයි. 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 03 සිට 07 දක්වා කුලියාපිටිය මධ්‍ය විද්‍යාලයේ පැවති 19+ ප්‍රදර්ශනයට විද්‍යාලයේ කුටියක් ඉදිරිපත් කිරීම, බාලදක්ෂ කඳවුරු, වාණිජ දිනය (තිනෙත), උත්සව සංවිධානය (DSI Supper sport දැනුමයි, වාසනාවයි), කලා දිනය (තොටිලි වැටෙන් එහා), නිවාසන්තර මළල ක්‍රීඩා උළෙල, නායකත්ව වැඩමුළු, සඟරා එළි දැක්වීම, ශිෂ්‍ය නායක කඳවුරු ආදිය මේ සඳහා නිදසුන් කිහිපයක් පමණි.

**ක්‍රීඩාවේ දායකත්වය**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය ක්‍රීඩාවේ ඉතිහාසයේ රන් අකුරින් සිය නාමය සටහන් කිරීමට කටයුතු කළේ ජී. එම් ජයතිලක ආරම්භක විදුහල්පතිතුමාගේ යුගයේ දී ය. එදා සිට මේ දක්වා විදුහල් මාතාව දෙස් විදෙස් හි සුපතල කිරීමට ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාල දරු දැරියන්ට අවස්ථාව ලැබිණි. ශ්‍රියානි කුලවංශ , වත්මන් කාන්තා ක්‍රිකට් නායිකා චමරි අතපත්තු මෙන් ම ඉෂාරා පල්ලේගම, දිනුෂ දිල්ෂාන් උඩවෙළ, ගයන්ත ලක්මාල් පණ්ඩිත යනු එබඳු ක්‍රීඩක ක්‍රීඩිකාවන් කිහිපදෙනකු පමණි. ඒ අනුව පාසල තුළ විවිධ ක්‍රීඩා ක්‍රියාත්මක කරමින් එයට අවශ්‍ය පුහුණුවක් ද සහිතව ක්‍රීඩා අධ්‍යාපනය සිසුන් වෙත ලබා දීමට විදුහල කටයුතු කරමින් සිටී. එසේම වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය වන "Battle of the tusker" ඉතා උත්කර්ෂවත්ව පවත්වනු ලබයි.




**ශ්‍රියානි කුලවංශ**　　　　**චමරි අතපත්තු**

**ප්‍රදානයන්**

ඒ අනුව උක්ත අරමුණ ඉටු කිරීමට ගැනීම සඳහා වත්මන් විදුහල්පතිනිය ඇතුළු කාර්ය මණ්ඩලය ඉතා විශිෂ්ට සේවාවක් ඉටු කරමින් සිටී. පාසල් අධීක්ෂණය යටතේ පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 73% ක ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට එමගින් හැකියාව ලැබී ඇත. එසේම 2018 වසරේ අ.පො.ස. උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විශිෂ්ට ප්‍රතිඵල වාර්තා කිරීම වෙනුවෙන් විද්‍යාලය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඇගයීමට ද ලක්ව ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පැවැත්වූ "ගුරු ප්‍රතිභා ප්‍රභා" සම්මාන උළලේ දී දූයේ දූ දරුවන්ව අනාගත අභියෝගයන්ට සාර්ථක මුහුණ දීමට සමත් නිපුණතාවයෙන් පරිපූර්ණ යහපත් ශ්‍රී ලාංකීක පුරවැසියන් ලෙස සමාජයට දායාද කිරීමේ උදාර මෙහෙයට නායකත්වය දී පාසල සාර්ථකත්වය කරා මෙහෙයවීම වෙනුවෙන් 2016,2017 සහ 2018 යන වර්ෂවල නොකඩවා වත්මන් ගරු විදුහල්පතිතුමිය වන වී. එන්. එස්. ඩී. අබේවික්‍රම මහත්මිය සම්මානයට පාත්‍ර වී ඇත. එය පාසැලේ සාර්ථකත්වය මොනවට පැහැදිලි කරයි.



වත්මන් විදුහල්පතිනිය

**පාසල මඟින් සිසුන් සඳහා ලබාදෙන සේවාවන්**

***පුස්තකාලය***

පාසලක හදවත වන්නේ පුස්තකාලයයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා සෘජු දායකත්වයක් සපයන දැනුම් කෝෂ්ඨාගාරය වන්නේ ද පුස්තකාලයයි. ශ්‍රී ලංකා ජාතික පුස්තක හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ශ්‍රේණිගත කිරීම තුළ විද්‍යාලය සතු වන්නේ "1 ශ්‍රේණියේ පුස්තකාලයකි." "ලබා තොරතුරු කුසලතා දිනමු හෙට අපි අපේ ලෝකය" යන්න එහි දැක්මයි. පොත් 17420 ක එකතුවකින් යුතුව බැහැර දෙන අංශය හා විමර්ශන අංශය ලෙස සිය එකතුන්

පවත්වාගෙන යාම සිදු කරයි. පුස්තකාලයේ එකතු සංවර්ධනය කිරීමේ දී පාඨක අවශ්‍යතා විශ්ලේෂණය කිරීම මෙම පුස්තකාලයේ නිරීක්ෂණය කළ හැකි ඉතා ධනාත්මක සාධකයකි. විශේෂයෙන්ම වාර සඟරා, පුවත්පත්, පුවත්පත් ලිපි කැපුම් එකතු, බ්‍රේල් එකතුව, සිතුවම් එකතුව, අත් පත්‍රිකා, ශ්‍රව්‍ය දෘෂ්‍ය මූලාශ්‍ර, වාර්ෂික වාර්තා ආදියෙන් තොරතුරු ලබා දෙමින් ශිෂ්‍ය ප්‍රජාව වෙනුවෙන් තොරතුරු අවශ්‍යතා ඉටු කිරීමේ කාර්යයයේ නියැලී සිටී. එසේම වෘත්තිමය අධ්‍යාපන සුදුසුකම් ලද පශ්චාත් උපාධිධාරී පුස්තකාලයාධිපතිවරියක් පුස්තකාලය සතු වීම ද පුස්තකාල කාර්යයන් විද්‍යාත්මකව හා පහසුවෙන් සිදුකර ගැනීමට ලද මහඟු අවස්ථාවකි.

***නවීන තාක්ෂණය මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම***

තාක්ෂණය දිනෙන් දින යාවත්කාලීන වේ. අධ්‍යාපන ක්‍රමය සඳහා තාක්ෂණය භාවිතය ලොව පුරා ඉතා ප්‍රචලිත වී ඇත. ලෝකයට සමගාමීව ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය ද සුහුරු පංතිකාමර ඉදිකිරීමට මුල පුරා ඇත. මේ සඳහා වන අධ්‍යයන කාර්යමණ්ඩලය ද මේ වනවිට පුහුණු කර ඇති අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මෙම සුහුරු පංති කාමරය ඉතා සාර්ථක ව භාවිත කරමින් සිටී. පාසැල තුළ වයි-ෆයි කලාප ඇති කිරීම මගින් නව දැනුම සොයා යන පිරිසට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය තුල විවිධ ක්‍රීඩා හා සංගම් 40කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. ඒ ඒ ක්‍රීඩා හා සංගම් භාර ආචාර්ය මණ්ඩලය විසින් සිසුන් මෙහෙයවමින් විශාල විෂය සමගාමී ක්‍රියාකාරකම් රාශියක් සිදුකරමින් සිටී. නිදසුන් : බෞද්ධ සංගමය, කලා සංගමය, සමාජ විද්‍යා සංගමය, රතු කුරුස, බාලදක්ෂ/බාලදක්ෂිකා, මාධ්‍යය ඒකකය.

**ආදිශිෂ්‍ය සංගමය**

ආදි ශිෂ්‍ය සංගමය 1956 වසරේදී පිහිටුවන ලදි. එතැන් පටන් දෙස්, විදෙස් සුපතල ආදි විද්‍යාර්ථීන් විසින් පාසල සංවර්ධනය සඳහා අද්විතීය කාර්යය භාරයක් ඉතා ප්‍රශංසනීය ව සිදුකරනු ලබයි.

**සංවර්ධන හා වෙනත් ව්‍යාපෘති**

2016 වර්ෂයේ ඇරඹී තාක්ෂණ විෂය ධාරා සිසුන් සඳහා තෙමහල් තාක්ෂණ පීඨයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 2018 වසරේදී විද්‍යාලයට ලබාගත හැකි වීම විශේෂ ජයග්‍රහණයකි.

**පාසැල සතු භෞතික සම්පත්**

පාසැල විසින් භෞතික සම්පත් සංවර්ධනය සඳහා ද වැඩි ඉඩකඩක් වෙන් කරයි. ඒ අනුව ආගමික පරිශ්‍ර, නේවාසිකාගාර පහසුකම්, අංග සම්පූර්ණ පුස්තකාල ගොඩනැගිල්ල, ආදි ශිෂ්‍ය සුභසාධන අලෙවිසල, ආපන ශාලා, ක්‍රීඩාපිටිය, පරිගණක සම්පත්, සන්නිවේදන සම්පත්, මුද්‍රණ සම්පත්, රථවාහන සම්පත්, විද්‍යාගාර පහසුකම්, CCTV කැමරා පද්ධති ආදිය මේ සඳහා නිදසුන් ය.

**පාසැල තුළ ශිෂ්‍ය විනය හෙවත් පාසලේ සම්ප්‍රදායන්**

යහපත් ශිෂ්‍ය පරපුරක් බිහිකිරීමට නම් සම්ප්‍රදායන් අත්‍යවශ්‍ය සාධකයකි. එතුළින් සිසුන් තුළ ස්වයං විනයක් නිර්මාණය වේ. එබැවින් පාසල වෙත පැමිණීමේ සිට පිටවීම දක්වා පාසල් සම්ප්‍රදායන් පාසැල තුළ ක්‍රියාත්මක වේ. නිදසුන් ලෙස පහත සම්ප්‍රදායන් කිහිපයක් සඳහන් හැකිය.

- පාසැලට පැමිණෙන සියලුම සිසුන් බුද්ධ ප්‍රතිමාවට නමස්කාර කර පංතිකාමර වෙත ගමන් කිරීම.
- නිසි ප්‍රමිතියෙන් යුතු පාසැල් නිල ඇඳුම් භාවිතා කිරීම.
- දෛනික පංති කාමර පිරිසිදු කිරීම.
- පාසැල් කාලය තුළ පංති කාමරවල රැඳී සිටීම.
- පන්සිල් ගැනීම, පාසැල් ගීතය ගායනා කිරීම, ඡත්ත මානවක ගාථා ගායනා කිරීම, ජාතික ගීය ගයනය එක් ව සිදු කිරීම.
- සුදුසු ඉරියව්වකින් භාවනා කිරීම.

- ප්‍රවෘත්ති, නිවේදන ඉදිරිපත් කරන අවස්ථාවලදි නිශ්ශබ්දව සවන් දීම.
- පංති කාමරයෙන් බැහැරව යනවිට දෙදෙනා බැගින් පෙළට ගමන් කිරීම.
- පාසලේ පරිසරය ආරක්ෂා කිරීම.
- ගුරුවරුන්ට හා අනෙකුත් කාර්ය මණ්ඩලයට ගෞරව කිරීම.

2017 වසරේ මැයි මස 26 දින සිය වජ්‍ර ජයන්තිය මහත් අභිමානයෙන් සැමරූ ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය තවත් චිරාත් කාලයක් දැයේ දූවා දරුවන්ගේ ගුණ නැණ බලය දෙස් විදෙස්හි සුපතල කිරීමට කටයුතු කරමින් සිටී.

**මූලාශ්‍රය**


- ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය : වාර්ෂික වාර්තාව (2018). ඉබ්බාගමුව : ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය
- ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය : වාර්ෂික වාර්තාව (2016). ඉබ්බාගමුව : ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය
- ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය : හැටවස් පූර්ණ සමරු කලාපය (1942-2002)
- බංඩාර,ජයවීර (2000), ජී.එම් ජයතිලක චරිතාපදානය හා ඉබ්බාගමුව මහා තක්සලා වංශ කථාව, දෙහිවල : කතෘ ප්‍රකාශනය.
- ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලයට අවුරුදු 75යි. (2017. මැයි 21), දිවයින
- ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය 75 වැනි සංවත්සරය හෙට (2017 මැයි 26). දිනමිණ
- Ibbagamuwa Central Forges ahead with virtune,wisdom and diginity (2015 January 25), Sunday Times. 8p
- Ibbagamuwa Central College ; Special Commemorative Issues (2017 May 26), Ibbagamuwa : Ibbagamuwa Central College

# සී. ඩබ්. ඩබ්. කන්නන්ගර යුගය දක්වා ලංකාවේ බටහිර අධ්‍යාපනය

**සංජීව පතිරණ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
samansanjeeva@gmail.com

## හැඳින්වීම

ක්‍රි.ව. 1498 දී කැලිකට් වෙත පැමිණි වස්ගෝද ගාමා ''අපි ක්‍රිස්තියානීන් සහ කුළුබඩු සොයා පැමිණි බව ප්‍රකාශ කළේය. පෘතුගීසීන්ගේ පෙරදිග ගමනේ එක් අරමුණක් වූයේ ආගම ප්‍රචාරය කිරීමයි.[1](එම්.ජී. මැසෝවර් 1983) පෘතුගීසීහු වනාහි කතෝලික ආගම ඇදහූහ. පෘතුගීසීන් තම කතෝලික ආගම මෙරට ප්‍රචාරය කිරීම සඳහා යොදා ගත් එක් ප්‍රබල මාධ්‍යයක් වූයේ අධ්‍යාපනයයි. මේ සඳහා සුදුසුම ක්‍රමය ලෙස ඔවුන් පිළිගෙන තිබුණේ ස්වභාෂාවෙන් තම පෙරදිග යටත් විජිතවල අධ්‍යාපනය ලබාදීමය. ඒ බව පැහැදිලි වන්නේ ශාන්ත ප්‍රැන්සිස් සේවියර් පියතුමා විසින් මිෂනාරීන් හොඳින් පෙරදිග භාෂා අධ්‍යයනය කළ යුතු බව පවසා තිබීම නිසා ය.[2](ජී. ෂුරාමර් සහ අයි. විකී 1932)කතෝලික නිකායන් අතරින් ප්‍රැන්සිස්කන්, ඔගස්තීනියානු, ජේසුයිට් සහ ඩොමිනිකන් නිකායවල මිෂනාරීවරු ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබාදීමට පෙළඹුණහ. ක්‍රි.ව. 1602 වනවිට ජේසු නිකායකයින් සිංහල භාෂාව හදාරන්නට විය.[3](CALR P. 15) එසේම ඔවුන් සිංහල භාෂාවෙන් තම පල්ලියේ වූ පැරිස් පාඨශාලාවල දී දේශීය දරුවන්ට ආගම උගන්වා ඇත.[4](CALR P. 80) පසුකලෙක පෘතුගීසි අධ්‍යාපනය පිළිබඳ ප්‍රාමාණික සුපරීක්ෂණයක යෙදුණු ආචාර්ය දොන් පීටර් පියතුමා ද පෙන්වා දෙන්නේ පෘතුගීසි මිෂනාරීවරුන් අධ්‍යාපනයේ මෙන්ම ජාතික භාෂා ගැන ද සැලකිලිමත් වූ හේතුව වන්නේ ආගම ප්‍රචාරය කිරීම බවයි.[5] (අධ්‍යාපන සියවස I කාණ්ඩය පි.283)

ක්‍රි.ව. 1658 දී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පාලනය ලන්දේසීන් විසින් බාර ගැනීමත් සමගම ඔවුහු ද පල්ලිය අසල වූ පාඨශාලාවල දේශීය දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට මහත් සේ උනන්දු විය. එම පාඨශාලා පැරිෂ් පාසැල් නම් වූ අතර ඒවායෙහි දරුවන්ට පමණක් නොව වැඩිහිටියන්ටද භාෂා පරිවර්තකයන් යොදාගෙන අධ්‍යාපනය ලබා දුනි. එහිදී සිංහල හෝ දෙමළ භාෂාව අධ්‍යාපන මාධ්‍ය වශයෙන් භාවිත විය. මෙය විලියම් පැල්ක් ආණ්ඩුකාරවරයාගේ වාර්තාවලින් මේ බව පැහැදිලි වේ.[6](විලියම් පැල්ක්, 1757) ක්‍රි.ව. 1690 අගෝස්තු 24 වෙනිදා කොළඹ සෙමනේරිය පිහිට වූ අතර එහිදී පූජකයින් කතිසේරුවන්, ලිපිකරුවන්, ගුරුවරුන් හා භාෂා පරිවර්තකයන් පුහුණු කිරීම මෙහි දී සිදු විය.[7] (ලන්දේසි වාර්තාව 1690.08.24) මෙරට මුලින්ම ගුරු පුහුණුව සඳහා ආයතනයක් ලන්දේසීන් විසින් කොළඹ පිටකොටුවේ දී ක්‍රි.ව. 1747 කොළඹ නෝමල් පාසල නමින් පිහිටුවන්නට යෙදුණි.[8](ලන්දේසි වාර්තාව 1746.11.26) පැරිෂ් පාසල්වලට බඳවා ගනු ලැබූ ස්වභාෂා ගුරුවරන්, අනිවාර්යෙන්ම රෙපරමාදු ආගම වැළඳගත් අයෙකු විය යුතු විය. ඔහු ප්‍රදේශයේ වැදගත් පවුලකින් තෝරා ගත්තේය. ඔහු පාසල් තෝම්බුව නම් සංඛ්‍යාලේඛන භාරව ද කටයුතු කළ අතර ඔප්පු හෝ ගිවිසුම් සකස් කිරීම, ඉඩම් ලිවීම, සහතික කිරීම් ද සිදු කළේය.[9](සොෆයා පීටර් 1908 පි.82) මේ අනුව පැහැදිලි වන්නේ ලන්දේසීන් අධ්‍යාපනය සඳහා වඩා උනන්දු වූ බවත් එය හුදෙක් ආගම ප්‍රචාරය සඳහා යොදා ගත් ප්‍රබල මාධ්‍යයක් බවත්ය.

ක්‍රි.ව. 1796 දී ලංකාවේ මුහුදුබඩ පළාත් ඉංග්‍රීසීන්ට බාර දීමට ලන්දේසීහු කැමති වූහ. එම පාලනය බාරගත්තේ පෙරදිග ඉන්දීය ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ මද්‍රාසි පාලනයයි. මෙම මද්‍රාසි පාලනය ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ කිසිදු උනන්දුවක් නොදක්වීම නිසා එය ක්‍රමයෙන් පිරිහීමට පත්විය.[10](Terner 1923 P.21) ගුරුවරුන්ට වැටුප් නොගෙවුණි. බොහෝ පාසල් වැසී ගියේය. ක්‍රි.ව. 1802 දී බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා වූ සර් ෆෙඩ්රික් නෝර්ත් අධ්‍යාපනය ගැන මෙන්ම මිෂනාරි ක්‍රියාකාරීත්වය ගැන බෙහෙවින් උනන්දු විය. ඔහු ප්‍රකාශ කළේ ලන්දේසීන් විසින් ගෙනගිය පාසල් ක්‍රමය තවදුරටත්නොනසා පවත්වාගෙනගියේ නම් තව නොබෝ කලකින් සිංහල ජාතියම තම ආගම අදහනු ඇති බවයි.[11](ෆෙඩ්රික් නෝර්ත් 1799.01.15) මේ තත්ත්වය නිසා නෝර්ත් ආණ්ඩුකාර තැන ජේම්ස් නෝර්ඩිනර් පියතුමා ප්‍රමුඛ ලන්ඩන් මිෂනාරි සමාගමේ මිෂනාරීවරුන් මෙරටට ගෙන්වා ගැනීමට උත්සුක විය. ඔවුන් නැවත පැරිෂ් පාඨශාලා

ප්‍රතිසංවිධානය කිරීමට පියවර ගත්තේ සුදුසු ගුරුවරුන් ද පත් කරමිනි. ජේම්ස් කෝඩිනර් පියතුමා දිවයිනේ පාඨශාලා පරීක්ෂකවරයා ලෙස ද මෙකල කටයුතු කළේය.[12](ෆෙඩ්රික් නෝර්ත් 1799.02.26)පැරිෂ් පාසැල්වල ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබා දෙන අතරතුර රජයේ තනතුරු සඳහා ඉංග්‍රීසි දත් සුදුස්සන් බඳවා ගැනීමට කොළඹ ඇකඩමිය ද ආරම්භ කළේය.[13](ෆෙඩ්රික් නෝර්ත් 1800.01.30)නෝර්ත් ආණ්ඩුකාරයා පවුම් පන්දහසක් පමණ වර්ෂයකට වියදම් කළ අතර ක්‍රි.ව. 1803 දී යටත් විජිත කාර්යාලය එය පවුම් 1500 දක්වා අඩුකරන ලෙස දන්වීය.[14](යටත් විජිත ලේකම් 1803.02.08)

මේ නිසා නෝර්ත්ගෙන් පසුව දේශීය අධ්‍යාපනය අඩපණ විය. තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය රජයෙන් ඉල්ලා සිටියේ ලංකාවේ ආගම ප්‍රචාරය සඳහා අධ්‍යාපනය දියුණු කළ යුතු බවයි. එයට රජයේ අවරසරය හිමිවිය[15].(යටත් විජිත ලේකම් 1810.09.30) එහිදී යටත් විජිත ලේකම්වරයා ප්‍රකාශ කළේ ස්වදේශික දරුවන් කිහිප දෙනෙකු හට ස්කොට්ලන්තයේ අධ්‍යාපනය ලබා දී පූජක තනතුරට පත් කළ යුතු බවයි. තවද ක්‍රි.ව. 1815 මාර්තු 02 දා ඓතිහාසික උඩරට ගිවිසුමෙන් කන්ද උඩරට ඇතුළු මුළු දිවයිනම ඉංග්‍රීසි ආධිපත්‍යයට නතුවිය. එංගලන්ත සභාවේ කොළඹ අගරදගුරු පදවිය ද ක්‍රි.ව. 1818 දී ආරම්භ කරන ලද අතර අගරදගුරුතුමන් යටතට මෙරට සියලු පාසල් පත්කරන ලදී. ඔහු රජයේ අණ පරිදි අධ්‍යාපනය සහ ආගමික කටයුතු කරගෙන ගියේය.[16](රොබට් බ්‍රවුන්රිග් 1816.11.05) මේ තත්ත්වය 1831 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන තුරු පැවතියේය. තවද රොබට් බවුන්ඩ්රිග්ගේ පාලන කාලය තුළ වෙස්ලියන්, ප්‍රෙස්බිටීරියන්, බැප්ටිස් නිකායවල මිෂනාරීහු මෙරටට පැමිණ තම ආගමික හා අධ්‍යාපනික කටයුතු කරගෙන ගියහ.[17](බටර්වර්ත් 1815.10.09) කෝල්බෲක් යෝජනාව අනුව එංගලන්ත සභාවේ රදගුරුවරුන්ගේ ප්‍රමුඛත්වයදෙමින් පාඨශාලා කොමිසම පත්කරන ලදී.[18](1834.05.16 ගැසට් පත්‍රය)එමඟින් ද අධ්‍යාපනයට පල්ලියේ දායකත්වය නොඅඩුව ලැබුණි.

කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මීලඟට වැදගත්ය. එහිදී කොමිසමේ කාර්යභාරය වූයේ ලංකාවේ රාජ්‍ය වියදම අඩු කිරීම සඳහා බ්‍රිතාන්‍යයෙන් ගෙන්වන නිලධාරීන් අඩු කිරීමට මෙරට ඉංග්‍රීසි අධ්‍යාපනය නැංවීමයි. එමෙන්ම මිෂනාරී සමාගම් විසින් ගෙන ගිය අධ්‍යාපනයේ දී රාජ්‍ය පැයක් ඊට නොවීම ද එනිසා කෝල්බෲක් කැමරන් කොමිසම එම අධ්‍යාපන ක්‍රමය බෙහෙවින් අගය කළේය.[19](කෝල්බෲක් කැමරන් 01 කාණ්ඩය පි.188)මේ නිසා මිෂනාරීහු රාජ්‍ය අනුග්‍රමයෙන් පාසල් පවත්වාගෙන ගියේය. ගුරු පුහුණුව ද කොළඹ ඇකඩමිය යටතේ සිදුවිය. මැකන්සි ආණ්ඩුකාරවරයා ගුරුවරුන් පුහුණු කිරීම ආරම්භ කිරීමට නෝමල් පාසල ආරම්භ කිරීමට යෝජනා කළ අතර එසේ ගුරුවරුන් පුහුණු කිරීමට වෙනම ආයතනයක් ඇරඹීම මදුරාසියේ එංලන්ත බිෂොප්වරයා දුටුවේ දේශීය ජනතාවට අතර ක්‍රිස්තියානි දැනුම ප්‍රචාරය කිරීමට ගනු ලැබූ හොඳ උපක්‍රමයක් ලෙසය.[20](මධුරාසි බිෂොප් 1840.05.25) එසේම ගුරුවරුන් බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස ක්‍රිස්තියානි දේව මෙහෙයන්ට සහභාගීවී තිබීම ද සුදුසුකමක් ලෙස සලකන ලදී.[21](CSC Report II P.20) මේ අතර වෙස්ලියන් සහ චර්ච් මිෂනාරි සහ ඇමරිකන් මිෂනාරි සමාගමට ද කතෝලික පාසල්වලට ද රජයේ මුදල් ආධාර ලබාදුන් නමුත් බෞද්ධ හා හින්දු පාසල්වලට ආධාර ලබාදීම ප්‍රතිෂේප වූයේ ඒවා අවශ්‍ය මිටමට නොමැත යන පදනම මතය.[22](CSC Report 12 P.12) මේ අතර වර්ෂ 1857 දී කොළඹ බිෂොප්තුමාගේ ඉල්ලීම පරිදි ක්‍රිස්තියානි ආගම උගන්වන සියලුම පාසල්වලට මූල්‍ය ආධාර ලබාදීමට ව්‍යවස්ථාදායක සභාව යෝජනාවක් ද සම්මත කළේය.[23](Sesional Papers 1960-61 උපග්‍රන්ථය) මෙසේ අධ්‍යාපනය ආගමික කණ්ඩායම් වෙත පැවරීම වැඩිකල් යාමට පෙර ඉංග්‍රීසි සමාජය තුළ ම දැඩි විවේචනයට භාජනය විය.[24](1857.06.14 The Examiner/The Colombo Observer 1857.12.07) පාඨශාලා කොමිසමේ සාමාජිකයින්ට පාසල් පවත්වාගෙනෙ යාම පිළිබඳ දැනුමක් නැතිව මුදල් නාස්තිකරමින් සිටින බව සමකාලීන පුවත්පත් මඟින් ද වාර්තා වී ඇත.[25](The Times of Ceylon 1854.05.30) මේ අනුව පැහැදිලි වන්නේ 1834 දී පත්කළ පාඨශාලා කොමිසම අසාර්ථක වූ බැවින් 1841 දී පත් කළ පාසැල් කොමිසම ද අසාර්ථක වූ බවයි. 1852 දී ඩබ්.ජී. සෙන්ඩල් පාඨශාලා අධ්‍යක්ෂක ධූරයට පත් වූයේ එහෙයිනි. ඔහු දේශීය අධ්‍යාපනය නගා සිටුවීමට විශාල වෙහෙසක් දැරූ අතර 1871 දී එම ධූරයෙන් ඉවත්විය. 1879 දී බෲස් මහතා පාඨශාලා අධ්‍යක්ෂ ලෙස පත් වූ අතර 1896 දී අධ්‍යක්ෂතුමන්ට උපදෙස් දීම සඳහා අධ්‍යාපන මණ්ඩලයක් ද පිහිටුවීය. මේ වන විට ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තු මුදල්

නොමැති කමින් මහත් ගැටලුවලට මුහුණ පෑවේය. ස්වභාෂා පාසැල් පිහිටුවීමට රජයට මුදල් නොමැති වූයේන ගම්වැසියන් එසේ ස්වදේශීය භාෂා පාසලක් ඉල්ලා සිටි විට ඇතැම් අය ධනයෙන් ද ඇතැම් අය මුදලින් ද අනුග්‍රහ දක්වමින් පාසල ගොඩගන්නට වූහ.[26](ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1885)1875-79 වන විට කෝපි මීල පහළගොස් රජයේ ආර්ථික අර්බුදය උග්‍ර වූයෙන් ඉංග්‍රීසි පාසල් පළාත්පාලන ආයතනවලටත් පසුව ඒවා මිෂනාරීන්ටත් නැවත භාර දෙන ලදී. ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව ස්වදේශ භාෂා පාසල්වලට සීමා විය.[27](ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1885) මෙවැනි තත්ත්වයක් තුළමිෂනාරී අධ්‍යාපනය බෙහෙවින් ව්‍යාප්ත වීම නිසා බෞද්ධ හා හින්දු දරුවන්ට මහත් අසාධාරණයක් විය.

මෙලෙස බෞද්ධ හා හින්දු දරුවන්ට අධ්‍යාපනය නොලැබී යාම නිසා ඔවුන් තුළ දැඩි කළකිරීමක් පැවති අතර මිෂනාරී ආගමකි ප්‍රතිපත්ති විවේචනයට බෞද්ධ භික්ෂූන් වහන්සේලා දායක වූහ. දිවයින පුරා තැනින් තැන වාද විවාද බුදුදහම සහ ක්‍රිස්තු ධර්මය මුල් කරගෙන ඇති විය. ඒ අතර ඇති වූ පංච මහා වාද වැදගත් විය. ඉන් සුවිශේෂී වාදය වූයේ 1873 අගොස්තු 26 සහ 28 දෙදින තුළ පැවති පානදුරාවාදයයි. එහි ප්‍රතිඵලයක් ලෙස සර් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සහ බ්ලැවැස්කි මැතිණිය ක්‍රි.ව. 1880 දී මෙරටට පැමිණියහ. බෞද්ධ පරම විඥානාර්ථ සමාගම ආරම්භ කෙරුණි. 1881 දී ඕල්කට් තුමා විසින් බෞද්ධ අධ්‍යාපන අරමුදලක් ආරම්භ කළේය.

එංගලන්ත සභාව කොළඹ බිෂොප් විද්‍යාලය හා කාන්තා විද්‍යාලය ආරම්භ කර තිබූ අතර 1874 දී වෙස්ලියන් මිෂනාරී සමාගම කොළඹ වෙස්ලි විද්‍යාලය ද බැප්ටිස් මිෂනාරී සමාගම කොළඹ කේරි විද්‍යාලය ද ප්‍රෙස්බිටීරියන්වරු ඔවුනගේ පාසල්ද ආරම්භ කළහ. බෞද්ධ විද්‍යාලයන් ආරම්භ විය. ඒ අතර ගාල්ල මහින්ද හා සංඝමිත්තා බාලිකා විද්‍යාලය, ගම්පොල ජිනරාජ විද්‍යාලය, මාතලේ විජය විද්‍යාලය,  නාවලපිටියේ අනුරුද්ධ විද්‍යාලය සහ මහනුවර ධර්මරාජ විද්‍යාලය ද වැදගත් විය. මෙයට අමතරව ක්‍රි.ව. 1873 දී කොළඹ දී විද්‍යෝදය පිරිවෙන ද ක්‍රි.ව. 1887 දී විද්‍යෝදයේ ශාඛාවක් ලෙස රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙණ ද ඇරඹිණි. මේ අතර විද්‍යෝදය පිරිවෙණෙහි අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදු වූ බැවින් ඊට වාර්ෂිකව ආධාර මුදල් වශයෙන් රුපියල් දාහක මුදලක් රජයෙන් ගෙවා ඇත.[28](ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1889)

ක්‍රි.ව. 1879 දී චාල්ස් ද බෲස් මහතා ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ලෙස තේරී පත් වූ පසුව ඔහුට පෙනී ගියේ දිවයිනේ පවතින අධ්‍යාපන ක්‍රමවේදය හා විභාග පටිපාටිය ක්‍රමවත් හා ප්‍රමාණවත් නොවන බවයි.[29](ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1889) එමෙන්ම ඔහු මෙරට උසස් අධ්‍යාපනය නගා සිටුවිය යුතු යැයිද යෝජනා කළේය. ඒ අනුව වර්ෂ 1880 දී කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල පරීක්ෂණ ද 1882 දී ලන්ඩන් විශ්වවිද්‍යාලීය පරීක්ෂණ ද කොළඹදී පවත්වන්නට යෙදුණි. ඊට අමතරව 1884 දී කොළඹ කෘෂිකර්ම විද්‍යාලය ආරම්භ කළේය.[30](ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1885) ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ග්‍රීන් මහතා යුරෝපීය ඉන්ජිනේරු විද්‍යාව ගැන්වීමට ආයතනයක් පිහිටුවීමට යෝජනා කළේ වර්ෂ 1889 දී ය. එහි ප්‍රතිඵලයක් ලෙස 1893 දී ඊපියුමන් මහතා මරදානේ කාර්මික විද්‍යාලය ආරම්භ කළේය.

ඉංග්‍රීසීන් ක්‍රි.ව. 1802 දී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවා තිබුණි. ඒ අනුව ඉංග්‍රීසි නීතිය අනුව නඩු විභාගය සිදුවිය. මේ වන විට ඉංග්‍රීසි උගත් පිරිසක් ද බ්‍රිතාන්‍යයට ගොස් නීතිය හදාරා පැමිණ තිබූ අතර 1874 දී නීති අධ්‍යාපන මණ්ඩලය පිහිටුවා ගෙන මෙරටට අවශ්‍ය නීතිවේදීන් පුහුණු කිරීමට පියවර ගෙන තිබේ. මේ අනුව වර්ෂ 1895 දී ලංකා නීතිවිද්‍යාලය කොළඹ වෙල්ලවීදියේ ආරම්භ කර 1911 දී අලුත්කඩේට ගෙන එන ලදී. මෙයට අමතරව වර්ෂ 1852 දී ශ්‍රීමත් ජෝර්ජ් ඇන්ඩෙසර්න් ආණ්ඩුකාරතුමා බටහිර වෛද්‍ය විද්‍යාවම මෙරට දී ඉගැන්වීමට යෝජනා කළ අතර 1870 වේ දී කොළඹ වෛද්‍ය විද්‍යාලය ආරම්භ කරන ලදී.

අධ්‍යාපනයේ පැවති විෂමතාවයන් දහ නවවන සියවස පුරා දැකගත හැකි විය. මේ නිසා ව්‍යවස්ථාදායක මණ්ඩල සාමාජික ඇම්. කුමාරස්වාමි මහතා විසින් 1865 දී ව්‍යවස්ථාදායක සභාවට යෝජනාවක් ඉදිරිපත් කර සම්මත කළේ ලංකාවේ පවතින අධ්‍යාපනය සම්බන්ධව සොයා බලා වාර්තා කිරීමටය.[31](1865.10.14 ව්‍යවස්ථාදායක සභා වාර්තාව)ඒ අනුව ආර්.එෆ්. මෝර්ගන් මහතා

ප්‍රමුඛ ව්‍යවස්ථාදායක සභා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් උප කමිටුවක් පත් කළේය. එය මොර්ගන් කමිටුව නම් විය. එහි වාර්තාව 1867 ජනවාරි 08 වෙනිදා රජයට බාර දුන් අතර, මුල් වරට රජය අධ්‍යාපනයේ වගකීම බාර ගත යුතු බවත් ගෙවීගිය කාලය තුළ අධ්‍යාපනය දියුණුවක් ලැබුවද එහි අඩුපාඩු බොහෝ පවතින බවත් පෙන්වා දුනි.[32](1867 Sesional Papers No.8 P.34) එමෙන්ම එහි වැඩිදුරටත් සඳහන් වූයේ අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය මහජනයාට අවශ්‍ය පරිදි ලබා දිය යුතු බවයි. මෙයට අමතරව කාර්මික අධ්‍යාපනය, ගුරු පුහුණුව, උසස් අධ්‍යාපනය හා පාසල් පිරිපාලනය පිළිබඳ බොහෝ යෝජනා ද එහි ඇතුළත් විය. නැවත විසිවන සියවස මුල දී එනම් 1900 දී අධ්‍යාපනයට විශාල මුදලක් වියදම් වීම පිළිබඳ රජයේ අවධානය යොමු විය. ඒ අනුව 1900 ඔක්තෝම්බර් 18 වන දින ආණ්ඩුකාර ශ්‍රීමත් වෙස්ට් රිජ්වේ ප්‍රකාශ කළේ යටත් විජිත ලේකම්වරයා විසින් තමාට ලංකාවේ වියදම් අවම කිරීම පිළිබඳ කිහිප අවස්ථාවකදීම දන්වා ඇති බවත්, එහෙත් අධ්‍යාපනයේ දියුණුවට ආධාර නොදීම හෝ එහි ප්‍රගතිය අවහිර කිරීම ශිෂ්ට සම්පන්න රජයකට සුදුසු නොවන බවයි.[33](වෙස්ට් රිජ්වේ 1900.10.18) එහෙත් ඉන් දින හයකට පසුව ආණ්ඩුකාර වෙස්ට් රිජ්වේ ප්‍රකාශ කළේ අධ්‍යාපනයට යන වියදම අධිකවීම නිසා, නගර සභා සහ පළාත් පාලන මණ්ඩල අධ්‍යාපනය සැපයීමේ වගකීම භාරගත යුතු බවයි.[34](වෙස්ට් රිජ්වේ 1900.10.24)අධ්‍යාපනය පළාත් පාලන ආයතනවලට බාරදීමේ වැඩපිළිවෙල විමර්ශනය කිරීම සඳහා 1901 දී සිවිල් සේවා නිලධාරීන් තිදෙනෙකු යටතේ කමිටුවක් පත් කළේය.

මෙසේ පත්කළ කමිටුව සෙස් කමිටුව නම් විය. එහි වාර්තාව 1902 ජනවාරි 17 වෙනිදා රජයට බාර දෙන ලදී.[35](ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාව 1883 පි.46) එමඟින් අධ්‍යාපනය පළාත්පාලන ආයතන වෙත යොමු කිරීමට යෝජනා ඉදිරිපත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පළාත්පාලන ආයතනවලට අමතරව බද්දක් අයකර එම බද්ද ඉංග්‍රීසි අධ්‍යාපනය නැංවීමට යෙදවීමට යෝජනා විය.[36](1884 අංක 33 දරණ ආඥා පනත)මේ අතර 1901 දී පැවති ජනගහණ කමිටු වාර්තාව මඟින් ද අධ්‍යාපනයේ බොහෝ අඩුපාඩු පෙන්වා දී ඇත. එයට අනුව පාසල් යන වයසේ දරුවන්ගෙන් හතරෙන් තුනක්ම පාසල් නොයන බවත් මිෂනාරී පාසල් රජයේ පාසල්වලට වඩා බෙහෙවින් වැඩි බැවින් රජයේ පාසල් විවෘත නොවීම කනගාටුදායක බවත් මෙරට බාලිකා අධ්‍යාපනය ඉන්දියාව හා බුරුමයට වඩා පහත් මට්ටමක ඇති බවත් උසස් අධ්‍යාපනය අතින් මෙරට දියුණු වී නැති බවත් පෙන්වා දුන්නේය.[37](1901 ජනගහන වාර්තාව)

මේ අතර 1880 දී ස්ටීල් ඕල්කට්තුමාගේ පැමිණීමත් සමඟ අනගාරික ධර්මපාල, හික්කඩුවේ ශ්‍රී සුමංගල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, රත්මලානේ ධම්මාලංකාර හිමි බත්තරමුල්ලේ සුභූති හිමි මෙන්ම පොන්නම්බලම් අරුණාචලම්, පොන්නම්බලම් රාමනාදන්, ශ්‍රී ලා ශ්‍රී ආරුමුග නාවලර් තුමා ද ඇතුළු ගිහි පැවිදි සිංහල සහ දමිළ විශාල පිරිසක් අධ්‍යාපන උන්නතිය වෙනුවෙන් පෙනී සිටියහ. එහිදී පරමවිඥානාර්ථ සමාගම, මහා බෝධි සමාගම මෙන්ම ශෛව පරිපාලන සභාව ද පාසල් දියුණු කිරීමට බෙහෙවින් කැපවී ක්‍රියා කළේය. ඒ අනුව එතෙක් පැවති මිෂනාරි, රජයේ සහ පෞද්ගලික පාසල්වලට අමතරව බෞද්ධ හා හින්දු පාසල් බොහෝමයක් ආරම්භ කළේය.[38](සුමතිපාල 1968 පි.28-32)

| වර්ෂය | බෞද්ධ පාසැල් ගණන | හින්දු පාසැල් ගණන |
|---|---|---|
| 1880 | 04 | 01 |
| 1885 | 08 | 04 |
| 1890 | 18 | 06 |
| 1895 | 52 | 30 |
| 1900 | 142 | 45 |

1902 දී මූලික අධ්‍යාපන පනත බ්‍රිතාන්‍යයේ සාර්ථකව ක්‍රියාත්මක වීම නිසා මෙරට ද 1906 අංක 05 දරණ අධ්‍යාපන ආඥාපනත අනුව නගර සභා සීමාවල පාසල් මගින් එම ප්‍රදේශවල දරුවන්ට ස්වභාෂාවෙන් අධ්‍යාපනය දීම අනිවාර්ය කරන ලදී. පාසල් නොඑන ශිෂ්‍යයෙකුට මුලින් රුපියල් 20.00 ක් ද පසුව දිනකට රුපියල් 10.00 බැගින් අමතරව දඩ ද ගෙවීමට නියම විය.[39](1906 අංක 05 ආඥා පනත)මෙයට අමතරව 1907 අංක 08 දරණ ග්‍රාමීය පාඨශාලා ආඥාපනත ද වැදගත් විය.

එමඟින් ග්‍රාමීය ප්‍රදේශවල සහ වතුකරයේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම අනිවාර්ය කරන ලදී. එමගින් පාසැල් පවත්වාගෙන යාම හා ඉදිකිරීම සඳහා ග්‍රාමීය පාසල් කමිටු සහ දිස්ත්‍රික් කමිටුවලට බලතල ලබා දුනි.[40](1907 අංක 08 දරණ ග්‍රාමීය පාසල් ආඥා පනත)

මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පිරික්සා බැලීමට මැකලම් ආණ්ඩුකාරයාගේ ඉල්ලීම මත ජේ.ජේ.ආර්.බ්‍රිජ් 1911 දී ලංකාවට එවන ලදී. ඔහු ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳ සකස් කළ වාර්තාවක් 1912 දී එංගලන්තයේ අධ්‍යාපන මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.[41](බ්‍රිජ් වාර්තාව 1912 පි.21) බ්‍රිජ්වාර්තාවෙන් මෙරට අධ්‍යාපනය පිළිබඳ දීර්ඝව කරුණු ඉදිරිපත් කර තිබුණි. බ්‍රිජ් කරුණු පරීක්ෂා කරන විට ආණ්ඩුකාරයා 1911.06.29 දින නවදෙනෙකුගෙන් යුත් තවත් කමිටුවක් අධ්‍යාපනය සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළේය. එය මැක්ලියෝ කමිටුව නම් විය. මැක්ලියෝ කමිටුවට ප්‍රධාන ලෙස බලපෑවේ ද්විතීක පාසැල්වල ස්වදේශ භාෂාවන්ගෙන් අධ්‍යාපනය ලබා දීම සම්බන්ධව සොයා බැලීමට යි.[42](මැක්ලියෝ වාර්තාව 1912) මෙම වාර්තා දෙක පදනම් කරගෙන ඉංග්‍රීසි රජය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළේය.

එහෙත් මේ වෙන විට දිගින් දිගටම දේශපාලන ප්‍රතිසංස්කරණ ගැන මෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන ද යෝජනා ඉදිරිපත් වූ බැවින් 1920 අංක 01 දරණ අධ්‍යාපන ආඥාපනත හඳුන්වා දනෙ ලදී. 1920 වන තුරු අධ්‍යාපන අධ්‍යක්ෂ යන තිලය වත් ඔහුගේ දෙපාර්තමේන්තුවත් සංස්ථාපනය කරවන නීතියක් ලංකාවේ නොවීය.[43](ලංකාවේ අධ්‍යාපන සියවස 02 කාණ්ඩය පි.529) මේ නිසා 1920 අංක 01 දරණ ආඥා පනතින් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව ස්ථාපිත කිරීම, අධ්‍යාපන මණ්ඩල පිහිටුවීම, පාසල් තුළ අපක්ෂපාතීව ආගම ඉගැන්වීම, දිස්ත්‍රික් අධ්‍යාන කමිටු පිහිටුවීම, වතු පාසල් කටයුතු, මුදල් පරිපාලනය වැනි කරුණු රැසක් ක්‍රියාත්මක විය.[44](1920 අංක 1 අධ්‍යාපන ආඥා පනත)

තවද ඉන් අනතුරුව ද අධ්‍යාපනය පිළිබඳ යෝජනා දිගින් දිගටම ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් විය. 1926 පෙබරවාරි 26 වන දින ව්‍යවස්ථාදායක සභා මන්ත්‍රී ඒ. කනගරත්නම් මහතා රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය විවේචනය කරමින් කියා සිටියේ ස්ව භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට දරුවන්ට අයිතියක් ඇති බවයි.[45](රංජිත් රුබේරු, ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය පි.179) තවද අධ්‍යාපනය සම්බන්ධව කොමිසමක් පත් කිරීමට සර්.ඩී.බී. ජයතිලක මහතා ගෙන ආ යෝජනාව ස්ථිර කළේ ඊ.ඩබ්. පෙරේරා ය. ඒ අනුව 1926 ජූලි 17 මැක්රේ කමිටුව පත් කරන ලදී.[46](ව්‍යවස්ථාදායක මණ්ඩල වාර්තාව 1926 පි.365-368) මැක්රේ කමිටුව පොන්නම්බලම් රාමනාදන්, වයිතිලිංගම් දොරේසාමි, ජී.ඩබ්.ඩබ්. කන්නන්ගර, ඒ. කනගරත්නම්, ටී.බී. ජයා, ඩී.බී. ජයතිලක, ජී.ඒ.එච්. විලී, ඩබ්.ඒ ද සිල්වා, ජී.බී. රඹුක්වෙල, සී ද එස් කුලරත්න, ජෝන් බික්නේල් පියතුමා සහ ජොන් බැප්ටිස් වීරි පියතුමා යන අයගෙන් සමන්විත විය. මැක්රේ කමිටුව සිංහල හා ඉංග්‍රීසි පාසල් පිළිබඳවත් සමස්ථ අධ්‍යාපනය පිළිබඳවත් කරුණු අධ්‍යයනය කළේය. එම කමිටුවට කරුණු ඉදිරිපත් කළ ඇමරිකා එක්සත් ජනපදයේ මහාචාර්ය කීල් පැට්රික් පෙන්වා දුන්නේ හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානියනුවෙන් බෙදුන පාසල් පැවතීම තුළින් සමස්ථ සමාජයම තුළම බෙදීමක් තදින් ඇති වන බවයි. රටේ අවශ්‍යතාවයට සෑහෙන මිනිස් බලයක් අධ්‍යාපනය තුළින් ලබා දිය යුතු බව ඔහු පෙන්වා දුන්නේය.[47](1929 ව්‍යවස්ථාදායක මණ්ඩල වාර්තාව අංක 28 පි.262) මේ දෙකම එදා සිට අද දක්වාම සිදුවේද යන්න විමසා බැලිය යුතුය.

මේ අනුව බලන විට යටත් විජිත යුගය පුරා බටහිර අධ්‍යාපනය හඳුන්වාදීම සහ විවිධ වෙනස්කම් සිදු වූයේ යටත්විජිත පාලකයන්ගේ සහ මිෂනාරි සමාගම්වල අවශ්‍යතාවය මතය. රජය ඇතැම් විට අධ්‍යාපනය මිෂනාරීන්ට පවරා දුනනේ වියදම අඩුකර ගැනීමේ සහ අවශ්‍යතා සපුරා ගැනීමේ පහසු මග එය වූ බැවිනි. එහෙත් රටේ ජනතාවට අවශ්‍ය අධ්‍යාපනයක් ඉන් ලැබුනේද යන්න ගැටලු සහිතය.

එවන් පසුබිමක 1931 සිට ක්‍රියාත්මක වූ ඩොනමෝර් ව්‍යවස්ථාදායකය තුළ මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ට අධ්‍යාපනය මෙහෙයවීමේ වගකීම ප්‍රථම වරට ලැබුණි. එතෙක් එම වගකීම පැවතියේ එංගලන්ත අධ්‍යාපන ඇමතිවරයාටය. ඩොනමෝර් ව්‍යවස්ථාදායක සභාව පළමුවරට 1931 ජූලි 08 වෙනිදා රැස්විය. එහිදී පත් වූ ප්‍රථම අධ්‍යාපන විධායක කමිටුව මෙසේය. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා, එච්.ඩබ්. අමරසූරිය මහතා, ඩබ්.බී. කරලියැද්දේ මහතා, ඒ.

රත්නායක මහතා, ජී.ආර් ද සොයිසා මහතා, ජී.ඊ මඩවල මහතා සහ එස්.ඒ වික්‍රමසිංහ මහතාය. එහි සභාපති සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා මෙරට ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා ද විය.

කන්නන්ගර අධ්‍යාපන යුගය කොටස් 2කි. එනම් 1931-1938 යුගය ප්‍රථම භාගය සහ 1939-1948 දෙවන භාගය වේ. මේ කාලසීමාව තුළ 1939 අංක 31 සරව ආඥාපනත සහ 1945, 1946, 1947, 1951, 1953 දී ඊට ගෙන ආ සංශෝධන ද 1947 දරන අංක 26 දරන ආඥාපනත ද වැදගත් වේ. දේශීය බුද්ධිමතෙකු යටතේ අධ්‍යාපනයේ මල්ඵල දරූ ස්වර්ණමය යුගය ලෙස අද දක්වාම විද්වතුන් සළකන්නේ කන්නන්ගර යුගයයි. එදා මෙදා තුර එක ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල දක්වා නිදහස් අධ්‍යාපනය ලබා දෙන ලොව පිහිටි රටවල් දෙක අතරට ලංකාව ද එක් වූයේ මේ නිසාය. මෙයට අමතරව ශිෂ්‍යත්ව ලබාදීම, ග්‍රාමීය හා වතු අධ්‍යාපනය නගා සිටුවීම, මධ්‍ය විද්‍යාල ඇරඹීම, නොමිලේ ශිෂ්‍ය දිවා ආහාර ලබාදීම, ගුරු වැටුප් හා විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, වැඩිහිටි අධ්‍යාපනය, පාසැල් සෞඛ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම, විභාග පැවැත්වීම ක්‍රමවත් කිරීම, ප්‍රාථමික අධ්‍යාන අවස්ථා පුළුල් කිරීම,අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර ශක්තිමත් කිරීම, පාසල තුළ වෙනත් ආගම් ඉගැන්වීම තහනම් කිරීම, පාසල් වෙත ආධාර ලබාදීම වැනි දහසකුත් එකක් කාර්යයන් මෙකල ආරම්භ විය. ගෙවීගිය දශක නවය තුළ පත්වූ රජයන්ට එම කටයුතු සියල්ල නිසි ලෙස පවත්වාගෙන යාමට නොහැකි වීමෙන් කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිපත්තිවල වැදගත්කම වැටහී යයි.

**මූලාශ්‍රය**


1. People and Nation (A world History) Anatode G. Mazour 1983 USA. P. 366
2. ජී. ෂුරාමර් සහ අයි. විකී Epistolae S. Francisici Xaver ii සංස්: Manumenta Historica Societatis Iesu, Rome 2 කාණ්ඩය 14, 14 275-473 පි.
3. Ceylon Antiquary and Literary Register II පි. 15
4. - එම - පිටුව 80
5. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සියවස් I කාණ්ඩය අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ, 1969 පිටුව 283
6. ආණ්ඩුකාර විලියම් පැල්ක් විසින් හතාවියේ අග්‍රාණ්ඩුකාරවරයාට යැවූ වාර්තාව 1757-59 රා.ලේ. ලන්දේසි ලේඛන අංක 2743
7. 1690.08.24 දින ලන්දේසි දේශපාලන මණ්ඩල වාර්තාව රාජ්‍ය ලේඛනාගාරය අංක 31 ලන්දේසි වාර්තාව පිටුව 455
8. 1746.11.26 ලන්දේසි දේශපාලන මණ්ඩල වාර්තාව, රාජ්‍ය ලේඛනාගාරය ලන්දේසි වාර්තාව 101
9. ලංකා ආණ්ඩුකාරයාට අග්‍රාණ්ඩුකාරයා නිකුත් කළ උපදෙස් (1656-1665) සොපයා පීටර්ස් රාජ්‍ය මුද්‍රණය 1908 (ඉංග්‍රීසි පරිවර්තනය) පිටුව 82
10. Terner L.J.B. Collected papers on the History of theMeritime Provinces of Ceylon 1795-1805, Times Printers 1923, P. 161
11. 1799.01.15 දින ගාලු සම්මේලනයේ දී නෝර්ත් ආණ්ඩුකාරයාගේ දේශනය
12. 1799.02.26 නෝර්ත් ආණ්ඩුකාරයා නැගෙනහිර ඉන්දීය වෙළඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට යවන ලද ලිපිය.
13. 1800 ජනවාරි 30 නෝර්ත් ආණ්ඩුකාරයා පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමට යැවූ ලිපිය
14. 1803 පෙරබරවාරි 08 දින යටත් විජිත ලේකම් විසින් නෝර්ත් ආණ්ඩුකාරයාට එවූ ලිපිය
15. 1810.09.30 යටත් විජිත ලේකම් මේට්ලන්ඩ්ට එවූ ලිපිය
16. 1816.11.05 බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා යටත් විජිත ලේකම්ට යැවූ ලිපිය
17. පාර්ලිමේන්තු මන්ත්‍රී බටර්වර්ත් මහතා 1815.10.09 දින යටත් විජිත ලේකම්ට යැවූ ලිපිය
18. 1834.05.16 ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රය
19. Colboork Cameroon Papers Vol. 1 P.188
20. මදුරාසි බිෂොප්වරයා 1840.05.25 දින මැකන්සි ආණ්ඩුකාරවරයාට එවූ ලිපිය
21. Central School Commission Report 2 (1841-1842) p.23
22. - ibid - Report No. 12 (1853) P. 12

23. Constitutional Council Sesional Papers (1960-61)
24. 1857.06.14 The Examiner Newspaper / 1857.12.14 The Colombo Observer
25. 1854.05.30 The Times of Ceylon
26. ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1885 පි.62
27. - එම - පි.68
28. ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1889 පි.53
29. - එම - පි 46
30. - එම - 1885 පි.76
31. 1865.10.14 Constitutional Council Sesional Papers P.36
32. 1867 Constitutional Council Sesional Papers No. 8 p. 34
33. ආණ්ඩුකාර වෙස්ට් රිජ්වේගේ ව්‍යවස්ථාදායක ඇමතුම 1900.10.18 පි.324
34. - එම - 1900.10.24 දින
35. ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තුමේන්තුවේ පාලන වාර්තාව 1883 පි.46
36. 1884 අංක 33 දරණ ආඥා පනත
37. 1901 ජනගහන වාර්තාව
38. සුමතිපාල කේ.එච්.එම්. ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය තිසර ප්‍රකාශකයෝ දෙහිවල 1968 පි.28-32
39. 1906 අංක 5 දරණ අධ්‍යාපන ආඥා පනත
40. 1907 අංක 8 දරණ ග්‍රාමීය පාඨශාලා ආඥා පනත
41. බ්‍රිජ් වාර්තාව, Sesional Papers No. 21, p. 46
42. Sesional Papers No.20, P. 26මැක්ලියෝ වාර්තාව
43. අධ්‍යාපන සියවස 2 කාණ්ඩය පි. 529
44. 1920 අංක 1 දරණ අධ්‍යාපන ආඥා පනත
45. රුබේරු රංජිත්, ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය, අපෝතිකරිස් සමාගම කොළඹ 1971 පි. 179
46. ව්‍යවස්ථාදායක මණ්ඩල වාර්තාව 1926 පි.365 - 367
47. මැක්රේ කමිටු වාර්තාව

# අධ්‍යාපන දර්ශනය එදා සහ අද : සී.ඩබ්.ඩබ්. කන්නන්ගරගේ දායකත්වය

**ඒ. හරිනි නවෝදා ද සොයිසා, කෞශල්‍යා යටිගම්මන, ගාමිණී විජයරත්න**
ජාතික විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

අධ්‍යාපනය යන සංකල්පය සියවස් ගණනක් තිස්සේ පරිණාමය වෙමින් පැවත එන්නකි. එය කාලයෙන් කාලයට, සංස්කෘතියෙන් සංස්කෘතියට හා රටින් රටට අනම්‍ය වූ ආකාරවලින් පැවත ආ බව පෙනේ. සෑම ක්ෂණයකම වෙනස් වන ලෝකයේ අධ්‍යාපනයද ඒ හා වේගයකින්ම පරිණාමයට පත් වේ."Educare" යන ලතින් වචනයෙන් බිඳී ආ මෙම "Education" යන්නෙහි අර්ථය 'ඉවතට ගෙනයාම' නැතහොත් 'පිටතට මතුකර දීමයි'. එනම් ශිෂ්‍යාගේ දැනුම, කුසලතා හා ආකල්ප පිටතට මතු කර දීමයි(මගේ ලෝකයඨ අධ්‍යාපනය හා අධ්‍යාපන දර්ශනය, 2016).

අධ්‍යාපනය සම්බන්ධයෙන් මුල් වරට අදහස් ප්‍රකාශ කරන්නේ ග්‍රීක ජාතික ප්ලේටෝ (Plato) නම් දාර්ශනිකයා විසිනි. තත්කාලීන සමාජ රටාවන්හි යහ පැවැත්මට අධ්‍යාපනය කොතරම් උවමනා වීද යන්න ඔහු විසින් දක්වා ඇත. අධ්‍යාපනය යනු වෘත්තීය පුහුණුවක් යන පටු අදහස බැහැරලූ ප්ලේටෝ පැවසුවේ පුද්ගලයාට පුරවැසිභාවය පිළිබඳ පරිපූර්ණත්වයට ළඟා වීමත් යුක්ති සහගතව පාලනය කල හැකි ලෙස ලබා දෙන අධ්‍යාපනය නියම අධ්‍යාපනය බවයි. එතුළින් පූර්ණ පෞර්ෂයකින් හෙබි මිනිසෙකු බිහිකිරීම ඔහුගේ අදහස විය. මෙහිදී විෂය මාලාව පොදු වියයුතු බවත්, එය ගැහැණු පිරිමි දෙපක්ෂයටම පොදු විය යුතු බවත්, වයසට හා ලැදියාවන්ට අනුරූප වියයුතු බවත් ඔහු දක්වා ඇත (මගේ ලෝකයඨ අධ්‍යාපනය හා අධ්‍යාපන දර්ශනය, 2016). ඔහු අධ්‍යාපනය මූලික අධ්‍යාපනය, ද්වීතීක අධ්‍යාපනය හා තෘතීක අධ්‍යාපනය ලෙස ව්‍යුහ 3ක් යටතේ විස්තර කර ඇති අතර අධ්‍යාපනය යනු කය සහ ආත්මය සංවර්ධනය කිරීමයි.

ශ්‍රී ලංකාවට ගැළපෙන පරිදි අධ්‍යාපන දර්ශනයක් මුල් වරට හඳුන්වා දුන් ශ්‍රේෂ්ඨ නායකයා ලෙස ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාය. 1947 වර්ෂයේදී කල්කටා විශ්ව විද්‍යාලයේ පැවති සමුළුවකදී අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔහු විසින් කරන ලද ප්‍රකාශනයක් පහතින් උපුටා දැක්විය හැක.

"අධ්‍යාපනය යනු සාක්ෂරතාවය පමණක් නොවේ. ඒ තුළින් රටක ජනතාවගේ චින්තන ක්‍රමය හැඩ ගැස්වීම ප්‍රධාන විය යුතුය. නිදහස්ව, නිවහල්ව, සිතන්නට, කියන්නට හැකි ජනතාවක් බිහි කිරීම එහි මුඛ්‍ය පරමාර්ථය විය යුතුයි. නිදහස් අධ්‍යාපනය ජාතික චින්තනයේ මුරගල විය යුතුයි. අපගේ දේශයෙහි පාසල් පද්ධතියේ ක්‍රියාකාරීත්වය විය යුත්තේ අපගේ භාෂාව, අපගේ ආගම, අපගේ සංස්කෘතිය සහ සම්ප්‍රදායන් සඳහා නැඹුරු කරවීම මෙන්ම ඉහත කී පරිදි ගැඹුරු චින්තනයකින් යුතු වූ දරු පරපුරක් මෙන්ම වැඩිහිටි පරපුරක් බිහි කිරීමයි".

ව්‍යුහ 3ක් යටතේ විස්තර කරතිබූ ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනය, කන්නන්ගර අධ්‍යාපන දර්ශනය යටතේදී බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපනය නොමිලේ ලබා දීමටත්, සෑම දරුවෙකුටම සම අධ්‍යාපන අවස්ථා ලබා දීමටත් කටයුතු කරන ලදී. ප්ලේටෝගේ දර්ශනය තුළ මෙන්ම කන්නන්ගර දර්ශනය තුළද සමානාත්මතාවය, පුරවැසි භාවය හා පුද්ගලයා තුළ මානසික සංවර්ධනය ඇති කිරීම අපෙක්ෂා කර ඇත. එසේම එතුමාගේ අධ්‍යාපන ක්‍රමය තුළින් ශාරීරික, මානසික, සදාචාරාත්මක හා සෞඛ්‍ය වර්ධනයක් අපේක්ෂා කළ අතර, එම සෑම අංශයක්ම සමතුලිතව වර්ධනය කර ගනිමින් පූර්ණ පෞරුෂයක් සංවර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී. මේ අනුව අපට පෙනී යන්නේ ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනය හා කන්නන්ගර අධ්‍යාපන දර්ශනය තුළ බොහෝ සමානතා දක්නට ලැබෙන බවයි.

## කන්නන්ගර අධ්‍යාපන දර්ශනය

අධ්‍යාපන ක්‍රියාවලියේ දී මතුවන ගැටළු, ප්‍රශ්න අවම කරමින් ඒවාට ප්‍රායෝගික විසඳුම් සපයා ගැනීම හා අධ්‍යාපනයට අදාළ සංකල්ප හා අදහස් විශ්ලේෂණය කිරීම අධ්‍යාපන දර්ශනයේ අපේක්ෂාවයි. එවකට සර්වජන ඡන්ද බලය ලැබුණු අවස්ථාව වන විට ශ්‍රී ලාංකේය ජනතාවගේ සාක්ෂරතාවය තිබුණේ 20% පමණ අවම ප්‍රතිශතයකයි. ඊට ප්‍රධාන හේතුව එවකට අධ්‍යාපනය

සීමා සහිත වීමයි. මේ නිසා කන්නන්ගර මැතිතුමාගේ අදහස වුයේ මෙලෙස ජනතාව අධ්‍යාපනය නොලැබීම භයානක තත්වයක් බවයි. එවන් වකවානුවකදී ඔහු විසින් කන්නන්ගර අධ්‍යාපන දර්ශනයක් හඳුන්වා දෙන ලදී.

කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන දර්ශනය පිළිබඳව විමර්ශනය කරන විට අපට පෙනී යන්නේ වරප්‍රසාද නොලද ජනයා රැකියා නියුක්තියට අවශ්‍ය දැනුමින් හා කුසලතාවලින් සන්නද්ධ කොට සමාජ සවලතා ඇති කරමින්, ජාතික සංවර්ධනයට සහ ආර්ථිකයට දායක වන්නා වූ, අධ්‍යයන ගාස්තු වලින් නිදහස් වූ සියලු පාසල් වලට පොදු, තනි අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දී ඇති බවයි. මෙයට මුල් පදනම 1944 දී හැන්සාඩ් වාර්තාවක නිදහස් අධ්‍යාපන පිළිවෙත සම්බන්ධයෙන් එතුමා කරන ලද ප්‍රකාශනයක දැක්වේ. ඒ මගින් සෑම පුරවැසියෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරක්ෂිත කර ඇත.

"අපි ගම් වලින් ආරම්භ කරමු. එතෙරවනු සඳහා දැඩි ආශාවෙන් තම දෑත් දිගු කොට තමන්ට කිසිසේත් තරණය කළ නොහැකි ස්ටික්ස් ගංගාවෙන් තමන් එතෙර කරන්නැයි ඉල්ලා සිටින මිනිසුන් සහිතව ඊනියාස් දුටු පින්තූරය පරිදි, අධ්‍යාපනය සඳහා බලාපොරොත්තු විරහිතව හඬනා අපේම මිනිසුන් සිටින තැනින් පටන් ගනිමු. අධ්‍යාපනය සඳහා දැඩි ආශාවක් පවතී"( වන්නිනායක, 2017).

ඔහු විසින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන දර්ශනය තුළ මූලික අරමුණු 2ක් දක්නට විය.

- සහජ කුසලතා ඇති සෑම පුද්ගලයෙකුටම සමාජයේ ඉහළම තත්වයට එළඹීමට සම අවස්ථා තිබිය යුතුයි.
- සෑම තලයකම අධ්‍යාපනය නොමිළේ ලබා දිය යුතුය.

මේ මගින් ඔහු අපේක්ෂා කළේ ජාති, ආගම්, කුල, වත්පොහොසත්කම් නොසලකා සෑම දරුවෙකුටම බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් නොමිළේ අධ්‍යාපනය ලබා දීමත්, බාලාංශයෙන් පටන් ගෙන වසරෙන් වසර ක්‍රමයෙන් ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබා දීමත්ය. එතුමා විසින් පසුකාලයේදී කොළඹ තිබූ සුපිරි පාසල් ගමට ගෙන යාමේ පියවරක් වශයෙන් මධ්‍ය විද්‍යාල ආරම්භ කරන ලදී. මෙය එක්තරා ආකාරයකට පාසල් අවධියේ සිටම ඇති නැති පරතරය අවම කිරීමට ගන්නා ලද වෑයමේ ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දිය හැක. මෙලෙස මධ්‍ය විද්‍යාල ආරම්භ කර, ඒවාට දක්ෂ ගුරුවරුන් පත් කොට ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ මගින් ග්‍රාමීය දක්ෂ දරුවන් මධ්‍ය විද්‍යාල වලට තෝරා ගෙන, ඉගැන්වීමේ ක්‍රමයක් මුලින්ම මධ්‍ය විද්‍යාල 4කින් ආරම්භ කරන ලදී.

**කන්නන්ගර අධ්‍යාපනයේ එදා තත්වයන්**

එවකට කන්නන්ගර අධ්‍යාපන ක්‍රමය පැවතියේ බහුතර ශ්‍රී ලාංකීය ජනතාවට හිතකර ආකාරයෙන් නොවේ. එදා අධිරාජ්‍යවාදී පාලකයන්ගේ අරමුණු සඳහා යොදා ගෙන තිබූ අධ්‍යාපන ක්‍රමය නිසා ස්වභාෂා අධ්‍යාපනයට වැදගත්කමක් නොතිබුණි. එවකට ධනපති පවුල් වලට පමණක් අධ්‍යාපනය ලැබීමේ භාග්‍යය උරුම වී තිබුණි. මෙය සමාජ ගැටලුවක් විය. මෙවැනි සන්දර්භයක් තුළ ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතිය ජාතික ලක්ෂණයන්ගෙන් සමන්විත කරවීම කන්නන්ගර මැතිතුමාගේ අභිප්‍රාය විය. ඒ සඳහා ගත් පියවරක් වශයෙන් නිදහස් අධ්‍යාපන පණත හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලය වුයේ මෙතෙක් ධනපති පන්තියට පමණක් සීමා වී තිබූ අධ්‍යාපනය ලැබීමේ අයිතිය දුප්පත්, අහිංසක, ග්‍රාමීය දරුවන්ටද හිමි කර ගැනීමට හැකියාව ලැබීමයි.

නිදහස් අධ්‍යාපන පණත ඉදිරිපත් කරමින් එතුමා පවසා සිටියේ,

"මේ රටේ සෑම ළමයෙකුටම ඔහුගේ මව්පියන්ගේ වත් පොහොසත්කම් නොබලා ස්වකීය ඥාන ශක්තිය දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන අටියෙන් ප්‍රාථමික අවධියේ පටන් විශ්වවිද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය ඇති විය යුතුය. මේ තීරණය මම තදින්ම අනුමත කරමි" යනුවෙනි(වන්නිනායක, 2017).

කන්නන්ගර මැතිතුමා විසින් අධ්‍යාපන අවස්ථා හැකි තරම් පුළුල් කිරීම සඳහා ඊට පිළියම් වශයෙන් ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමයත්, වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයත් සංවිධානය කරන ලදී. ග්‍රාමීය අධ්‍යාපන

ක්‍රමය ඇරඹීම තුළින් හැකි තරම් ග්‍රාමීය ප්‍රදේශවල පාසල් ඉදි කිරීමත්, ඒවායේ විෂයමාලාවන්ට ප්‍රායෝගික විෂයන් ඇතුළත් කිරීමත් සිදු විය.

1932 දී හැන්සාඩ් වාර්තාවේ දක්වා ඇති පරිදි;

"ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන අරමුණ වූයේ පාසල් ගොඩනැගිල්ල ඇතුළත කටයුතු සඳහා පැය 2ක් සහ එළිමහනේ කටයුතු සඳහා පැය 3ක් වැය කිරීමයි. අප මින් අදහස් කරන්නේ බුද්ධි වර්ධනය, සෞඛ්‍ය සහ කායික වර්ධනයත්, සෞන්දර්ය සහ සමාජ සංවර්ධනයත්ය''(අතුකෝරාල,2017).

එසේම වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය තුළින් රාත්‍රී ඉංග්‍රීසි පාසල් පිහිටුවා ඒ මඟින් වැඩිහිටි තරුණයින්ට ඉංග්‍රීසි භාෂාව ලිවීමට හා කියවීමට පුහුණුවක් ලබා දෙන ලදී. මේ නිසා ලංකාවේ සියලුම දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා දීම නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය ලැබීම.
- ප්‍රාථමික අවධියේදී ඉගැන්වීම මව් බසින් සිදු කිරීම.
- තුන්වැනි ශ්‍රේණියේ සිට සෑම පාසලකම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම.
- දරුවාගේ හිස, හදවත සහ අත් (Head, Heart, Hand-3H) සංවර්ධනය වන පරිදි විෂය මාලාවක් හඳුන්වා දීම(කරුණාරත්න, 2018).

මින් අදහස් වන්නේ අධ්‍යාපනය දරුවාගේ බුද්ධි වර්ධනය සඳහාම පමණක් නොවිය යුතු බවයි. මෙහිදී 'අත්' (Hand) කෙරෙහි අවධානය යොමු කරන ලද්දේ ප්‍රායෝගික අධ්‍යාපනයේ වැදගත්කම පෙන්වා දීමටයි. එනම් යම් ක්‍රියාවක් තුළින් ලබන දැනීමයි. 'හිත' (Mind) යනුවෙන් අදහස් වන්නේ සත්‍ය වටහා ගැනීමයි.

**කන්නන්ගර දර්ශනය හා නූතන ඉගෙනුම් ක්‍රම භාවිතයන්**

වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රබල බලපෑමක් කළ ධනාත්මක මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ නිර්මාතෘ ලෙස හඳුන්වන මහාචාර්ය Martin Seligman වරෙක ප්‍රකාශ කර ඇත්තේ;

"ශත වර්ෂයකට වඩා ශිෂ්‍යයන්ගේ පාසල් ඉගෙනීම අවධානය යොමු කර තිබුණේ සාර්ථකතා, ජයග්‍රහණ හා සාධන ළඟා කර ගැනීමටයි. කෞශල්‍යය වර්ධනය කර ගැනීමටයි. විනයානුකූල කිරීමටයි. නමුත් එම දක්ෂතා වර්ධනය කරමින්, යහපැවැත්ම සඳහා කුසලතා සහ සාධනය යන දෙඅංශයම එක්ව වර්ධනය කළ හැකි නම් එය වඩාත් ප්‍රශස්ථය යනුවෙනි" (අතුකෝරාල,2017).

එසේම 21 වෙනි ශතවර්ෂයේ අධ්‍යාපනඥයින් අවධාරණය කරන්නේ;

"වර්තමාන ගුරුවරුන් විසින් තම ශිෂ්‍යයන් සූදානම් කළ යුතුව ඇත්තේ, තවමත් නිර්මාණය වී නොමැති රැකියා සඳහාය. තවමත් සොයාගෙන නොමැති නව නිෂ්පාදන වල කටයුතු කිරීම සඳහාය. එසේම නිර්මාණය හා නවෝත්පාදනය ගොඩ නැංවීම සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කිරිම සඳහාත්ය'' (Trilling Fadel, 2009).

ඉහත ප්‍රකාශ අනුව පෙනෙන්නේ වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කන්නන්ගර දර්ශනය තුළ මෙන්වර ප්‍රසාද නොලද ජනයා රැකියා නියුක්තියට අවශ්‍ය දැනුමින් හා කුසලතාවලින් සන්නද්ධ කොට සහජ කුසලතා ඇති සෑම පුද්ගලයෙකුටම සමාජයේ ඉහළම තත්වයට එළඹීමට සම අවස්ථා ලබා දීම වැදගත් කොට සලකන බවයි. එසේ වුවත් වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් යම් අඩුපාඩු දක්නට ලැබේ. ඒවා අතර;

- විභාග විසින් විෂයමාලාව යටපත් කර ගෙන සිටීම.
- ද්විතීක පාසල් වල විෂයමාලාව පටුවීම.
- ප්‍රායෝගික වැඩ සඳහා උපකරණ ප්‍රමාණවත් නොවීම.
- වැඩිහිටි අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් පියවර නොවීම(කන්නන්ගරාවලෝකන, 2017)

ශ්‍රී ලංකාව තුළ පවතින අධ්‍යාපන ක්‍රමය වරින් වර විවිධ වෙනස්කම් වලට භාජනය වුවද සැලකිය යුතු වෙනසකට පාත්‍ර වී නැත. මේ නිසා බොහෝ පාසල් වල තවමත් තාක්ෂණය භාවිතයට ගැනීම,

පරිගණක පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම හා පාසල් වෙත අන්තර්ජාල පහසුකම් සැලසීමේ ගැටලු දක්නට ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ තවමත් අධ්‍යාපන හා ඉගැන්වීමේ ක්‍රමවේදයන් සම්ප්‍රදායික ක්‍රමවේදය (Traditional Method) තුළ ගොඩ නැගී තිබේ. Tablet, Computers, Smart Phone, Laptop, Projectors වැනි උපාංග ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීම නාගරික පාසල් වල සැලකිය යුතු ප්‍රමාණයකට කළද, ග්‍රාමීය පාසල් වල එවැන්නක් සිදු නොවේ. ඊට හේතු ලෙස;

- බොහෝ පාසල් වලට මෙම උපාංග (Devices) මිළදී ගැනීමට ප්‍රතිපාදන නොමැති වීම.
- ඒවා පිළිබඳ මනා පුහුණුව ලත් ගුරුවරුන් හිඟකම පෙන්වා දිය හැක.

(https://roar.media/sinhala/main/sponsored/evolution-of-education-in-sri-lanka/&

කන්නන්ගර දර්ශනයට අනුව අධ්‍යාපනයේ වගකීම වන්නේ දරුවාගේ පූර්ණ පෞරුෂය වර්ධනය කරමින් ළමයාගේ හැකියාවන්, ළැදියාවන් හා සමාජ අවශ්‍යතා අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කිරීමයි. එකල තිබූ සාම්ප්‍රදායික ඉගැන්වීම් වලට වඩා ජීවිතයේ එදිනෙදා සම්බන්ධවන ලෙස ස්වභාවික අධ්‍යාපන අවස්ථා පාසල තුළින් සම්පාදනය විය යුතු බව ඔහුගේ අදහසයි. එහිදී ශිෂ්‍යයන්ගේ මෙන්ම ගුරුවරුන්ගේත් දැනුම් අවශ්‍යතා සපුරාලමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව වඩා ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කර ගැනීමට තාක්ෂණය යොදා ගැනීම වැදගත් බවකන්නන්ගර දර්ශනයෙන් ගම්‍ය වේ. එහිදී තාක්ෂණික විෂයන් පාසැල් විෂයමාලාවන්ට ඇතුළත් කිරීමෙන් මේ බව සනාථ වේ. ගුවන් විදුලිය, ජංගම චිත්‍රපට ආදී සන්නිවේදන මාධ්‍යයන් පාසැලේ සහ වැඩිහිටි පන්තිවල අධ්‍යාපනයට සහාය සේවාවක් ලෙස යොදා ගත්තේය (ජයවර්ධන, 2012).හිස, හිත, අත සෞඛ්‍ය (H4) දියුණු කළ ශිෂ්‍ය පිරිසක් නිර්මාණය කිරීම සඳහා පාසල් විෂයමාලාව බොහෝ දුරට ප්‍රායෝගික කිරීමටත්, අර්ථවත් කිරීමටත් නිසි පියවර ගත් අතර ඉගැන්වීම් ක්‍රම ද ඒ අනුව සකස් කරන ලදී.

කන්නන්ගර චින්තාවන් පංතිකාමර ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රම වලට මනාව ආදේශ කළ හැකි බව පෙනේ. බහුල වශයෙන් ගත් විට අප සෑම කෙනෙකුම ඉගෙන ගෙන ඇත්තේ ගතානුගතික/ සාම්ප්‍රදායික පන්ති කාමරයකය (Traditional Class Room).

**රූපය 01: ගතානුගතික පන්තිකාමරයක්**



*මූලාශ්‍රය: සමානතාවට එරෙහිව සමතාවය, (2018). කන්නන්ගර අනුස්මරණ දේශනමාලාව 29, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව*

මෙම සම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රියාවලියට අමතරව ගුරු කේන්ද්‍රීය (Teacher Centered) සහ ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centered) වැනි ඉගෙනුම් ප්‍රවේශ පවති. එහිදී මිශ්‍රිත ඉගෙනුම් ක්‍රියාවලිය (Blended Learning) වඩා වැදගත්කමක් උසුලයි. මිශ්‍රිත ඉගෙනුම් ක්‍රියාවලිය යනු "පන්තිකාමරය තුළ සිදුවන සම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රියාවලිය සහ මාර්ගගත නොවන ඉගෙනුම් සහ මාර්ගගත පුහුණුව ඇතුළත් සහය ඉගැන්වීම් ක්‍රියාවලිය යන ක්‍රම දෙකේ වාසි අන්තර්ගත නව්‍ය සංකල්පයකි."

"Blended Learning is and innovative concept that embraces the advantages of both traditional teaching in the classroom and ICT supported learning including both offline learning and online training"(KL Dangwal, 2017).

**රූපය 02: ගුරු කේන්ද්‍රීය පන්තිකාමරයක්**




*මූලාශ්‍රය: සමානතාවට එරෙහිව සමතාවය, (2018). කන්නන්ගර අනුස්මරණ දේශනමාලාව 29, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව*

**රූපය 03: ශිෂ්‍ය කේන්ද්‍රීය පන්තිකාමරයක්**




*මූලාශ්‍රය: සමානතාවට එරෙහිව සමතාවය, (2018). කන්නන්ගර අනුස්මරණ දේශනමාලාව 29, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව*

කන්නන්ගර දර්ශනයට අනුව ගුරුවරයාගේ කාර්යය විය යුත්තේ දරුවාට විවිධ ක්‍රියාකාරකම් මගින් දැනුම ලබා ගැනීමට අවස්ථාව සැලසීමයි. මෙහිදී ශිෂ්‍යයා කේන්ද්‍රකොට ගෙන අධ්‍යාපනය ගොඩනැගිය යුතු බවත්, සැමවිමට ඉගෙනුම් අවස්ථා සම්පාදන කරමින් ක්‍රියාකාරකම් තුළින් ඉගෙනීමට අත්දැකීම් ලැබීමට සැලැස්විය යුතු බවත් පෙන්වා දේ. දරුවාගේ හිස, හදවත සහ අත් (Head, Heart, Hand - 3H) සංවර්ධනය වන පරිදි විෂය මාලාවක් හඳුන්වා දුන්නේ මේ නිසාය. විෂය කරුණු ලබා දීමට වඩා ඒවා අත්දැකීම් මගින් ග්‍රහණය කර ගැනීමේදී දරුවා අධ්‍යාපනය මනාව සංකලනය වන අතර එමගින් දැනුම හා ප්‍රායෝගිකත්වය අතර ඇති දුරස්ථ බව අඩු වේ. එසේම මෑතක් වන තුරු පාසල්වල පැවැති ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය බැහැර වී ශිෂ්‍ය කේන්ද්‍රීය බව වර්ධනයවීමෙන් පසු ශිෂ්‍යයාගේ ස්වයං ඉගෙනුම් ක්‍රියාකාරකම් වර්ධනය වූ බව පෙනේ.

වර්තමානයේ පාසල් ප්‍රධාන වශයෙන් කාණ්ඩ 4 කට වර්ගීකරණය කර ඇත.


1 AB - උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සහිත පාසල්

1 C - උසස් පෙළ කලා, වාණිජ විෂය ධාරාව සහිත පාසල්

Type 2 - සාමාන්‍ය පෙළ දක්වා පන්ති පැවැත්වෙන පාසල්

Type 3 - 1 සිට 5 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල්


**ප්‍රස්ථාර අංක 01: පාසල් වර්ගය අනුව ගුරු-සිසු ප්‍රතිශත, පළමු ශ්‍රේණියට ඇතුළත් වීම් හා ගුරු-සිසු අනුපාත ප්‍රතිශතය**




Source: MoE (2018) Annual Census Report-2017, Policy Planning and Performance Review Division

ඉහත ප්‍රස්ථාරයෙන් පාසල් වර්ගය අනුව 2017 වර්ෂය අවසාන වන විට තිබූ පාසල් සංඛ්‍යාවත්, ශිෂ්‍ය සංඛ්‍යාවත්, ගුරුවරුන් සංඛ්‍යාවත්, පළමු ශ්‍රේණියට ඇතුළත් වීම සහ ගුරු ශිෂ්‍ය අනුපාත ප්‍රතිශතය දක්වා ඇත. ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම පාසල් සංඛ්‍යාවක් ඇතුළත් වන්නේ 3 වැනි වර්ගයේ පාසල් කාණ්ඩයට වන අතර, මේවායේ 5 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වෙන බැවින් සිසුන් හා ගුරුවරුන් සංඛ්‍යාවේ අඩුවක් පවතී.

**ප්‍රස්ථාර අංක 02: පළාත් සහ ඉගෙනුම් මාධ්‍ය අනුව ශිෂ්‍ය සංඛ්‍යාව**




Source: MoE (2018) Annual Census Report-2017, Policy Planning and Performance Review Division

පළාත් සහ ඉගෙනුම් මාධ්‍ය අනුව ශිෂ්‍ය සංඛ්‍යාව බෙදී යෑමේ අසමානතාවය ඉහත ප්‍රස්ථාරයෙන් දැක්වේ. එහිදී අපට පෙනී යන්නේ උතුරු හා නැගෙනහිර පළාත් වල සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා අල්ප බවයි.

**වගු අංක 01: ඉගැන්වෙන මාධ්‍ය අනුව පාසල් වර්ග වල විසිරීම - 2017**

| ක්‍රියාත්මක පාසල් | ඉගැන්වීම් මාධ්‍ය | | | | | | පාසල් වර්ගය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය පමණක් | දෙමළ මාධ්‍යය පමණක් | සිංහල සහ දෙමළ මාධ්‍යය | සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යය | දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය | බාලක | බාලිකා | මිශ්‍ර | එකතුව |
| 1AB | 296 | 114 | 9 | 437 | 142 | 31 | 92 | 136 | 801 | 1029 |
| 1C | 1121 | 545 | 22 | 94 | 26 | 10 | 24 | 66 | 1728 | 1818 |
| Type 2 | 2303 | 939 | 22 | 20 | 2 | 2 | 20 | 28 | 3240 | 3288 |
| Type 3 | 2612 | 1411 | 22 | 7 | 3 | 4 | 18 | 21 | 4020 | 4059 |
| එකතුව | 6332 | 3009 | 75 | 558 | 173 | 47 | 154 | 251 | 9789 | 10194 |

Source: MoE (2018) Annual Census Report-2017, Policy Planning and Performance Review Division)

ඉහත වගුවෙන් ඉගැන්වෙන මාධ්‍ය අනුව පාසල් වර්ග වල විසිරීම දක්වා ඇත. එහිදී අපට පෙනී යන්නේ මාධ්‍ය 3න්ම ඉගෙනීමට පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව 558ක් බවයි. ඉන් 437ක්ම 1 AB වර්ගයේ පාසල්ය. ඉන් පාසල් 801ක් මිශ්‍ර පාසල් වන අතර, 92ක් බාලක පාසල් හා 136ක් බාලිකා පාසල් වේ.

අද ලෝකය පුරා පාසල් හා සිසුන් ඉහළම තාක්ෂණයේ උපාංග සහ සේවා භාවිතයටත්, සමාජ මාධ්‍ය හරහා දැනුම ලබා ගැනීමටත්, තොරතුරු බෙදා හදා ගැනීමටත්, සංවාදයේ යෙදීමට හා අධ්‍යාපන අවස්ථා සොයා යැමටත් මහත් රුචිකත්වයක් දක්වයි. MOOC (Massive Open Online Courses) හා Lynda වැනි දුර සිට අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය ලැබීම සහ ජාලගත ඉගෙනුම් පාඨමාලාවන් වලට යොමු වීමෙන් වර්තමානයේ අධ්‍යාපනය ලැබීමත් දක්නට ඇත. තවද අනාගතයේ ඩිජිටල්කරණය වු ඉගැන්වීම් ක්‍රියාවලිය තුල අධ්‍යාපනය පරිගණක ක්‍රීඩාවක ආකාරයෙන් සිදු කිරිමේ සැලසුම්, YouTube වැනි video හුවමාරු සේවා අධ්‍යාපනික උපාංගයක් (Educational Device) ලෙස භාවිතා කිරිම, Cloud තාක්ෂණය ඇසුරෙන් හා දත්ත මූලික කරගත් ඉගැන්වීම් ක්‍රමවේද, තාත්වික යතාර්ථය හෙවත් Virtual Reality තාක්ෂණය ඉගැන්වීම් සඳහා සහයට ගැනීම ඇතුලු බොහෝ දේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා භාවිතයට ගනී(ශ්‍රී ලංකාව තුල අධ්‍යාපන ක්‍රමයේ විකාශනය, 2017). දැනටමත් ලෝකයේ දියුණු රටවල් බෙහොමයක පාසල් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මේවා දායක කරගෙන ඇත. අද වන විට ශ්‍රී ලංකාවේ පාසල් තුළ ද ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණය භාවිතයට ගැනීම සැලකිය යුතු මට්ටමක පවතී.

**නිගමන**

ඉහත කරුණු අනුව පෙනී යන්නේ මෙතෙක් කන්නන්ගර ප්‍රතිසංස්කරණ අනුව, පෞද්ගලික පාසල්, රජයේ පාසල් හා ආධාර ලබන පාසල් ලෙස කාණ්ඩ 3ට වර්ගීකරණය කර තිබූ පාසල් වර්තමානයේ 1 AB, 1 C, Type 2 හා Type 3 ලෙස කාණ්ඩ 4ට වර්ගීකරණය කර ඇති බවයි.. එසේම වැඩිම පාසල් සංඛ්‍යාවක් ඇතුළත් වන්නේ Type 3 වර්ගයේ පාසල් කාණ්ඩයට වුවත් ඒවායේ සිසුන් හා ගුරුවරුන් සංඛ්‍යාවේ අඩුවක් පවතී.

කන්නන්ගර අධ්‍යාපනය තුළ ප්‍රාථමික පාසල් වල ඉගෙනුම් මාධ්‍ය දරුවාගේ මවු බසෙන් සිදු කළ අතර,3 වන පන්තියේ සිට සැම පාසලකම ඉංග්‍රීසි ඉගැන්විය යුතු අතර අවසාන වශයෙන් සමස්ත අධ්‍යාපනයේ පදනම, හදවත, හිස හා දෑත ඉලක්ක කළ යුතු විය. ඒ අනුව පාසල් විෂය මාලාව බොහෝ දුරට ප්‍රායෝගික කිරීමටත්, අර්ථවත් කිරීමටත් නිසි පියවර ගත් අතර ඉගැන්වීම් ක්‍රම ද ඒ අනුව සකස් කරන ලදී. නමුත් වර්තමානයේ පාසල් වල පළාත් අනුව ගැළපෙන පරිදි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් 3 න්ම ඉගැන්වීම සිදු කරයි. එසේම 1 AB පාසල්වල මාධ්‍ය 3න්ම ඉගෙනීමට පහසුකම් සලසා ඇත.

මේ අනුව කන්නන්ගර නිදහස් අධ්‍යාපනය මඟින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරක්ෂිත කර ඇත. නමුත් වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් යම් අඩුපාඩු දක්නටලබෙන බැවින්ශ්‍රී ලංකාවේ පශ්චාද් ප්‍රාථමික අධ්‍යාපනය පුද්ගල අවශ්‍යතාව අනුව ගැලපීමේ හා විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාවක් පවතින බව පෙනේ. එහිදී විශේෂයෙන්ම පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පුද්ගල විවිධතා අනුව හැඩගැස්විය යුතුය. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට නව තාක්ෂණික උපාංග හා සේවා වල සහය ලබා ගැනීමෙන් වඩාත් ඵලදායී සහ ගුණාත්මක සේවාවක් ලබාගත හැකිය. එබැවින් නාගරික පාසල් වලට පමණක් මෙය සීමා නොවී ග්‍රාමීය පාසල් වලටද මෙම සේවාවන් ලබා ගැනීමේ හැකියාවන් පුළුල් කිරීමේ කාලය දැන් එළඹ ඇත.

තවද, නවීන තාක්ෂණය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදාගත යුත්තේ අපටම ගැළපෙන අධ්‍යාපන රටාවක් තුළය. එනම් හුදෙක් තාක්ෂණය කෙරෙහි පමණක් අවධානය යොමු නොකර, කන්නන්ගර දර්ශනයේ ඇති සාධනීය ලක්ෂණයන් ශ්‍රී ලංකාව වැනි රටකට ගැලපෙන පරිදි යොදා ගැනීම වඩත් කාලෝචිත වේ.

**මූලාශ්‍රය**


- අතුකෝරාල, දයා. (2017). කන්නන්ගරාවලෝකනඃ දූරදර්ශී අධ්‍යාපන දාර්ශනිකයා යළි කියවමු, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08.
- කන්නන්ගරාවලෝකන.(2017). තුන්කල්දුටු ඉසිවරයාණෝ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08.
- කරුණාරත්න, එස්. (2018). කන්නන්ගර අනුස්මරණ දේශනමාලාව 29 වන සමරුවඃ සමානතාවට එරෙහිව සමතාවය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- ජයවර්ධන, ආ. (2012, 10 13). කන්නන්ගර දරුවෝඃකන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල පසුකාලීන බලපෑම. Retrieved from http://kannangaradaruwo.blogspot.com/2012/10/blogpost_13.html#.XVuN_UqWbIU
- මගේ ලෝකයඃඅධ්‍යාපනය හා අධ්‍යාපන දර්ශනය. (2016, 02 27). Retrieved from http://nandavimala87.blogspot.com/2016/02/blog-post 59.html
- වන්නිනායක, ධර්ම. (2017). කන්නන්ගරාවලෝකනඃ මේ රටේ සැබෑ විප්ලවවාදියා කන්නන්ගර ශ්‍රීමතාණෝය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08.
- ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපන ක්‍රමයේ විකාශනය. (2017, 09 12). Retrieved from Team Roar: https://roar.media/sinhala/main/sponsored/evolution-of-education-in-sri-lanka/
- Fadel, C. (n.d.). 21st Century Skills: Learning for Life in Our Times.
- Kiran Lata Dangwal. (2017). Blended Learning: An Innovative Approach. *Universal Journal of Educational Research, 5*(1), 129-136. DOI:10.13189/ujer.2017.050116
- Trilling, B., & Fadel, C. (2009). 21st Century Skills: Learning for Life in Our Times. San Francisco, CA: John Wiley & Sons.

# අධ්‍යාපනය හා සංස්කෘතිය පිළිබඳ කන්නන්ගර චින්තනය පිළිබඳ විමසුමක්

**ඩබ්. එම්. ජී. එන්. පනම්පිටිය**
සහකාර කථිකාචාර්ය - සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
gnpanampitiya@gmail.com

**සංක්ෂේපය**

සංස්කෘතිය වූ කලී මානව ජීවිතයේ පවතින අප්‍රමාණ පැතිකඩයන්හි පිළිඹිඹුවකි. අනෙක් අතට එය සමාජය තුළ ඒකරාශි වී පවතින විවිධ අංගෝපාංගයන්ගේ සංකලනයකි. සමාජයක් සතුව පවත්නා ඊටම අනන්‍යනා වූ සංස්කෘතික අංගයන් අනාගත පරම්පරාවන් වෙනුවෙන් සුරක්ෂිත කරමින් දායාද කිරීමෙහි ලා සුවිශේෂී වූ කාර්යභාරයක් අධ්‍යාපන ක්‍රියවලිය හරහා සිදුවෙයි. දේශීය අනන්‍යතාවයෙන් යුතු වූ ද වර්තමාන මානව අවශ්‍යතාවන්ට අනුරූප වූ ද ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමෙහි ලා ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ නාමය සුවිශේෂී වෙයි. ඒ අනුව මෙම ලිපියේ මූලික පරමාර්ථය වන්නේ දේශීය සංස්කෘතිය හා අධ්‍යාපනය පිළිබඳ කන්නන්ගර මහතාගේ දැක්ම පිළිබඳ විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීමයි. මෙය මූලික වශයෙන් ද්විතීය මූලාශ්‍ර මත පදනම් වී පවතී. එහිදී ද්විතීක මූලාශ්‍ර සඳහා අවශ්‍ය පොත්පත් හා පර්යේෂණ ලිපි ආදිය පර්යේෂණයේ අරමුණුවලට අනුකූලව තෝරා ගන්නා ලදී. දේශීය සංස්කෘතිය, දේශීය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය, බටහිර බලපෑම යටතේ දේශීය සංස්කෘතිය විපර්යාසයට ලක්වීමට මිෂනාරී අධ්‍යාපනයේ බලපෑම හා පුනර්ජීවනයක් සඳහා අවශ්‍ය ජාතික අධ්‍යාපනයක අවශ්‍යතාවය පිළිබඳ කන්නන්ගර චින්තනය පිළිබඳ මෙම ලිපිය හරහා විග්‍රහ කොට තිබේ.

**හැඳින්වීම**

ඕනෑම මානව සමාජයක මිනිසා සමාජීය සත්වයකු වශයෙන් අන්තර්ග්‍රහනය කරගන්නා අත්දැකීම් හා දැනුම් සම්භාරයන් පදනම් කොටගෙන ආකල්ප, චින්තනය හා හැසිරීම් රටා පද්ධතිය හැඩගැසීම සිදු වේ. පුද්ගල හැසිරීම් රටා හා චින්තනය නිර්මාණය වීමෙහි ලා බලපාන්නා වූ එක් තීරණාත්මක සාධකයක් වශයෙන් සංස්කෘතිය හඳුන්වා දීමට පුළුවන. බ්‍රිතාන්‍ය මානවවිද්‍යාඥයකු වන ඊ.බී. ටයිලර් පෙන්වා දෙන ආකාරයට මිනිසා සමාජයේ සාමාජිකයෙකු වශයෙන් උකහා ගන්නා දැනුම, විශ්වාස, කලාව, සදාචාරදහම්, නීතිරීති හා වෙනත් හැදියාවන් හා පුරුදු පුහුණු ආදියෙහි සංකීර්ණ සමස්තය සංස්කෘතියයි (Rao, 2009:190). එයින් ගම්‍ය වන ආකාරයට මිනිසා සමාජ පරිණාමය තුළ කාලාන්තරයක් තිස්සේ නිර්මාණය කරගත් ඇදහිලි විශ්වාස, සිරිත්විරිත්, භාෂාව, සාහිත්‍ය හා කලාශිල්ප ආදී සියල්ල සංස්කෘතිකාංගයන් වශයෙන් හැඳින්වීමට පුළුවන. ඒ ඒ සමාජ ක්‍රමයන්ට ආවේණික වූ විවිධ සංස්කෘතීන් ලොවපුරා දක්නට ඇති අතර ඒ සෑම සංස්කෘතියක් තුළම ඒ ඒ ප්‍රජාවන්ට හා සමාජයන්ට ආවේණික වූ ද අනන්‍යය වූ ද ලක්ෂණයන් දක්නට ලැබේ.

පුද්ගලයා තමන් ජීවත් වන සමාජ හා සංස්කෘතිකාංග සිය ජීවිතය තුළට අභ්‍යන්තරීකරණය කරගනු ලබන්නේ ඉගෙනුම් ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙනි. ඕනෑම මානව සමාජයක සංවර්ධනය හා බලගැන්වීමෙහි පදනම වන්නේ අධ්‍යාපනනයි. ''අධ්‍යාපනය වූ කලී මිනිස් ජීවිතය පුරාවටම ක්‍රියාත්මක වන අනාගත සංවර්ධනයක් අපේක්ෂාවෙන් ඉගෙනීම අතින් ස්වයංපෝෂිත වීමකි. මෙය ජීවක් වීම සඳහා කෙරෙන ප්‍රයත්නයක් ද වේ'' යනුවෙන් හැඳින්වෙන්නේ මහත්මා ගාන්ධිතුමා පවසනුයේ එහෙයිනි (සිරිසේන, 1999:14). ඒ අනුව පෞද්ගලික වශයෙන් සැලකීමේ දී පුද්ගලයාගේ ත් පොදුවේ ගත්කල සමස්ත සමාජයේත් ප්‍රගතිය අරමුණු කිරීම අධ්‍යාපන ක්‍රියාවලියේ එක් ලක්ෂණයක් වෙයි. එසේම පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනය, චිත්තාභ්‍යන්තරය තුළ නිලීන වී පවතින විභව ශක්තීන්, හැකියාවන් හා කුසලතාවයන් සංවර්ධනය කිරීම ආදිය ද අධ්‍යාපනයේ පරමාර්ථයන් අතර වෙයි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 28 වගන්යෙහි දැක්වෙන ආකාරයට දැක්වෙන ආකාරයට ''සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමට අයිතියක් තිබේ. මෙකී විශ්වීය අයිතීන් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීමෙහි ලා රාජ්‍යයන් විසින් සිදුකළ යුතු

කාර්යයන් කිහිපයකි. එනම්, ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කිරීම හා එය නොමිලේ සැපයීම, සාමාන්‍ය හා වෘත්තීය අධ්‍යාපනය ඇතුළු ද්විතීය අධ්‍යාපනයේ විවිධත්වයන් වර්ධනය කිරීම, සෑම දරුවෙකුටම ද්විතීය අධ්‍යාපනය සඳහා ප්‍රවේශ මාර්ගයන් ඇති කිරීම, ඒ සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය දරුවනට නිදහස් අධ්‍යාපනය ආරම්භ කිරීම හා මූල්‍යමය ආධාරයන් ලබා දීම ආදී පියවරයන් ගැනීම, ඒ ඒ දරුවන්ගේ හැකියාවන්වලට අනුව උසස් අධ්‍යාපනයට ප්‍රවේශ මාර්ගයන් ඇති කිරීම, සියලුම දරුවන්ට අධ්‍යාපනික හා වෘත්තිමය තොරතුරු හා මාර්ගෝපදේශකත්වයන් ලබා ගැනීමට අවකාශ සැලසීම, දරුවන් පාසල් වෙත පැමිණීම ක්‍රමානුකූල කිරීමට හා අතරමගදී පාසැල් හැරයාම වැළැක්වීමට පියවර ගැනීම, ළමයාගේ පෞරුෂත්වයට හා අයිතිවාසිකම්වලට හානි නොවන පරිදි පාසැල්වල විනය පවත්වාගෙන යාම හා අඩු සාක්ෂරතාවයන් සහිත රටවල එය දුරලීම සඳහා නූතන ඉගැන්වීම් ක්‍රමවේදයන්ට, විද්‍යා හා තාක්ෂණික දැනුම උකහා ගැනීම සඳහා ප්‍රවේශවීමට අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය කිරීම ආදියයි" (Convention on the Rights of the Child, 1989:08). ඕනෑම රටක සංවර්ධනය හා සමාජ, ආර්ථික අභිවෘද්ධිය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ප්‍රධාන වන්නා වූ ක්ෂේත්‍ර දෙකක් තිබේ. එනම්, ආර්ථිකය හා අධ්‍යාපනයයි. යම්කිසි රටක් සිය අනන්‍යතාවයන් සුරක්ෂිත කරගෙන සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රගමනයකට ගමන් ගැනීමට නම්, ආර්ථිකය සේම අධ්‍යාපනික ක්ෂේත්‍රය ද දේශීය මුහුණුවරක් ගැනීම හා එම රටේ ඉතිහාසයට, සංස්කෘතියට හා කාලීන අවශ්‍යතාවලට අනුරූපවන්නක් විය යුතුය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ද මෙය අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. අධ්‍යාපනික ක්‍රියාවලිය තුළ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ආරක්ෂා කොට ගනිමින් විමර්ශනශීලී හා විචාරවත් චින්තනයෙන් යුතු පුරවැසියන් නිර්මාණය කිරීමෙහිලා සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ චින්තනය මෙහිදී සුවිශේෂී වෙයි. අධ්‍යාපනය හා සංස්කෘතිය පිළිබඳ එතුමාගේ චින්තනය දේශීය අනන්‍යතාවයෙන් යුතු වූ ද නිදහස් හා නිවහල් වූවක් ද විය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය නිතැතින්ම අප රටේ ඉතිහාසය, භාෂාව හා ආගම ආදී සංස්කෘතික ලක්ෂණයක් හා ඒකාබද්ධ වූවක් විය යුතුය යන්න එතුමාගේ දැක්ම විය. ඒ අනුව මෙම ශාස්ත්‍රීය ලිපිය හරහා සංස්කෘතිය හා ඒකාබද්ධ වූ අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමෙහි ලා ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ චින්තනය මෙහිදී විමර්ශනයට බඳුන් කරනු ලැබේ.

**දේශීය සංස්කෘතිය පිළිබඳ කන්නන්ගර චින්තනය**

සංස්කෘතිය වූ කලී සමාජ උරුමයක් වන අතර මිනිසා සමාජයේ සාමාජිකයෙකු වශයෙන් අත්පත්කර ගන්නා කලාශිල්ප, දැනුම හා විශ්වාස පද්ධතීන් ආදී සියල්ල සංස්කෘතිය තුළට අන්තර්ගත වී පවතී. ඇමරිකානු මානව විද්‍යාඥ රැල්ෆ් ලින්ටන් පෙන්වා දෙන ආකාරයට සංස්කෘතිය වූ කලී මානව සමාජය තුළ පැතිර පවතින සරම්පරාවෙන් පරාම්පරාවට උරුම වන්නා වූ දෙයකි ( Rao, 2009:190). ඒ අනුව, සමාජීය වශයෙන් පැතිර පවතින සම්ප්‍රදායෙන් හිමිවන්නා වූ සිරිත්විරිත්, විශ්වාස පද්ධතීන් හා පුරුදු පුහුණු ආදී සියල්ල සංස්කෘතිය යන්න නියෝජනය කරයි (Kroeber, 1963:61). එසේම සංස්කෘතිය මිනිසාගේ ජෛවමය, පාරිසරික, මානසික හා ඓතිහාසික සාධකයන්ගෙන් යුතු වූවකි. මිසුන්ගේ සිතුම් පැතුම්, අදහස්, ධර්මතා ආදී අභෞතික දෑ මෙන්ම පාෂාණ යුගයේ සිට නූතන යුගය දක්වා මිනිසුන් විසින් නිර්මාණය කරන ලද සියලු නිෂ්පාදන, කලාශිල්ප ආදී භෞතික දෑ ද සංස්කෘතිය නියෝජනය කරයි. ඒ ඒ සංස්කෘතීන්ට අවේණික වූ ලක්ෂණයන් පරම්පරාවෙන් පරම්පරාවට පවරා දීම අධ්‍යාපන ක්‍රියාවලිය හරහා සිදු වේ.

සංස්කෘතිය හා අධ්‍යාපනය පිළිබඳ කන්නන්ගර මහතාගේ චින්තනය ප්‍රධාන ලක්ෂණ කිහිපයක් යටතේ සංක්ෂිප්තව දැක්වීමට පුළුවන. එනම්, පැරණි සිංහල බෞද්ධයන් විසින් නිර්මාණය කරන ලද උසස් සංස්කෘතියක් පවතින බව, බටහිර බලපෑම යටතේ එම සංස්කෘතිය ක්‍රමයෙන් පිරිහීම හා විදේශීය ලක්ෂණ එම සංස්කෘතිය තුළට එක්වීම, මිෂනාරී අධ්‍යාපනය ක්‍රමය එම විපර්යාසයන්ට මෙවලමක් වීම, පුනර්ජීවනයක් සඳහා යුරෝපීය හා සිංහල සංස්කෘතීන් දෙකෙහි යම් වටිනාකම් වේ ද ඒවායෙහි මනා සංයෝගයෙන් ආවේණික වූ නව සාරසංග්‍රහ රටාවක් ඇති කිරීම අවශ්‍ය බව හා විදේශීය සංස්කෘතික ලක්ෂණ ඇතිකිරීමේ මෙවලම වූයේ මිෂනාරී අධ්‍යාපනය නම් යළි පුනර්ජීවනයක් ඇතිකළ හැකි එකම ක්‍රමය වන්නේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීමෙන් පමණක් බවයි (සුමතිපාල,1993:158). එතුමාට අනුව ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනයේ මුඛ්‍ය

පරමාර්ථය විය යුත්තේ කාලානුරූපී අවශ්‍යතාවයන්ට අනුකූල වූ ත්, නව්‍ය වූ ත්, දේශීය අනන්‍යතාවයක් සහිත වූ ත් සංස්කෘතික හරපද්ධතීන්ගෙන් පෝෂණය වූ විචාරශීලී අනාගත පරම්පරාවක් නිර්මාණය කිරීමයි. මෙයින් පළමු වන කරුණ වන පැරණි සිංහල බෞද්ධයන් විසින් නිර්මාණය කරන ලද උසස් සංස්කෘතියක් පවතින බවට කන්නන්ගර මහතාගේ චින්තනය පිළිබඳ විශ්ලේෂණාත්මකව විමසා බැලීමේ දී අතීත සංස්කෘතික උරුමයන් තුළින් විද්‍යමාන වන එවක ලාංකික අධ්‍යාපන ක්‍රමයන් හා ජනතාවගේ නිර්මාණ ශක්තිය පිළිබඳ අමතක කළ නොහැකිය. අතීත ශ්‍රී ලාංකේය ජනයා සතුව පැවති නිර්මාණ ශක්තිය, පරිකල්පන හැකියාවන්, කලා කෞශල්‍ය හා කාර්මික ඥානය ආදියට සාක්ෂි මහා වැව්, දාගැබ්, මූර්ති, ගෘහ නිර්මාණයන් තුළින් විදහා දැක්වේ. විජයාවතරණයෙන් පසු ඔවුන් මල්වතු ඔය අසබඩ ජනාවාස පිහිටුවා ගැනීමත් සමඟ සිංහල ශිෂ්ටාචාරයේ ආරම්භය සිදු වූ බව මහා වංශය, දීප වංශය ආදී වංශකතාවල සඳහන් වෙයි. එසේම මිහිඳු මාහිමියන්ගේ ආගමනයෙන් බුදු දහම මෙරට ස්ථාපිත වීමත් සමඟ ආර්යන් පැමිණීමත් සමඟ හැඩගැසුණු ශිෂ්ටාචාරය බෞද්ධ මුහුණුවරක් ගන්නට විය. ලොවට අද්විතීය වූ සංස්කෘතිකාංගයන් හා නිර්මාණයන් බිහිකළ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි මූල බීජයන් ඒ තුළින් රෝපණය වූ බව සැබෑය. නමුදු ඉපැරණි සිංහල සංස්කෘතිය සපුරා ඉන්දීය ආභාෂය තුළින් ගොඩ නැඟුනකැයි එතුමා විශ්වාස නොකළේය. එනම් එතුමාගේ අදහස් වූවේ පෙර කී සිංහල බෞද්ධ සංස්කෘතික ආභාසයන් රෝපණය වූයේ එවක පැවති සරුසාර භූමියක විනා සංස්කෘතික හා සදාචාරාත්මක වශයෙන් නිස්සාර වූ භූමියක නොවන බවයි. "අපේ සංස්කෘතිය අවසාන වශයෙන් ජම්බුද්වීපයේ සංස්කෘතික උරුමයෙන් ව්‍යුත්පන්නය. අපේ බීජය අප ලබා ගත්තේ එහි සරුවට වැඩුණු පාරම්පරික වෘක්ෂයෙනි" යි කන්නන්ගර මහතා සඳහන් කරන්නේ එබැවිනි (සුමතිපාල,1993:158). ලංකාවේ ප්‍රාග් ආර්ය ශිෂ්ටාචාරය විමසා බැලීමේ දී පෙනී යන්නේ වංශකතාවන්හි ත් ජනප්‍රවාදයන්හි ත් යක්ෂයන් හා නාගයන් ඉදිරිපත් කොට ඇත්තේ ආදි කල්පික ගෝත්‍රිකයින් ලෙස නොව ශිෂ්ට සමාජයක සාමාජිකයින් ලෙස බවයි. වැව් කර්මාන්තය හා දිය ඇළවල් සම්බන්ධයෙන් බොහෝ විට නාග ලාංඡනය යොදා තිබීම නාග ගෝත්‍රයේ මිනිසුන් වාරි මාර්ග විෂයෙහි යම් වැදගත්කමක් දැරූ බව සිහි කරවයි (ගුරුගේ, 1969:90). එකල රෙදි විවීමේ ආදී ශිල්පයන් ද දියුණුව පැවති බව විජය කුමරු සිය පිරිසත් සමඟ තම්බපණ්ණියට ගොඩ බසිනා විට කුවේණි නම් වූ යක්ෂ ගෝත්‍රික කුමරිය කපු කටිමින් සිටි බවට වන විස්තරය සාක්ෂි දරයි.

එතෙක් පැවති විවිධ සංස්කෘතිකාංගයන්ගෙන් හෙබි වූ ශිෂ්ටාචාරය තුළට විජයාවතරණය හා මහින්දාගමනයෙන් පසු එක් වූ ගෘහනිර්මාණ හා කලා ශිල්පයන් එක් වී මනා සුසංයෝගයෙන් විශිෂ්ට සංස්කෘතියකාංගයන් නිර්මාණය වූ බව කන්නන්ගර මහතාගේ අදහස විය. ස්තූප, මූර්ති ශිල්පය හා වාරිකර්මාන්ත ආශ්‍රයෙන් විද්‍යමාන වන්නේ එයයි. ඒ සම්බන්ධයෙන් කන්නන්ගර මහතා ප්‍රකාශ කළේ "මුල්කාලීන ධර්ම දූතයන් විසින් මෙම දිවයිනට හඳුන්වා දෙන ලද විවිධ ගෘහ නිර්මාණ හා කලාත්මක ලක්ෂණ සිංහලයන් විසින් කොතරම් දුරට තමන්ගේම පුද්ගලිකත්වයක් කාවද්දා වර්ධනය කරන ලද්දේ ද යත් ඇතැම් අවස්ථාවලදී ඒවායෙහි දියුණුව ඒවා උපත ලද රටේදී පැමිණි මට්ටම අභිභවා ගිය මල්ඵල ගැන්වීමක් බඳුවිය" යනුවෙනි (සුමතිපාල,1993:159). දාගැබ් නිර්මාණයෙහි ලා උසස් ඉංජිනේරු ශිල්ප ඥානයෙන් ද, ද්‍රව්‍යයන්ගේ ශක්තිය හා ආතතිය පිළිබඳ විශේෂඥ දැනුමක් ද, ප්‍රායෝගික කුසලතාවයක් ද අත්‍යවශ්‍ය වෙයි. සිංහල ස්තූප ඉන්දියාවේ ඉපැරණි එම වර්ගයේ ස්ථූප සෑම එකකට ම වඩා විශාලත්වයෙන් වැඩි වන අතර ඒවාටම අනන්‍ය වූ ලක්ෂණ ප්‍රකට කරයි. රුවන්වැලි මහා සෑයෙහි පරිධිය සලකුණු කිරීම පිණිස යොදාගත් උපකරණය මහා වංශයෙහි මෙසේ දක්වයි. "රන් කණුවෙක සවිකරන ලද කරකරවෙන රිදී රිටක් "යනුවෙනි (ගුරුගේ, 1969:94). වට ප්‍රමාණයෙන් ඉතා වැඩි මෙවන් ස්තූපයක පාදම කොතරම් ශක්තිමත් විය යුතු ද යන්න පිළිබඳ හෙළයන්ගේ අවබෝධය, උසස් මෙන්ම ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාවලියක් හා ශික්ෂණයකින් යුතු බව මනාව ප්‍රකට කරයි.

සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ අදහසට අනුව "මෙකල අපරදිග උසස් ජාතීන් මිලේච්ඡභාවය තුළ වැද පැවති හෝ ආරම්භ වී හෝ නොමැති අවධියක ලංකාව ඉපැරණි රාජධානියක හා ආගමක කේන්ද්‍රස්ථානයක් විය: කලාවන්ගේ තෝතැන්නක් විය: පෙරදිග වෙළදාමේ මධ්‍යස්ථානය විය" (සිංහලයන්ගේ සංස්කෘතික කාර්ය සාධනය, 1947:05). අනුරාධපුර පොළොන්නරු යුගවල පටන්ම පැරණි සිංහලයන්ගේ ගොඩනැගිලි ඉංජිනේරු ශිල්පය මෙයට කදිමට සාක්ෂි දරයි. අනරාධපුර ථූපාරාමයේ හා මිහින්තලය අම්බස්ථල චෛත්‍යයෙහි අදට ද නටබුන්ව පවතින චෛත්‍ය ප්‍රාසාද

මෙයට කදිම නිදසුන්ය. විශේෂයෙන් අඩි එකසිය පණහක් පමණ උස නව මහල් ප්‍රාසාදයක් වූ ලෝවාමහාපායෙහි නිර්මාණය සඳහා පැරණි සිංහලයන් සතුව පැවති නිර්මාණාත්මක කුසලතාවය, ගල්කණු අතර බර තුලනය කිරීම, එම ගොඩනැගිලි නිර්මාණය සඳහා භාවිත වූ ද්‍රව්‍යයන්ගේ ශක්තිය පිළිබඳ ව පුරාණ ලාංකීය නිර්මාණකරුවා සතු වූ අවබෝධය ප්‍රායෝගික ඥානයෙන් හා කුසලතාවයෙන් ආඪ්‍ය වූ සංස්කෘතියක අපූර්වත්වය විදහා පායි. කන්නන්ගර මහතා දේශීය සංස්කෘතික අනන්‍යතාවය හා උරුමය පිළිබඳ නිතැතින් සාඩම්බර විය. විය. "දෙදහස් වසරකට වඩා පැරණි වූ ද ප්‍රමාණයෙන් හා ගෘහ නිර්මාණය අතින් ඊජිප්තුවේ ගොඩනැගිලිවලට වඩා නොදෙවෙනි වූ ද යෝධ ආගමික ගොඩනැගිලි ද විශාල ජලසම්පාදන ව්‍යාපාර ද රටේ ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨත්වය හා ඉපැරණිභාවය පිළිබඳ සාක්ෂි වේ" යනුවෙන් එතුමා දක්වන්නේ එබැවිනි (සිංහලයන්ගේ සංස්කෘතික කාර්ය සාධනය, 1947:07). අතීත හෙළ සංස්කෘතියෙහි පැවති නගර සැලසුම්, ගෘහ නිර්මාණ ශිල්පය, ඉංජිනේරු ශිල්පය, චිත්‍ර ශිල්පය හා කලා හැකියාව එකට සම්පිණ්ඩණය කොට නිර්මාණය වී ඇති සීගිරිය මෙයට කදිම නිදසුන්ය. සියවස් ගණනාවක් පුරා අව්වැසිවලට හා සුළඟට නිරාවරණය වී පැවතිය ද නොනැසී පවතින සීගිරි බිතුසිතුවම් හි අපූර්වත්වය අද ද විඳගත හැකිය. "දහයියා පොතු හා කාබනික කෙඳි මඟින් දැඩිකළ මැටි, හුණු හා වැලිමුසු මැටි, හුණින් බැඳි බදාමය යන තුන් තට්ටුවක් එළා පසුතලය සකස් කරනු ලැබේ. සමස්තය පුරා ශුද්ධාලෝප කොට පොරණ සිත්තරා භාවිත කළ පෘථිවිජ හා වනජ සාම්ප්‍රදායික වර්ණයන් වූ රතු අඳුරු කහ සහ පච්ච වැදැ අල්ලා සිටීමට පෙදෙර්රු හැන්දෙන් සිලිටි කැරිණ" (සිල්වා, 1969:134). ඒ තරම් ආදි යුගයක යොදාගත් ශිල්ප ක්‍රමයෙන් හෙළිවන නිපුණතාවය, වර්ණ සංයෝජනයේ ගැලපීම ද ලොව උසස් බිතු සිතුවම් අතර ප්‍රමුඛස්ථානයක් සීගිරි සිතුවම් වෙත ලබා දීමට සමත් වෙයි. ගිලන් පුද්ගලයින්ට උවටැන් කිරීමත් වෙදකම් කිරීම ත් ඈත අතීතයේ සිටම අපගේ සංස්කෘතියෙහි එක් සුවිශේෂී ලක්ෂණයක් විය. මහා වංශයෙහි දැක්වෙන ආකාරයට " බුද්ධදාස රජතුමා සුප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් විය. එතුමා රෝගාතුරටන්ට ද, පිළුනට හා අන්ධයන්ට ද වෙදහල් කරවීය" (ප්‍රනාන්දු,1969:105). ඉපැරණි රෝහල්වල නටබුන් හා බෙහෙත් ඔරු කියාපාන්නේ අතීත දේශීය සංස්කෘතිය තුළ පැවති දේශීය ඥානය හා ශිල්ප ක්‍රමයන් පිළිබඳවයි. ඒ අනුව කන්නන්ගර මහතාගේ චින්තනය නිරන්තරයෙන්ම දේශීය පැරණි සංස්කෘතිකාංගයන් තුළින් පෝෂණය වූ දේශීය ඥානය හා ශිල්ප ක්‍රමයන්ගෙන් ගුරුහරුකම් ලබා ගෙන කුසලතා පූර්ණ වූ ද අනාගතය විනිවිද දක්නා වූ ද විචාරවත් පරම්පරාවක් නිර්මාණය කිරීම කෙරෙහි නිතැතින්ම යොමු විය.

**දේශීය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය පිළිබඳ කන්නන්ගර චින්තනය**

සිංහල රාජ සමයෙහි පැවති අධ්‍යාපන ක්‍රමය තුළින් දේශීය සංස්කෘතියෙහි හරපද්ධතීන් ආරක්ෂා කිරීමෙහිලා වූ කෘත්‍යාත්මක කාර්යභාරය පිළිබඳ කන්නන්ගර මහතා වෙත වූයේ පැහැදීමකි. අතීතයේ පැවති දේශීය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය එතුමා නිරන්තරයෙන් අගය කළේය. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එතුමා ප්‍රකාශ කළේ "අපේ පන්සල්වලට අනුබද්ධ වූ පාසල් ක්‍රමයක් අප රටෙහි තිබුණි. ඒවා මඟින් අපේ ආගම, අපේ සංස්කෘතිය, අපේ භාෂාව සහ අපේ සම්ප්‍රදායන්ට අනුකූල ව අධ්‍යාපනයක් ලැබීමේ පහසුකම් සෑම ළමයෙකුට ම ලැබී තිබුණි" යනුවෙනි (සිංහලයන්ගේ සංස්කෘතික කාර්ය සාධනය, 1947:02). ලංකාවාසීන් බුදුදහම මඟින් හික්මුණු විශිෂ්ට සම්ප්‍රදායකට හා අධ්‍යාපන ක්‍රමයකට හිමිකරුවන් වූයේය. එම අධ්‍යාපන ක්‍රමය ජනතාවගේ අධ්‍යාත්මික සේම සමාජීය අභිලාෂයන්ට අනුකූල වූ එකක් විය. ඒ අනුව විහාරය ආගමික හා අධ්‍යාපන කටයුතුවල කේන්ද්‍රස්ථානය විය. අතීත අධ්‍යාපනයේ මූලික අරමුණ වූයේ ජනතාවගේ සදාචාරාත්මක හා අධ්‍යාත්මික මෙන්ම සමාජීය හැකියාවන්ගෙන් පෝෂණය කිරීමයි. වල්පොල රාහුල හිමියන් දක්වන ආකාරයට "මෙම අරමුණෙන් තොර වූ අධ්‍යාපනය නිෂ්පල යැයි සලකන ලදී. යමෙකු තම සදාචාරාත්මක හා අධ්‍යාත්මික ගුණ වගාව ඇති කිරීමේ අපේක්ෂාවෙන් තොර ව ලෞකික ලාභ ප්‍රයෝජන අත්කර ගැනීමේ චේතනාවෙන් ආගම හදාරනවාට වඩා අධ්‍යයනයෙන් කාලය අපතේ නොහැර නිදි සුවයෙන් කල් ගෙවීම මැනවැයි සලකන ලදී" (ආරියපාල, 1969:148). එහිදී ගුරුවරයෙකුගේ යුතුකම වූයේ හුදෙක් ඉගැන්වීම පමණක් නොව සිසුන්ගේ සදාචාරාත්මක හා අධ්‍යාත්මික සුබසිද්ධිය සැලසීමයි. ඒ අනුව මෙකල පැවති අධ්‍යාපන කටයුතු ආගමික හා සංස්කෘතික පසුබිමෙහි පිහිටි ජීවන ක්‍රමය මගින් හැඩගැසී තිබුණි. කන්නන්ගර මහතා වැඩිදුරටත් පෙන්වා දෙන්නේ "දීර්ඝ වූ කාලාන්තරයක් පුරා දිවයිනේ සෑම ළමයෙකුට ම

අධ්‍යාපනයක් ලබා දුන් බව වාර්තාවලින් අපට දැනගන්නට ලැබේ. සමහර විට එම මූලික අධ්‍යාපනය දෙන ලද්දේ එතරම් අධික මිලක් වැයකොට ඉදිකළ ගොඩනැගිලි තුළ නොවේ. එසේ ම සමහර විට එතරම් සර්ව සම්පූර්ණ ආකාරයකින් හෝ නොවේ. එහෙත් දිවයින පුරා තැන තැන පන්සල් තිබුණු අතර සෑම පන්සලක ම මෙන් පාසලක් තිබුණි" (සුමතිපාල,1993:166). උදාහරණයක් වශයෙන් සලකතොත් සීගිරිය නැරඹීමට එකල පැමිණි සාමාන්‍ය පුද්ගලයින් සීගිරි බිතු සිතුවම් ආදිය දැක තම සිතෙහි පහළ වූ හැඟීම් හා සිතිවිලි කවිවලින් දක්වා ඇති අයුරු සාමාන්‍ය ජනතාව අතර එකල පැවති සාක්ෂරතාවය හා නිර්මාණ හැකියාව පිළිබඳ සාක්ෂි ගෙනහැර දක්වයි. "සීගිරිය නැරඹීමට පැමිණි සමාජයේ විවිධ පන්තිවලට අයත් ශත සංඛ්‍යාත පුද්ගලයන් තම හැඟීම් හා සිතිවිලි මනෝඥ වූ ත් ශිථිල වූ ත් ගීවලින් පළ කිරීමට සමත් වීමෙන් පෙනී යන්නේ එකල අධ්‍යාපනය වරප්‍රසාද ලත් අතළොස්සකට පමණක් සීමා නොවී, පෘථුල ව ව්‍යාප්තව පැවති බවයි" (ආරියපාල, 1969:150).

කන්නන්ගර මහතා පෙන්වා දුන්නේ "පිරිවෙන් ආශ්‍රිතව පැවති පාසල්වල ඉගැන්වීමේ මාධ්‍ය වූයේ මව්බසයි. අධ්‍යාපනය අනිවාර්ය නොවීය. එහෙත් එය නොමිලයේ ලබා දෙන ලදී. වසර දෙදහසක් පමණ පැවති මෙම අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම නොමිලයේ දෙන ලද අධ්‍යාපනයක් විය" යනුවෙනි (සුමතිපාල,1993:166). විවිධ කලා ශිල්ප හා කර්මාන්ත පිළිබඳ අධ්‍යාපනය විහාරාරාම මෙන්ම නිවෙස්වල ද ලබා දෙන ලදී. "ශ්‍රී රාහුල සංඝරාජ තෙරුන් ප්‍රධාන ස්ථානය දැරූ කැරගල පිරිවනෙහි ඉගැන් වූ විෂයනට අමතරව වෛද්‍ය, නීති, බඳු වෘත්තීන් සඳහා ලෞකික විෂයන් ද ඉගැන්වීමෙහි යෙදුණි" (කුරුප්පු,1969:176). ඒ අනුව පෙනී යන්නේ එකල පැවති අධ්‍යාපනය දෙවැදෑරුම් වූ බවයි. ඉන් එක් අරමුණක් වූයේ පුද්ගලයින් ශිෂ්ටසම්පන්න ලෙස ජීවත් වීමට අදාල සාමාන්‍ය දැනුම ලබා දීමයි. අනෙක් පරමාර්ථය වූයේ පුරවැසියන් වෘත්තියක් හෝ රැකියාවක් සඳහා පුහුණු කිරීමයි. එබැවින් තොටගමුවේ විජයබා පිරිවනෙහි අභිධර්ම, සූත්‍ර හා විනය පිටකය, අටුවා, වේද ආදිය හැරුණු කොට ආයුර්වේදය, අර්ථ ශාස්ත්‍රය, නීති ශාස්ත්‍රය, නක්ෂත්‍රය හා ගණිතය ආදී ලෞකික විෂයන් ද ඉගැන් වූ බව සඳහන් වෙයි. එහිදී සංඝයා වහන්සේලාගේ හා රජවරුන්ගේ අධ්‍යාපනය හැරුණු කොට පොදුජනයාගේ අධ්‍යාපනය පිළිබඳ සලකා බැලීමේ දී පෙනී යන්නේ එය ශික්ෂණය හා ලෞකික වෘත්තීය ආදී සමාජ අවශ්‍යතාවයන්ට අනුව නිර්මාණය වූ අධ්‍යාපන ක්‍රමයක් වූ බවයි.

**බටහිර බලපෑම යටතේ දේශීය සංස්කෘතිය විපර්යාසයට ලක්වීමට මිෂනාරී අධ්‍යාපනයේ බලපෑම පිළිබඳ කන්නන්ගර මහතාගේ අදහස්**

ආසියාතු ජාතීන් අතර පොදු ලක්ෂණ සුලබ වන බැවින් රජවරුන්ගේ පාලන කාලවල සිදු වූ ආසියාතික රටවල හා ජාතීන්ගේ සංක්‍රමණ හෝ ආක්‍රමණ හේතුවෙන් ඒ ඒ ලක්ෂණ මිශ්‍රවීම මත සිංහල බෞද්ධ සංස්කෘතියේ රටාවට එතරම් හානියක් සිදු නොවූ බව කන්නන්ගර මහතාගේ අදහස විය. නමුත් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතීන්ගේ බලපෑමත් සමඟ අවුරුදු දෙදහස් ගණනක් මුළුල්ලේ පැවත ගෙන ආ දේශීය සංස්කෘතිය තුළට විදේශීය ලක්ෂණ එක්වීම තුළ එය ක්‍රමයෙන් විපර්යාසයන්ට බඳුන් වූ බවත් එම ක්‍රියාවලිය සඳහා මිෂනාරී අධ්‍යාපනය ප්‍රධාන මෙවලමක් වූ බවත් එතුමාගේ විස්වාසය විය. එය කන්නන්ගර මහතා දක්වන්නේ "ගත වූ අවසාන සියවස හෝ සියවස් දෙක තුළ සංස්කෘතික අංශයන් හි දී සිංහලයන් පමණ ආභාසය සඳහා අපරදිග කෙරෙහි යොමුවන්නට පුරුදු වූ ආසියාතික ජනතාවක් ඇත්නම් ඒ ස්වල්පයකි. වාණිජ්‍ය හා ආෂ්ට ලාභාපේක්ෂාවෙන් සොළොස්වන සියවස් මුල්කාලයෙහි මෙහි පැමිණි පෘතුගීසීන්ගෙන් ආරම්භව 1815 දී ස්වාධීනත්වය පිළිබඳ අවසාන සලකුණ පවා බ්‍රිතාන්‍යයන්ට අහිමි වීම දක්වා වූ තෙසිය වසරක කාලයක් තුළ අනු ක්‍රමයෙන් මෙහි පැමිණි යුරෝපීය ජාතිකයින් සමඟ මෙම කුඩා ජාතියට නොකඩවා සටන්වල යෙදීමට සිදුවීම නිසා ජාතික සංස්කෘතිය පෝෂණය කළා වූ ආයතන පිරිහීම හෝ අතුරුදහන් වීම සිදු විය" යනුවෙනි (සුමතිපාල,1993:167). පෘතුගීසීන් ලක්දිවට පැමිණීමෙන් අනතුරුව එවක පැවති පන්සල්, පිරිවෙන් අධ්‍යාපනය හා සාහිත්‍ය විනාශ කළ බව ප්‍රකට කරුණකි. එවක දේශීය අධ්‍යාපනයේ විශිෂ්ට පිරිවෙනක් වූ තොටගමුවේ ශ්‍රී විජයබා පිරිවෙන සම්පූර්ණයෙන් විනාශ කළ බව වර්ෂ 1944 හැන්සාඩ් වාර්තාවෙහි දැක්වෙයි (සුමතිපාල,1993:167). පෘතුගීසීන් යටතේ පැවති ලංකාවේ අධ්‍යාපනය ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා බොහෝදුරට භාවිත විය. හුදු ආගමික පරමාර්ථයෙන් පමණක් නොව පෘතුගාලය හා එහි යටත්විජිත

අතර සංස්කෘතික හා දේශපාලන බැම්මක් පවත්වා ගැනීමේ පරමාර්ථයෙන් ද ආගම පැතිරවීම ඔවුන්ගේ අපේක්ෂාව විය. පෘතුගීසීන් විසින් ආරම්භ කරන ලද මිෂනාරී පාසල්වල ප්‍රධාන විෂය වූයේ ක්‍රිස්තියානි ධර්මයයි. "මෙම පාසල්වල ගුරුවරුන් වූයේ ප්‍රධාන වශයෙන් මිෂනාරීවරුන්ය. එහිදී ළමයින්ට ලියන්නට කියන්නට උගත්තේ පෘතුගීසි භාෂාවයි. වයසින් ඊට වැඩි වූ ද නියතම ව වඩා බුද්ධිමත් වූ ද පිරිමි ළමයින් සඳහා ලතින් අධ්‍යාපනය පිළිබඳ උසස් පාසලක් විය" (පීටර්, 1969:269). සංස්කෘතියක භාෂාව හා ආගම කේන්ද්‍රීය ලක්ෂණයන් වන අතර ක්‍රිස්තියානි ආගම හා පෘතුගීසි හා ලතින් භාෂාවන් සමාජගත කිරීමෙන් පෘතුගීසීන්ගේ ප්‍රධාන අභිප්‍රාය වූයේ දේශීය සංස්කෘතියෙහි පැවති අනන්‍යතාවයන් ක්‍රමයෙන් දුර්වල කරමින් මෙරට ජනතාවගේ සිතුම් පැතුම් හා ආකල්ප යුරෝපීය සංස්කෘතික ලක්ෂණයන්ට අනුරූප කිරීම තුළ පාලනය පහසු කර ගැනීමයි.

ලන්දේසීන් විසින් පිහිටුවන ලද අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් කන්නන්ගර මහතා අදහස් දක්වන්නේ "1956 දී ලන්දේසීහු ඔවුන්ගේ තැන ගත්තෝය. ඔවුහ් තමන්ගේ පැරිෂ් පාසල් පිහිට වූහ. ඔවුහු ජනයා තම ආගමට හැරවීමේ කටයුතුවල නොකඩවා යෙදුණහ. ඔවුහු සිංහල මුල්ලකට කර තැබූහ, පහත් තත්වයකට ඇද දැමූහ. එයින් ගොඩ ඒමට එයට නොහැකි වූ තරමය, වරක් නොසුදුසුය යනුවෙන් කී පසු නැවත නැඟී සිටීමට අසීරුය. 1658 දී ලන්දේසි භාෂාව අධිකරණයේ භාෂාව විය. සිංහල භාෂාව විනාශකර දමන ලදී. සිංහල වූ සියල්ල අහෝසි විය. සියලුම සම්ප්‍රදාය, චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත්, භාෂාව, ආගම යනාදී සියල්ල යටපත් විය" යනුවෙනි (සුමතිපාල,1993:167). ලන්දේසීන්ගේ අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රධාන අරමුණු දෙකක් විය. එනම්, දේශීය ජනතාව ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම හා රටෙහි ලන්දේසි බලය තහවුරු කර ගැනීමයි. 1815 දී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක් බවට පත් වීමෙන් අනතුරුව ඒ යුගයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ කන්නන්ගර මහතාගේ අදහස වූයේ බ්‍රිතාන්‍යයන් විසින් ධනවත් සේම බලවත් පුද්ගලයින්ට අධ්‍යාපනය ලැබීම සඳහා උසස් පාසැල් ද, ගෙවීමට හැකි අයට යාම සඳහා ප්‍රාදේශීය මට්ටමේ ඉංග්‍රීසි පාසැල් ද ජනතාවගෙන් ඉතිරි පිරිස සඳහා ස්වභාෂා පාසල් ද පිහිට වූ බවයි. එහිදී උසස් පාසැල් හරහා බ්‍රිතාන්‍යයන් වෙනුවෙන් රට පරිපාලනය කිරීමේ කටයුතු පැවරීමට විස්වාසකටයුතු ක්‍රිස්තියානි පුරවැසියන් ද, ප්‍රාදේශීය ඉංග්‍රීසි පාසැල් හරහා ගුරුවරු, ලිපිකරු ආදී වෙනත් රජයේ සේවකයින් ද බිහි වූ බවත් ස්වභාෂා පාසැල් තුළින් ගාස්තු අය නොකරන ලද ඵලදායීතාවයක් නොමැති හුදු මූලික අධ්‍යාපනයක් පමණක් ලබා දුන් බවයි.

මත්ද්‍රව්‍ය භාවිතය බටහිර යටත්විජිතණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූවක් වන අතර එහි අනිසි ප්‍රතිඵලයන් පිළිබඳ කන්නන්ගර මහතා ප්‍රකාශ කළේ "මත්පැන් අපේ ජාතියේ ශක්තිය විනාශ කොට ඇත" යනුවෙනි (සුමතිපාල,1993:170). දේශීය සංස්කෘතිය තුළ මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතය පිළිකුල් සහගත දෙයක් වූ අතර බෞද්ධාගමික පදනමක් මත නිර්මාණය වූ දේශීය සංස්කෘතිය තුළ මත්පැන් ආදිය වෙළදාම ද ගර්හිත වෙළදාමක් විය. බුදු දහමින් ශික්ෂණය ලැබූ සංස්කෘතියක් තුළ බුද්ධිමත්, විචාරවත් මෙන්ම නිර්මාණශීලී ජනතාවක් නිතැතින් ම බිහි වී තිබිණි. නමුත් විශේෂයෙන් ඉංග්‍රීසි පාලනයේ ආශිර්වාදය මත බීමත්කම රටපුරා පැතිරීමත් සමඟ ජනතාව සතුව පැවති විචාරශීලී පරිණතභාවය මෙන්ම නිර්මාණශීලී පෞරුෂය ද ක්‍රමයෙන් හීනව යන්නට විය. බටහිර අධ්‍යාපනය තුළින් සිතුම් පැතුම් හා ආකල්ප ගොඩනැගුණු අනුකරණවාදී පරම්පරාවන් නිර්මාණය වීම මෙම සංස්කෘතික පරිහානීන්ට ප්‍රධාන වශයෙන් හේතුසාධක විය.

**පුනර්ජීවනයක් සඳහා අවශ්‍ය ජාතික අධ්‍යාපනයක අවශ්‍යතාවය පිළිබඳ කන්නන්ගර චින්තනය**

ලංකාවේ ජාතික පුනර්ජීවනය හුදකලාව සිදුකළ හැක්කක් නොවන බවත් ආසියාවේ විවිධ ජාතීන් අතර ඇති ආගමික, භාෂාමය, සංස්කෘතිකමය පොදු ලක්ෂණයන් පිළිබඳ අවධානය යොමුකළ යුතු බව එතුමාගේ අදහස විය. ඒ අනුව පුනර්ජීවනයක් සඳහා හොඳම මාර්ගය වශයෙන් කන්නන්ගර මහතා සැලකුවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමයි. ඒ සම්බන්ධයෙන් එතුමා මෙසේ පැවසීය. "අපි ජාතික අධ්‍යාපන ක්‍රමයක්, ජාතියේ ඉරණම ඉෂ්ට ප්‍රාප්ත කර ගැනීම අරමුණු කොටගත් ජාතික අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැගීම ආරම්භ කරමු. මෙරටෙහි ජාතියක් ඉදිකරන්නේ ද නැත් ද? අප සැමදා වහලුන් වශයෙන් වෙසෙන්නේ ද? අප කිසියම් නිදහසක් ලබාගන්නේ නැත් ද? අප ඒ සඳහා ඉලක්ක කරන්නේ නම් අපේ පාසල් ආරම්භ කරමු. අපේ ජනතාවට අධ්‍යාපනයක් ලබා දෙමු, එය ජාතික අධ්‍යාපනයක් වීමට නම් ආත්මයෙන් එය නියත වශයෙන්ම ආගමික වියයුතු අතර ස්වරූපයෙන් ජාති හිතෛෂී විය යුතුය. එය ජාතික අධ්‍යාපන ක්‍රමයක් වන්නේ නම් එය

අනුප්‍රාණය මැත යුගවලින් නොව ඓතිහාසික අතීතයෙන් ලබාගත යුතුය. එය ජාතික අධ්‍යාපන ක්‍රමයක් වන්නේ නම් සාධාරණත්වය, සමානාත්මතාවය හා අන්‍යෝන්‍ය සේවය පිළිබඳ මූලධර්ම පදනම් කොටගත යුතුය" (සුමතිපාල,1993:178). ඒ අනුව කන්නන්ගර මහතා විස්වාස කළේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ධනය, බලය, ස්ත්‍රීපුරුෂභාවය ආදී කිසිදු කොන්දේසියකින් තොරව ජාතියේ සියලුම ළමයින්ට සේවය සැපයිය යුතු මෙන්ම ඔවුන්ගේ කායික, සදාචාරාත්මක හා බුද්ධිමය අභිවෘද්ධිය ඉලක්ක කරගත්තක් වියයුතු බවයි. එහිදී එතුමා අවධාරණය කළේ බටහිර විද්‍යා හා තාක්ෂණික දැනුම ආදිය අප සංස්කෘතිය තුළට අවශ්‍ය අයුරින් අවශෝෂණය කරගත්ත ද දේශීය අනන්‍යතාවයන් සුරක්ෂිත කිරීම ජාතික අධ්‍යාපන ක්‍රියාවලියක මුඛ්‍ය අරමුණ වියයුතු බවයි. එසේම කන්නන්ගර මහතා ප්‍රකාශ කළේ රටක අභිවෘද්ධිය කෙරෙහි ජනගහනයේ වර්ධනය හෝ ධන සංචිතයේ වර්ධනය පමණක් නොව එම රාජ්‍යය තුළින් බිහිවන ජනතාවගේ ගුණාත්මකභාවය ඉවහල් වන බවයි.

එසේම සියලු දෙනාටම සමාන අවස්ථා සහිත අධ්‍යාපන ක්‍රමයක් සහිත රාජ්‍යයක් පිහිටුවාලීම ත් පවතින අර්ථ ක්‍රමයේ හා අවශ්‍යතාවයන්ට අනුකූල වූ ද මානව සම්පත්වල ප්‍රශස්ත වර්ධනයට අවකාශ සැලසෙන පරිදි ත් ද්විතීක අධ්‍යාපනය විවිධාංගීකරණය කළයුතු බව එතුමාගේ අදහස විය. උගන්වන භාෂාව සම්බන්ධයෙන් එතුමාගේ අදහස වූයේ "ප්‍රාථමික පාඨශාලාවල ඉගැන්වීමේ මාධ්‍යය ඒකාන්තයෙන් ම මවුබස විය යුතුය. තව ද නානාවිධ පාඨශාලාවල විෂයමාලාවේ ඉතා ම උසස් තැනක් ඉංග්‍රීසි බවට දියයුතු යැයි ද මම පිළිගනිමි" (ජයසූරිය, 1969:613 ). ඒ අනුව ළමයින්ගේ කථනය හා බහු ආංශික වර්ධනය සඳහා ත් සිය මව් භාෂාව ඉවහල් වන බැවින් සෑම ළමයෙකුටම සිය මව්බසින් අධ්‍යාපනය ලබා දීම සෑම රාජ්‍යයකම යුතුකම විය යුතු බව කන්නන්ගර මහතා පෙන්වා දුන්නේය. නමුත් ඉංග්‍රීසි භාෂාව ලෝක භාෂාවක් වන බැවින් ද බොහොමයක් පොතපත ඉංග්‍රීසියෙන් පළ වී ඇති බැවින් ද එම භාෂාව ඉගැනීමට ද විෂයමාලව තුළ ස්ථානයක් හිමිවිය යුතු බව විශ්වාස කළේය. ඒ අනුව සහජ දක්ෂතා ඇති දරුවන්ට පෞද්ගලිකව ගත් කල තමාගෙත් පොදුවේ ගත්කළ මුලු මහත් රාජ්‍යයේත් සුබසිද්ධිය සඳහා තම හැකියාවෙන් උපරිම ඵල නෙලා ගැනීමේ ඉඩ ප්‍රස්ථාවන් සලසා දීම අධ්‍යාපනය පිළිබඳ කන්නන්ගර චින්තනයේ හරය විය.

**සමාලෝචනය**

පැරණි සිංහල බෞද්ධයන් විසින් නිර්මාණය කළ උසස් සංස්කෘතිකාංගයන් නිරන්තරයෙන් අගය කළ එතුමා අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් බුද්ධිමත් සේම නිර්මාණශීලී පරපුරක් නිර්මාණය කිරීමට නම් අතීතයේ ප්‍රතිජනනාත්මක දෑ තුළින් ගුරුහරුකම් ලැබීම අනිවාර්ය වන බව තරයේ විස්වාස කළේය. එසේම වර්තමානයේ පවතින විද්‍යා හා තාක්ෂණික ඥානයන්, භාෂාවන් ආදිය තුළින් ද පෝෂණය ලබා ගනිමින් නූතන ආර්ථික ක්‍රමය හා අවශ්‍යතාවයන්ට අනුරූප වන පරිදි දේශීය ජාතික අධ්‍යාපනය සකස් වීම අත්‍යවශ්‍ය බව පෙන්වා දුන්නේය. මෙකී සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන විමසා බැලීමේ දී පෙනී යන්නේ වසර දෙදහස් ගණනක් මුළුල්ලේ ගොඩනැගුණු භාෂාව, ආගමික හර පද්ධතීන්, ගොඩනැගිලි ශිල්පය, වාරිමාර්ග, මූර්ති ආදී කලාශිල්ප හා සාහිත්‍ය ආදී ක්ෂේත්‍රයන්හි ගැඹුරු මෙන්ම විස්තාරිත දේශීය ඥානයන්ගෙන් සුපෝෂණය වූ සංස්කෘතික හර පද්ධතීන් හා ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් ද වර්තමාන විද්‍යා හා කාර්මික දැනුම් සම්භාරයන්ගෙන් ද ගුරුහරුකම් ලබමින් අනාගත අවශ්‍යතාවයන්ට ද අනුකූල වූ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ගොඩ නැගීම සිදු කළ යුතු බව සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ සංස්කෘතිය හා අධ්‍යාපනය පිළිබඳ දැක්ම අතර ප්‍රබල වූ බවයි.

**මූලාශ්‍රය**


- ආරියපාල එම්.බී. (1969), ප්‍රජාවගේ සිතුම් පැතුම් අධ්‍යාපනයෙන් හැඩගැහුණු අයුරු, ලංකාවේ අධ්‍යාපනය: 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- කුරුප්පු, කේ. එම්. ඩබ්. (1969), සුප්‍රසිද්ධ විද්‍යාපීඨ, 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- ගුරුගේ, ඒ.ඩබ්.පී. (1969), විද්‍යා හා කාර්මික ශිල්පය, 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.

- පීටර්, ඩබ්. එල්. ඒ. පියතුමා (1969), පෘතුගීසි මිෂනාරිවරුන්ගේ අධ්‍යාපන කටයුතු, 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- ප්‍රනාන්දු, මාක්ස්. (1969), ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව හා මූර්ති ශිල්පය, 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- ජයසූරිය, එෆ්. ආර්. (1969), "අනගි මුතු ඇටයක් " ඇගයීමක්, 2 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- සිරිසේන, එච්. (1999), ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති, පරමාර්ථ හා අරමුණු, කර්තෘ ප්‍රකාශන.
- සිල්වා, රාජා (1969), අධ්‍යාපනයේ සහ සංස්කෘතියේ ජීවමාන ස්මාරකයක්, 1 කොටස, සියවස ප්‍රකාශනය, කොළඹ, ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය.
- සිංහලයන්ගේ සංස්කෘතික කාර්ය සාධනය, 1947, කල්කටාවෙහි පැවති ආසියාතික කලා හා සංස්කෘතික සම්මේලනයේදී කන්නන්ගර මහතා විසින් පවත්වන ලද මූලාසනයේ කඩි
- සුමතිපාල, කේ.එච්.එම්. (1993), ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයඃ 1796-1965, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- Convention on the Rights of the Child (1989), Part 1, Geneva, United Nations Organization.
- Kroeber, A.L. (1963), Anthropology: Culture Patterns and Process, New York, Harcourt, Brace & World.
- Rao, Shankar (2009), Principles of Sociology with an Introduction to Social Though, 6th Revised Edition, New Delhi, S. Chand and Company LTD.

# බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී බෞද්ධ අධ්‍යාපනයට භික්ෂූන් වහන්සේගෙන් සිදු වූ මෙහෙය

**ඩබ්ලිව්. එම්. හිරාන් මධුසංක වීරබාහු**
පර්යේෂණ නිලධාරී, පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය,
සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**සංක්ෂේපය**

මිහිඳු මා හිමිගේ ආගමනයෙන් පසුව මෙරට ප්‍රතිෂ්ඨාපිත බෞද්ධ දර්ශනය එතැන් සිට විකාශය වූයේ කහ සිවුරත් පන්සලත් සමඟිනි. ඒ එදා සිට වර්තමානය දක්වාම නොනවතින බැඳීමක් ඒ සංකල්ප ද්වය කෙරේ බන්ධනය කරමිනි. ක්‍රි පූ 2 සියවසේ ඇරඹියායැයි සැලකෙන මෙරට බෞද්ධාගමික අධ්‍යාපන සංකල්පය පැවත ආවේ නම් ඒ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙනි. ඒ ගුරුවරයාගෙන් ගෝලයාට උරුම වූ ශිල්ප කොටස මුඛ පරම්පරාගතව පැවතීමෙනි. කෙසේ වුවද එය එදා අධ්‍යාපනයේ මූලික සිද්ධාන්තය වූ අතර වළගම්අභය රජුගේ රාජ්‍යෝදයෙන් පසුව බෞද්ධාගමික හා ආරාමික ජීවිතය කේන්ද්‍ර කරගත් අධ්‍යාපන සංකල්පවල විශේෂ වෙනසක් සිදු වූයේ මහාවිහාරික භික්ෂූන්ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමත් සමගිනි. එතැන් සිට බෞද්ධ අධ්‍යාපනය ලේඛන මාධ්‍යයට පැමිණි අතර භික්ෂූන් වහන්සේ සහ විහාරස්ථානය තවදුරටත් අධ්‍යාපනය ලබා දෙන මධ්‍යස්ථානයම විය. පොත්ගුල් සම්ප්‍රදාය, පිරිවෙන් සම්ප්‍රදාය, පුස්තකාල සම්ප්‍රදාය වැනි අධ්‍යාපනික සංකල්පවල තිඹිරි ගෙය ලෙසින් පන්සල දිස් වූ අතර භික්ෂූන් වහන්සේ එහි නිලලත් පාලක හා ආරක්ෂක යන තනතුරු ස්වභාවයෙන්ම ඉසිලීය.

කෙසේ වුවද ලාංකේය ශිෂ්ටාචාරයේ විවිධ යුගවලදී ඇති වූ පරසතුරු උවදුරු ආක්‍රමණ සංක්‍රමණ මත සාසනයත් සාසනික අධ්‍යාපනයත් රකිනු වස් භික්ෂුවත් පන්සලත් ඉදිරිපත් විය. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී බෞද්ධ අධ්‍යාපනයේ පසුබෑම මැඩලීම වෙනුවෙන් භික්ෂූන් වහන්සේලා මැදිහත්වීම නිසා අධ්‍යාපනික ප්‍රබෝධයක් හටගත්තේය. එපමණක් නොව සිංහලය, පාලිය, සංස්කෘතය, කාව්‍යය, ගද්‍ය, පද්‍ය භාෂාව, ඡන්දස් අලංකාර හා හෙළ බස දෙස රැකීම පිණිස උන්වහන්සේලා ගත් මෙහෙය ද අපමණය. මේ සියල්ල භික්ෂූන් වහන්සේලා විසින් යටත් විජිතවාදයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග විය.

**මුඛ්‍ය පද:** ***අධ්‍යාපනය, අධිරාජ්‍යවාදය, පුනර්ජීවනය, බෞද්ධාගම, භික්ෂූන් වහන්සේ***

## හැඳින්වීම

මෙරට දේශිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ බලාධිකාරීන් හෙවත් අධ්‍යාපන ඒකාධිකාරය පැවැතියේ මුල් කාලයේ සිටම බෞද්ධ භික්ෂූන් වහන්සේ සතුවය. එය කිසිඳු යුගයක වෙනස් නොවූ අතර අන් පාර්ශවයක් වෙත හෝ එය මාරු වීමට හෝ ඉඩක් නොවුණි. හේතුව වූයේ රාජ්‍ය අනුග්‍රහයත් බෞද්ධ දර්ශනයත් සමගින් අධ්‍යාපනය යන සංකල්පය විකාශය වීමයි, බැඳී පැවතීමයි. එය වෙනස් වීමේ ලක්ෂණ පෙන්වූයේ යටත් විජිත යුගයේදී පමණි. නමුත් එය යටත්විජිතවාදීන්ට ද සිතූ තරම් පහසු නොවූ අතර අවිච්ඡින්නව තමන් සතුව පැවැති බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය උන්වහන්සේලා දිවි හිමියෙන් රැක ගත්හ. එසේම උන්වහන්සේලා දේශීය බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධාකාරයේ භූමිකා නිරූපණය කළ අතර ඒවා කෙසේද යත්

- අධ්‍යාපන ආයතන ප්‍රධානීන් ලෙස
- අධ්‍යාපන ආයතන පාලකයින් ලෙස
- අධ්‍යාපන ආයතනවල නිර්මාතෘවරු ලෙස
- ආචාර්යවරු ලෙස
- ලේඛකයින් ලෙස
- ශිෂ්‍යයන් ලෙස යනාදී භූමිකාය

මෙම භූමිකා අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණ, යාපහු, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ හා මහනුවර වැනි රාජධානි යුගවලදීත් ක්‍රියාත්මක වූ අතර පෘතුගීසි ලන්දේසි යුගවලටත් එය පොදු

විය. කෙසේ නමුත් බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී සමස්ත අධ්‍යාපන ක්‍රමවේදයම උඩු යටිකුරු වී එය භික්ෂූන් වහන්සේ වෙතින් ගිලිහී අධ්‍යාපන නිලධාරී නම් කොට්ඨාසයක් වෙත එය ආදේශ වන තෙක් එහි පාලකයෝ පාලිතයෝ හා බහුතර ශිෂ්‍යයෝද වූයේ දේශීය භික්ෂු පරපුරේය.

ක්‍රි.ව 1815 දී පූර්ණ වශයෙන් ලක්දිව බ්‍රිතාන්‍ය ආධිපත්‍යට යටත් වීමෙන් පසුව දේශීය සංස්කෘතියේ සෑම සියලු අංශයක්ම පරිහාණි යුගයක් කරා ඇදී ගියේය. ඒ අතර දේශීය අධ්‍යාපනය හා පිරිවෙණද පරිහාණිය කරා ඇදුණු තවත් එක් අංශයක්ම විය. පිරිවෙණ, පන්සල, විහාරස්ථානය, පොත්ගුල මුල්කරගෙන පැවති දේශීය බෞද්ධ අධ්‍යාපන ක්‍රමය අධිරාජ්‍යවාදී බලපෑම විසින් වසා ගන්නා ලද්දේය. රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසා මිෂනාරී පාසල් ක්‍රමය රට පුරා වේගයෙන් ව්‍යාප්ත විය. බ්‍රිතාන්‍ය රජයට මෙවැන්නක අවශ්‍යතාව ඒ වන විටදී තදින් දැනී තිබුණේ මෙරට පාලනය සඳහා යන වියදම් පක්ෂය අවම කර ගැනීම වෙනුවෙනි. සිවිල් පරිපාලන කටයුතු සඳහා විදේශීය නිලධාරීන්ම යොදා ගෙන සිටි අතර ඔවුන් සඳහා වැය වන වියදම් අධික වීම නිසා සමස්ත වැය ශීර්ෂ අධික විය. ඒ සඳහා දේශීයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුහුණු කර අවම පිරිවැයක් යටතේ පරිපාලනයේ යෙදවීම යටත් විජිතවාදීන්ගේ අරමුණ වූ නිසා මිෂනාරී හෙවත් ඉංග්‍රිසි භාෂා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම ප්‍රධාන අරමුණ විය. මේ සඳහා මූලික අඩිතාලම සකස් කළේ නොර්ත් ආණ්ඩුකාරවරයාය.(úfca;=x.,2016:257) ඔහුගේ ආගමික නිර්බාධවාදී ප්‍රතිපත්තියෙන් උපරිම ඵල නෙළා ගත් මිෂනාරී ව්‍යාපාරය මෙරට ආම් ව්‍යාප්තියේ හා ක්‍රිස්තියානි අධ්‍යාපන ව්‍යාප්තියේ යෙදී සිටියහ. ඒ අනුව බැප්ටිස්ට්වරු, වෙස්ලියන්වරු, මෙතෝදිස්තවරු, චර්ච් මිෂනාරීවරු හා ඇමරිකන් මිෂනාරී යන කණ්ඩායම් මෙරට මිෂනාරී අධ්‍යාපනය ආරම්භ කිරීමේ නියැලී සිටියහ. (ඉලංගසිංහ,1998:145) මේ වන විට පුද්ගලික මිෂනාරී පාඨශාලාද ගණනාවක් රජයේ අනුග්‍රහය යටතේ බිහිවී තිබුණි.

කෙසේ නමුත් මේ නිසා පැරණි බෞද්ධ අධ්‍යාපනයට මරු පහරක් වූ මෙම මිෂනාරී පාසල් ව්‍යාපාරයට ප්‍රති උත්තර දීමට භික්ෂූහු අරගල ස්වරූපයේ වැඩසටහන් ගෙන ගිය අතර එය උදා වූයේ පහතරට ප්‍රදේශවලිනි. එහිදී දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය රැක ගනු වස් බෞද්ධ භික්ෂූහු පෙරමුණ ගන්නා ලද්දේ හෙළ බස රැස හා නිදහස දිනා ගැනීමට පැවැති සටන් ව්‍යාපාරත් සමගිනි. රජයෙන් කිසිඳු ආධාරයක් පන්සල් හා පිරිවෙන් ආශ්‍රිතව පැවැති බෞද්ධ පාසැල් නොලැබීය.(අයිවන්,2007:138)පිරිවෙණින් භික්ෂුවගෙන් විහාරස්ථානයෙන් බෞද්ධාගමින් තොරවූ බටහිර අධ්‍යාපන ක්‍රමයට එරෙහි වූ මේ භික්ෂූන් වහන්සේලා ගෙන ගිය ව්‍යාපාරය පුනර්ජීවන ව්‍යාපාරය නම් ලද අතර දේශීය අධ්‍යාපනය වෙනුවෙන් එහි වැඩි ඉඩක් වෙන් විය. දේශීය අධ්‍යාපනය නගා සිටුවන්නේ නම් එය සමාජය තුළ සුලභ කළ යුතු යැයි මෙකල පුනර්ජීවනවාදීන් අතර මතය විය. ඒ වෙනුවෙන් අධ්‍යාපනික පොත පත සුලභ කිරීම සඳහා උත්සාහයයන් දැරීමට සිදුවිය. පාලි හා සංස්කෘත පොත පත විදෙස් රටවලින් ගෙන්වා ගෙන මුද්‍රණය කොට බෙදා හැරීමත් ඒ පොත් පත් පිළිබඳ තොරතුරු පුවත්පත්වල පළ කරවා බෙදා හැරීමත් විහාරස්ථාන ආශ්‍රිතව පොත්තුල් නැවත ඇති කිරීට කටයුතු කිරීමත් යන සාධනීය උත්සාහ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් ඇරඹිණි. (තිලකසිරි,2000:122) 1832 දී පමණ මේ ආකාරයේ ස්වෝත්සාහයෙන් කිසිඳු රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව ඇරඹි පාඨශාලා හා පිරිවෙන් ගණන 34 ක් බව කෝල්බෲක් කොමිසම වාර්තා කරයි. (ඉලංගසිංහ,1998:145) මෙවා ''පන්සල් පාසැල්'' ලෙසින්ද එකල ව්‍යවහාර වූයේ පන්සල මුල්කරගෙන බිහිවූ පාඨශාලා වීම නිසාය. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ අධ්‍යාපනය කෙරේ භික්ෂූන් වහන්සේ දැක්වූ දායකත්වයට නිදසුනක් වශයෙන් එය සැලකිය හැකිය.

1860 දී පමණ ගත් මේ උත්සාහයයන් ඉන් වසර කිහිපයකට පසුව මල් ඵල දරා ඇති බවත් ලක්මිණිපහන පුවත්පත ඊට සාක්ෂි දරයි. දේශීය ශිල්ප ශාස්ත්‍ර අධ්‍යාපනික පොත් පත සුලභ කිරීම සඳහා ගත් තවත් උත්සාහයක් ලෙසින් මුද්‍රණාල පිහිටුවීම පෙන්වා දිය හැකිය. බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමේ ව්‍යාපාර සඳහා රජයේ මුද්‍රණාලවල සහායත් නොලැබුණ තැන ඒ සඳහා දේශීයයන් එක් වී පුද්ගලික මුද්‍රණාල ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. ඒ සඳහා මුල් වූ එක් භික්ෂූන් වහන්සේ නමකි මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි. ලක්මිණිපහණ මුද්‍රණාලය 1862 දී එසේ පිහිටවූ එක් මුද්‍රණාලයක් වූ අතර අධ්‍යාපනය රැක ගැනීමේත් ජාතික ව්‍යාපාරය ගෙනයාමේත් පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේලා මේ සඳහා ද මූලික වූහ. මුල් කාලීනව මේ මුද්‍රණාලය විසින් බෞද්ධාගමික

පොත් පත ලෙස බුද්ධ ධර්මය, නක්ෂත්‍රය, ව්‍යාකරණ, උම්මග්ග ජාතකය, දහම්ගැටය ආදී පොත් හැටක් පමණ මුද්‍රණ ද්වාරයෙන් පිට කිරීමට හැකි වී ඇත. එපමණක් නොව ලක්රිවිකිරණ මුද්‍රණාලයදවලානේ සිද්ධාර්ථ හිමිගේ මූලිකත්වයෙන් පිහිටවූ ලංකාභිනව මුද්‍රණාලය, කොටහේනේ සර්වඥ ශාසනාභිවෘද්ධි සමාගමේ මුද්‍රණාලයද මෙසේ ඇරඹි මුද්‍රණාල අතර ප්‍රධාන වේ. මේ මුද්‍රණාල අතර හික්කඩුවේ සුමංගල හිමිගේ බටුවන්තුඩාවේ පඬිතුමාගේ ආදී වියතුන්ගේ පොත පත මුද්‍රණය වී එකල යටපත් වන්නට ගිය දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය පෝෂණය කරන්නට මඟක් පැදිණි.

භික්ෂූන් වහන්සේ හා විහාරස්ථාන ඇසුරේ වූ පැරණි පොත්ගුල් සම්ප්‍රදාය නැවත ප්‍රතිෂ්ඨාපනය කරනු වස් පොත්ගුල් නැවතත් ඇති කිරීම සඳහා ද භික්ෂූන් වහන්සේ ගත් මෙහෙය ප්‍රශංසනීයය. පැරණි පොත පත නැවතත් පුස්කොළ පොත්වල ලියා පොත්ගුල්වල තැන්පත් කිරීමතවත් එක් උත්සාහයකි. එහි දී පැල්මඩුල්ලේ සුදර්ශන ධර්ම ශාලා විහාරස්ථානයේ නායක හිමිගේ උත්සාහයෙන් එම විහාරස්ථානයේ පිහිටවූ පොත්ගුල ප්‍රධාන වේ. මෑත කාලීන ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනයෙහි ආදී කතෘ වශයෙන් හැඳින්වෙන වලානේ සිද්ධාර්ථ හිමියෝද මෙකී පැල්මඩුල්ල අධ්‍යාපන ආයතනයෙන් බිහිවූ කීර්තිමත් හා ශ්‍රේෂ්ඨ ශිෂ්‍ය හිමිනමකි.

**හික්කඩුවේ සුමංගල මහ නාහිමි**

අධිරාජ්‍යවාදීන්ගේ පීඩනය හමුවේ විහාරස්ථාන ආශ්‍රයේ වූ අධ්‍යාපනික සේවය ප්‍රමාණික නොවන බව වටහාගත් භික්ෂූන් වහන්සේලා බෞද්ධ අධ්‍යාපනයේ දිශාව පුළුල් කිරීමට උනන්දු විය. සිංහලයාගේත් බෞද්ධාගමත් සතු අධ්‍යාපනය ද ආගමද නෂ්ට වී යන්නට මඟ පෑදුණු යුගයෙක එය ආරක්ෂා කිරීම වෙනුවෙන් හා අධිරාජ්‍යවාදීන් හා කරට කර සටන් වැදුණු උත්තම හිමි නමක් වූයේ හික්කඩුවේ සුමංගල හිමියන්ය. ඒ යුගයේ තිබූ අවශ්‍යතාව වෙනුවෙන් මුලින්ම පෙරමුණ ගත්තෝ කවරහුද ඒ සුමංගල හිමිගේත් රත්මලානේ ධම්මාලෝක හිමිගේත් ගුරු වූ වලානේ සිද්ධාර්ථ හිමියන්ය. උන්වහන්සේ විසින් රත්මලාන පරමධම්මචේතිය පිරිවෙණ ආරම්භ කලේ බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමේ මූලික පියවරක් තැබීම සඳහාය. උන්වහන්සේ භාරයේ වූ පරමධම්මචේතිය පිරිවෙණ තුළ වූ පැවිදි ශිෂ්‍යයින් අතලොස්ස අතර දක්ෂ කීර්තිමත් උගත් හිමිවරු දෙනමක් වූහ. උන්වහන්සේලා නම් අන් කවරෙකුත් නොව හික්කඩුවේ සුමංගල හිමිත් රත්මලානේ ධර්මාලෝක හිමිත්ය. පරමධම්මචේතිය පිරිවෙණහි අධ්‍යාපනයෙන් පසුව උන්වහන්සේලා දෙනම මාළිගාකන්දේ විද්‍යොදය හා පෑළියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ් තැනූවෝ උන්වහන්සේලා වූහ. කෙසේ වුවද නූතන විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ කීර්තිමත් විශ්වවිද්‍යාල ද්වයක ආදී කතෘන් වන්නට උන්වහන්සේලා කළේ අපමණ මෙහෙයකි.

හික්කඩුවේ සුමංගල හිමි මේ කාර්ය සංසිද්ධියේත් පුනර්ජීවන ව්‍යාපාරයේත් පුරෝගාමී ඉදිරිපෙළ ප්‍රධානම චරිතයක් විය. උන්වහන්සේ 1858 වර්ෂයේදී ගාල්ල බෝගහවත්තේදී සුදර්ශන පරමානන්ද විහාරයේ විද්‍යාස්ථානයක් පිහිටුවා ගිහි පැවිදි බොහෝ ශිෂ්‍යනට අධ්‍යාපනය ලබා දුන් සේක. 1873 දී පැවැති පානදුරාවාදයෙන් ලත් විජයග්‍රහණය හා ලත් ප්‍රසිද්ධිය හා ප්‍රබෝධය ඔස්සේ යමින් එම වර්ෂයේම මාළිගාකන්දේ පාම්හවුස් නම් මන්දිරය ඉදිරිපිට විද්‍යෝදය පිරිවෙණ ආරම්භ කළහ. මෙහි නඩත්තුව සඳහා ප්‍රභූන් 13 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පිහිටුවා එය විද්‍යාධාර සභාව යයි නම් කරන ලදී. විදුදය පිරිවෙණ ආරම්භයේදී පැවිදි ශිෂ්‍යයින් 8ක් ද ගිහි ශිෂ්‍යයින් 20 ක් පමණද යුක්ත වූ බව සඳහන් වේ.(තිලකසිරි,2000:413) ආරම්භයේදී මේ පිරිවෙන් **ශාස්ත්‍රාලය** ලෙසින් ව්‍යවහාර වුවද පසුකාලීනව විද්‍යෝදය පිරිවෙණ ලෙසින් ව්‍යවහාර විය. විදුදය විශ්වවිද්‍යාලය ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙසින් නම්වූ පසුත් එහි පාලන තනතුරුවල පිහිටියේ භික්ෂූන් වහන්සේම වන අතර ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒ නම් ලද පසුත් එහි උපකුලපති වූයේ වැලිවිටියේ සෝරත හිමිය. සුමංගල හිමියෝ විදුදය බිහි කර නොනැවතුනාක් මෙන් උන්වහස්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවද සිය ගුරුන් ගිය මග ගනිමින් ලංකාවේ නොයක් පෙදෙස්වල පිරිවෙන් 200කට වැඩි ප්‍රමාණයක් පිහිටුවනු ලදහ.(වික්‍රමසිංහ,2004:26) ඒ පිරිවෙන් මගින්ද විදුලකර විදොදය මගින් දේශිය අධ්‍යාපනය සඳහා කෙරෙනුයේ යම් මෙහෙවරක්ද එයම සිදු විය.

සුමංගල මහ නාහිමිගෙන් රටට දැයට සමයට හා යටත් විජිත යුගයේදී දේශීය අධ්‍යාපනයේහිලා වූයේ යම් මෙහෙයක්ද එය සනාථ කිරීමට අගනා කථාවක් හමුවේ. එනම් උන්වහන්සේ හා දූත

පිරිසක් යම් අවශ්‍යතාවකට එක් වරෙක බුරුම සංඝරාජ හිමි හමු වූ අවස්ථාවක ඒ සංඝරාජ හිමි විසින් උන්වහන්සේ හඳුන්වා දුන්නේ ''ඔබලාගේ රටේ අගනා මැණික් පහක් තියෙනවා, ඒ රුවන්වැලි සෑය, ශ්‍රී මහා බෝධිය, දළදා වහන්සේත් ශ්‍රී පාදස්ථානත් අප ඉදිරියේ මේ වැඩ සිටින ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය හික්කඩුවේ සුමංගල හිමියනුත් '' යන ලෙසිනි.

**රත්මලානේ ධර්මාලෝක මහ නාහිමි**

1875 වර්ෂයේදී රත්මලානේ ධර්මාලෝක නාහිමි විසින් විද්‍යාලංකාර පිරිවෙණ ආරම්භ කරන ලද්දේය. 1874 දී කැලණිය විද්‍යාලංකාර දායක සභාව පිහිටුවා එහි උත්සාහත් සිය ගෝල හිමි වූ රත්මලානේ ධර්මාරාම හිමිගේ සහායත් ඇතිව මේ පිරිවෙණ බිහි කළහ. පොල්අතු සෙවිලි කළ කුඩා පැල්පතක ගුරු ගෝල දෙනමක් විසින් උගැන්වීම් ආරම්භ කළා යැයි ඉතිහාසයේ සඳහන්වේ. මේ ආයතනවල ආගමික විෂය පමණක් නොව භාෂාව, කාව්‍ය, විනය, තර්කනය, පාලි, සංස්කෘත වැනි විෂය ගණනාවක්ම උගැන්වීම ආරම්භ කරන ලද්දේය. කෙසේ නමුත් එකල අධ්‍යාපන තතත්වයේ වූ විෂමතාව හේතුවෙන් ආරම්භ කරන ලද ඒ පිරිවෙන් අතික්‍රමණය කිරීමට අද හෝ දේශීය අධ්‍යාපන යාන්ත්‍රණයට නොහැකි වී ඇත. එනම් වර්තමානයේදී දේශිය අධ්‍යාපනයේ මූලිකම ආයතන ස්වරූපය නිරූපණය කරන ආයතනවලින් මූලික තැන් කිහිපයක්ම මේ ආයතන ද්වය විසින් ලබා ගන්නා නිසාය.

ප්‍රධාන පිරිවෙන් සේම රටපුරා අනු පිරිවෙන්ද බිහිවීම නිසා හා උගැන්වීම වර්ධනය වූ නිසාද ගුරුකුල පරම්පරා කිහිපයක් ද වර්ධනය විය. මේ පිරිවෙන් නිසාම විවිධ මතවාද සමඟ ගුරුකුල ගණනාවක්ද මේ යුගයේදී බිහිවීම දක්නට ලැබෙන්නකි. බටුවන්තුඩාවේ පඬිතුමා සියලු පිරිවෙන් හා ගුරුකුලවලට නොබැඳී අධ්‍යාපනික වශයෙන් වැදගත් හා බෞද්ධ අධ්‍යාපන අංශයට වටිනාකමක් එකතුවන පැරණි පොත පත සංස්කරණයෙහි යෙදුණේය. එපමණක් නොව පසුකාලීනව වැටලිපන්වල දීපංකර හිමියෝද දොඩම්දූව ශෛලබිම්බාරාමයේ සීලක්ඛන්ද හිමියෝද දම්රම් හිමියෝ මෙන්ම සංස්කෘත බසින් සිය අධ්‍යාපනික කාර්යයහි නිරත වූහ. එපමණක් නොව රත්මලානේ ධර්මාලෝක හිමිගේ ගෝල හිමි වූ රත්මලානේ ධර්මාරාම හිමිද මෙකල දේශිය අධ්‍යාපනය වෙනුවෙන් කළ මෙහෙය අපමණය. සිය ගුරුන්ගේ මඟ ගනිමින් බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් සාහිත්‍ය පොත පත කරවීමේ උත්සුක විය. උන්වහන්සේ විසින් කරන ලද විශේෂ සාහිත්‍ය සංග්‍රහය නම් සිංහල භාෂාවේ අදදු සාකච්ඡාවට පාත්‍ර වන ගැටලුවක් වන ණ න හා ළ ල රීතිය සොයා ගැනීමයි.(වික්‍රමසිංහ,2004:50) භාෂාව තුළ විශාල පෙරළියකටත් විපර්යාසයනටත් හේතු වූ මේ රීතිය අද දක්වාම මතභේදවලට තුඩු දී ඇත.

**බෞද්ධ පාඨශාලා**

බොදු අධ්‍යාපනය වෙනුවෙන් බොදු පාඨශාලා ආරම්භ කිරීම තවත් දිශාවකින් සිදු විය. මේ සඳහා මූලික වූයේද පහතරට හා මුහුදුබඩ ප්‍රදේශ වීම විශේෂ ලක්ෂණයකි. ධර්මපාලතුමා හා ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් ඇරඹි පරමවිඥානාර්ථ සමාගම බෞද්ධ පාඨශාලා පිහිටුවීමේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය මව් ආයතනය විය. ඒ සමාගම යටතේ පසුකාලීනව පාඨශාලා රාශියක් බිහිව තිබූ අතර සියල්ල බොදු පාසැල්ම විය. දොඩම්දූව බද්දේගම, ගාල්ල, පානදුර යන ප්‍රදේශවිල් මෙය වහා පැන නැගුණ අතර බෞද්ධ පාඨශාලාවක් පිහිටුවීම පිළිබඳ පැරණිම තොරතුර ලැබෙන්නේ දොඩන්දූවේ පියරතන හිමි විසින් 1869 දී ආරම්භ කළ **ජිනලබ්ධි විශෝධක** නම් පාඨශාලාව පිළිබඳවය. මීට අමතරව එම ප්‍රදේශයේම ඊට අනුබද්ධව **යසෝදරා** බාලිකා පාසැල නමින් ගැහැණු පාසලක්ද කෝග්ගල, අම්බලන්ගොඩ, කටුකුරුන්ද, පානදුර, ආදී ප්‍රදේශවලත් පියරතන හිමිගේ ප්‍රධානත්වයෙන් පාසැල් ඇරඹිණි. (ඉලංගසිංහ,1998:150) පානදුර රන්කොත් විහාරස්ථාන භූමියෙහි ඇරඹි උපාධ්‍යාය පාසැල ද මෙසේ ම එම විහාරස්ථානයේ විසූ ගුණරතනතිස්ස හිමිගේ මූලිකත්තයෙන් ඇරඹි පාසැලක් විය. එසේම කොරතොට ධර්මාරාම හිමියන් විසින් ඇරඹි කොරතොට බෞද්ධ පාසැල ගාල්ලේ දංගෙදර තවත් බෞද්ධ පාසැලක්ද පිහිටුවනු ලැබීය. මේ යුගයේදී බෞද්ධ පාසැල්වල ඉගැන්වීම් කටයුතු සඳහා බෞද්ධ පොත පතේ තිබූ හිඟතාව නිසා ඒ පොත පත සම්පාදනය කිරීමටද උන්වහන්සේලා යොමු වූහ. ඒ අනුව **ඥෙයාාර්ථ දීපනී** හා **ජිනධර්ම විකාශිනී** යන ග්‍රන්ථද විනය නීති යන මැයෙන් ග්‍රන්ථයක්ද සම්පාදනය කළහ. (පඤ්ඤාලෝක හිමි,2002:526)

මෙයින් පසු විශේෂයෙන්ම ඕල්කට්තුමාගේ සහායෙන් 1881 දී සිංහල ජාතියට අයත් බෞද්ධ අරමුදල නමින් අරමුදලක් පිහිටුවා ප්‍රථමයෙන් ගාල්ලේ ඉංග්‍රීසි බෞද්ධ පාඨශාලාවක් ද ආරම්භ කෙරිණි. 1886 නොවැම්බර් 1 දින පර්මවිඥානාර්ථ සමාගම විසින් පිටකොටුවේ බෞද්ධ ඉංග්‍රීසි පාසැලක් ආරම්භ කළේ පැවැති රිවිදින දහම් පාසැලපිටකොටුවේ බෞද්ධ ඉංග්‍රීසි පාසැල යන මැයෙන් වෙනස් කරමිනි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි සහ හික්කඩුවේ හිමි එක්ව සිංහල බෞද්ධයින්ගේන් ඉල්ලා සිටියේ මෙම පාසැලත් අන් පාසැල්ද වෙනුවෙන් එක්ව ආධාර කරන ලෙසිනි. එසේම මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිගේ හා සුමංගල හිමිගේ මූලිකත්වයෙන් 1886 ඔක්තෝම්බර් 23 දින පරම විඥානාර්ථ සමාගමේ රැස්වීමක් පවත්වා බෞද්ධ ඉංග්‍රීසි පාසැලක් ආරම්භ කිරීමට නියම කර ගත් අතර ශිෂ්‍යයින් 37 කින් ආරම්භ කළ එම පාසැල 1890 දී ශිෂ්‍යයින් 160 ක් දක්වා වර්ධනය වී පසුව 1895 දී මරදානට ගෙන යන ලද අතර පසුව එය දිවයිනේ විශිෂ්ඨම පාසැලක් වන ආනන්ද විද්‍යාලය බවට පත් විය. (පඤ්ඤාලෝක හිමි,2002:533)

ක්‍රිස්තියානි පාසැල්වලින් බෞද්ධ දරුවන්ට සිදුවන ගැහැට පිළිබඳ ශෝක වූ රයිගම පතහවත්ත විහාරයේ වැඩ සිටි කොතලාවල සුවර්ණජෝති හිමියෝ පසුවදාම එනම් 1872 දී තාවකාලික ගොඩනැගිල්ලක බෞද්ධ පාසැලක් ආරම්භ කළහ. එපමණක් නොව පසුව ප්‍රදේශයේ බාලිකා පාසැලක්ද ආරම්භ කරන ලදී. මෙසේ මේ ප්‍රදේශයේ ද ප්‍රදේශ ගණනාවකම මේ ආකාරයේ බෞද්ධ පාසැල් 14 ක් ආරම්භ කරන ලද අතර එයින් 11 කම මූලික වූයේ රයිගම ගණානන්ද හිමිය. මේ ආකාරයේම පාසැල්පද්ධතියක් නැවතත් ආරම්භ වෙමින් පැවැති අතර ඒවා පිරිවෙන් යටතේම වූ බෞද්ධ පාසැල් ලෙස හැඳින්විණි. මුලදී පිරිවෙන්ද පසුව බෞද්ධ පාසැල්ද ඉන් පසුව පිරිවෙන් යටතේ බෞද්ධ පාසැල් ලෙසින් දේශීය අධ්‍යාපන ක්ෂෙත්‍රය වර්ධයන කරනු වස් මේ පාසැල් ක්‍රමය ඇරඹීය. මේ පාසැල් පශ්චාත්කාලීනව ඇරඹී ඒවා වුවද මේවා ආරම්භ කිරීමේද පුරෝගාමී වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාමය.

කෙසේ කුමනාකාරයෙන් කුමන ප්‍රදේශයක බෞද්ධ පාසැල් හෝ පිරිවෙන බිහිවුනද ඒ සියල්ල තුළ මූලික වූයේ භික්ෂූන් වහන්සේලාමය. කෙසේ වුවද මේ ව්‍යාපාරය හීන කරනු වස් හා ව්‍යාපාරය අඩපණ කරනු වස් රජය විසින් විවිධාකාරයේ නීති ගෙන එන ලදී. ඒ අතර පාඨශාලා ලියාපදිංචි කළ යුතුය හා ඒ සඳහා ගාස්තු ගෙවිය යුතුය යන නීති මූලික විය. කෙසේ වුව කුමනාකාරයේ හෝ ක්‍රම මගින් ව්‍යාපාරය බණ්ඩනය වීමට ඉඩ නොදී අය අඛණ්ඩව ඉදිරියට ගෙන ඒමටත් ක්‍රියා කළෝ මේ භික්ෂූන් වහන්සේලාමය. ගාල්ලේ මහින්ද, කොළඹ මියුසියස්, බලපිටියේ සිද්ධාර්ථ විද්‍යාලය යනාදී විද්‍යාලත් බිහිවූයේ මේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට මේ කාලයේදී ගෙන ගියාවූ ව්‍යාපාරායේ එක් එක් සංධිස්ථානවල ප්‍රතිඵල ලෙසිනි. (අයිවන්,2006:132)

කෙසේ වුවද මේ අකාරයේ වූ අධ්‍යාපනික වැඩපිළිවෙල හෙවත් බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය වෙනුවෙන් කැප වී කටයුතු කළ හා ඒ උත්සාහයයන් කිසිසේත්ම නිශ්ඵල නොවූ බවත් එය දේශිය අධ්‍යාපනය උදෙසා කළ උපරිම ආයෝජනය බවත් සනාථ වන්නට ගත වූයේ දශක දෙක තුනක් පමණි. ඒ බව හා එහි ප්‍රතිඵල පහත සඳහන් එකල සංඛාලේඛන දෙපාර්තමේන්තුවේ වගු සටහනින් පෙන්නුම් කෙරේ.

**වගුව 01: භික්ෂූන්වහන්සේලා විසින් 19 සියවස මැද භාගයේදී පමණ සිට ඇරඹි අධ්‍යාපනික ප්‍රබෝධය නිසා 20 වන සියවස මුල් භාගයේදී බෞද්ධ ජනයා ලැබූ සාක්ෂරතාව ප්‍රතිශතයක් ලෙස**

| Religion | Male | | | | Female | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1881 | 1891 | 1901 | 1911 | 1881 | 1891 | 1901 | 1911 |
| Buddhism | 23.5 | 28.7 | 34.9 | 41.8 | 1.4 | 2.6 | 5.2 | 9.1 |
| Hindus | 19.8 | 23.3 | 25.9 | 29.6 | 1.0 | 1.8 | 2.5 | 4.0 |
| Muhammadus | 26.9 | 30.5 | 34.4 | 36.2 | 1.5 | 1.5 | 3.3 | 3.2 |
| Christians | 41.4 | 50.0 | 55.2 | 60.3 | 13.6 | 21.7 | 30.2 | 38.8 |

උපුටා ගැනීම සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූලාශ්‍රය 1911

**නිගමනය**

මේ අනුව බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී විශේෂයෙන්ම 19 වන සියවස මැද භාගයේදී පමණ සිට ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය නිසා අධිරාජ්‍යවාදී බලපෑම මත වැළලීයන්නට තිබූ පිරිවෙන පන්සල මූලික කර ගත් පැරණි බෞද්ධ අධ්‍යාපනික සංස්කෘතිය භික්ෂූන් වහන්සේලාගේම මැදිහත්වීම මත දිවි හිමියෙන් ආරක්ෂා කර ගැනීමට හැකි වූ බවත් පෙන්වා දිය හැකිය. එපමණක් නොව එකල එසේ බෞද්ධ භික්ෂූන් වහන්සේ විසින් ආරම්භ කළ පිරිවෙන් පසුකලෙක ජාතික වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්ව අද වන විට ජාතික තලයේ උපරිම සේවයක් සිදු කරමින් විශ්වවිද්‍යාල තත්ත්වයට පැමිණ ඇත. තවද රටේ ද්විතියික අධ්‍යාපනය ලබා දෙන ප්‍රසිද්ධම හා ප්‍රධානම පාසල්වලින් බොහාමයක්ම පාහේ යථෝක්ත සඳහන් කළ බෞද්ධ පුනර්ජීවනය මගින් පිළිපන් ඒවා බවත් සඳහන් කළ යුතුමය. එසේම ඒ භික්ෂූන් වහන්සේලා විසින් ඇරඹි බොදු අධ්‍යාපනික ප්‍රබෝධයේ ප්‍රතිඵල ආසන්නම දශකවලදී ලැබිය හැකි වූ බවත් පසුකාලීනව ලංකාවේ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ දියුණුවට උන්වහන්සේලාගේ දායකත්වය ප්‍රායෝගිකවම ආධාර වී ඇති බවත් සඳහන් කළ යුතුමය.

**මූලාශ්‍රය**


- අයිවන් වික්ටර්, (2006), පන්සලේ විප්ලවය, රාවය ප්‍රකාශකයෝ, කොළඹ.
- ඉලංගසිංහ මංගල, (1992), රජය ආගම හා අධ්‍යාපනය, කැලණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල.
- පඤ්ඤාලෝක හිමි මීගොඩ, (2002), ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- ජයසිංහ කරුණාරත්න, (2007), ශ්‍රී ලංකාවේ රාජාවලිය අවසන් කළ බ්‍රිතාන්‍යයෝ, ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන, කොළඹ.
- වික්‍රමසිංහ මාර්ටින්, (2004), අපේ උරුමය හා භික්ෂූන් වහන්සේ, සරස පොත් ප්‍රකාශකයෝ, රාජගිරිය.
- විජේතුංග, ඩබ්ලිව්. එම්. කේ. (සංස්.)(2016), ශ්‍රී ලාංකේය ඉතිහාසය, ඇම්. ඩී. ගුණසේන ප්‍රකාශකයෝ, කොළඹ.
- Ceylon Census of 1911 The review of the Results of the Census of 1911 Denham E.D Colombo H. C Cottle, Government Record office, Colombo Press 1912.

# කන්නන්ගර චින්තනය පිළිබඳ හැඳින්වීමක්

**කඩවලවැවේ කල්‍යාණ හිමි**
දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
kadawalawewe1989@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අද්විතීය ආස්ථානයක් හිමි කර ගන්නා සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා දාර්ශනික චින්තනයක් සහිතව අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීමට කාලීන මෙහෙවරක් කළ විද්වතෙකි. සෑම පුරවැසියෙකුටම සමාන ලෙස අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇති බවත් රජයේ වියදමින් අධ්‍යාපනය ලැබීම අවනම්බුවක් නොවන බවත් එතුමා පෙන්වා දුන්නේ ය. අධ්‍යාපනය වෙනුවෙන් කරනු ලබන වියදම් රට වෙනුවෙන් කළ ආයෝජනයක් සේ සැලකූ එතුමා ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලැබීමේ වටිනාකම පෙන්වා දුන්නේය. ප්‍රායෝගිකත්වයෙන් තොර අධ්‍යාපනයෙහි අර්ථ ශූන්‍යත්වය පෙන්වා දුන් එතුමා 4Hනම් සංකල්පය මගින් ජීවන අරමුණු සාධනයට අධ්‍යාපනය ඉවහල් වන ආකාරය හඳුනාගත්තේය. සමාජ හරපද්ධතීන් හා සංස්කෘතික සාරයන් අධ්‍යාපන මාධ්‍යයෙන් සමාජගත කිරීමට අවකාශ ඇති බව ද එතුමා පෙන්වා දුන්නේය. රටෙහි පවතින අධ්‍යාපනය එරට තුළ උද්ගතවන ජාතිවාදී ආගම්වාදී සියලු ගැටලුවලට පාදක වන ආකාරය එතුමන් දක්වා ඇති අතර ආගමික හා ජාතික වශයෙන් මිශ්‍ර පාසල් ක්‍රමයක් යෝජනා කළේය.

**මුඛ්‍ය පද:** ***අධ්‍යාපනය, කන්නන්ගර චින්තනය, සංස්කෘතිය, අර්ථක්‍රමය, රජය***

**හැඳින්වීම**

ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මහතා 1884 ඔක්තෝබර් මස 13 වන දින අම්බලන්ගොඩ රන්දොඹේදී උපත ලැබූ අතර ගමේ පාසලේ මූලික අධ්‍යාපනය ලබා ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේ ඉහළ අධ්‍යාපනය ලැබීය. පසුව එම විද්‍යාලයේ ගණිත ගුරුවරයකු වශයෙන් සේවය කළේය. ගණිත විෂය කෙරෙහි කුසලතාවයක් දැක්වූ මෙතුමා ගණිතය පිළිබඳ එංගලන්තයේදී පැවැත්වූ විභාගවලදී ශ්‍රී ලංකා ශිෂ්‍යයන් පමණක් නොව බ්‍රිතාන්‍ය ශිෂ්‍යයන්ද අභිබවා ප්‍රතිඵල දැක්වීමට සමත්වූයේය. ඒ මහතා මොරටුව වේල්ස්කුමාර විද්‍යාලයේද කොළඹ වෙස්ලි විද්‍යාලයේද සේවය කළේය. නීතිය හැදෑරූ මෙතුමා ශ්‍රී ලංකාවේ දේශපාලන කරළියට පිවිසෙනතුරු ගාල්ල උසාවියේ නීතිඥවරයකු වශයෙන් කටයුතු කළේය. 1915 වසරේ මෙරට ඇතිවූ සිංහල මුස්ලිම් ජාතිවාදි අරගලයේදී සිරගතවූ සිංහලයන් වෙනුවෙන් නොමිලයේ එම නඩුවලට පෙනී සිටිමින් මුදලට යට නොවූ අභීත නීතිඥයකු වශයෙන් හා සිංහලයකු වශයෙන් තම යුතුකම මැනවින් ඉටු කළේය. ආචාර්ය කන්නන්ගර 1920 වර්ෂයේදී ව්‍යවස්ථාදායක සභාව සඳහා දකුණු පළාත නියෝජනය කළ අතර 1924 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරන ලද ව්‍යවස්ථාදායක සභාවේ ගාලු දිස්ත්‍රික්කය නියෝජනය කළේය. 1930 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දේශපාලන කෙෂ්ත්‍රයේ නව යුගයක ආරම්භයක් ඇතිවූ අතර ලංකා ජාතික සංගමයේ එහි සභාපතිවරයා වශයෙන් මෙතුමා පත්කර ගන්නා ලදී. 1931 වර්ෂය ලංකා ඉතිහාසයේ සුවිශේෂ අවස්ථාවක් ලෙස සැලකිය යුතු අතර ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ මුළු ආසියාවෙන්ම ප්‍රථම වරට සර්වජන ඡන්දබලය ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලදී. 1931 වර්ෂයේ දී සර්වජන ඡන්දයෙන් ප්‍රථමවරට ගාල්ල ඡන්ද කොට්ඨාසය නියෝජනය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වූ කන්නන්ගර මහතා 1931 දී අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් පත්ව 1947 වන තුරුම අධ්‍යාපන ඇමැතිධූරය හෙබවිය. කන්නන්ගර මැතිතුමන් විසින් බිහි කරන ලද නිදහස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් තුළින් එවකට මෙරට අධ්‍යාපන පෙරළියක් මෙන්ම සමාජ පෙරළියක්ද ඇතිවිය.

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ප්‍රථම වරට මහජන නියෝජිතයෙකු අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් පත්වූ අතර ඇමැතිවරයා හා ඡන්දයෙන් පත්වූ ඔහුගේ විධායක කාරක සභාව මහජන අවශ්‍යතා සඳහා වගකිව යුතුවිය. රට වැසියාගේ ඕනෑ එපාකම් දන්නා පුද්ගලයකු රටවැසියන් අතුරෙන් රට වැසියාගේ දරුවන්ගේ අධ්‍යාපනය භාරව පත්වූ ප්‍රථම අවස්ථාව එයවිය. 1948 දී ශ්‍රී ලංකාව ස්වකීය නිදහස ලබා ගන්නාවිට 1931 සිට 1947 දක්වා අධ්‍යාපන ඇමැතිව සිටි

කන්නන්ගර මහතා ප්‍රමුඛ අධ්‍යාපන කාරක සභාව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ගැටලු මැනවින් පරීක්ෂා කර බලා ඒවා සැලකිල්ලට ගෙන ඉන් සමහරක් විසඳා ලක් වැසියනට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත්හ. මෙම විසඳුම්ද පදනම් කරගනිමින් කන්නන්ගර අධ්‍යාපන ඇමැතිතුමන් විසින් 1938 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පනත** මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කෙෂ්ත්‍රයේ විශාල පෙරළියක් විය. එම පනත මගින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම් කරගෙන 1940 දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳව විශේෂ කාරක සභාවක් පත්කරන ලදී. 1943 වර්ෂයේදී මෙම කාරක සභා වාර්තාව ප්‍රසිද්ධ කරන ලද අතර, 1944 රාජ්‍ය මන්ත්‍රණ සභාවෙ නැවත විවාදයට භාජනය කර 1945 වර්ෂයේදී නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගන්නා ලදී. මෙම යෝජනා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ නව නැම්මක් හා නව යුගයක් උදා කිරීමට සමත්විය.

**කන්නන්ගර සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පසුබිම**

සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර විද්වතාණන්ගේ අධ්‍යාපන ප්‍රතිපත්ති ලංකාවේ පෙරළියක් කිරීමට සමත් විය. එතුමාගෙන් අධ්‍යාපනයට සිදු වූ සෙවය සහ එතුමාගේ චින්තනය පිළිබඳව විමසා බැලීමට පෙර මෙකල ලංකාව තුළ පැවති අධ්‍යාපන ක්‍රමය හා චින්තනය පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය. දළ වශයෙන් එකල පාසල් වර්ග දෙකක් විය. එනම් **ඉංගීසි පාසල්** සහ **පිරිවෙන් ඇතුළු ස්වභාෂා පාසල්** වශයෙනි. මෙහි ඉංග්‍රීසි පාසල් ක්‍රිස්තියානි ආගමේ සමිති විසින් පාලනය කරන ලදි. ක්‍රිස්තියානි පාසල්වල ප්‍රධානාචාර්ය ධූරය සඳහා බ්‍රිතාන්‍යයේ උපාධිධාරීන්ව පත්කරගත්තේය. මෙම හේතුන් නිසා ලංකාවේ ඉංග්‍රීසි පාසල් බ්‍රිතාන්‍යයේ පුද්ගලික පාසල්වල ස්වරූපයට පත් වීම වැළැක්විය නොහැකි විය. විභාග ක්‍රමය සැකසුනේ කේම්බ්‍රිජ් විභාග ක්‍රමයට අනුවය. එමෙන්ම මෙම පාසල්වලින් සිදු වූ සේවාවන් ද රාශියක් මෙහි දී පෙන්වා දිය යුතුය. ඒ අතර ක්‍රීඩා කටයුතු හා චරිත සංවර්ධනය, නීති හා වෛද්‍ය සේවය වැනි සේවාවන් ප්‍රධාන වේ. එමෙන්ම මෙකල පැවති අධ්‍යාපන ක්‍රමය තුළින් පරිපාලනයට අවශ්‍ය කරන පිරිසක් නිර්මාණය වීම ද පෙන්වාදිය හැකි වැදගත් කරුණකි. නිදහසින් පසු ශ්‍රී ලංකාව ඵලදායී ප්‍රගතියක් අත්කර ගැනීමට එම සාධකය හේතු විය. එහෙත් මෙකල පැවති මෙම අධ්‍යාපන ක්‍රමය බොහෝ උගතුන්ගේ විවේචනයට ලක්ව පැවතුනි. එසේ විවේචනය කළ වුන් අතර වෝල්ටර් සෙන්ඩල් සහ රොබට් බ්‍රිජ් යන දෙපල ප්‍රධානය. ඔවුන් ප්‍රකාශ කර සිටියේ පිටතින් ගෙනෙන ලද මෙම අධ්‍යාපන ක්‍රමය ලංකාවට නොගැළපෙන බවයි. මෙම අධ්‍යාපන ක්‍රමය මගින් තරුණ පරපුර සාම්ප්‍රදායික සංස්කෘතිය අවඥාවෙන් සැළකීමට පුරුදු වන අතර ඔවුන්ට රැකියා බලාපොරොත්තුවෙන් කාර්යාල දොරටු අසළ රැඳී සිටීමටත් සිදු වනු ඇති බව ඔවුහු පෙන්වා දුන්හ. එමෙන්ම එක්තරා ප්‍රංශ ජාතික අධ්‍යාපනඥයෙකු පෙන්වා දුන්නේ සිංහල හා දෙමළ දරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම බුද්ධිය මොට කරන්නක් බවයි. තවද මෙම ඉග්‍රීසි අධ්‍යාපනයේ පැවති ගැටලුකාරී තත්වයක් නම් මෙම පාසල් නගරබදව පමණක් පිහිටුවා තිබීමයි. එම හේතුවෙන් ගම්බද දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන ළමයින්ට අධ්‍යාපන අයිතිය නැතිවී ගියේය. එමෙන්ම මෙම අධ්‍යාපනය විවර වූයේ ධනවත් පවුල් වල දරුවන්ට පමණි. මෙම ඉංග්‍රීසි පාසල් ආර්ථික වටිනාකම් මත පදනම්ව ඉගැන්වීම් කළේය. සමාජයේ ඉහළ තත්වයකට යා හැකි එකම මාර්ගය වූයේ මෙම ඉංග්‍රීසි පාසල් වලින් අධ්‍යාපනය ලැබීමයි.

මෙකල පැවති අනෙක් පාසල් වර්ගය නම් ස්වභාෂා පාසල්ය. මෙම පාසල්වලට සම්බන්ධ වූයේ නගරයේ ඉංග්‍රීසි පාසලට යාමට තරම් වත් පොහොසත් කම් නොතිබූ දුප්පත් දරුවන්ය. ස්වභාෂා පාසල්වල අරමුණ වූයේ මවු බස පිළිබඳ දැනුමක් ලබා දීමයි. අධ්‍යාපනික උපකරණ, ක්‍රීඩාගාර, විද්‍යාගාර ආදියෙන් තොරව ඉතාමත් දුෂ්කරතා සහ අපහසුතා මධ්‍යයේ මෙම පාසල් පවත්වාගෙන ගියේය. ස්වභාෂා පාසල් අධ්‍යාපනයෙන් පසු ඉංග්‍රීසි පාසලට යාමට තරම් මුදල් නොමැති දරුවන්ගේ අනාගතය ඛේදජනක විය. ඔවුන්ට ගම තුළම නැවතී සිටීමට සිදු විය. මෙම ස්වභාෂා පාසල්වලින් ද සුවිශාල සේවාවක් සිදු විය. එනම් මවු බස දත් උගත් සිංහලයන් බිහි වූයේ මෙම පාසල් ක්‍රමය තුළිනි.

ඉංග්‍රීසි භාෂා පාසල් සහ ස්වභාෂා පාසල් සංකල්පය හේතුවෙන් ලංකාව තුළ පන්ති භේදයක් ඇති විය. එය මෙසේ පෙන්වා දී ඇත. ''අප විසින් ජනයා කොටස් දෙකකට බෙදා ඇත. එක් කොටසක් උසස්ය. අනික පහත්ය. එක් කොටසක් කලිසම් අඳී. අනික අඳීන්නේ රෙද්දය. ඉංග්‍රීසි අධ්‍යාපනය

නිසා අපේ රට සමාජයෙහි පන්ති දෙකක් වශයෙන් බෙදී ඇත. ඉසුරුමත් වූත් ධනවත් වූත් බලසම්පන්න වූත් ගෙවීමට හැකියාවක් ඇත්තා වූත් අය විදේශීය භාෂාවකින් උසස් අධ්‍යාපනයක් දෙන පාසල් වර්ගයකට යති. ඔවුන් ඒ සඳහා ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවීම ප්‍රයෝජනවත්ය. කවර හෙයින් ද යත් මෙරටේ රාජ්‍ය භාෂාව ඉංග්‍රීසි වන හෙයිනි. එසේම ඉංග්‍රීසි නොදන්නා කිසිවෙකුට උසස් නිලයකට පත්විය නොහැකි හෙයිනි.''[10] යනුවෙනි. මෙම ප්‍රකාශය තුළින් මෙකල පැවති ක්‍රමය හා බෙදීම පිළිබඳව මනාව විවරණය වේ. මෙම සාමාජීය බෙදීම දේශපාලනික වශයෙන් ද බරපතල ගැටුම් ඇති කිරීමට සමත් විය. මෙම තත්වය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා මනාව අවබෝධ කරගෙන තිබුණි. මෙතුමාගේ ඒකායන පරමාර්ථය වූයේ ගම්බද දරුවන්ට ද මෙම අධ්‍යාපන අවස්ථාව ලබා දිය යුතු බවයි. නිදහස් අධ්‍යාපනයක් දක්වා එතුමාගේ චින්තනය ව්‍යාප්ත වීමට මෙම සාධකයන් පසුබිම් වී ඇති බව හඳුනාගත හැකිය.

කන්නන්ගර චින්තනය හැඳින්වීම

''අධ්‍යාපනය යනු සාක්ෂරතාවය පමණක් නොවේ. ඒ තුළින් රටක ජනතාවගේ චින්තන ක්‍රමය හැඩ ගැස්වීම ප්‍රධාන විය යුතුය. නිදහස් නිවහල්ව සිතන්නට කියන්නට හැකි ජනතාවක් බිහි කිරීම එහි මූඛ්‍ය පරමාර්ථය විය යුතුයි. නිදහස් අධ්‍යාපනය ජාතික චින්තනයේ උරගල විය යුතුයි. අපගේ දේශයෙහි පාසල් පද්ධතියේ ක්‍රියාකාරිත්වය විය යුත්තේ අපගේ භාෂාව අපගේ ආගම අපගේ සංස්කෘතිය හා සම්ප්‍රදායයන් සඳහා නැඹුරු කරවීම මෙන්ම ඉහත කී පරිදි ගැඹුරු චින්තනයකින් යුතුවූ දරු පරපුරක් මෙන්ම වැඩිහිටි පරපුරක් බිහි කිරීමයි." 1947 වර්ෂයේදී කල්කටාවේදී විශේෂ දේශනයක් පවත්වමින් කන්නන්ගර ශ්‍රීමතාණන් විසින් කරන ලද ඉහත ප්‍රකාශයෙන් රටක අධ්‍යාපනය පිළිබඳව එතුමා තුළ පැවැති චින්තනය හා දර්ශනය මනාව පැහැදිලි වේ. කන්නන්ගර මහතා යනු චින්තනයක් මත පදනම් වූ අධ්‍යාපනඥයෙකි. එහෙයින් ඔහුගේ චින්තනය හඳුනාගැනීම මෙහි දී වඩාත් වැදගත් වෙයි. එතුමාගේ අධ්‍යාපන චින්තනය ප්‍රවේශ කිහිපයක් යටතේ හඳුනාගත හැකිය.

**අධ්‍යාපනය සහ සංස්කෘතිය**

**අධ්‍යාපනය සහ රජය**

**අධ්‍යාපනය සහ අර්ථ ක්‍රමය** යනුවෙනි.

අධ්‍යාපනය යනු හුදෙක් එක් අංශයක පමණක් සිදු වන සංවර්ධනයක් නොවේ. එතුළ බහුවිධ පරමාර්ථයන් මෙන්ම අර්ථයන් පවතියි. සංස්කෘතිය, දේශපාලනය, ආර්ථිකය වැනි අංශයන් තුළින් අධ්‍යාපනය නියෝජනය වන බව එතුමාගේ මතය විය. ඒ අනුව කන්නන්ගර චින්තනය පුළුල් පරාසයක පැතිර පවතින්නක් බව පෙන්වා දිය හැකිය. මෙතුමන්ගේ මෙම චින්තනය හුදෙක් අහම්බෙන් වූවක් නොවේ. කුඩා කල පටන් ඔහු ලද අත්දැකීම් හා දැනුම් ඒ සඳහා පාදක විය. එමෙන්ම ඔහු අධ්‍යාපනය යන්න දාර්ශනික අර්ථයකින් විමර්ශනය කරන්නට විය. එහි ප්‍රතිඵලය වූයේ අද්විතීය අධයාපන චින්තනයක් එතුමා තුළින් ප්‍රභවය වීමයි.

ඒ අනුව මෙම නිබන්ධනයේ අරමුණ වන්නේ එතුමා ඉදිරිපත් කරන ලද විවිධ පනත් මෙන්ම අධ්‍යාපනයේ අභිවෘද්ධිය උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් පසුපස පැවති එතුමාගේ චින්තනය අධ්‍යයනය කිරීමයි. එය පූර්වෝක්ත ප්‍රවේශයන් තුන ඔස්සේ මෙහි දී කරනු ලැබේ. මෙම චින්තනය මත පදනම්ව එතුමාගෙන් ඉටු වූ සේවය අනිර්වචනීය වේ. එමෙන්ම මෙම නිබන්ධනයේ දී එතුමා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයට කළ සේවාවන් පිළිබඳව අධ්‍යයනය කිරීමට යොමු නොවේ. උක්ත ප්‍රවේශයන් තුන ආශ්‍රයෙන් එතුමාගේ චින්තනය අධ්‍යාපනය විෂයෙහි ක්‍රියාත්මක වූ ආකාරය මෙහි දී විමසා බලනු ලැබේ.

**අධ්‍යාපනය සහ සංස්කෘතිය**

සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන චින්තනයේ පැනෙන සුවිශේෂී ලක්ෂණයක් නම් අධ්‍යාපනය සහ සංස්කෘතිය අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ අවධාරණය කිරීමයි. මෙතුමා

[10]හැන්සාඩ් 1944, පිටුව 847

සංස්කෘතිය යන්න යොදා ඇත්තේ සමාජ විද්‍යාත්මක හෝ මානවවංශ විද්‍යාත්මක අර්ථයකිනි.[11] ඇමරිකානු මානවවංශ විද්‍යාවේ ප්‍රධානියා වශයෙන් සැළකෙන ඒ. කෝබර් එම වචනය මෙසේ අර්ථ කථනය කර ඇත. ''මානව පෞරුෂයට අදාළ ස්වයංකාරී ප්‍රතීක හෝ සහජාසයානුගත නොවන්නා වූ සියලු ක්‍රියාකාරකම් හා මනෝවිද්‍යාත්මක නොවන ඵල සංස්කෘතිය වශයෙන් විග්‍රහ කළ හැකිය. ජීව විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ව්‍යවහාරයෙහි ලා ගත් කල මෙම විග්‍රහයෙන් අර්ථවත් වන්නේ සංස්කෘතිය තත්වාරෝපිත හෝ ඉගෙනගත් කටයුතු සහ මේවාහි නිෂ්පාදිත ඵලවලින් සමන්විත වන බවයි. ඉගෙනගත් යන අදහස හේතු කොට ගෙන සමාජීය වශයෙන් පැවරුණු යමක් වේද එය සම්ප්‍රදායෙන් ලැබෙන යමක් වේ ද එය සමාජයන්හි සාමාජිකයකු වශයෙන් මිනිසා විසින් ලබා ගන්නා ලද යමක් වේ ද එය පිළිබඳව නැවත සලකා බැලීමට අප නැවත යොමු වේ''[12] යනුවෙනි.

එසේම එතුමා ආගම සහ සංස්කෘතිය අතර ද පවත්නා සම්බන්ධයක් පෙන්වා දුන්නේය. සංස්කෘතිය යන්න ආගමෙන් තොරව කථා කළ නොහැකිවාක් මෙන්ම ආගම ද සංස්කෘතිය මත පදනම්ව පවතියි. ඒ අනුව එතුමාගේ සංස්කෘතිය හා අධ්‍යාපනය පිළිබඳ චින්තනය කරුණු තුනකින් සමන්විත වේ.

01. පැරණි සිංහලයන් විසින් වර්ධනය කරන ලද උසස් සංස්කෘතිය

02. බටහිර බලපෑම යටතේ එම සංස්කෘතිය අනුක්‍රමයෙන් පිරිහීම සහ එහි තැන වඩ වඩා විදේශීය වූ ලක්ෂණ වලට හිමි වීම. මිෂනාරී අධ්‍යාපනය මෙම විපර්යාසයට මෙවලමක් විය.

03. පුනර්ජීවනයක් සඳහා අවශ්‍යතාව එනම් එහි පැරණි ස්වරූපයෙන් නොව සංස්කෘතීන් දෙකෙහි වටිනා යමක් වේද එහි සංයෝගයක් වශයෙන් එයටම ආවේණික පෞද්ගලිකත්වයක් සහිතව නව සාර සංග්‍රහ රටාවකටය. එතුමාගේ විශ්වාසයට අනුව මෙය සිදු කළ හැකි වන්නේ ජාතික අධ්‍යාපනයක් වර්ධනය කිරීමෙන් පමණි.[13]

ශ්‍රී ලංකාව තුළ පැවති ඉපැරණි බෞද්ධ සංස්කෘතිය පැරණි බෞද්ධ ජම්බුද්වීපයෙන් ලද්දක් බව එතුමාගේ අදහස විය. සිංහල සංස්කෘතියේ පදනම වන බුද්ධාගම ඉන්දියාවෙන් ලංකාවට ගෙනාවේය. ''අපේ සංස්කෘතිය අවසාන වශයෙන් ජම්බුද්වීපයේ සංස්කෘතික උරුමයෙන් ව්‍යුත්පන්නය. අපේ බීජය අප ලබා ගත්තේ එහි සරුවට වැඩුනු පාරම්පරික වෘක්ෂයෙනි.''[14] භාරතයෙන් අප ලද සංස්කෘතිය හෙළ දිව දී එයට අනන්‍ය වූ ක්‍රමවේදයක් ඔස්සේ වර්ධනය විය. ''සංස්කෘතික බීජය පතිත වූයේ සරුසාර බිමකය. එය නොයෙක් මාර්ගයන්ගෙන් පෝෂණය ලබා ගත් අතර කාලයාගේ ඇවෑමෙන් බොහෝ අතින් අද්විතීය සුන්දරත්වත් ස්වභාවයත් තමන්ගේම වූ පෞද්ගලිකත්වයත් උත්කෘෂ්ට මල්ඵල ගැන්වීමක් ඉන් බිහි විය.''[15] එසේම මෙවන් උසස් තත්වයක සංස්කෘතියක් සිංහල ජාතියට උරුමව පවතිද්දී බටහිර ජනතාව අනාර්ය මට්ටමේ පැවතුනි.

ශ්‍රී ලාංකිකයන් වූ අප අතින් සිදු වූ වැදගත්ම කාරණය ලෙස එතුමා පෙන්වා දෙන්නේ බුදු දහම රැක ගැනීමයි. එසේම මෙම සිංහල සංස්කෘතිය පෙරදිග මෙන්ම අපරදිග ද සංස්කෘතීන්ට වඩා උසස් තත්වයක පැවතුණි. සාහිත්‍ය, සංගීතය, කලාව වැනි නොයෙක් අංශයන් කෙරෙහි මෙන්ම මූර්ති, චිත්‍ර ආදී සියලු අංශයන් නියෝජනය කළේය. විදේශීය වෙළඳාමට ද ලංකාව තෝතැන්නක් විය.

මෙසේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රභවය වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ කරුණු සලකා බැලීමෙන් අනතුරුව එතුමා එය පිරිහීමට මුල් වූ කරුණු පිළිබඳව විමසා බලයි. මෙහි දී එතුමන්ට හමුවන ප්‍රධාන කරුණ නම් පෘතුගීසීන්ගේ පැමිණීමයි. එමෙන්ම අනතුරුව ඇති වූ ලන්දේසි සහ ඉංග්‍රීසි ආක්‍රමණද මේ සඳහා බලපෑ ආකාරය එතුමා පෙන්වා දී ඇත. ''ගත වූ අවසාන සියවස

[11] සුමතිපාල, කේ.එච්.එම්. (1993), *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය,* පිටුව 157

[12]koeber, A.L (1963), *Anthropology; Culture patterns and processes*, P.61

[13]සුමතිපාල, කේ.එච්.එම්. (1993), *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය,* පිටුව 158

[14]සිංහලයන්ගේ කාර්ය සාධනය, 1947 දී කල්කටාවේ පැවති ආසියාතික කලා හා සංස්කෘතික සම්මේලනයෙහි දී සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් පවත්වන ලද මූලාසනයේ කථාව

[15]එම

හෝ සියවස් දෙක තුළ සංස්කෘතික අංශයන්හි දී සිංහලයන් පමණ ආභාසය සඳහා අපරදිග කෙරෙහි යොමු වන්නට පුරුදු වූ ආසියාතික ජනතාවක් ඇත් නම් ඒ ස්වල්පයක් පමණි. වාණිජ හා රාෂ්ට ලාභාපේක්ෂාවෙන් සොළොස් වන සියවස මුලදී මෙහි පැමිණි පෘතුගීසින්ගෙන් ආරම්භව 1818 දී ස්වාධනත්වය පිළිබඳ අවසාන සළකුණ පවා බ්‍රිතාන්‍යයන්ට අහිමි වීම දක්වා වූ තෙසියවසක කාලයක් අනුක්‍රමයෙන් මෙහි පැමිණි යුරෝපීය ජාතිකයන් සමග මෙම කුඩා ජාතියට නොකඩවා සටන්වල යෙදීමට සිදු වීම නිසා ජාතික සංස්කෘතිය පෝෂණය කළා වූ ආයතන පිරිහීම හෝ අතුරුදහන් වීම සිදු විය.''[16]

ලංකාවේ පන්සල කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමය විනාශ මුඛයට පත්විය. එහි ප්‍රතිඵලය වූයේ මෙතෙක් කල් ශ්‍රී ලංකාව පෝෂණය කළ උතුම් බෞද්ධ සංස්කෘතිය ක්‍රමයෙන් පරිහාණියට පත් වෙමින් පිටරටියන්ගේ සංස්කෘතීන් මෙරට ව්‍යාප්ත වීමට පටන් ගැනීමයි. ඔවුන් විසින් නිර්මාණය කරන ලද පාසල් ක්‍රමය තුළ ඉංග්‍රීසි භාෂාව පමණක් උගන්වමින් සිංහල භාෂාව විනාශයට පැමිණවීමට කටයුතු යෙදවීය. එපමණක් නොව සිංහල වූ සියල්ල අහෝසි විය. සියලුම සම්ප්‍රදාය, චාරිත්‍ර වාරිත්‍ර, ආගම, භාෂාව යනාදී සියල්ල විනාශයටගියේය.

ක්‍රිස්තියානිකරණයට සහ බටහිරීකරණයට මෙකල අධ්‍යාපනය යොදාගෙන පැවතුණි. පාසල් පාලනය කිරීමට රජය විසින් පවරණ ලද්දේ ක්‍රිස්තියානි පල්ලියටයි. මෙම තත්වය තුළ නැවත සිංහල බෞද්ධ සංස්කෘතිය නගා සිටු වීමට නම් ලංකාව තුළ ජාතික පුනර්ජීවයක් ඇති කළ යුතු බව එතුමා විශ්වාස කළේය. ඒ සඳහා ඉවහල් කරගත හැකි උචිතම ක්‍රමවේදය නම් අධ්‍යාපනය බව එතුමාගේ විශ්වාසය විය. එහි දී මවු භාෂාවෙන් අධ්‍යාපනය ලබා දීම, ඉතිහාසය වැනි විෂයන් තරුණයන්ට ඉගැන්වීම වැනි ක්‍රමයන් භාවිත කළ හැකි විය.

මෙතුමන් තුළ පැවති මෙම ඍජු චින්තනය හේතුවෙන් එතුමාට විරුද්ධව ඇතමුන් චෝදනා කරන්නට විය. ඒ අතර එක් චෝදනාවක් නම් එතුමා ආගමික මතභේද ඇති කරන්නෙක් ලෙස ක්‍රියා කරන බවයි. එයට එතුමා දුන් පිළිතුර නම් ''බෞද්ධයන් විසින් කවර කරුණක් සම්බන්ධයෙන් හෝ තම අයිතිවාසිකම් ඉල්ලා සිටීමට උත්සාහ කරන කල්හි ඔවුන් දිවයිනේ ආගමික මතභේද මතු කිරීමට උත්සාහ දරන්නේ යැයි සෑම විටම ඔවුන් අවඥාවට ලක් කරන බව කීමට සිදු වීම කණගාටුවට කරුණකි. එහෙත් එම චෝදනාවට අප ලක් වුවද සාධාරණත්වය ඉටු කරන්නැයි ඉල්ලා සිටීමට අපට සිදු වන ඇතැම් කරුණු ඇත.''[17]

එතුමාට විරුද්ධව නැගුණු තවත් චෝදනාවක් නම් එතුමා කුණු රොඩු අවුස්සන්නෙකු බවයි. එයට ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. ''අධ්‍යාපන ඇමතිවරයා දෙබර වදයක් සොළවා ඇතැයි ප්‍රකාශයට පත් කොට ඇත. කෙනෙකුගේ යුතුකම ඉටු කිරීමේ දී එක් දෙබර වදයකට වඩා වුව ද සෙලවීමට සිදු විය හැකිය. මා ඒ නිලය දරණ තාක් කල් දෙබර වදයක් හෝ වද දහයක් සෙලවීමට සිදුවුවත් මාගේ යුතුකම මා විසින් ඉටු කරනු ඇත.''[18] යනුවෙනි.

මෙසේ සංස්කෘතිය සහ ආගම් පිළිබඳව කථා කිරීම හේතුවෙන් එතුමා ආගම් පිස්සෙකු ලෙස ඇතැමුන් විසින් හඳුන්වන ලදි. එහි දී එතුමන් ප්‍රකාශ කර සිටියේ තමා ආගම් පිස්සෙකු හෝ ක්‍රිස්තියානි විරුද්ධවාදියෙකු ද නොවන බවයි. එමෙන්ම එතුමා තම ධුරය තුළ වැඩ කිරීමේ දී ආගම් පිළිබඳ අන්තවාදී නොවී අපක්ෂපාතීව කටයුතු කර ඇත. පාසල බෞද්ධ ද ක්‍රිස්තියානිද යනාදී වශයෙන් විමර්ශනය නොකළේය. සියලුම දරුවන් අධ්‍යාපන අයිතියට උරුමකරුවන් සේ සළකා අවශ්‍ය විධි විධානයන් ගන්නා ලදි.

පූර්වෝක්ත පරිදි ආනයනය කරන ලද අධ්‍යාපන ක්‍රම මගින් අධිරාජ්‍යවාදයේ සංස්කෘතිය මෙරට තුළ ව්‍යාප්ත වන විට එතුමා එය මාරාන්තික සුව කළ නොහැකි තත්වයක් ලෙස පෙන්වා දුන්නේය. මෙම මර උගුලෙන් බේරීමට ඇති එකම ක්‍රමය නම් පුනර් අධ්‍යාපන ක්‍රමයක්විය. පුනරුදයක් සඳහා එකම සාර්ථක ප්‍රහාරය ලෙස මතුමා සැලකුවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමයි. ඒ බව එතුමාගේ පහත ප්‍රකාශයෙන් මොනවට විවරණය වේ. **''අපි ජාතික අධ්‍යාපන ක්‍රමයක්, ජාතියේ**

---

[16]ආසියාතු සංස්කෘතියෙහි ලංකාව, 1947 වර්ෂයේ දී නවදිල්ලියෙහි පැවති ආසියාතු සම්බන්ධතා සම්මේලනයේ දී කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව

[17]හැන්සාඩ් 1945, 2881 තීරුව

[18]හැන්සාඩ්, 1933, පිටුව 1673

**ඉරණම ඉෂ්ට ප්‍රාප්ත කරගැනීම අරමුණු කරගත් ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම ආරම්භ කරමු. මෙරටෙහි ජාතියක් ඉදි කරන්නේ නැද්ද? අප සැමදා වහලුන් ලෙස වෙසෙන්නේද? අප කිසියම් නිදහසක් ලබා ගන්නේ නැද්ද? අප ඒ සඳහා ඉලක්කක කරන්නේ නම් අපේ පාසල් ආරම්භ කරමු. අපේ ජනතාවට අධ්‍යාපනයක් ලබා දෙමු. එය ජාතික අධ්‍යාපනයක් වන්නට නම් ආත්මයෙන් එය නියත වශයෙන් ආගමික විය යුතු අතර ස්වරූපයෙන් ජාති හිතෛෂී විය යුතුය. එය ජාතික අධ්‍යාපනයක් වන්නට නම් එහි අනුප්‍රාණය මෑත ඉතිහාසයෙන් නොව ඈත අතීතයෙන් ලබා ගත යුතුය. එය ජාතික අධ්‍යාපනයක් වන්නේ නම් සාධාරණත්වය, සමාණත්වය හා අන්‍යෝන්‍ය සේවය පිළිබඳ මූලධර්ම පදනම් කර ගත යුතුය. එය ජාතික අධ්‍යාපන ක්‍රමයක් වන්නට නම් එය ජාතික පාලනය යටතේ පැවතිය යුතුය. එය ජාතික අධ්‍යාපනයක් වන්නට නම් එමගින් ජාතියේ සියලුම සේවයක් සැලසිය යුතු වන අතර එය ඔවුන්ගේ කායික, සදාචාරාත්මක හා බුද්ධිමය අභිවෘද්ධිය ඉලක්ක කොට පැවතිය යුතුය.''**[19]යනුවෙනි.

එතුමාගේ චින්තනයට අනුව අපගේ අධ්‍යාපනය ගොඩනැංවීමෙහිලා වෙනත් ජාතීන්ගේ ක්‍රමවේදයන් සහ දැනුම් ලබා ගතයුතු නමුත් ඔවුන්ගේ සංස්කෘතිය ණයට නොගත යුතුය. ''අපගේ සංස්කෘතිය සැමවිට ම රිසි සේ වෙනත් ප්‍රභවයන්ගෙන් යම් යම් දේ ලබා ගත යුතු හා අවශෝෂණය කළ යුතු මුත් එහි ස්වලක්ෂණයන් විනාශ නොවී පවත්වා ගත යුතුය. කෙතරම් උසස් වූද අනුන්ගේ හුදු අණුකරණය කිරීම නියත වශයෙන්ම පුද්ගලයන්ගේ හෝ ජාතීන්ගේ විනාශයට හේතු වන්නා සේම සංස්කෘතීන්ගේ ද විනාශයට හේතුවේ.''[20] යනුවෙනි. මේ අනුව තම ඓතිහාසික මූලයන් රැක ගැනීමට අධ්‍යාපනය ඉවහල් කර ගත යුතු බව මෙතුමාගේ අදහස විය. එමෙන්ම එතුමා නිරන්තරයෙන්ම ජනතාවගේ ගුණාත්මක භාවය අගය කළේය. එතුළින් ශිෂ්ටාචාරයක් ශ්‍රේෂ්ඨත්වයට පත් වන බව පෙන්වා දෙන්නට යෙදුණි. මේ අනුව මෙතුමා විසින් යෝජනා කරන ලද ජාතික අධ්‍යාපනය කොටස් තුනකින් යුතු විය.

01. සමාජය නූතන බවට පත් කරන නමුත් බටහිර සංස්කෘතියට නතු නොකරන සංරසංග්‍රාහක සංස්කෘතියක් වර්ධනය කිරීම.

02. සියලු දෙනාටම සමාන අවස්ථා සහිත වූ විශ්ව සාධාරණ ලෙසින් අධ්‍යාපනයක් ලත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක් පිහිටුවාදීම.

03. අර්ථ ක්‍රමයේ සහ විපුල මානව සම්පත්වල ප්‍රශස්ත වර්ධනයට ඉඩ සැලසෙන පරිදි ද්විතීයික අධ්‍යාපනය විවිධාංග කිරීම.[21]

යනුවෙනි. මේ අනුව සෑම රාජ්‍යයකම සෑම ළමයෙකුටම මවු බසින් අධ්‍යාපනය ලබා දීම රජයේ යුතුකම බව මෙතුමා පෙන්වා දුන්නේය. ''දිවයිනේ ජනයාට වැඩි වශයෙන් ස්වභාෂාවෙන් අධ්‍යාපනයක් දීම කෙරෙහිත් ඉහළ මට්ටම දක්වා වූ අධ්‍යාපනය ස්වභාෂාවෙන් ලබා දීම කෙරෙහිත් මා සහ මගේ විධායක කාරක සභාව හැකි සෑම උත්සාහයක්ම දරණු ලැබේ.[22] මෙය සමස්ත ලෝකය පුරාම පිළිගැනී ඇති කරුණකි. ළමයෙකු කථා කරන භාෂාව තුළින් ඉගෙනීමෙන් ඔහුගේ බුද්ධිය වර්ධනය වේ. කන්නන්තර මහතාගේ මෙකල සටන් පාඨය වූයේ භාෂාවක් නැත්නම් ජාතියක් නැත යන්නයි. මේ අනුව මෙතුමා මවු භාෂාවෙන් ඉගැන්වීමේ වැදගත්කම නොයෙක් ආකාරයෙන් පෙන්වා දෙන්නට යෙදුණි. එමෙන්ම පාසල් තුළ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැදගත් කම ද එතුමා පෙන්වා දුන්නේය. ''දැන් ඉංග්‍රීසි බොහෝ දුරට ලෝක භාෂාවක් බවට පත්වී ඇත. පිටරටවල සිට මෙහි ගෙනෙන සිය දහස් ගණන් පොත් සියල්ලම ඉංග්‍රීසි පොත්ය. රට තුළම ස්වභාෂාවෙන් පොත් විශාල ප්‍රමාණයක් පළ කළහොත් මිසක ඉංග්‍රීසි බැහැර කිරීම යුක්ති සහගත නොවේ.[23] යනුවෙනි.

---

[19]හැන්සාඩ්, 1944, පිටුව 946

[20]සිංහලයන්ගේ කාර්ය සාධනය, 1947 දී කල්කටාවේ පැවති ආසියාතික කලා හා සංස්කෘතික සම්මේලනයෙහි දී සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් පවත්වන ලද මූලාසනයේ කථාව

[21]සුමතිපාල, කේ.එච්.එම්. (1993), *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය,* පිටුව 179

[22]හැන්සාඩ්, 1931, පිටුව 824

[23]හැන්සාඩ්, 1944, පිටුව 936

ආගම ඉගැන්වීම සම්බන්ධයෙන් ගත් කළ එතුමාගේ මුල් කාලීන අදහස වූයේ කිසිදු නිකායකට අයත් ආගමක් පාසල් වේලාව තුළ නොඉගැන්විය යුතු බවයි. නමුත් පසුකලෙක විධායක කමිටුවට එකග වී ඒ ඒ ආගම්වලට අයත් දරුවන්ට ඒ ඒ ආගම ඉගැන්වීමට යෝජනා කළ බව දක්නට ලැබේ. ''බෞද්ධ ළමයෙකු සිටී නම් ඔහුට බෞද්ධාගම ඉගැන්විය යුතුය. කතෝලික ළමයෙකු සිටී නම් ඔහුට කතෝලික ආගම ඉගැන්විය යුතුය. මුස්ලිම් ළමයෙකු හෝ හින්දු ළමයෙකු සිටී නම් ඒ ඒ ආගම් ඉගැන්විය යුතුය. අපි කවරෙකු කෙරෙහිවත් පක්ෂවාදී නොවන අතර එසේ කළ හැකි එකම ස්ථානය රජයේ පාසලය. එහි කාටත් එක හා සමානව සලකනු ලැබේ.''[24] යනුවෙනි.

**අධ්‍යාපනය සහ රජය**

කන්නන්ගර චින්තනයෙහි පැනෙන දෙවන අරමුණ වන්නේ සියල්ලන්ට සමාන අවස්ථා සහිත විශ්ව සාධාරණ ලෙසින් අධ්‍යාපනයක් ලත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක් පිහිටුවීමයි. මෙතුමාගේ මුල්කාලයේ පටන් පැවති අදහස වූයේ ඒකාබද්ධ රාජ්‍ය පාසල් ක්‍රමයක් ඇති කිරීමයි. 1927 දී ලංකාවට පැමිණි කිල්පැට්‍රික් මහතාගේ අදහස් මේ සඳහා බලපා ඇති බව එතුමා ප්‍රකාශ කොට ඇත. මෙම මහාචාර්යවරයා කළ ප්‍රකාශය පිළිබඳව කන්නන්ගර මහතා පහත පරිදි වාර්තා කොට ඇත. ''මෙරටෙහි ජනතාව නිත්‍ය කාණ්ඩ වශයෙන් බෙදී පැවතීමේ ප්‍රවණතාවක් ඇති බව මට පෙනී යයි. එසේම එක් එක් කණ්ඩායම සදාචාර වශයෙන් සැක සහිත හා සදාචාර වශයෙන් එදිරිවාදීව පැවතීමේ උපද්‍රවය ද සහිත වෙයි. ඉන්දියාවෙහි හින්දු භක්තිකයනට හා මුස්ලිම් භක්තිකයන්ට එකට ජීවත් වීමට අතිශය දුෂ්කර බව සර්වප්‍රකාරයෙන් පැහැදිලිය. ලංකාවෙහි ද ඇතැම් දුෂ්කරතාවයන් ඇත. මෙබඳු දෙයක් සිදුවීමේ මහා උවදුරක් ඇතැයි මට සිතේ. එනම් හින්දූන් තමන්ගේ පාසල්වල තමන්ගේ ආගමේ පැවැත්ම පිළිබඳව උනන්දු වනු ඇත. බෞද්ධ හා ක්‍රිස්තියානි ආගම් ද එසේය.'' යනාදී වශයෙන් එතුමා පැහැදිළි කරන්නේ මෙසේ ජාතීන් හෝ ආගම් අනුව පාසල් භේද වීම තුළින් රටේ දේශපාලනයට එය ප්‍රබල බලපෑමක් වන ඇති බවයි. රජය විසින් විශේෂයෙන් සළකන යම් ආගමක් වේනම් අනෙක් ආගමිකයින් රජයට චෝදනා කරනු ඇත. ඔවුන් එකිනෙකා කෙරෙහි සැක පහළ කරගනු ලබන අතර එදිරිවාදී කම් ද ඒ හේතුවෙන් වර්ධනය වේ. එය එසේ වුවහොත් ලංකාවේ අනාගතය ඉතාමත් භයානක විය හැකි බව එතුමන් පෙන්වා දී ඇත.

තමන්ගේ දරුවා තමන්ගේ වර්ගයේ දරුවන් සිටින පාසලකට පමණක් ඇතුළත් විය යුතුය යන පදනමේ සිට ක්‍රියා කිරීම තුළින් මෙබඳු ගැටුම්කාරී තත්වයන් උද්ගත වේ. එසේ සිතීම තුළින් සිදු වන්නේ එකිනෙකාට සහයෝගයක් නොදක්වන ළමුන් පිරිසක් බිහි වීමයි. ඒ අනුව රටේ අධ්‍යාපනය සකස් විය යුත්තේ එකට මුසු කිරීමේ න්‍යාය මත පදනම්ව බව කන්නන්ගර මහතාගේ අදහසයි. මේ වන විට විවිධ ආගම් මාර්ගයෙන් පවත්වාගෙන යනු ලබන පාසල් විශාල ප්‍රමාණයක් ලංකාවේ පැවතුණි. මෙතුමාගේ අදහස වූයේ එම සියලුම පාසල් රජයට පවරාගත යුතු බවයි.

මෙම අදහස මෙතුමාට ඇති වීමට හේතුව නම් අකුරු ලියන්නට කියන්නට හැකියාව සහ සමාන අවස්ථා සළසන ඒකාබද්ධ පාලන ක්‍රමයක් ද්විත්ව පාලනය යටතේ නොපැවතිය හැකිය යන ඔහුගේ මතයයි. පහත දැක්වෙන අඩුපාඩු එකල පැවති ආගමික අධ්‍යාපන ක්‍රමය තුළින් ඔහු හඳුනාගත්තේය.

01. කුඩා වූත් අවශ්‍ය වූත් පහසුකම් අඩු පාසල් බිහිවීම.

02. ශිෂ්‍යයින්ගේ ආගම අනුව වෙන්ව සිටීම

03. තරගකාරීත්වය හා විශේෂණය

04. පාසල් පාලකයින් පරිත්‍යාගශීලී හෝ සේවයක් පිළිබඳ හැඟීමකින් දිරිගන්වන ලද අය නොවීම.

05. අධ්‍යාපන වියදම් දැරූ අයට ඒ පිලිබඳ පාලනයක් නොතිබීම

06. උසස් ආගමික නිළ දැරූ අය ඉතා බල සම්පන්න මුල් බැසගත් වරප්‍රසාද සහිත අය බවට පත්ව සිටීම

[24]හැන්සාඩ්, 1945, තීරුව 2890

07. ගුරුවරුන්ගේ තත්වය ඉතා පහත් මට්ටමක පැවතීම.

08. ආයෝජනයේ ඵල ආයෝජනයට සමානුපාතික නොවීම

යනුවෙන් එම තත්වය සාරාංශ වශයෙන් දැක්විය හැකිය. රජයේ වගකීමක් වූ අධ්‍යාපනය වෙනත් පෞද්ගලික අංශයකට පැවරීමට නොහැකිය. මෙම හේතු නිසා මෙතුමා ඒකාබද්ධ පාසල් ක්‍රමයක අවශ්‍යතාව පෙන්වා දුන්නේය. එසේම මෙම පාසල් බහුල බව එතුමන් විසින් ඉදිරියේ දී යෝජනා කිරීමට බලාපොරොත්තු වන මධ්‍යම පාසල් ක්‍රමය ඇති කිරීමේදී ගැටලුකාරීස්වභාවයන් ඇති කිරීමට ඉඩ ඇති බව ද එතුමා පෙන්වා දුන්නේය. ආගමික වශයෙන් වෙන වෙනම පාසල් පැවතීම හේතුවෙන් රාජ්‍යයට සිදුවන ගැටලු එතුමා පුන පුනා ප්‍රකාශ කළේය. ආගමික මත පදනම් කරගෙන ළදරු පාසල් ද ප්‍රාථමික පාසල් ද පශ්චාත් ප්‍රාථමික පාසල් ද යනුවෙන් එකිනෙකින් වෙන් වූ ආයතන පවත්වා ගෙන යා නම් අපගේ ජාතියට කුමක් වන්නේ ද? මෙම පාසල්වලින් පිටවන අයට ගුරුවරුන් වීමට අවශ්‍ය වන්නේ නම් ඉක්බිතිව ඔවුන් පුහුණු කරනු ලබන්නේ ද ඔවුන්ගේ ම ආගමික වූ පාසල් තුළය. එහි ප්‍රතිඵලය වන්නේ ළමුන් පුහුණු කිරීමේ කාර්යභාර්ය ගන්නා අයට ගුරු වෘත්තියට සම්බන්ධ වෙනත් අය ආශ්‍රය කිරීමට හැකියාව නොමැති වීමයි. රජයේ පුහුණු පාසල් වලට විරුද්ධ අයට අවශ්‍යව තිබෙන්නේ ජාතිය එකිනෙකා සමග සම්බන්ධතාවක් නැති අය වශයෙන් තබා ගැනීමයි.''[25] යනුවෙන් එතුමා මේ පිළිබඳව අදහස් දක්වා ඇත.

එමෙන්ම රජය විසින් මුදල් ගෙවනු ලබන විට වෙනත් පෞද්ගලික කළමණාකරුවන් විසින් පාසල් පාලනය කිරීමට ද මෙතුමා විරුද්ධ විය. කළමණාකරණය වෘත්තියක් බවට පත්කරගත් බොහෝ ගිහියන් මෙන්ම පූජකයෝ ද සිටිති. ඔවුන් පාසල තම භුක්තියක් වශයෙන් සලකමින් ක්‍රියා කරනු දැකගත හැකිය. මෙම පාසල් තුළ සිටින කළමණාකරුවන් පාසල කේන්ද්‍ර කර ගනිමින් ලාභ ඉපයීම සිදු කරන බව එතුමා පෙන්වා දුන්නේය. මෙබඳු පාසල් කළමණාකරුවන් ලෙස සිටි බොහෝ ක්‍රිස්තියානි පූජකයෝ රජයෙන් ගෙවන විශාල වැටුප ලබා ගනිමින් පාසල තුළ ඒකාධිකාරයක් ගොඩනැගූහ. එසේම රටේ දේශපාලනයට ද එය බාධාවක් විය. කන්නන්ගර මහතා පෙන්වා දුන්නේ ආගමික පූජකයන් විසින් මෙරට පාලනය කරනු ලබන බවයි. පාසල් විසින් ඔවුන් නඩත්තු කරන අතර රජය විසින් බිල ගෙවයි. ආගමික පූජකයන්ට ඉතා විශාල වැටුප් ගෙවන අතර ඔවුන් විසින් එම තනතුරු ගිහියන්ට දෙනු නොලැබේ. යනුවෙන් එතුමා පෙන්වා දී ඇත. එමෙන්ම රට තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යම් කිසි ප්‍රගතිගාමීතීරණය ගැනීමට සූදානම් වන සෑම අවස්ථාවකම එම පූජකයන් එය කඩා කප්පල් කර දැමීමට පෙළඹේ. එසේම මෙම ආගමික පාසල් ක්‍රමය යටතේ ගුරුවරයාට දැඩි පීඩාවන්ට පත් වීමට සිදු වෙයි. ඇතැම් කළමණාකරුවන් ගුරවරයාට වැඩකරුවෙකු මෙන් සළකයි. මෙනිසා මෙතුමා පෙන්වා දෙන්නේ කළමණාකරුවන් විෂයෙහි කිසියම් සීමා පැනවීමක් තිබිය යුතු බවයි.

මේ අනුව පොදු අධ්‍යාපන ක්‍රමයක් පිළිබඳව කරුණු දැක්වූ මෙතුමා එය රාජ්‍ය හා සම්බන්ධ රජය විසින් පාලනය කරනු ලබන්නක් විය යුතු බව පෙන්වා දුන්නේය. එමෙන්ම සර්වජන ඡන්දයකට උපප්‍රමේයක් වශයෙන් සියලු ජනයාට ලියන්නට කියවන්නට හැකියාවක් ලබා දීම, ජාතිය, ආගම, කුලය ආදී භේදයකින්තොරව සෑම දෙනාගේම සමානත්වය, ප්‍රජාපාසල්, ලාංකික කිරීම වැනි කරුණු කෙරෙහිද අවධානය යොමු කර ඇති බව පෙනී යයි.

**අධ්‍යාපනය සහ අර්ථ ක්‍රමය**

රටෙහි ආර්ථිකයට හා සමෘද්ධිමත් භාවයට අධ්‍යාපනය ඉවහල් වනආකාරය මෙතුමා අවධාරණය කළේය. ''යම් රටක නියම අධ්‍යාපනයක් නොමැති නම් එම රටෙහි නියම සමෘද්ධියක් නොමැත.'' යනුවෙන් පෙන්වා දී ඇත. පුද්ගලයකුට අධ්‍යාපනය තුළින් තම කාර්යන් සාර්ථකව කරගැනීමට හැකියාව ලැබෙන බව මෙතුමා පෙන්වා දුන්නේය. රටෙහි ආර්ථිකය ශක්තිමත් කිරීමට නම් පළමුව අධ්‍යාපනය සංවර්ථනය කළ යුතු විය. අ්‍යාපනික සංවර්ධනයෙන් තොරව දියුණු වූ කිසිදු ජාතියක් නොමැති බව මෙතුමා පෙන්වා දෙන්නට විය. නූගත් සමාජයක් චාරිත්‍රවාරිත්‍ර හා සම්ප්‍රදායන්ට ද ඒවා මගින් අතීත නිෂ්පාදන ක්‍රියා මාර්ග වලට ද ශිල්ප ක්‍රම වලට ද ඇලී ගැලී පවතී. නව දැනුම හා කුසලතා ලබා ගැනීම දිරිගන්වන්නා වූ වෙනස් වීම් වලට එම සමාජය පහසුවෙන් ප්‍රතිචාර

[25]හැන්සාඩ්, 1944, පිටුව 930

නොදක්වයි. අධ්‍යාපන වැඩපිළිවෙළ මගින් සංවර්ධනයට ඇති බාධාවන් බිඳ දමනු ලබයි. යනුවෙන් පෙන්වා දී ඇති පරිදි ආර්ථිකය කෙරෙහි ඍජුවම බලපාන සාධකයක් ලෙස අධ්‍යාපනය පෙන්වා දිය හැකිය.

මෙම චින්තනකය තුළ සිට ක්‍රියාත්මක වූ කන්නන්ගර මහතාට රටෙහි අධ්‍යාපනය වෙනුවෙන් රජයෙන් ලැබුණු මූල්‍ය අනුග්‍රහය අල්ප විය. විදුලි ව්‍යාපාර, දුම්රිය, මහාමාර්ග වැනි දෑ රටෙහි ආර්ථිකයට සම්බන්ධ හෙයින් ඒවා සංවර්ධනය කිරීමට රජය කැමති නමුත් ගම්බද ප්‍රදේශයන්හි අධ්‍යාපනය නගා සිටුවීමට මුදල් වෙන් කිරීමට අකමැති විය. එකල මුදල් ඇමතිවරයාගේ අදහස වූයේ කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන නිසා ණය අරමුදල් වලින් පාසල් ඉදි නොකළයුතු බවයි. එසේම එතුළින් ඇති වන්නේ ප්‍රතිවිරුද්ධ ප්‍රතිලාභ බවද ඔහු පෙන්වා දී ඇත. එනම් ඔවුන් ඉගෙනීමක් ලද කල වඩා හොඳ අධ්‍යාපනයක් හා වැඩිපුර අධ්‍යාපනයක් සඳහා උද්ඝෝෂණ කරනු ඇත. එවිට වියදම් අංශය බොහෝසෙයින්ම වැඩි වනු ඇත. එබැවින් කළයුතු හොඳම පිළියම පාසල් ඉදිකිරීම සඳහා ණය අරමුදල් නොගැනීමයි. යනුවෙනි.

නමුත් මෙම අදහසට තරයේ විරුද්ධ වූ කන්නන්ගර මහතා පෙන්වා දුන්නේ අධ්‍යාපනය යනු ඉස්තරම්ම ආයෝජනයක් බවයි. **''හැකි සෑම අවස්ථාවකම දුප්පත්කම තුරන් කළ යුතුය. තම පැරණි යල් පිණු අදහස් අත්තහරින මෙන් මම ඉතා ගෞරවයෙන් මුදල් ඇමති තුමාගෙන් ඉල්ලා සිටිමි. අපේ මුදල් අපි හොඳම ආයෝජනය සඳහා යොදවමු. ..... අධ්‍යාපනය සඳහා වැය කරන ඕනෑම මුදල් ප්‍රමාණයකින් ඉතා විශාල ප්‍රතිලාභ ලැබෙනු ඇත. මුල් අවස්ථාවෙහි දරණ පාඩුව එමගින් නිසැකවම පිරිමසාලනු ඇත.''**[26] යනුවෙනි.

මෙතුමා පෙන්වා දුන්නේ ගම්බද ළමයින් වයස 14න් පාසල හැර යන අතර ඉන් ඉදිරියට ස්වභාෂා පාසලෙන් අධ්‍යාපනය ලබන්නේ නම් ඔහුට යා හැකි උපරිම ස්ථානය වූයේ ගුරුවරයෙක් වීම දක්වා පමණක් බවයි. එහෙත් සියලුම දෙමවුපියන් සහ දරුවන් ආර්ථික වශයෙන් උසස් තත්වයක් අපේක්ෂා කරයි. එම දරුවන්ට රජයේ රැකියාවලට හෝ සිවිල් සේවයේ ඉංජිනේරු, දොස්තර, නීතිඥ වැනි තනතුරු වලට පත්වීමේ භාග්‍ය අහිමි විය. ගම්බද මිනිසුන්ට මේ පිළිබඳ කිසිදු බලාපොරොත්තුවක් නොතිබුණි. කන්නන්ගර මහතා ප්‍රශ්න කරනුයේ එවන් බලාපොරොත්තුවක් රහිත කවර නම් පුද්ගලයෙක් වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමුවේද යනුවෙනි. මෙම හේතුව නිසා නිදහස් අධ්‍යාපනයේ වටිනාකම මෙතුමා අවධාරණය කළේය.

එතුමා පෙන්වා දෙන්නේ සියලු දෙනාට නොමිලයේ එකහා සමානව ඉගෙනීමට අවස්ථාව ලබා දෙන්නේ නම් මෙම තත්වයන් වැළකී යන බවයි. ඔහු දරුවන්ට ලබා දිය යුතු අධ්‍යාපනය පිළිබඳව මෙසේ කරුණු ඉදිරිපත් කළේය. **''අප විසින් අදහස් කර ගෙන සිටිය ක්‍රමය දළ වශයෙන් මෙසේය. වයසින් අවුරුදු 12 පමණ වන තෙක් සෑම දෙනාටම සාමාන්‍ය ශාස්ත්‍රීය විෂයන්හි ප්‍රමාණවත් පුහුණුවක් දෙනු ලබන අතර ඉන් පසුව ශිෂ්‍යයින් තම විශේෂ හැකියාවන් අනුව වෙනත් විෂය ධාරාවන් වෙතට බෙදී යනු ඇත. එහි දී ශාස්ත්‍රීය නොතකා හරින මුත් වෘත්තීය අංශය අවධාරණයට ලක් වේ.''**[27]යනුවෙනි. මෙතුමාගේ අදහස වූයේ මෙම සියලුම විෂය ධාරාවන් එකම මධ්‍යම පාසලකින් ලබා දීමය.

මෙසේ දරුවන් ශ්‍රේණි කිරීම් හා වර්ග කිරීම් වලට ලක් කිරීමට හේතුව මේ වන විට පවතින වැරදි අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් තමන්ට නුසුදුසු ක්ෂේත්‍රයන්හි දරුවන් අධ්‍යාපනය ලැබීමට යොමුවීමයි. චිත්‍ර ශිල්පය ඉගෙනීමට අවශ්‍ය දරුවාට ඒ සඳහා අවකාශ පැවතිය යුතුය. එසේම දරුවා මෙසේ ශ්‍රේණි ගත කළ ද ඔහුට අවස්ථා කිහිපයක් තුළ තමන්ගේ ක්ෂේත්‍රය මාරු කිරීමේ හැකියාව ද පැවතිය යුතු බව එතුමා පිළිගත්තේය. කන්නන්ගර මහතා පෙන්වා දුන්නේ ළමුන් තුළ පවත්නා අභියෝග්‍යතාවන් හා හැකියාවන් අනුව දරුවන්ට වෘත්තීය අධ්‍යාපනයක් දිය යුතු බවයි. **''පවත්නා තත්වයට අනුව හැකිතාක් දුරට අධ්‍යාපනය කෘෂිකාර්මික හා කාර්මික පදනමක් ඇති කිරීමට අපි හැම වෙහෙසක්ම දරමු.''**[28]යනුවෙනි. එමෙන්ම ගම තුළ හැදී වැඩුණු දරුවා ගමෙහිම රැදී සිටිමින් සේවය කිරීම අවමානයක් සේ නොසළකන තත්වයක් ඇති කළ යුතු බවද එතුමා

[26]හැන්සාඩ්, 1944, පිටුව 838-60

[27]හැන්සාඩ්, 1940, පිටුව 2736

[28]හැන්සාඩ්, 1931, පිටුව 825

පෙන්වා දුන්නේය. එතුමාගේ අරමුණ වූයේ දරුවන් සියලු අංශයන්ගෙන් ශක්තිමත් කිරීමයි. **''අපගේ ප්‍රධාන අරමුණ වනුයේ පාසල් ගොඩනැගිල්ල ඇතුළත කටයුතු සඳහා පැය දෙකක් සහ එළිමහනේ කටයුතු සඳහා පැය තුනක් වත් වැය කිරීමයි. අප අදහස් කරනුයේ බුද්ධිමය වර්ධනයත් සමගම ඊටත් වඩා සෞඛ්‍යය හා කායික සංවර්ධනයත් සෞන්දර්ය හා සමාජ වර්ධනයත්ය.''** යනුවෙන් එතුමා පෙන්වා දී ඇති පරිදි පරිපූර්ණ අධ්‍යාපනයක් තුළින් දරුවන් රටේ ආර්ථිකයට දායක කරගත හැකිය.

එමෙන්ම අධ්‍යාපනය තුළින් නැගෙන අනෙක් ගැටලුව නම් ඔවනුන්ට රැකියාවන් සඳහා කුමක් ලැබේද යන්නයි. එයට ද විසඳුමක් කන්නන්ගර චින්තනයෙහි අන්තර්ගත වෙයි. එනම් පාසල් වැඩි ගණනක බිම අස්වැද්දීම, එළවළු වැවීම, එළවලු කොටුවක් රැක බලා ගැනීම, මේසන් වැඩ හා වඩු වැඩ වැනි විවිධ වෘත්තීන්ට අයත් ඥාන සම්භාරයන් දරුවන්ට පාසල තුළ දී ලබා දෙනු ලැබේ. එසේම විශේෂ වශයෙන් නූල් කැටීම සහ රෙදී විවීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට එතුමා නැඹුරු වූ බව ද පෙනී යයි.

මෙම ක්‍රමවේදය තුළින් පැවති ලිවීම, කියවීම හා අංක ගණිතය යන R තුනේ සංකල්පය වෙනුවට ඉන් ඔබ්බට ගිය H හතරේ සංකල්පය වර්ධනය කිරීමට මෙතුමා අපේක්ෂා කළේය. අධ්‍යාපනය මගින් දරුවාගේ සෞඛ්‍ය, හිස, හදවත, සහ අත යන සියල්ල කෙරෙහි අවධානය යොමු විය. මානසික මෙන්ම කායික සංවර්ධනය ද අපේක්ෂා කළේය. ග්‍රාමීය අධ්‍යාපනයට මෙම සංකල්පයන් මුසු කිරීම තුළින් අති දැවැන්ත ආර්ථික සංවර්ධනයකට රට පත්වන බව එතුමා විශ්වාස කළේය. ගම කේන්ද්‍ර කරගනිමින් මධ්‍ය විද්‍යාල හරහා මෙම අධ්‍යාපනය ගමේ තරුණයන්ට ලබා දෙන විට ඔවුන් රැකියා සොයා නගරයට සංක්‍රමණය වීම නවතිනු ඇත. ගුරුවරයෙකු හෝ වෙනත් රැකියාවක් වෙනුවෙන් බලා සිටිනු වෙනුවට තම දෑත වෙහෙසා උපයා ගැනීමේ හැකියාව මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම තුළින් දරුවන්ට හුරුවන බව එතුමා පෙන්වා දුන්නේය.

එසේම මෙතුමා ආහාර නිෂ්පාදනය පිළිබඳව ද කරුණු ඉදිරිපත් කොට ඇත. ලංකාවේ අර්ථිකය අහාර අතින් රට ස්වයං පෝෂණය වීමත් සමග ආරම්භ විය යුතු බව මෙතුමා පෙන්වා දුන්නේය. පිට රටින් ආනයන භෝග පරිභෝජනය කරන තාක් කල් ලංකාව තුළ කාර්මික ව්‍යාප්තියක් ඇති නොවේ. මෙතුමා විශ්වාස කළේ ගැමියන්ගේ ප්‍රතිඅධ්‍යාපනය මගින් ස්වංපෝෂිත ආර්ථිකයක් නිර්මාණය කළ හැකි බවයි. ගොවිතැන පිළිබඳ විද්‍යාත්මක දැනුම සහ කය වෙහෙසා වැඩ කිරීම පිළිබඳ ගෞරවයක් ගම්බද මිනිසුන්ට කාවැද්දිය යුතුය. ගොවිතැන ද අධ්‍යාපනයේම එක් කොටසක් බවට පත් කළ යුතු බව එතුමාගේ අදහස විය.

උසස් අධ්‍යාපනය ද මෙම ක්‍රමයට සකස්විය යුතු බව මෙතුමා පෙන්වා දුන්නේය. එය බටහිර ක්‍රමයට අනුගතව මහ බරැති විභාග සමත් කිරීමක් නොවිය යුතුය. රටේ ආර්ථිකය නගා සිටු වීමට ඉන් පිටුබලයක් ලබා ගත හැකිවන අයුරින් පවතින උසස් අධ්‍යාපනය ද වෙනස් විය යුතුය. එකල විශ්වවිද්‍යාලවලින් පිට වන පුද්ගලයින්ගෙන් එබදු ඵලයක් අපේක්ෂා කළ නොහැකි විය. ''පුද්ගලයන්ට ආශ්‍රමයක මෙන් හුදෙකලාව අධ්‍යාපනය දීමේ ප්‍රීතිය කුමක්ද? පුද්ගලයන් ජීවිතයේ ප්‍රායෝගික අංශයෙන් වෙන්ව තබා ගැනීමේ ප්‍රීතිය කුමක්ද? යනුවෙන් ඔහු නිතර ප්‍රශ්න කළේය. අධ්‍යාපනය ප්‍රායෝගත්නයට නැඹුරුවිය යුතු බම එතුමාගේ අදහසයි.

මේ අනුව මෙතුමා මෙම චින්තනයට උචිත ආකාරයේ විශ්වවිද්‍යාලයක් නිර්මාණය කිරීම පිළිබඳව අදහසක් ඇති කර ගත්තේය. ඒ සඳහා බෞද්ධ පිරිවණක් සුදුසු බවත් ඒ අනුව කැලණියේ විද්‍යාලංකාර සහ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනත් යන පරිවේනස්ථාන දෙක ආශ්‍රය කරගනිමින් විශ්වවිද්‍යාල ඇති කිරීමට තීරණය කළේය. මේ වන විට පැවති ලංකා විශ්වවිද්‍යාලය විවෘතව පැවතියේ ඉංග්‍රීසි උගත් ධනවත් පැළැන්තියට පමණි. එහෙත් මෙම පිරිවෙන් විශ්වවිද්‍යාල ද්වය සිංහල භාෂාවෙන් දේශීය ක්‍රමයට අනුව දේශීය අවශ්‍යතාවන්ට උචිත වන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දෙන ස්ථානයක් ලෙස සකස්කරන්නට මෙතුමාට අවශ්‍ය විය.

**නිගමනය**

පූර්වෝක්ත පරිදි සී.ඩබ්.ඩබ. කන්නන්ගර විද්වතාණන් ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනික පුනරුදයක් ඇති කිරීම උදෙසා ඉදිරිපත් කරන ලද චින්තනය අංශ කිහිපයක් ආශ්‍රයෙන් විවරණය කරගත හැකිවිය.

එහි දී එතුමන් දාර්ශනිකව අධ්‍යාපනය නම් සංකල්පය පිළිබඳව හෙළා ඇති දෘෂ්ටිය අද්විතීයවේ. සැමට අධ්‍යාපයන ලබා දීම උදෙසා නිදහස් අධ්‍යාපනය ඇති කිරීමේ පටන් සුවිශාල කාර්යභාරයක් එතුමාගේ චින්තනය තුළින් සිදු විය. රජය, දරුවා, ගුරුවරයා සහ දෙමවුපියන් යන සියලු අංශයන් කෙරෙහි සාවධානය යොමු කරමින් ඒ සියලු දෙනාට උචිත වන අයුරින් අධ්‍යාපනය ගොඩනැගීම එතුමාගේ පරමාර්ථය විය. එමෙන්ම ස්වභාෂාවෙන් ඉගැන්වීමේ වැදගත්කමත් එතුළ පුද්ගල සංවර්ධනය සිදුවන ආකාරයත් දාර්ශනිකව මෙතුමා විසින් විවරණය කර ඇත. රටට ඔබින අධ්‍යාපන ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීම තුළින් රටේ ආර්ථිකය දේශපාලනය හා සංස්කෘතිය ස්ථාවර හා සංවර්ධනය කිරීමට මෙම කන්නන්ගර චින්තනය ඉවහල් වේ. අධ්‍යාපනයෙන් තොරව එකී කිසිදු අංශයක ප්‍රගතියක් අත් කර ගත නොහැකි බව මෙතුමාගේ අදහස විය. එමෙන්ම දරුවන්ට සකලාංග පූර්ණ අධ්‍යාපනයක් ලබාදීමේ යුක්තියුක්ත බව මෙතුමා අවධාරණය කළේය. රටෙහි පවතින ජාතිවාදී ප්‍රශ්න සමනය කරමින් ඒකාබද්ධ වූ ශ්‍රී ලාංකික ජාතියක් නිර්මාණය කිරීමට වර්තමානය තුළ වුවද එතුමාගේ චින්තනය ඉවහල් වන බව පෙන්වා දිය හැකිය. දැනුම පමණක් නොව එම දැනුමේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව ද මෙතුමා අවධාරණය කළේය. තවද ගුණ ධර්ම වලින් හෙබි දරු පිරිසක් රටට දායාද කිරීමට අධ්‍යාපනයට හැකි බව එතුමා පෙන්වා දුන්නේය. එමෙන්ම පුද්ගලයා තමන්ගේ ශක්තියෙන් උපයාගෙන ජීවත් වීමට තරම් වූ පෞර්ෂයකින් යුක්ත වූවෙක් බවට පත් කිරීමේ හැකියාව අධ්‍යාපනය සතුව පවත්නා බව එතුමා විශ්වාස කළේය. කායික හා මානසික සෞඛ්‍ය සංවර්ධනය කරමින් නිරෝගිමත් ජාතියක් රටට අවශ්‍ය බවත් එම අවශ්‍යතාව පිරිමසාලනු ලබන්නේ අධ්‍යාපනය තුළින් බවත් මෙතුමා පෙන්වා දුන්නේය.

ග්‍රාමීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමට මෙතුමා දැඩි උත්සාහයක් දැරීය. ඒ සඳහා එතුමාගේ චින්තනය උපනිශ්‍රය විය. එතුමා දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලු දරුවන් දරුවන් සේ සලකා අධ්‍යාපනය ලබා දිය යුතු බව පෙන්වා දුන්නේය. එතුමා කුඩා කළ දුප්පත්කම නිසා පීඩා වින්දේය. ඒ බව මෙසේ සටහන් කර ඇත. ''මම කටුක අත්දැකීමෙන් කථා කරමි. තරග විභාගයකින් පසුව රිච්මන්ඩ් විද්‍යාලයේ මූලික ශිෂ්‍යත්වධාරී ශිෂ්‍යයකු වශයෙන් මා තෝරා පත් කරගන්නා ලදි. මා මෙම ශිෂ්‍යත්වය දිනා ගත්තේ විභාගයේ පළමුවැනියා වීමෙනි. මගේ විදුහලේ පංති තුනකට අයත් නේවාසිකාගාර ශිෂ්‍යයෝ සිටියහ. ඉන් එකක අයකිරීම රුපියල් 25 ක් වූ අතර මෙම පංතිය ඉතා පොහොසත් අයගේ පුතුන්ගෙන් සමන්විත විය. ඉහළ පන්තියක් වශයෙන් ඔවුන් කෑම ගත්තේ ගුරුවරුන් සමගය. දෙවන පංතියෙහි අයකිරීම රුපියල් 15ක් විය. ගුරුවරුන් සමග කෑම ගත් අයට දෙවර්ගයකට අයත් කෑම කොටස් දෙකක් ලැබුනු අතර රුපියල් 15 ගෙවූ අයට ලැබුනේ එක් කොටසකි. මා ඇතුළත් කරන ලද්දේ පහළම පංතිය වූ රුපියල් 10 ක් ගෙවන අය අතරටය.

මා අනිකුත් ළමුන්ට වඩා හොඳ ආහාර හා වඩා හොඳ සැලකිලි ලැබෙනු දුටුවෙමි. එහෙත් අද දක්වා ම මෙම විදුහලෙහි නිදහස් අධ්‍යාපනයක් මට ලැබුනේය යන කරුණ සැමවිටම මට ඇනුම් පදයක් වශයෙන් කියනු ලැබේ. මට නියත වශයෙන්ම නිදහස් අධ්‍යාපනයක් ලැබුණි. එහෙත් මෙම අවනම්බුව මගේ ජීවිතය හා බැඳී පවතියි.

නිදහස් අධ්‍යාපනය පිළිබඳ එම චෝදනාව කිසිවෙකු විසින් මෙරට ළමයෙකු වෙත එල්ල කරනු දැකීමට මා අකමැතිය. සියලු ළමුන්ට එකට අධ්‍යාපනය ලැබීමටත් එකට ආහාර අනුභව කිරීමටත් සැළැස්විය යුතුය.''[29] යනුවෙනි. මෙම ප්‍රකාශය තුළින් පෙනී යන්නනේ එතුමාගේ චින්තනය සඳහා එතුමා විඳී අත්දැකීම් ද පාදක වී ඇති බවයි.

[29]හැන්සාඩ්, 1945, තීරුව 4675

**මූලාශ්‍රය**


- රුබේරු, රංජිත් (1971), ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය, ඇපොතිකරීස් සමාගම, කොළඹ.
- වන්නිආරච්චි, ජේ.පී. (2007), කන්නන්ගර චින්තනය සහ නිදහස් අධ්‍යාපනය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
- වීරතුංග, එන් (1973), ලංකාවේ අධ්‍යාපන මූලධර්ම හා ලංකාවේ අධ්‍යාපන ප්‍රගතිය, සීමා සහිත ඇම්.ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.
- සියවස ප්‍රකාශනය, (1994), ලංකාවේ අධ්‍යාපනය, අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යංශය, කොළඹ.
- සුමතිපාල, කේ.එච්.එම්. (1993), ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, දෙහිවල.
- හැන්සාඩ් වාර්තා
- සිංහලයන්ගේ කාර්ය සාධනය, 1947 දී කල්කටාවේ පැවති ආසියාතික කලා හා සංස්කෘතික සම්මේලනයෙහි දී සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් පවත්වන ලද මූලාසනයේ කථාව
- ආසියානු සංස්කෘතියෙහි ලංකාව, 1947 වර්ෂයේ දී නවදිල්ලියෙහි පැවති ආසියානු සම්බන්ධතා සම්මේලනයේ දී කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව
- Koeber, A.L (1963), Anthropology; Culture patterns and processes, Newyork.

# නිදහස් අධ්‍යාපනයෙන් ජීවය ලද මහව විජයබා මධ්‍ය මහා විද්‍යාලය

ඒ.එච්.එම්. ජනක අතපත්තු

## පිහිටීම

ශ්‍රී ලංකාව තුල නිදහස් අධ්‍යාපනය නිර්මාණය කිරීම මගින් උප්පත්තියක් ලද මධ්‍ය විද්‍යාලයක් වශයෙන් මහව ප්‍රදේශයේ පිහිටා ඇති විජයබා මධ්‍ය මහා විද්‍යාලය හැඳින්විය හැකි වේ. දිවයිනේ දුෂ්කර නියම් ගම් ප්‍රදේශයකට අයිති වන්නි හත්පත්තුව නම් පැරණි පරිපාලන ප්‍රදේශයේ නිර්මාණය වූ මෙම විදුහලෙන් නිදහස් අධ්‍යාපනයේ වරමින් ශ්‍රී ලංකාවට බිහිවූ බුද්ධිමතුන් සංඛ්‍යාව අතිමහත්ය. මෙලෙස අධ්‍යාපනික වරප්‍රසාදයක් සහිතව ඉතා විශේෂ වැදගත්කමක් සහිතව නිර්මාණය වූ  මෙම විදුහල පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රිකයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහව ග්‍රාම නිලධාරී වසමේ වේ. අනුරාධපුර සිට කුරුණෑගලට දිවයන මහා මාර්ගයේ දළදාගම මංසන්දියෙන් මොරගොල්ලාගම යා කෙරෙන අතුරු මාර්ගයේ කි.මී 3ක් පැමිණි විට විදුහල හමුවේ.

## පාසලේ ඉතිහාසය

කන්නගර මහතා අමරණීයත්වයට පත් කල කාරණයක් ලෙස මධ්‍ය මහා විද්‍යාල ක්‍රමය ආරම්භ කිරීම දැක්විය හැකි වේ.අධ්‍යාපනයට ප්‍රාදේශික හැඩයක් ගෙනදීම මින් එක් අරමුණකි. විධායක කමිටු නියෝගයක් අනුව , අධ්‍යාපන දෙපාර්තමේන්තුව 1936 වසරේදී පාසල් සැපයීම පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. එය පවත්වන ලද්දේ විවිධ ප්‍රදේශවලට ගැලපෙන ලෙසකට පිළියෙළ කල විෂය මාලා සහ අධ්‍යාපනික අවස්ථා සැපයීමේ පරමාර්ථයෙනි. ඒ සමගම මධ්‍ය මහා පාසැල් ක්‍රමයක් ඇති කිරීමේ යෝග්‍යතාව මන බැලීමද මින් සිදු කරන ලදී .

මධ්‍ය මහා විද්‍යාලයක පැවැත්වුයේ හයවන ශ්‍රේණියේ සිට දහතුන ශ්‍රේණි දක්වා පමණි. උපාධිධාරීන් හා පුහුණුවලත් ගුරුවරුන් පත් කර ඉහල මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම මධ්‍ය මහා විද්‍යාලවලින් බලාපොරොත්තු වුවකි. කලා, වාණිජ , විද්‍යා , කෘෂිකර්ම ,චිත්‍ර, සංගීත,වඩු වැඩ ,යකඩ වැඩ, මැටි වැඩ හා රෙදි විවීම යන විවිධ විෂයන්ගෙන් යුක්තවූ අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබා දීම මධ්‍ය විද්‍යාල වල වූ තවත් අරමුණකි.


මධ්‍ය මහා විද්‍යාලවල ප්‍රධාන ලක්ෂණයක් වුයේ එක් ඡන්ද කොට්ටාසයක අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට ක්‍රියාත්මක වීමයි. මේ නිසා සිදුවූ තවත් වාසියක් නම් ප්‍රදේශයේ අනෙක් පාසල්වලින් ශිෂ්‍යයින් තෝරා මැදි විදුහල්වලට යැවීමේ හැකියාවයි. එම නිසා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය අනුව සංවිධානය වී තිබූ ඡන්ද කොට්ටාස 50ක් තුල එක බැගින් මධ්‍ය විද්‍යාල 50ක් ගොඩනැගීම එවකට රජයේ තිබූ අදහස විය. මේ සංකල්පය අනුව යාපහුව ආසනය තුල මහව විජයබා මධ්‍ය විද්‍යාලය නිර්මාණය විය.

මහව විජයබා මධ්‍ය විද්‍යාලය ආරම්භ වන්නේ ක්‍රි.ව 1946 ජනවාරි 3 වනදාය. යාපහුව පාර්ලිමේන්තු මන්ත්‍රී හා මුදල් ඇමතිව සිටි යූ.බී. වන්නිනායක මහතා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකුව සිටියදී නිදහස් අධ්‍යාපන පනත යටතේ මෙම මැදි විදුහල නිර්මාණය වේ. මෙහි සිටි මුල්ම ශිෂ්‍ය සංඛ්‍යාව වන්නේ සිසුන් හයකි. මෙම විදුහල මුලින්ම ආරම්භ කරන්නේ බලල්ලේ පිහිටි යූ.බී වන්නිනායක මහතාගේ නිවසේදී වේ. පසුව බලල්ල විදුහලේ අධ්‍යන කටයුතු අවසන් වූ පසු සවස පාසලක් ලෙස මෙය පවත්වාගෙන යන ලදී. පාසල ආරම්භ වන අවදියේදී මෙම පාසලේ සියලු අධ්‍යයන කටයුතු සිදු කරන ලද්දේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

පසු කාලයේ දී මහව නගරයට ආසන්නව තිබූ අක්කර 25ක භූමි භාගයකට මෙම විදුහල ගෙන යන ලදී . එදා මෙම විදුහල ආරම්භ වන්නේ පොල් අතු මඩු 6ක පන්ති කාමරවලිනි. මහවට පාසල ගෙන යන අවදිය වන විට මෙම විදුහලේ සිසුන් සංඛ්‍යාව 99ක් වන අතර ගුරුවරුන් වුයේ 8 දෙනෙකි. ක්‍රමයෙන් ස්ථිර ගොඩනැගිලි 4ක් මෙහි නිර්මාණය වුයේ පාසල ස්ථාවර තත්වයකට පත්කරමිනි. ඒ අතර මෙම පාසලේ මුල්ම විදුහල්පති වුයේ ආර්.ඩී  සිරිසේන මහතාය.

මුලින්ම පොල් අතු ගොඩනැගිලිවලින් ආරම්භ වූ මෙම පාසලේ මුලින්ම ස්ථිර ගොඩනැගිලි විවෘත කරන ලද්දේ නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘ එවකට අධ්‍යාපන අමාත්‍ය සි.ඩබ්.ඩබ් කන්නන්ගර මහතා වේ. පහත දැක්වෙන්නේ කන්නන්ගර මහතා එදින විදුහලේ ලොග් සටහන් පොතේ තැබූ අනුස්මරණ ලොග් සටහනේ ඡායාරූපයකි.

අචාර්ය සි. ඩබ්. ඩබ්. කන්නන්ගර  මහතා තබා ඇති ලොග් සටහන



The new buildings of the Central School were declared open by the Hon. Mr. C.W.W. Kannangara, the Minister of Education on 25th October 1946 at 3 p.m. Among those present were Hon Mr J. L. Kotelawala, Minister of Communications & Works, Dr Ian Sundeman, the Director of Education, Mr Dudley Senanayake M.S.C., Mr U. B. Wanninayake M.S., Mr D. C. Gunawardena, Supervisor of Central Schools, Mr B. F. Perera, Govt Agent NWP, Mr [illegible] Jayasinghe, Education Officer NWP. The following verses were made for the occasion by the Hon Mr Kannangara,

[illegible]

පහත දැක්වෙන්නේ අචාර්ය සී. ඩබ්. ඩබ් කන්නගර මහතා විජයබා මැදි විදුහලට පැමිණීම ගැන එදවස ජාතික පුවත් පතක වාර්තා කර තිබූ අයුරුයි.



## Cloth As Prizes In Central Schools

### MINISTER'S SCHEME APPROVED BY BOARD

KURUNEGALA, Monday

He has obtained the sanction of the Board of Ministers to distribute cloth to scholarship winners in Central Schools whose parents' incomes were less than Rs. 15 a month, said Mr. C. W. W. Kannangara, Minister of Education, at the opening ceremony of the Maho Central School.

The Minister in the company of Col. J. L. Kotelawala, Minister of Communications and Works, Mr. Dudley Senanayake, M.S.C., Dr. Ian Sundeman, Director of Education, Mr. B. F. Perera, Government Agent, North Western Province, and Mr. U. B. Wanninayake, Member of the State Council for the area, were conducted in procession from the Maho Resthouse to the new Central School.

At the public meeting held in the school hall, Mr. Wanninayake, on behalf of the inhabitants of the Wanni Hatpattu, welcomed the Minister of Education to the Wanni Hatpattu.

He assured the Minister of the deep gratitude of the people of the Wanni for the great boon he had bestowed on them by establishing that Central School.

With the introduction of free education he had no doubt that future generations of the Wanni would justify their place in society. The poverty of the people of the Wanni was due to a very great extent to the want of education.

The Nayake Thero of the Kalkawela Buddhist Temple expressed his gratitude to the Minister for having established that Central School.

### ASSISTANCE IN FOOD PRODUCTION

Col. J. L. Kotelawala said that the people of that area should congratulate themselves in having selected to represent their interests in the State Council a person like Mr. Wanninayake. Mr. Wanninayake was the type of man, who was never satisfied, till he obtained the fullest measure of relief to his people.

Speaking of the Wanni, Mr. Kotelawala said they were always grateful to the Wanni for the great assistance it gave to the country during the war in the supply of foodstuffs. He hoped that with the opening of that Central School, Wanni Hatpattu would turn scholars not second to any others in Ceylon.

Speaking of the great part that Buddhist monks could do for the country, he said it was they who made the country. It was the saffron robes that made Ceylon the envy of the world, but was sorry to say, that today a certain section of the monks were trying to ruin their beloved Lanka. He called upon the [illegible] to prevent that great calamity.

Mr. Dudley Senanayake said that the way had now been made open by the Ministry of Education for the sons and daughters of the Wanni to educate themselves and take their rightful place in the affairs of the country.

Dr. Ian Sundeman addressing the meeting in Sinhalese, said the Department would give all facilities to make the new school a success.

Mr. B. F. Perera said that he would always extend his fullest co-operation to make the school a success.

Mr. Kannangara, said that he was being blamed by a certain section because he was trying to make his [illegible] free. The Government policy was now to make education available to the poorest of the poor.

ඒ අතරම මෙම විදුහලේ ප්‍රථම ආදී ශිෂ්‍යා වුයේ බළල්ල හන්ගිලිපොල ආර්. සි උඩුවේරිය මහතා ය. ඒ අතර ප්‍රථම උපගුරුවරයා වුයේ ඩබ්. ජයසේන මහතා වේ. 1955 වන විට ලි වැඩ සදහා ගොඩනැගිල්ලක් හා පුස්තකාල පහසුකම් ලබා දී ඇත. 1959 දී විද්‍යා කලා, වාණිජ උසස් පෙළ පන්ති ආරම්භ කරන ලදී. ඒ අතර විද්‍යාගාර ගොඩනැගිල්ලක් යු.බි වන්නිනායක මහතා විසින් 1962 වර්ෂයේදී විවුර්ත කර ඇත. ක්‍රමක්‍රමයෙන් දන්ත චිකිත්සාගාරයක්, ගෘහ විද්‍යාගාරයක්, කෘෂිවිද්‍යා ගාරයක් පාසලට එකතුවිණි. 1986 වසර වන විට පාසල පරිගණක විද්‍යාගාරයයක් ලැබී ඇත. මේ ආකාරයට දෙමහල් ගොඩනැගිලි, බාලක බාලිකා හොස්ටල් පහසුකම්, ගුරු නිවාස වැනි පාසලක් තුල ඇතුලත් සියලු පහසුකම් මෙම මැදි විදුහලේ නිර්මාණය වී ඇත. මේ ආකාරයට 1987 වන විට මෙම විදුහල පර්ෂද මලස්ත විදුහලක් බවට පත් විය. ඉන් පෝෂිත විදුහල් 11 පමණ වේ. කුරුණෑගල දිස්ත්‍රිකයේ ප්‍රථම වරට පර්ෂද ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමේ ගෞරවය ද හිමිවන්නේ මහව විජයබා විද්‍යාලයට වේ.

මෙතෙක් ඉතිහාසය තුල මෙම විදුහල මාධ්‍ය විද්‍යාලයක් විදියට නිර්මාණය වීම නිසා වන්නියේ අඩු වරප්‍රසාදිත දුවා දරුවන්ගේ අධ්‍යාපන තත්වය ඔසවා තැබීම වෙනුවෙන් මෙම විදුහල විශාල කාර්යභාරයක් සිදු කර ඇත. එවකට වන්නියේ ඈත ගම දනව් දුපත්පත් ගැමියන්ගේ අධ්‍යාපනයට දක්ෂ දුවා දරුවන්ට ශිෂ්‍යත්ව විභහගය සමත්ව උසස් අධ්‍යාපන කටයුතු බාධවකින් තොරව ඉදිරියට කරගෙනයාමට මෙම විදුහල විශාල පිටිවහලක් වී ඇත. ඊට හොදම නිදසුන නම් ශ්‍රී ලංකාවේ විශිෂ්ට සාහිත්‍ය වේදියෙකු වූ සයිමන් නවගතේගම මහතා දැයට දායාද වන්නේ නිදහස් අධ්‍යාපනය හා ඒ නිසා බිහි වූ මෙම මාධ්‍ය විදුහලත් නිසාවෙනි. නවගත්තේගම නම් ඉතා දුෂ්කර ග්‍රාමීය පරිසරයක ජිවත් වූ ඔහු නිසග අධ්‍යාපන දක්ෂතාව නිසා ශිෂත්වය සමත් විය. නමුත් ඉතා අඩු මුල්‍යම වත්කමක් හිමි එතුමාගේ පවුල් පසුබිම නිසා ඉදිරි අධ්‍යාපන කටයුතු ආඩාල වන්නට තිබිය දී නිදහස් අධ්‍යාපනය මගින් හදුන්වා දුන් ශිෂත්ව ක්‍රමය හා මාධ්‍ය විද්‍යාල ක්‍රමය නිසා එතුමාට මහව විජයබා මැදි විදුහලට පැමිණීමට හැකි විය. ඉන් පසු ඔහු සාර්ථකව තම උසස් අධ්‍යාපන කටයුතු පවා සම්පුර්ණ කරගත්තේ නිදහස් අධ්‍යාපන ක්‍රමයට පින් සිදු වන්නට වේ. මීට අමතරව සාහිත්‍යවේදී සුමන ආලෝක බණ්ඩාර වගේම ඉතා විශාල වෛද්‍යවරුන් සංක්‍යාවක් ද ඉංජිනේරුවන් , පරිපාලන කේෂ්ත්‍රය ඉහල නිලධාරින් වැනි විවිධ විෂය කේෂ්ත්‍ර වල උසස් නිලධාරින් ගණනාවක් මෙම මැදි විදුහලෙන් බිහි වී ඇත

මෙලෙස ආචාර්ය සි.ඩබ් .ඩබ් කන්නන්ගර මහතා ශ්‍රී ලංකාවට හදුන්වා දුන් මහගු දායාදයක් වන නිදහස් අධ්‍යාපන පනත මෙලෙස අධ්‍යාපනය හා සමාජය උඩු යටිකුරු කළේය . ඒ පනත නිසා වන්නි හත්පත්තුවේ ගැමියන්ට දායාද වූ මහව විජයබා මාධ්‍ය මහා විද්‍යාලය ද වන්නි හත්පත්තුවේ අධ්‍යාපන තත්වය උඩු යටිකුරු කළේය . එම වරප්‍රසාදය භුක්ති විදි හා භුක්ති විදින වන්නි හත්පත්තුවේ දරුවන් එමටය . අදටත් කන්නන්ගර මහතාගේ අරමුණු බලාපොරොත්තු සඵල කරමින් මහව විජයබා මාධ්‍ය මහා විද්‍යාලය තම මහගු දායකත්වය නිදහස් අධ්‍යාපන කේෂ්ත්‍රයට ලබා දෙමින් පවතී.

**මූලාශ්‍රය**


- රුබේරු, රංජිත්, (1994) ශ්‍රී ලංකා අධ්‍යාපනය කන්නගර සමය (1931-1948) කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- විදුහල් පැතිකඩ, (1998) මහව විජයබා මධ්‍ය මහා විද්‍යාලය.
- හේරත්, සමන්ත, අභයසුන්දර, ප්‍රනීත්, බණ්ඩාර, තිබිරියාගම, (2011). සයිමන් නවගත්තේගම සංකථන සංහිතා , කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

# නාලන්දා (පිරිමි) ජාතික පාසල මිනුවන්ගොඩ

එච්.ඒ.එස්.එන්.හංචාපොල

එන්.ඒ.ඩී.එම්.නිශ්ශංක

ස්වශක්තියෙන් නැගී සිටින, බුද්ධිමත්, හික්මුණු, සහජීවනයෙන් කටයුතු කරන පරිසර හිතකාමී දරු පිරිසක් රටට දායාද කිරීම මෙහෙවර කරගත් නාලන්දා (පිරිමි) ජාතික පාසල සියවසකට අධික කාලයක් මුළුල්ලේ පටන් රටට හා සමාජයට වැඩදායී ළමුන් දස දහස් ගණනක් බිහි කර ඇති පාසලකි. මිනුවන්ගොඩ කලාපය තුළ පවත්නා එකම පිරිමි පාසල වූ නාලන්දා විද්‍යාලයෙහි ඉතිහාසය 19 වන සියවස දක්වා දිවයයි.

1912 දී ආරම්භ කරන ලද මිනුවන්ගොඩ විද්‍යාලය තේක්ක වත්තක කොටසක් එළිපෙහෙලි කර පොල් අතු කුඩා මඩුවක් විය. 1912 සිට දීර්ඝ වූ ලිඛිත ඉතිහාසයක් ඇති මෙම පාසලේ ආරම්භයේදී මිශ්‍ර පාසලක් විය. තේක්ක වත්තක් පිහිටීම හේතු කොට ගෙන මෙම විද්‍යාලය ''තේක්ක වත්ත විද්‍යාලය'' ලෙස ප්‍රදේශයෙහි ප්‍රචලිත විය. 1912 දී පටන් ක්‍රමයෙන් භෞතික හා මානව සම්පත් අතින්ද වර්ධනය විය. මෙසේ ඇරඹුණ පාසල 1918 වසර වන විට මිනුවන්ගොඩ ද්විභාෂා රජයේ බාලිකා විද්‍යාලය නමින් ප්‍රසිද්ධ විය. එහිදී මෙන් සිංහල පාසැල හැරයාමේ විභාගය දක්වා පන්ති පැවැත්විය.

1923 දී ප්‍රථම වරට කාන්තාවක් මුල් ගුරු තනතුරට පත් විය. ඇය D.L.R.M.සමරවික්‍රම විය. ඇයට අමතරව තවත් ගුරුවරුන් දෙදෙනෙක් මෙහි සේවය කළෝය. මෙහිදී මුල් ගුරුතුමිය රු. 44ක මාසික වැටුපක ද උප ගුරුවරිය රු.25ක වැටුපක්ද ලැබුවාය.

D.L.R.M.සමරවික්‍රම මහත්මියගෙන් පසුව 1924 දී මිනුවන්ගොඩ ද්විභාෂා රජයේ බාලිකා විද්‍යාලයේ ප්‍රධාන ආචාර්ය ධූරයට පත් වූයේ D.L.නිශ්ශංක මහතාය 1943 වන විට මිනුවන්ගොඩ ද්විභාෂා රජයේ බාලිකා විද්‍යාලයේ සේවය කළ ගුරුවරුන් සංඛ්‍යාව සිව් දෙනෙකු වු අතර සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 75 ක් විය. වර්තමානයේ දී මේ පිරිස සුළු පිරිසක් වුවද 1943 වන විට මෙම පිරිස පාසලක සැලකිය යුතු පිරිසකි.

මෙම කාලසීමාව වන විට ලාංකීය අධ්‍යාපනයේ ක්‍රමයේ සුවිශේෂී කාල සීමාවක් ලෙස හැඳින්විය හැකිය. 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස පත් වූ C.W.W.කන්නංගර මහතා අධ්‍යාපන නගා සිටුවීමටත් සෑම දරුවෙකුටම අධ්‍යාපන අයිතිය ලබාදීම සඳහාත් දේශීය අධ්‍යාපනය නගා සිටුවීම සඳහාත් කටයුතු රැසක් සිදුකරන ලදී. මෙහිදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයන් රැසක් සිදු කිරීමේ අරමුණින් C.W.W.කන්නංගර මහතා 1939 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට 1931 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත ඉදිරිපත් කරන ලදී. 1931 අංක 31 දරණ පනතට අනුව ගම්බද අධ්‍යාපනය නගා සිටුවීම සඳහා එතෙක් පැවති සෑම ඡන්ද කොට්ඨාසයකින්ම පාසලක් තෝරාගෙන එම විද්‍යාල මධ්‍ය විද්‍යාල ලෙස දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මධ්‍ය විද්‍යාල සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා මිනුවන්ගොඩ ඡන්ද බල කොට්ඨාසයෙන් තෝරා ගනු ලැබුවේ මිනුවන්ගොඩ ද්විභාෂා රජයේ බාලිකා විද්‍යාලයයි. ඒ අනුව 1943 නොවැම්බර් 02 වෙනිදා මෙම පාසල මධ්‍ය විද්‍යාලයක් බවට පරිවර්තන විය. 1943 වන විට මෙම පාසල සතු වුයේ එක් පාඨශාලා ගොඩනැගිල්ලක් පමණක් නිසා Industria Et Intergaitas ලෙස ප්‍රකට විය.

D.I.නිශ්ශංක මහත්මියගෙන් පසුව මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලයේ විදුහල්පති ධූරයට පත් වනුයේ E.W.P.සමරසිංහ මහතාය. එතුමා ආධුනික භට කණ්ඩායමෙහි කීර්තිමත් සාමාජිකයෙකු සේම මෙම පාසලට පත් වූ ප්‍රථම විදුහල්පතිවරයා ද වුවේය. එතුමාගේ සේවා කාලයෙන් පසුව කෙටි කලකට T.G.Sගුණවර්ධන මහතා විදුහල්පති ධූරයෙ හෙබ විය. ගුණවර්ධන මහතාගෙන් පසුව 1945 සිට විදුහල්පති ධූරය හෙබ වනු ලබන්නේ J.M.F.G.ප්‍රනාන්දු මහතාය. එතුමාගේ බිරිඳ ද මෙම පාසලේම ගුරු මණ්ඩලයේ සේවය කළාය. එතුමාගේ කාලය තුළ මෙම පාසල අධ්‍යාපනික හා ක්‍රීඩා යන සෑම අංශයකින්ම ශීඝ්‍ර සංවර්ධනයක් ලබමින් ඉදිරියටම ගමන් කර ඇත. මේ වන විට සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව පන්සීයක් පමණ විය. J.M.F.G.ප්‍රනාන්දු මහතාගේ සේවා කාලය තුළ සිදු වූ සුවිශේෂී සිදු වීම වනුයේ

1947 දී ආචාර්ය C.W.W.කන්නංගර මහතා මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලය වෙත පැමිණ පාසලේ කටයුතු අධීක්ෂණය කර පාසලේ අනාගත අභිවෘද්ධිය පිළිබඳ විදුහල්පතිවරයා සමඟ සාකච්ඡා කර උපදෙස් ලබා දී ඇත.

1945 දී දෙවන ලෝක යුද්ධ ආරම්භ වීමත් සමඟ කොළඹ ප්‍රදේශය යුධ මධ්‍යස්ථානයක් බවට පත් වීමත් සමඟ කොළඹ ප්‍රදේශය යුධ මධ්‍යස්ථානයක් බවට පත් වීමත් සමඟ කොළඹ ප්‍රදේශයේ පැවති පාසල් වෙනත් ආරක්ෂිත ස්ථාන කරා යොමු කරන ලදී. ඒ අනුව කොළඹ නාලන්දා විද්‍යාලයෙන් කොටසක් මිනුවන්ගොඩ ප්‍රදේශයට රැගෙන විත් මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලයට ආසන්නයේ පැවති රජමහා විහාරයේ ඉඩමෙහි කොටසක මිනුවන්ගොඩ නාලන්දා මහා විද්‍යාලය නමින් පිහිටුවා ඇත. මෙම පාසල මිශ්‍ර පාසලක් විය.

මේ කාලසීමාව වන විට මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලය ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනයත්, පාසල තුළ පන්තිකාමර ඉදිකිරීමත්, පාසල් ක්‍රීඩා පිටිය විශාල කිරීමත් ආදී හේතු පදනම් කරගෙන ශිෂ්‍ය නේවාසිකාගාරය බොරගොඩවත්ත ප්‍රදේශය වෙත රැගෙන ගොස් ඇත. මෙම මධ්‍ය විද්‍යාලය තුළම සවස් වරුවෙහි දෙමළ මාධ්‍යයෙන් වෙනම විදුහල්පති වරයෙක් යටතේ ''සවස ඉස්කෝලේ''' නමින් වෙනම පාසලක් පවත්වාගෙන ගොස් ඇත. මෙම භූමිය තුළම මිනුවන්ගොඩ ප්‍රාථමිකය නමින් වෙන පාසලක් පැවති අතර එහි 11වන ශ්‍රේණිය දක්වා පන්ති පවත්වා ඇත.

මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වීමට හැකියාව හිමිව ඇත්තේ ශිෂ්‍යත්ව විභාගය හා ඇතුළත් වීමේ විභාග වලින් සමත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණි. මේ නිසාම මෙම පාසල තුළ දක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන් රැසක් අධ්‍යාපන කටයුතු සිදුකර ඇත. 1952 වසරේදී ප්‍රථම වතාවට මෙම පාසලෙන් ශිෂ්‍යාවක සරසවි වරම් හිමි කරගෙන ඇත. ඇය රංජනී පෙරේරා විය. T.G.S.ගුණරත්න ශිෂ්‍යාව මාරි මියුසියස් හිගින්ස් ත්‍යාගය දිනා ගනිමින් 1952 දී සරසවි වරම් හිමි කර ගත්තාය. එම වසරේදීම S.A.කොරනේලිස් සිසුවා ප්‍රථම සිසුවා ලෙසින් ආචාර්ය හේවාවිතාරණ ත්‍යාගය හිමිකරගෙන සරසවි වරම් ලබා ගත්තේය.

මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාලය ආරම්භයේ සිටම මෙහි වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රීඩා අංශයෙහිලා දක්ෂයන් වූ අතර 1994 දී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළලේ දී රන් පදක්කමක් ලබා ගැනීමට මෙම පාසලේ ආදි ශිෂ්‍යාවක් වන පුෂ්පමාලි රාමනායක ක්‍රීඩාකාවට හැකි විය.

1972 වර්ෂයේ දී නාලන්දා මහා විද්‍යාලයේ වාණිජ අංශයේ සිසු සිසුවියන් මධ්‍ය විද්‍යාලය වෙත මාරු කර යවා නාලන්දා මහා විද්‍යාලයේ සිටි සියලු පිරිමි සිසුන් මධ්‍ය විද්‍යාලය වෙත මාරු කර එම පාසල මිනුවන්ගොඩ නාලන්දා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය ලෙසත් මිනුවන්ගොඩ මධ්‍ය විද්‍යාල මිනුවන්ගොඩ නාලන්දා පිරිමි විද්‍යාලය ලෙසත් නම් කර ඇත.

වර්තමානය වන විට මිනුවනගොඩ නාලන්දා පිරිමි මධ්‍ය විද්‍යාලය ජාතික පාසලක් වන අතර 1 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා සියලු විෂයන් සහිත මිනුවන්ගොඩ අධ්‍යාපන කාලාපයේ එක පිරිමි පාසල ලෙස විරාජමානව වැජඹෙයි.





1943 මධ්‍ය විද්‍යාලයක් බවට පත්වන විට සේවය කළ විදුහල්පති හා ආචාර්ය මණ්ඩලය (තොරතුරු හා ඡයාරූප ඒ.පී. ධම්මික අධිකාරි නාලන්දීය ආදි ශිෂ්‍ය සංගමය)

# නිදහස් අධ්‍යාපනයේ පහස ලත් හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය

**එම්.පී. හංසමාලි**
තාවකාලික සහාය කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යානාංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය,
piumistperera@gmail.com

**එච්.විතානගේ**
තාවකාලික පර්යේෂණ සහායිකා, සමාජීය විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය,
hareeshasadaruwani186@gmail.com

## හැඳින්වීම

දිවයිනේ මෙන් ම විදේශ රටවල දී ශ්‍රී ලාංකිකයෝ උසස් අධ්‍යාපනය ලබා විවිධාකාරයේ ඉහළ තනතුරු දරමින් වැජඹෙති. එවැනි ලාංකික සියල්ලන්ගේ ම අදහස වන්නේ ඔවුන්ට මංපෙත් විවර වුයේ නිදහස් අධ්‍යාපනය නිසාය යන්නයි. දැයේ දූ දරුවන්ට නිදහස් අධ්‍යාපනයේ දොරගුලු විවරකර ඔවුන්ගේ අනාගත සුභසිද්ධිය වෙනුවෙන් කැප වූ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ කාර්යභාර්ය සිහිපත් කළ යුතු ය.

නිදහස් අධ්‍යාපන පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළ පසු ආරම්භක මධ්‍ය විද්‍යාල 54න් 19 වෙනි පාසල වන කැලණි ගං මිටියාවතේ හංවැල්ල රාජසිංහ විද්‍යාලය ඇරඹිණි. ඒ 1948 ජනවාරි මස 2වන දිනය.

### විද්‍යාලයීය ඓතිහාසික තොරතුරු

පළමුවන රාජසිංහ රජුගේ ප්‍රෞඪ ඉතිහාසයට හිමිකම් කියන ගුරුබැවිල නම් ඓතිහාසික නගරය වන්නේ හංවැල්ල ප්‍රදේශයයි. ශ්‍රීපාදයේ පහස ලත් කැලණි ගං මිටියාවතේ ඓතිහාසික සීතාවක රාජධානිය පිහිටා ඇති හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය 1943 වර්ෂයේ දී දැනට හංවැල්ල පැරණි තානායම පිහිටි ස්ථානයේ රජයෙන් මිශ්‍ර පාඨශාලාවක් ලෙස ආරම්භ වී ඇත. මෙම විදුහල ඉන් අනතුරුව වර්තමාන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පිහිටි ස්ථානයේ පවත්වාගෙන ගොස් ඇත. ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපන චින්තනයට අනුව පිහිටුවන ලද රාජසිංහ මැදි විදුහලේ ආරම්භක විදුහල්පති ලෙස එවන් එදිරිවීර මහතා කටයුතු කර ඇත.

එවකට වර්තමාන විද්‍යාල භූමිය ආශ්‍රිත ප්‍රදේශය හැඳින්වූයේ "ලංසියා මැරූ ගොඩැල්ල" නමිනි. මෙම භූමිභාගය මුලින්ම අයත්ව තිබුණේ තෙපානිස් වැලිකල අප්පුහාමි යන අයෙකුට ය. සමනබැද්දේ කපිතාන් ඩී. එස් ගුණසේකර මහතා ඇතුළු කමිටුවක් විසින් ප්‍රදේශවාසීන්ගේ රුපියල් 12,000 ක මුදලක් එකතු කර මෙම භූමිභාගය මිලට ගෙන ඇත. 1947 ජුනි මස 20 වන දින ඉංග්‍රීසි පුවත්පතේ පළ වී ඇති අන්දමට පසුව එම භූමිය එවකට අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මැතිඳුන්ට භාරදී ඇත.


පසුව 1961 දෙසැම්බර් මස 21 වන දින මුල්ගල් තබා ගොඩනැගිලි ඉදි කොට දැනට පාසල පිහිටි ස්ථානය වෙත විද්‍යාලය ගෙන යනු ලැබුවේ 1953 වර්ෂයේ මැයි මාසයේදීය. විද්‍යාලයීය පළමු ගොඩනැගිලි විවෘත කිරීමේ උත්සවය සඳහා එවකට අගමැති ඩඩ්ලි සේනානායක මහතා, අධ්‍යාපන අමාත්‍ය එම්.ඩී බණ්ඩාර මැතිතුමා, හොරණ පාර්ලිමේන්තු මන්ත්‍රී හැරී ජයවර්ධන මැතිතුමා හා අධ්‍යාපන අමාත්‍ය එම්. ඩබ්ලිව් හවුස් මහතා සහභාගී වූහ.

ඓතිහාසික සීතාවක රාජධානියේ පළමුවන රාජසිංහ රජු සිහිවීම හා සීතාවක ප්‍රදේශයේ ප්‍රධාන පාසල මෙය වූ බැවින් එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටි පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ යෝජනාවකට අනුව **හංවැල්ලේ මධ්‍ය මහා විද්‍යාලය** නමින් තිබූ පාසල **හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය** ලෙස නම් කරන ලදී. කැලණි ගඟ අසබඩ පළමුව ඇරඹි පාසල ප්‍රාථමික පාසලක් ලෙස නම් කළ අතර පසු එම විද්‍යාලය **මායාදුන්න විද්‍යාලය** බවට පත්විය.

### පැරණි ගොඩනැගිල්ල



හයවන ශ්‍රේණියේ සිට සිංහල භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබාදුන් හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය ආරම්භක විදුහල්පතිවරයා වූ එවන් එදිරිවීර මහතා හික්කඩුව ප්‍රදේශයේ උපත ලබා ලන්ඩන් විශ්වවිද්‍යාලයේ උපාධිය හිමිකරගත්තේය. ඒ මහතා 1943 ජනවාරි දින සිට 1953 සැප්තැම්බර් 10 වන දින දක්වා එම ධූරයේ කටයුතු කර ඇත. ආරම්භක ගුරු දෙගුරු සංගමයේ සභාපති වූයේ දොන් ජාකොළිස් රූපසිංහ රාළහාමිය. ඔහු එවකට මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන මැතිතුමාගේ සීයා ය. වැඩිම කාලයක් විද්‍යාලය ගුරු දෙගුරු සමිතියේ ප්‍රධාන අනුශාසක ධූරය දැරුවේ අමාත්‍යවරයකු වූ පිලිප් ගුණවර්ධන මැතිතුමා ය.



### එවන් එදිරිවීර මැතිතුමා

විද්‍යාලයීය ප්‍රථම ශිෂ්‍යයා වූයේ ජේ. ජයතිස්ස නමැති අයෙකි. මොහු 1946 ජනවාරි මස 3වන දින විද්‍යාලයට ඇතුළත් කර ඇත. වර්ෂ 1946 සැප්තැම්බර් මස 8 වැනි දින මෙම ළමුන් සඳහා නේවාසිකාගාරයක් ආරම්භ කරන ලද අතර, ගැහැණු ළමුන් සඳහා පහත්ගම හංවැල්ල හරස් පාරේ පුද්ගලික නිවසක නියමාකාර පවත්වාගෙන යන ලදී. පිරිමි නේවාසිකාගාරයේ ප්‍රථම පාලකයා වූයේ පී. ඩබ්. පෙරේරා ගුරු මහතාය. එය 1954 වර්ෂයේ සිට ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා නොව නේවාසිකාගාරයක් ලෙස පවත්වාගෙන යන ලදී.

මේ සඳහා මාසයකට රුපියල් 20ක මුදලක් රජයෙන් ලබාදී ඇති අතර ආහාර හා අනෙකුත් පහසුකම් ද ලබාදී ඇත. වර්තමානයේ ක්‍රීඩා පාසල නේවාසිකාගාරය වන්නේ එම ගොඩනැගිල්ල ය. වර්ෂ 1954 මාර්තු මස 5 වන දින විදුහල්පති ලෙස පත්ව ආ බෝගොඩ ප්‍රේමරත්න මහතාගේ කාලයේදී වර්තමාන විදුහල්පති කාර්යාලයට සමාන්තරව දෙමහල් ගොඩනැගිල්ලට යාබදව පිහිටි තනි තට්ටුවේ පන්ති කාමර දෙක අයත් ගොඩනැගිල්ල"බෝගොඩ බ්ලොග්" නම් ඉදිකර තිබුණි. ඒ සිසුන්ගේ ශ්‍රම පරිත්‍යාගය, ප්‍රදේශවාසීන්ගේ සහ දෙමව්පියන්ගේ මූල්‍ය උපකාර මතය.

රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් ගීතය නිර්මාණය කරන ලද්දේ එවකට සිංහල විෂය ගැන්වූ ලයනල් ලොකුවිතාන ගුරු මහතා විසිනි. එමෙන් ම පාසල් ලාංඡනය නිර්මාණය කර ඇත්තේ ලයනල් ලොකුවිතාන ගුරු මහතා විසිනි. මෙහි සමනල කන්ද, කැලණි ගඟ හා හිරු නැගෙන ආකාරය තුළින් අධ්‍යාපනයේ නැග්ම ලෙසින් ඉණිමඟ සංකේතවත් කර ඇත. එහි ආදර්ශ පාඨය වන්නේ **"භක්තියෙන් හා ශක්තියෙන්"** යන්නයි. මදටිය වර්ණය කහ වර්ණය යොදාගෙන ඇත. ලාංඡනය ධජයේ මැදට වන්නට ද ධජය යට තීරුවට වන්නට ද ධජයේ යට තීරුවට සමාන්තරව විද්‍යාලයේ නම සඳහන්ව ඇත.

### විද්‍යාලීය ලාංඡනය

වර්ෂ 1956 වනවිට විද්‍යාලයට ක්‍රීඩා භූමියක් නොතිබුණු අතර ප්‍රථම ක්‍රීඩා උත්සවය පවත්වන ලද්දේ හංවැල්ල පොදු සුසාන භූමිය අසළ ගඩොල් ගසන භූමියක් ලෙස භාවිතා කළ කුරුස වෙල නමින් හැඳින්වූ පිට්ටනියක ය. දැනට ඇති ක්‍රීඩා පිටිය පසුව රජයට පවරාගත් භූමියක පිහිටා ඇත. වර්ෂ 1958 දී කනිෂ්ඨ ශිෂ්‍යභට කණ්ඩායම ආරම්භ කර ඇති අතර, 1966 දී ජ්‍යෙෂ්ඨ කණ්ඩායම ආරම්භ කර ඇත. ප්‍රථම ශිෂ්‍යභට කණ්ඩායම් භාර නිලධාරි ලුතිනල් ජී. බී සමරජීව මහතාද පසුව පිළිවෙළින් කපිතාන් ආර්. කේ.පී.ඩබ්සිල්වා මහතාද ලුතිනල් ඩී.ඩී වෙත්තසිංහ මහතා ද දෙවන ලුතිනල් අයි.ඩී හේමපාල යන නිලධාරීහු ද කණ්ඩායම් භාර නිලධාරී ලෙස කටයුතු කළහ.

පසුකාලීව විද්‍යාලයේ විද්‍යා, කලා හා වාණිජ විෂය ධාරා ආරම්භ කර ඇති අතර මුල්ම උසස් පෙළ විද්‍යා ගුරුවරයා වූයේ සත්‍යමුනි ගුරුතුමාය. වාණිජ අංශය භාර ගුරු මහතා වූයේ එස්. රූපසිංහ ගුරු මහතා වන අතර 70 දශකයේ සිංහල අංශය භාරව කටයුතු කරන ලද්දේ කොහොඹේපොළ ස්වාමීන් වහන්සේය. එවකට වාණිජ අංශය භාරව කටයුතු කරන ලදදේ වයි.කේ මුදලිගේ මහත්මිය හා ඊබට් ගුණවර්ධන ගුරුතුමාත්ය. විද්‍යා අංශය භාරව සතරසිංහ ගුරු මහතා කටයුතු ඇත.

ආරම්භයේ සිට මේ දක්වා විද්‍යාලයේ විදුහල්පති ධූරය දැරූ සියලුම විදුහල්පතිවරු හා විදුහල්පතිනියෝ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු මෙන්ම භෞතික කටයුතු සඳහා වර්ධනයක් ඉටු කළහ.



බෝගොඩ ප්‍රේමරත්න විදුහල්පතිතුමා

(වර්ෂ 1954 -1956)



එච්. ආර් පෙරේරා විදුහල්පතිතුමා

(වර්ෂ 1956- 1965)



එම්. එම් ජනාරත්න විදුහල්පතිතුමා

(වර්ෂ 1975 -1981)



කේ. බී. වී රොමියෙල් විදුහල්පතිතුමා

(වර්ෂ 1982 -1985)



එම්.ඩබ්.එස් හඳපාන්ගොඩ විදුහල්පතිතුමා

(වර්ෂ 1985 -1992)



චිත්‍රාංගනී ලුණුවිල විදුහල්පතිතුමිය

(වර්ෂ 1992 -1994)



එච්. එස්.කේ විජේතිලක විදුහල්පතිතුමා

(වර්ෂ 1994 -2008)

1946 වර්ෂයේ මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත් වන විට සිටි ඇදුරු මඬුල්ල අතර විදුහල්පති එවන් එදිරිසිංහ, එච් පරරාජසිංහම්, එම්.ඩී.එෆ්.අයි ප්‍රනාන්දු, එස් සත්‍යමුනි, ආර්.ඩී.ආර්.පී ගුණවර්ධන, ඩී.කේ. රාජපක්ෂ, එන් මුණසිංහ, එල්.ඩී ලැන්සි, ඩී අමරසේන, උපාලි සිල්වා, විජේරත්න, කත්‍රිආරච්චි, ජිනදාස, රන්කොටුව ගුරුමහත්මිය, අමරදාස, පියරත්න, සුගලාවතී ගුරු මහත්මිය යන අධ්‍යයන කාර්ය මණ්ඩලයත්, ලිපිකරු ජයතිලක, රසායනාගාර සහායක විලියම් වික්‍රමසිංහ, මුරකරු කරුණාරත්න, කම්කරු ජයසේන යන අනධ්‍යයන කාර්ය මණ්ඩලය ආචාර්ය මණ්ඩලයට අයත්වූහ.

**1946 වර්ෂයේ ආචාර්ය මණ්ඩලය**



1990 මාර්තු මස 4වන දින ජාතික පාසලක් බවට පත් වූ අතර කන්නන්ගර සංකල්පය තුළින් බිහි වූ හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ අද වන විට සිසුහු 3400ක් පමණ අධ්‍යාපනය ලබති. විද්‍යාලයීය විදුහල්පති ලෙස ඩබ්.ඩී.ආර්.කේ ජගත් ප්‍රියශාන්ත සූරසේන මහතා විශාල කාර්යයභාරයක් ඉටු කරයි. නියෝජ්‍ය විදුහල්පතිවරුන් සයදෙනෙකු ද සහාය විදුහල්පතිවරුන් සයදෙනෙකු ද ගුරුවරුන් 180කින් ද සමන්විත විද්‍යාලයීය අධ්‍යයන කාර්යය මණ්ඩලය මෙහි සේවයේ යෙදී සිටිති.

වර්තමාන පරිපාලන බෙදීම් අනුව හෝමාගම අධ්‍යාපන කලාපයේ ප්‍රධාන පාසල ලෙස අධ්‍යාපනික, ක්‍රීඩා හා විෂය බාහිර සමගාමී කටයුතුවලින් ප්‍රධාන ම පාසල බවට පත්ව ඇත. වර්තමානය වන විට සිසුන්ගේ විෂය බාහිර සමගාමී ක්‍රියාකාරකම් යටතට ගැනෙන විවිධ සංගම් රාශියක් විද්‍යාලය තුළ පවත්වා ගෙන යනු ලැබේ. ඒ අතර බෞද්ධ සංගමය, කලා සංගමය, වාණිජ සංගමය, විවාද සංගමය, තාක්ෂණික සංගමය, විද්‍යා සංගමය, නාට්‍ය හා රංගකලා සංගමය, නව නිෂ්පාදකයින්ගේ සංගමය, පරිසර සංගමය, ඉංග්‍රීසි මාධ්‍ය සංගමය, ජනමාධ්‍ය සංගමය, තොරතුරු තාක්ෂණ සංගමය, පුරාවිද්‍යා සංගමය, සෞඛ්‍යධාන සංගමය, බාලදක්ෂ සංගමය හා ආදි ශිෂ්‍ය සංගමය වේ.

අද වන විට විද්‍යාලයේ ක්‍රීඩා පාසල තුළින් සිසුන්ගේ ක්‍රීඩා හැකියා ඔප්නැංවීමට මහගු කාර්යයභාරයක් ඉටු කරනු ලැබේ. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරඟ ඉසව් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සහභාගී වී බොහෝ ජයග්‍රහණ ලබාසිටිති. මෙහි මළල ක්‍රීඩා, බැඩ්මින්ටන්, පාපන්දු, දැල් පන්දු, ක්‍රිකට්, පිහිනුම්, චෙස්, කරාතේ සහ එල්ලේ යන ක්‍රීඩා ප්‍රධාන ය.

වත්මන් විදුහල්පතිතුමාගේ මග පෙන්වීම යටතේ හංවැල්ල රාජසිංහ මැදි විදුහලට නව අංශ රාශියක් එක් කරමින් නවීන යුගයට ගැළපෙන ආකාරයට සෑම අංශයකින් ම උසස් ප්‍රතිඵල ලබා ගැනීමට ක්‍රමවත් අධ්‍යාපන සැලසුමක් ක්‍රියාත්මක කෙරේ. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයෙන් සිප්සතර හදාරා අද වන විට විවිධ වෘත්තීන්හි නිපුණ බුද්ධිමත්හු මෙරට මෙන් ම පිටරට රැකියාවල ද නියුක්ත වෙති.

**මූලාශ්‍රය**


- හංවැල්ල රාජසිංහ විද්‍යාලයීය ලොග් පොත ඇසුරෙනි
- www.rajasing.sch.lk
- https://placemap.net

# කන්නන්ගර සංකල්පයෙන් නව ජීවයක් ලද පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය

**තෂිලා යොහානි**
සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
thashilayohani@gmail.com

**පී. ජී. ටී. එන්. පෙරේරා**
සහකාර කථිකාචාර්ය, සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
pgtnp1991@gmail.com)

## හැඳින්වීම

ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නංගර (ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර) 1884 ඔක්තෝම්බර් මස 13 වන දා - 1969 සැප්තැම්බර් මස 23 වන දා)ශ්‍රී ලාංකික නීතිඥයෙකු හා දේශපාලනඥයෙකි. විසිවන සියවසේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාවේ නිදහස සඳහා වූ ව්‍යාපාරයේ සමාජයේ සෑම තරාතිරමකම ළමයින් උදෙසා ඇප කැප වීමට ලංකාවේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස පත්වූ අතර ඔහු අධ්‍යාපනය සඳහා විවර වූ අධ්‍යාපන ක්‍රමයට පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට දායකත්වය ලබා දුණි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස කන්නංගර මහතා 1940 දශකය පුරාම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයට පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේය. සියලු සිසුන්ට අධ්‍යාපනය නොමිලේ ලබාදීමෙන් දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශවල වරප්‍රසාද නොලත් දහස් ගණනක් සිසුන්ට ප්‍රතිලාභ ලබා දුන්නේය. ඔහු මධ්‍ය විද්‍යාල යෝජනා ක්‍රමයක් ආරම්භ කළ අතර එමගින් රටේ ග්‍රාමීය ප්‍රදේශවල උසස් තත්ත්වයේ ද්විතීයික පාසල් පිහිටුවන ලදී. කන්නංගර මහතා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි ලබා ඇති සුවිශේෂී ජයග්‍රහණ නිසා ඔහු ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස පොදුවේ හැඳින්වීමට හේතු විය. ඔහුගේ නිදහස් අධ්‍යාපන සංකල්පයෙන් පණ ලැබූ පිළියන්දල මැදි විදුහල් මාතාවගේ ආරම්භක ගමන් මග, කන්නන්ගර සංකල්පයෙන් නව පණක් ලැබීම හා ජාතික පාසලක් දක්වා දියුණු වීම යන සංධිස්ථාන තුනට අනුව පිළියන්දල මධ්‍ය විද්‍යාලයීය ඉතිහාසය අංශ තුනක් ඔස්සේ මෙමඟින් හඳුනාගත හැකි වේ.

## පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේ ආරම්භය

මාම්පේ ක්‍රිස්තියානි පාසලෙන් ලැබෙන අධ්‍යාපනය තුළින් ගම්බද බෞද්ධ දරු පිරිස බෞතීස්මයෙන් බේරා ගැනීමේ අරමුණින් මාම්පේ සරණපාල හිමියන්ගේ උත්සාහය මත 1887 වර්ෂයේදී පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ වූයේ මාම්පේ පියරතනසාර බෞද්ධ මිශ්‍ර පාඨශාලාව නමින් ය. මාම්පේ විහාරස්ථානයේ පිහිටි කුඩා බණ මඩුවේ පාසලක මෙන් අධ්‍යාපන කටයුතු ආරම්භ කළ අතර එකම ගුරුවරයා වූයේද මාම්පේ සරණපාල හිමිය. මෙම කාල සීමාවේදීම උන්වහන්සේගේ අනුශාසනා මත දායකයන්ගේ උත්සාහයෙන් මත්තෙගොඩ පාඨශාලාව, වෙනිවැල්කොළ පාඨශාලාව, කැස්බෑව බාලිකා පාඨශාලාව ආදී තවත් පාඨශාලාවන් ගණනාවක් පිළියන්දල ප්‍රදේශයේ බිහි විය (පි. ම. ම. වි., 2004).

මාම්පේ පියරතනසාර බෞද්ධ මිශ්‍ර පාඨශාලාව සඳහා ශිෂ්‍ය පිරිස වැඩි වූ බැවින් පොල් අතු මඩුව ප්‍රමාණවත් නොවුණි. මොරටුව ප්‍රදේශයේ පදිංචිව සිටි කතෝනිස් බාස් උන්නැහේට අයත් පිළියන්දල තිබූ හිස් ඉඩම තාවකාලිකව හෝ ලබා ගැනීමට සරණපාල හිමියන්ට හැකිවීය. ප්‍රධාන දායක කාරකාදීන් පිරිසකගේද දායකත්වය ඇතිව 1887දී මාම්පේ සරණපාල හිමි විසින් ඉගැන්වීම ආරම්භ කරන ලදී. පසුව ඔලබොඩුවේ ජයසේකර මහතා ගුරු තනතුරට පත් කර පාසල පවත්වාගෙන ගිය අතර වැඩි වන සිසු සිසුවියන් හමුවේ පාඨශාලාවේ අභිවෘද්ධිය තකා ක්‍රමානුකූල පාලනයක් අපේක්ෂාවෙන් පාසල කොළඹ ශ්‍රී පරම විඥානාර්ථ සමාගමට භාර කරන ලදී (පි. ම. ම. වි., 2004).

1889.07.07 වන දින මධ්‍යම මට්ටමේ පාඨශාලාවක් ලෙස මෙම පාසැල ලියාපදිංචි කරන අවස්ථාවේ සිසුවියන් 146ක් හා සිසුන් 192ක් මෙහි අධ්‍යාපනය හදාරමින් සිට ඇත. මේ වන විට ප්‍රධාන ගුරුවරයා ලෙස එම්. ඩී. ජේ. පෙරේරා මහතා කටයුතු කර ඇත (පි. ම. ම. වි., 2004).

වැඩි වන ශිෂ්‍ය සංඛ්‍යාව මත ප්‍රදේශවාසීන්ගේ ද ආධාර ඇතිව පරමවිඥානාර්ථ සමාගම ඉඩමක් මිලදී ගත් නමුත් 300 ඉක්මවා ගිය ශිෂ්‍ය සංඛ්‍යාවක් හා ගොඩනැගිල්ල නඩත්තු කිරීම තවදුරටත් අපහසු වීම

හේතු කොටගෙන පරමවිඥානාර්ථ සමාගම විසින් තමන් මිලදී ගත් ඉඩමත් පාඨශාලාවත් රජයට පවරා දෙනු ලැබීය (පි. ම. ම. වි., 2004).

**කන්නන්ගර සංකල්පය සමඟ ලද නව ජීවය**

1920 වසරේදී බස්නාහිර පළාත පාලනය කළෆ්‍රේසර් නම් බ්‍රිතාන්‍ය ඒජන්තවරයාගේ සංකල්පයේ ප්‍රතිඵලයක් ලෙස පිළියන්දල ප්‍රදේශයේ රජයේ ඉංග්‍රීසි මිශ්‍ර පාසලක් ආරම්භ කෙරුණි. ප්‍රධානාචාර්යවරයා වූයේ එස්. ඩබ්. සහබන්ධු මහතාය. ගොඩනැගිල්ලේ මැද කොටස සහ එක් අංශයක් ඉංග්‍රීසි මිශ්‍ර පාසල වෙනුවෙන්ද, අනෙක් අංශය ස්වභාෂා පිරිමි පාසල වෙනුවෙන්ද වෙන් කෙරණි. කාන්තා පාසල ද යාබද වෙනත් ගොඩනැගිල්ලක පිහිටා තිබුණි (පි. ම. ම. වි., 2004).

1920 සිට 1944 දක්වා වෙන් වෙන්ව තිබූ පාසල් තුන එවකට අධ්‍යාප ඇමතිවරයා වූ ආචාර්යය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ දේශ හිතෛෂී චින්තනයෙන් බිහිවූ මැදි විදුහල් සංකල්පය යටතේ එක් පාසලක් ලෙස එක් කර 1944. 01. 04 වන දින පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ කරන ලදී. මෙදින වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 323ක් වූ අතර පාඨශාලා පරීක්ෂක වූයේ එන්. ටී. ද සිලවා මහතාය. පිළියන්දල මධ්‍ය විද්‍යාලයේ ආරම්භක විදුහල්පතිවරයා වූයේ ඩී. එම්. කොස්තා මහතාය. 1944 මාර්තු මස 04වන දින පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත් කිරීමේ නිල උත්සවය එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජ්‍ය කථානායක වූ සුසන්ත ද ෆොන්සේකා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි (පි. ම. ම. වි., 2004).

1945 නොවැම්බර් 24 වන දින මධ්‍ය විද්‍යාලයේ ප්‍රථම ත්‍යාග උත්සවය පවත්වා ඇති අතර එවකට අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ප්‍රධාන ආරාධිතයා වූයේ එතුමාගේ සේවය වෙනුවෙන් දක්වන ලද කෘතගුණ දැක්වීමක් වශයෙනි. එහිදී එතුමා විසින් ශිෂ්‍ය නේවාසිකාගාරය ද විවෘත කර ඇත.

උත්සව සභාවේ ප්‍රධාන ආරාධිතයා වූ කන්නන්ගර මහතා මධ්‍ය විද්‍යාල සංකල්පය තුළින් ප්‍රදේශයේ දරු දූරියන්ට සැලසෙන සෙත පිළිබඳව පැහැදිලි කර "පිළියන්දලට හඳ පෑවා බොලන්නේ - කම්මැලිකම් හැර පාසැල් වරෙන්නේ" වශයෙන් කවි දෙපදයක් ගායනා කරන ලදී (පි. ම. ම. වි., 2004). කන්නන්ගර මහතාගේ සංකල්පය එල දරමින් ප්‍රදේශයේ දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලැබීමේ හැකියාව එලෙස උදා වුණි (ඡායාරූප අංක 1 සිට ඡායාරූප අංක 9 දක්වා).

**ජාතික පාසලක් දක්වා උසස් වීම**

1999 මාර්තු මස 24 වන දින ජාතික පාසලක් ලෙසට උසස් වූ පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේ එවක විදුහල්පතිවරයා වූයේ කේ. ජී. විමලසේන මහතාය. ජාතික පාසලක් ලෙස තවදුරටත් අධ්‍යාපන හා බාහිර ක්‍රියාකාරකම් සඳහා පවතින පහසුකම් පුළුල් වූයේ ප්‍රදේශයේ දරු දූරියන්ට පැවති අවස්ථා පුළුල් කරමින්ය. ක්‍රීඩා පහසුකම් උදෙසා සිදු කළ කැප කිරීමත් පාසලේ සිසු දරු දූරියන්ගේ ක්‍රීඩා කෞශල්‍යයත් හේතු කොට ගනිමින් 2009 වර්ෂයේදී පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය ප්‍රථම ජාතික ක්‍රීඩා පාසල ලෙසට නම් කරන ලදී. ඒ සමඟම පාසැලේ සිසු සිසුවියන් සඳහා පැවති ක්‍රීඩා පහසුකම් තව දුරටත් දියුණු වූවා මෙන්ම ප්‍රදේශයේ වෙනත් පාසැල්වල දරු දූරියන් උදෙසා ද ක්‍රීඩා පහසුකම් සැපයීමට හැකියාව සැලසිණි.

පිළියන්දල මධ්‍ය විද්‍යාලයේ දැක්ම වන්නේ "නිදහස් අධ්‍යාපනයේ පීතෘවර ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර සූරීන්ගේ සංකල්පයකට පණ පොවමින් දේශානුරාගී ගති පැවතුම්වලින් හෙබි විශ්ව සමාජයේ අභියෝගය නොපැකිලිව ජය ගත හැකි දරුවකු බිහි කිරීම" යි. එම දැක්ම කරා එළඹීමට වෙර දරන්නට නිම වූ මෙහෙවර වන්නේ "සල්පිටි කෝරළයේ හදවත බඳු මෙම පුණ්‍ය භූමියෙන් පොත පත පිළිබඳව හසල දැනුම සම්භාරයකින් ද; විෂය සමගාමී ක්ෂේත්‍රවල ඉහළම නිපුණතාවයකින් ද; හෙබි දූ දරුවන් ලක්මෑණියන් වෙත දායාද කිරීම" යි.

විද්‍යාලය "විද්‍යා දදාති විනයං" යන තේමා පාඨය මුල් කොටගනිමින් සිසු දරුවන් දස දහස් ගණනක් වත්මනෙහි දිගු පාසල් ගමනක් නිම කොට අවසන්ය (ඡායාරූප අංක 10). මෙම වචන ත්‍රිත්වයෙහි පරිසමාප්ත අර්ථය නම් "දැනුම තුළින් හික්මීම ඇති කර ගනිමු" යන්නයි. පිළියන්දල මධ්‍ය විද්‍යාලයීය ධජයෙහි නිරූපිත නිල වර්ණයන් වශයෙන් නිල් කහ රතු යන වර්ණයන් හඳුනාගත හැකි වේ (ඡායාරූප අංක 11). නිල ලාංජනයෙන් නිරූපිත නිල තේමා පාඨය වන්නනේ "බොධෙථ පබොධෙථ දමෙථ"

යන්නයි (ඡායාරූප අංක 12).පාසල් ගීතය තුළින් පාසල පිළිබඳ නිහතමානී ආඩම්බරයන් හැඟවෙන ආකාරයට දින දින විදු මවුන්ට වැජඹෙන්නට ප්‍රාර්ථනා කිරීමක් ගම්‍ය වේ. එහි පද රචනය හා තනු නිර්මාණය සංගීත ආචාර්ය ආනන්ද ජයසිංහ මහතා විසින් සිදු කරන ලද්දකි (පි. ම. ම. වි., 2017).

අද වන විට සිසුන් 3428 ක් ඉගෙනුම ලබන පිළියන්දල මධ්‍ය විද්‍යාලීය වත්මන් විදුහල්පතිවරයා ලෙස ඩී.පී උඩවත්ත මහතා කටයුතු කරනු ලබයි (ඡායාරූප අංක 13). ඒ මහතා සිය අදහස් කිහිපයක් පණිවුඩයක් ලෙසින් පාසලේ නිල වෙබ් අඩවියට ඉදිරිපත් කරනු ලබන්නේ "සෑම සිසුවෙකුගේම අවශ්‍යතා සපුරාලීමට විද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ ඔහු නිතැතින්ම ඇප කැපවී සිටින බවයි.

එමෙන්ම පිළියන්දල මධ්‍ය විද්‍යාලයේ විදුහල්පති වශයෙන්, පාසලේ සාරධර්ම, විශ්වාසය, ගෞරවය, නව්‍යකරණය සහ ප්‍රජා හැඟීම යන වැදගත්කම ඔහුගේ පෞද්ගලික වටිනාකම් සමඟ සමපාත වීම ගැන ඔහු සතුටු වන බවත් පසුගිය වසර කිහිපය තුළ පාසලේ දියුණුව සැලකිය යුතු මට්ටමක පැවතීම පිළිබඳ ඔහු සතුටු වන බව ද කියා සිටියි. පාසැල් ජීවිතයේ ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කරන විට මෙම ස්ථිර පදනම් මත මෙහි අනාගතය ගොඩනැගෙනු ඇතයි ඔහු විශ්වාස කරනු ලබයි. විශේෂයෙන් ඉගෙනුම ලබන්නන්ගේ ප්‍රයෝජනය සඳහා අධ්‍යයන කාර්ය සාධනය, විෂයමාලා සහභාගීත්වය සහ වගකිවයුතු පුරවැසිභාවය සම්බන්ධයෙන් සෑම සිසුවෙකුටම ඉහළ ප්‍රමිතීන් සහ අපේක්ෂාවන් හිමි කර දීම අප පාසලේ පදනම බව ඔහු පෙන්වා දේ. මධ්‍ය විද්‍යාලීන්ගේ උරුමය වූ ජයග්‍රහණ සහ දායකත්වය පිළිබඳ අසාමාන්‍ය වාර්තාවක් පවත්වා ගැනීමට කැපවන ලෙසත් අපි මෙම උසස් ප්‍රමිතීන් දරමින් ආඩම්බරයෙන් යුතුව කටයුතු කරන බවත් ඒ මහතා ඉතා ගෞරවයෙන් කියා සිටී.

පිළියන්දල මධ්‍ය විද්‍යාලය යනු ගරුසී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගරයන්ගේ පහසින් ගොඩනැගුණු දැනට සිසුන් 3600 ක් පමණ අධ්‍යයන කටයුතුවල නිරතව සිටින කීර්තිමත් විද්‍යාලයක් බවත් ඔහු පෙන්වා දේ. එමෙන්ම පිළියන්දල මධ්‍ය විද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පාසලක් වන අතර ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති ජයග්‍රහණ හේතුවෙන් දින දින දිදුළන විද්‍යාලයක් බවත් දීප්තිමත් අනාගතයට විදු මව් ගෙන යාම සතුටක් බවත් ඔහු ප්‍රකාශ කරයි. (උඩවත්තගේ.,2010)"

නියෝජ්‍ය විදුහල්පතිවරුන් හය දෙනෙකු ද සහාකාර විදුහල්පතිවරුන් හතර දෙනෙකු ද ගුරුවරුන් 179කින් ද සමන්විත විද්‍යාලීය අධ්‍යයන කාර්යය මණ්ඩලය සිසුන්ගේ නැණස පාදනු ලබයි. නියෝජ්‍ය විදුහල්පතිවරු වශයෙන් එච්.එස්.හේවගේ මහතා, ආර්.එම්.එස්.රත්නායක මහත්මිය, ආර්.ඩී.සී.එස්.රණවක මහත්මිය, පී.එස්.එම්.සම්සුදීන් මහතා, ඩබ්.ඒ.ඒ.කරුණාරත්න මහතා සහ ඩබ්.ටී.එස්.ප්‍රේමශාන්ත මහතා කටයුතු කරනු ලබයි. සහකාර විදුහල්පතිවරුන් වශයෙන් පූජ්‍ය කේ.චන්ද්‍රවිමල හිමියන්, ඒ.සී.එන්.එන්.කොස්තා මහත්මිය, චන්ද්‍රා කළුඅග්ගල මහත්මිය සහ එම්.එල්.ආර්.ප්‍රනාන්දු මහත්මිය කටයුතු කරති. එමෙන්ම ශ්‍රේණි ප්‍රධානාචාර්යවරුන් ද සියලුම ගුරුභවතු ද පාසලේ උන්නතිය වෙනුවෙන් සිය දායකත්වය නොඅඩුව ලබා දීමට ඇප කැප වී සිටිති.

විද්‍යාලයේ අධයාපනික දියුණුව පිළිබඳ සලකා බැලීමේදී ආසන්නතම වාර්තාගත තොරතුරු හමු වන්නේ 2017 වර්ෂයෙහි මුද්‍රණය කරන ලද පිළියන්දල මධ්‍ය විද්‍යාලයීය වාර්තාවෙනි. එහි සඳහන් වන ආකාරයට 2017 වර්ෂයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 402 නෙකු පෙනී සිටි අතර ඉන් 394 දෙනෙකු අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී  ඇත. ඉන් උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 99% කි (පි. ම. ම. වි., 2017).

තවද එහි විශිෂ්ට දක්ෂතා දැක්වූවන් ලෙස A සාමාර්ථ නවයක් (09) ක් ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 54 කි. ඉන් A සාමාර්ථ අටක් (08) ක් ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 47 කි. 2017 වර්ෂයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 372 දෙනෙකු පෙනී සිටි අතර ඉන් 244 දෙනෙකු උසස් පෙළ විභාගය සමත් වී ඇත. සමස්ථ ප්‍රතිඵලය ප්‍රතිශතයක් ලෙස 65.59% කි.

දක්ෂතා දක්වමින් 2017 අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් A සාමාර්ථ තුනක් (03) ක් ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 11 කි.

විෂය සමගාමී ක්‍රියාකාරකම් මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් වශයෙන් පාසල තුළ පිහිටුවා ඇති සංගම් මඟින් සිසුන්ගේ නායකත්ව පුහුණුව හා පෞරුෂ සංවර්ධනයට මහඟු කාර්යයක් ඉටු කරනු

ලබයි. එම සංගම් ලෙස බෞද්ධ සංගමය, මත්ද්‍රව්‍ය සංගමය, ඡායාරූප සංගමය, මාධ්‍ය ඒකකය සංගමය, කනිෂ්ඨ විද්‍යා සංගමය, ජ්‍යෙෂ්ඨ සංගමය, නාට්‍ය සංගමය, තාරකා විද්‍යා සංගමය, කලා සංගමය, වාණිජ සංගමය, කනිෂ්ඨ ශිෂ්‍ය නායක සංගමය, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක සංගමය, සාමාන්‍ය දැනීම සංගමය, ගෘහ ආර්ථික විද්‍යා සංගමය, චිත්‍ර සංගමය, ගුවන් පියාසර සංගමය, නව නිපැයුම් සංගමය, පරිගණක සංගමය, ජීවිතාරක්ෂක සංගමය, ජපන් භාෂා සංගමය, ඉංග්‍රීසි සාහිත්‍ය සංගමය, සිංහල භාෂා හා සාහිත්‍ය සංගමය, සිංහල විවාද සංගමය, පරිසර සංගමය, සාමාන්‍ය දැනීම සංගමය, පුස්තකාල පාඨක සංගමය, බාලදක්ෂ සංගමය, බාල දක්ෂිකා සංගමය, බාලක ශිෂ්‍යභට සංගමය, බාලිකා ශිෂ්‍යභට සංගමය, ශිෂ්‍යභට තූර්ය වාදක බාලක සංගමය, ශිෂ්‍යභට තූර්ය වාදක බාලිකා සංගමය, ශාන්ත ජෝන් ගිලන් රථ සංගමය, කෘෂි විද්‍යා සංගමය, රිය නියාමක සංගමය, පිහිනුම් තටාකාංගන සංගමය, මුද්දර සමාජය, තාක්ෂණ විද්‍යා සංගමය සහ ශිෂ්‍ය පාර්ලිමේන්තුව වශයෙන් නම් කළ හැක(පි. ම. ම. වි., 2017)

පිළියන්දල මධ්‍ය විද්‍යාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් ජාතික මෙන්ම ජාත්‍යන්තර ජයග්‍රහණ අත්පත් කරගෙන තිබීම ද සුවිශේෂ කරුණකි. ඒ අතර ක්‍රිකට් ක්‍රීඩාව සහ රගර් ක්‍රීඩාව විශේෂ වේ. පා පන්දු, දැල් පන්දු, අත් පන්දු, පිහිනුම්, චෙස්, කැරම්, බැට්මින්ටන්, කරාතේ, මලල ක්‍රීඩා ආදී විශාල ක්‍රීඩා ප්‍රමාණයක් පිළියන්දල මධ්‍ය විද්‍යාලය තුළ සිසුහු ප්‍රගුණ කළරති. විද්‍යාලයීය පිහිනුම් තටාකය ද විද්‍යාලයට නවමු එළියක් ගෙන එයි. සෞන්දර්යය අංශයේ නර්තන අංශයෙන් ලද ජයග්‍රහණ සුවිශේෂී වනුයේ නොකඩවා වසර ගණනක් සමස්ථ ලංකා ජයග්‍රහණ ලැබීම හේතුවෙනි. වාර්ෂිකව පවත්වනු ලබන සුසර රංග සරණි විවිධ ප්‍රසංගය විද්‍යාලීය කලා කුසලතාවන්ගෙන් හෙබි දූ දරුවන්ට කදිම තෝතැන්නකි.

***"සිරිබර මැදි විදුහල් මාතා***

***දිනේ පිළියන්දල විදුහල් මාතා"***

**මූලාශ්‍රය**


- පිළියන්දල මධ්‍ය විද්‍යාලීය ලොග් පොත ඇසුරෙනි.
- පි. ම. ම. වි. (2004). වසර 117ක අභිමානය ගෙන ආ ඉතිහාස කතාවෙන් බිඳක්. 117වන සැමරුම් කලාපය, පිළියන්දල.
- පි. ම. ම. වි. (2017). පිළියන්දල මධ්‍ය විද්‍යාලීය ත්‍යාග ප්‍රදානෝත්සවය 2017. පිළියන්දල.
- උඩවත්තගේ.ඩී.පී. (2019), සම්මුඛ සාකච්ඡා, විදුහල්පති, පිළියන්දල මධ්‍ය විද්‍යාලය, පිළියන්දල, 2019.09.01
- http://www.pilicentral.sch.lk/09.09.2019/8.32pm
- https://www.facebook.com/pg/piliyandalacentral/09.10.2019/6.02pm

## ඡායාරූප




ඡායාරූප අංක 01



ඡායාරූප අංක 02




ඡායාරූප අංක 03




ඡායාරූප අංක 04



ඡායාරූප අංක 05



ඡායාරූප අංක 06




ඡායාරූප අංක 07



ඡායාරූප අංක 08




ඡායාරූප අංක 09



ඡායාරූප අංක 10



ඡායාරූප අංක 11

ඡායාරූප අංක 12



ඡායාරූප අංක 13

# සබරගමුවේ නූතන අධ්‍යාපන කේන්ද්‍රස්ථානය "පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය"

**චිරාත් ඉන්දුම දිගෝආරච්චි**
පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
chirath.digo@gmail.com

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ දැනුම ප්‍රවාහයෙහි කේන්ද්‍රස්ථානය විහාරස්ථානයයි. ඒවා පිරිවෙන් නමින් ව්‍යවහාර විය. මෙම විහාර විද්‍යස්ථාන පදනම් කොටගෙන ශිෂ්‍යයෝ දහස් ගණනක් අධ්‍යාපනය ලැබූහ. ලක්දිව රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීම සමඟ අගනුවර ආශ්‍රිත විහාර පදනම්කොටගෙන අධ්‍යාපන ආයතන දියුණුවිය. ලිපි ලිවීම, කියවීම හා ත්‍රිපිටක ධර්මය පිරිවෙන්වල ඉගැන්වීම සිදුවිය. දඹදෙණි, කෝට්ටේ යුග වනවිට පිරිවෙන් පදනම් කොටගෙන පාලි, සංස්කෘත, ද්‍රවිඩ, ප්‍රාකෘත, දීන, ජාවක, අරාබි, පංජාබි, පර්ෂි, තෙළිඟු, කර්ණාටක ආදී භාෂාවන් ද ගණිතය, ඉතිහාසය, ජ්‍යොතිෂ්‍යය, වෛද්‍ය ශාස්ත්‍ර, ව්‍යාකරණ, තර්ක න්‍යාය හා ලලිත කලා ආදියද පිරිවෙන් විෂය මාලාවට එක් විය.

ඒ අනුව පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වූයේ දැනුම සමාජගත කළ හැකි ගුරුවරුන් බිහි කිරීමයි. මනා අධ්‍යාපනයත්, ශික්ෂණයත් ලත් මෙම පැවිදි, ගිහි ගුරු පිරිස ලාංකීය සියලු ජනයාට මගපෙන්වන නායකත්වයක් විය.

ශ්‍රී ලංකාව වෙත එල්ල වූ විදේශ ආක්‍රමණ හේතුකොටගෙන මෙරට අධ්‍යාපනය බිඳවැටී තිබුණු යුගයක පිරිවෙන් අධ්‍යාපනය ඇති කරලීම පිණිස මහත් පරිශ්‍රමයක් දැරූ හිමිනමක ලෙස වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන් දැක්විය හැකිය. ඒ හිමියන්ගේ මග යමින් පිරිවෙන් අධ්‍යාපනයේ වර්තමාන ජයවර්ධනපුර, කැලණිය වැනි විශ්වවිද්‍යාල බිහි වීම දක්වා වූ මූලාරම්භක විද්‍යායතනය පැල්මඩුල්ල රජමහා විහාරය තුළ ආරම්භ කරන ලද්දේ ගාල්ලේ ශ්‍රී මේධංකර හිමිපාණන් විසිනි. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම කාර්යය වූයේ ශ්‍රී පාදස්ථානාධිපති පදවිය හොබවමින් ඉඳුරුවේ සුමංගල, වලානේ ශ්‍රී සිද්ධාර්ථ, වස්කඩුවේ සුභූති ආදී කීර්තිමත් පැවිදි ශිෂ්‍ය පරපුරක් බිහි කිරීමයි. ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් ප්‍රමුඛ සඟ පරපුර විසින් අස්ගිරි පෝයමළු විහාර කේන්ද්‍රකොට දල්වාලූ ශාස්ත්‍ර ප්‍රදීපය සහස්‍ර ගුණයකින් ආලෝක කරන ලද්දේ පැල්මඩුල්ල මහා විහාරයේ තෙරවරුන් විසිනි. ඉන් ආලෝකවත් වූ අධ්‍යාපනික මූලස්ථාන අතර රත්මලානේ පරමධම්මචේතිය මූලායතනයද විය. අනතුරුව බිහිවූ විද්‍යෝදය, විද්‍යාලංකාර මහ පිරිවෙන් බිහිවීමේ ශාස්ත්‍රෝදය ඇති කරන ලද්දේ මෙකී පැල්මඩුල්ල මූලික පිරිවෙනෙහි දායකත්වයෙනි.

## පුරාණ පැල්මඩුල්ල වෙහෙර

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ පිහිටි දිස්ත්‍රික්ක දෙක අතරින් රත්නපුර දිස්ත්‍රික්කයට ප්‍රධාන තැනක් හිමි වන අතර වත්මන් රත්නපුරය මහනුවර යුගයේදී ප්‍රධාන කෝරල හතකට අයත් ව තිබූ බව සඳහන් වේ. එනම් කුරුවිට කෝරළය, නවදුන් කෝරළය, අටකලන් කෝරළය, කුකුළු කෝරළය හෙවත් දික්ගම්පතකෝරළය, කඩවතු හෙවත් අතරවා කෝරළය, මැද කෝරළය හා කොලොන්න කෝරළය වශයෙනි (ඥාණවිමල හිමි,2001). මෙම ප්‍රධාන කෝරළ පදනම්කොටගෙන වෙහෙර විහාර රාශියක් පිහිටා තිබූ බව සඳහන් වන අතර ඒවා අද වන තෙක්ම ජීවමානව පවතී.

සබරගමුවේ ඓතිහාසිකත්වය අතින් ප්‍රමුඛස්ථානයක් ගන්නා ස්ථානයක් ලෙස ශ්‍රී පාදස්ථානය දැක්විය හැකිය. ශ්‍රී පාදස්ථානය පදනම් කොටගෙන ඒ වටා ගොඩනැගී ඇති පූජනීය ස්ථාන මෙරට භාෂා සාහිත්‍යමය හා ධර්ම ශාස්ත්‍රීය අතින් වැදගත් මෙහෙයක් ඉටුකළ අතර එය නූතන අධ්‍යාපනයේ දියුණුව කෙරෙහිද බලපෑවේය.

දඹදෙණි යුගයේ සිට පැවත එන ධර්මකීර්ති සඟ පරපුරෙහි කේන්ද්‍රස්ථානයක් වූ පලාබත්ගල ආරණ්‍ය සේනාසනය මෙම ප්‍රදේශය පදනම් කොටගෙන පැවතීම තවත් වැදගත් කරුණකි. ඇතැම් උගත්හු දුටුගැමුණු කතා පුවත හා සම්බන්ධ මලියදේව මහරහතන් වහන්සේ මෙම සේනාසනය ආරම්භ කරන්නට ඇතැයි විශ්වාස කරති. පලාබත්ගල ආරණ්‍ය සේනාසනය අනුරාධපුර යුගය දක්වා සම්බන්ධ කරන ඇතැම් උගතුන් පොළොන්නරු යුගය වනවිට දිඹුලාගල හා පලාබත්ගල මෙරට පුණ්‍ය සම්මත ආරණ්‍යායතන දෙක ලෙස පැවැති බව දක්වයි (එම). ධර්ම ශාස්ත්‍රීය සේවයේ තවත් වැදගත්

සංධිස්ථානයක් ලෙස කුරුවිට කෝරළයේ කරංගොඩ පොත්ගුල් විහාරය දැක්විය හැකි අතර වළගම්බා රාජ්‍ය කාලයේ මාතලේ අළුවිහාරයේ ග්‍රන්ථාරූඪ කළ ත්‍රිපිටක පොත් ව්‍යාප්ත කිරීමේ සබරගමු මධ්‍යස්ථානය ලෙස පැවතී ඇත. මෙකී ධර්මශාස්ත්‍රීය අතින් වටිනා මෙහෙයක් ඉටු කළ වෙහෙර විහාර ස්ථානයන්හි පිහිටීම නූතන අධ්‍යාපන ප්‍රබෝධය ඇති කිරීමෙහිලා ප්‍රධාන කේන්ද්‍රස්ථානය වූ නවදුන් කෝරළයට අයත් පැල්මඩුල්ල රජමහා විහාරය වැනි විහාරයක් බිහිවීමට බලපෑවේය.

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත්ව පිහිටි විහාරස්ථානයක් වන පැල්මඩුල්ල විහාරස්ථානය කුට්ටාපිටිය, කිරිබත්ගල කඳු වැටිවලට මැදිවූ දෙනවකසානුව නම් වූ ප්‍රදේශයේ කුඩා උස් බිමක පිහිටා තිබේ. ඓතිහාසික තොරතුරු පිළිබඳ විමසීමේදී මෙය අනුරාධපුර යුගය දක්වා දිව යන බවත් පොළොන්නරු යුගයේ ශාසනික කතිකාවත් සඳහා වැඩම කළ මහ සඟරුවන වැඩසිටි පින් බිමක් ලෙසත් දක්වයි. දඹදෙණි යුගයේ පලාබත්ගල පතිරාජ පිරිවෙන් පරපුරේ ස්ථානයක් ලෙසත්, ධර්මකීර්ති සඟ පරපුරේ සංඝයාගෙන් ආරම්භව පැවත එන බවටත් පොතපතෙහි සඳහන් වෙයි (රාහුල හිමි,2016)[1]

පැල්මඩුල්ල වෙහෙරේ පුරාවෘත්තය දෙස බලද්දී සීතාවක රාජසිංහ රජු දවස පමණ සිට තොරතුරු අනාවරණය වෙයි. සීතාවක රාජසිංහ රජ දවස පැල්මඩුල්ල වෙහෙරට ආසන්න කන්දක විහාරයක වාසය කළ කිරිබත්ගල උන්නාන්සේ නම් තෙර නමක් වූ බවත් වර්තමානයේ මෙම විහාරය පැල්මඩුල්ල විහාරයට හිමිව පවතින බවත් සඳහන් වෙයි. මෙම කිරිබත්ගල හිමියන් වාසය කළ කන්ද පසුව හාන්දුරුකන්ද නම් විය. මෙසේ වාසය කිරීමට හේතු පාදක වී ඇත්තේ හිමිනමක එවක සීතාවක රාජසිංහ රජුගෙන් බේරී සැඟවී සිටීමට බව ඇතැමෙක් ප්‍රකාශ කරයි. උන්වහන්සේගෙන් පසුව උන්වහන්සේගේ ගෝල හිමිනමක් වූ සපුගස්කන්දේ හිමි නම් හිමි නමක් මෙහි වාසය කළ බව සඳහන් වේ. උන්වහන්සේ ශ්‍රී පාදස්ථානය පොත්ගුල් විහාරය ආදී විහාරස්ථාන ද භාරව කටයුතු කර තිබේ. සපුගස්කන්දේ හිමියන් හාන්දුරුකන්දේවිහාරය පදනම් කොටගෙන හෝ පැල්මඩුල්ල විහාරය පදනම්කොටගෙන වැඩ වාසය කල බවට නිවැරදි තොරතුරක් සඳහන් නොවෙයි. කෙසේ නමුත් හිමියන් මෙම විහාරස්ථාන දෙකෙහිම වැඩ වාසය කරන්නට ඇති බව මේ පිළිබඳ තොරතුරු අධ්‍යයනයේ දී අනුමාන කළ හැකිය. සපුගස්කන්දේ හිමියන් ශ්‍රී විජය රාජසිංහ රජුගෙන් පැල්මඩුල්ල ගම්වරය ද ලැබූ බව මෙම ඓතිහාසික සටහන්වල සඳහන් වෙයි. මෙම අවධියේ දී වැලිවිට ශ්‍රී සරණංකර හිමිපාණන් කෙරෙහි පැහැදී ධර්මාවබෝධය ලබමින් සිටී සපුගස්කන්දේ හිමියන් 1741 දී ශ්‍රී පාදස්ථානය සරණංකර හිමියන්ට බාරදුන් බවද සඳහන් වේ (එම).

මෙහි අතුරු කතාවක් වුවත් පැල්මඩුල්ල විහාරයේ වැදගත්ම සිදුවීම වන්නේ ඉන් පසුවය. එනම් සපුගස්කන්දේ හිමියන්ගේ ඥාති හිමිනමක් වූ වේහැල්ලේ ධම්මදින්න හිමි මේ අවධියේ දී මහනුවරට ගොස් ධර්ම විනය හදාරන්නට විය. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු උන්වහන්සේගේ උගත්කම, දේහ විලාසයන් හා ක්‍රියා ශූරත්වයත්, ප්‍රඥාවත් අවබෝධකරගෙන සරණංකර හිමියන් සමග සාකච්ඡා කොට 1728 දී රුහුණු මහා කිරිවෙහෙර පදවිය ද පිරිනමා තිබේ. මහා පාණ්ඩිත්‍යයක් තිබූ වේහැල්ලේ ධම්මදින්න හිමියන් 1751 දී කීර්ති ශ්‍රී රාජසිංහ ජතුමාගෙන් ශ්‍රී පාදස්ථානය හා විහාරගම් ලැබූ බව සඳහන් වේ. මෙකල වැලිවිට සරණංකර සංඝරාජ ස්වාමින් වහන්සේ පැල්මඩුල්ලේ මෙම ස්ථානයේ පැවති කුඩා විහාරස්ථානය සමඟ නිතර සබඳතා පැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙහි ටැම්පිට පිළිමගෙය නිර්මාණය වූ බව සඳහන් වෙයි.



පැල්මඩුල්ල විහාරයේ ටැම්පිට විහාරය 2019.09.01

[1]අරුණෝදය ශාස්ත්‍රීය සංග්‍රහය

කුඩා ටැම්පිට පිළිමගෙය කණු දාසයක් මත රඳවා තිබේ. සපු හා නා දැව යොදා ගනිමින් දැව තට්ටුව නිර්මාණයකොට තිබේ. විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් මේ වන විට දැකගත නොහැක.

ලංකාවේ ඉංග්‍රීසි පාලන සමය වනවිට සබරගමුවේ ප්‍රධාන බෞද්ධ හා අධ්‍යාපන මධ්‍යස්ථානය වශයෙන් පැවතියේ පැල්මඩුල්ල රජමහා විහාරයයි. 1751 දී වේහැල්ලේ ධම්මදින්න හිමි රුහුණු රට නායක තානාන්තරය ද ඇතිව පැල්මඩුලු වෙහෙරට වැඩම කොට තිබේ. මෙහි සිට ශ්‍රී පාදස්ථානය ද වැඩිදියුණු කරමින් විශාල ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසක් තැනූහ. වරින්වර ශ්‍රී පාදස්ථානය, පලාබත්ගල, කරංගොඩ පොත්ගුල් වෙහෙර, පැල්මඩුල්ල වෙහෙර ආදී ස්ථානවල වාසය කරමින් වෙහෙර විහාරස්ථාන වැඩිදියුණු කළ අතර අධ්‍යාපනයට ද මූලික තැනක් දී තිබේ. ධම්මදින්න හිමි 1776 මැයි මස 26 වන දින පොත්ගුල් විහාරයේ දී අපවත් වී වදාළහ (එම).

ඉන් අනතුරුව කෙටි කාලයක් පැල්මඩුල්ල විහාරයේ සංඝ නායකත්වය සිටි ගුණරතන මහා ස්වාමීන් වහන්සේත් උන්වහන්සේගෙන් පසුව ශ්‍රී පාදය ඇතුළු ස්ථාන භාරව කටයුතු කළ ධම්මදින්න හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක් වන කුඩා කඹුරුපිටියේ හිමියන් පිළිබඳවත් තොරතුරු සඳහන් වේ. අනතුරුව කිරිනැලියේ හිමි, කරතොට ධර්මාරාම හිමි යන හිමිවරුන් නායක පදවිය පැල්මඩුල්ල වෙහෙරේ දරා තිබේ. පැල්මඩුල්ල විහාරයේ වාසය කරමින් ධර්මාරාම හිමියන් විසින් රචිත "බාරස කාව්‍ය" නම් ප්‍රබන්ධයට රජුගෙන් පල්ලේබැද්ද ගම්වරය ලැබූ බවද සඳහන් වේ. ඉන් පසු කාලයකදී උඩරට රජු ධර්මාරාම හිමියන් සමඟ උදහස් වීමෙන් මෙම හිමියන්ට සබරගමුව තහංචි විය. ඉන් අනතුරුව මෙම වෙහෙර අධිපති ධූරය භාර වූයේ ධර්මාරාම හිමියන්ගේ ශිෂ්‍යයකු ව සිටි ගාල්ලේ මේධංකර හිමියන්ටය. ගාල්ලේ මේධංකර හිමියන් පොත්ගුල් වෙහෙර දී පැවිදි බව ලබා මාතර වේරගම්පිට විහාරයේ ධර්ම විනය ශබ්ද ශාස්ත්‍ර හා දෙස් විදෙස් භාෂා දැන උගත් බව සඳහන් වේ. 1823 දී ශ්‍රී පාදස්ථානය ගාල්ලේ මේධංකර හිමියන් ට හිමිවූ අතර 1826 දී ඒ සඳහා ආණ්ඩුකාරතුමා විසින් සන්නස් පත්‍රයක් ද පිරිනමා තිබේ. එම සන්නස අදටත් සුරක්ෂිතව මෙම විහාරස්ථානයේ ඇත. ගාල්ලේ ශ්‍රී මේධංකර නාහිමියෝ පැල්මඩුල්ල වෙහෙරේ ශාස්ත්‍ර ශාලාවක් හෙවත් පිරිවෙනක් ආරම්භ කළ බවද සඳහන් වේ. ලංකාවේ චිරප්‍රසිද්ධ මහා ප්‍රාඥයකු වූ ගාල්ලේ නාහිමියන්ගෙන් ඉගෙනුම සඳහා විවිධ පළාත්වලින් ගිහි පැවිදි විශාල පිරිසක් පැල්මඩුලු වෙහෙරට පැමිණ තිබේ. ඒ අතරින් වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමිය හා වස්කඩුවේ ශ්‍රී සුභූති මියන්ද අන්තේවාසික ශිෂ්‍යයෙකු වූ ඉඳුරුවේ සුමංගල හිමි ප්‍රමුඛය. වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන්ද වසර අටක් ඉගෙනුම ලබා ඒ වෙනුවෙන් ලබාදුන් ගුරු පූජාව ලෙස පූජා කළ කලුවර කවිච්චිය අදටත් විහාරස්ථානයේදක්නට ලැබෙයි. වස්කඩුවේ හිමියන් වසර හයක් ඉගෙනුම ලබා කවිච්චියක් හා ආසන තුනක් පූජා කොට තිබේ.[2]

ගාල්ලේ ශ්‍රී මේධංකර හිමියන් විසින් පැල්මඩුල්ල වෙහෙරේ ශාස්ත්‍ර ශාලාවක් ඉදි කරමින් ආරම්භ කළ පිරිවෙන් ස්ථානය ක්‍රම ක්‍රමයෙන් මහා විද්‍යායතනයක් බවට පත් විය. එනම් ආරම්භයේදීම මහා යතිවරුන් බිහිකල කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම එහි මූලික අඩිතාලම වන්නට ඇති බව සිතිය හැකිය. ඒ අනුව ගාල්ලේ මේධංකර හිමියන්ගෙන් පසු විහාරය තම ශිෂ්‍යයා වූ මහා පාණ්ඩිත්‍යයක් ඇති ඉඳුරුවේ ශ්‍රී සුමංගල හිමියන්ට පවරන ලදී. 1836 වසරේ දී පුස්කොල තුඩපතක ලියා පවරන ලද අතර එම තල්පත ලියූ බවට වලානේ සිද්ධාර්ථ භික්ඛු යනුවෙන් සටහන්කරද තිබේ. ඉන්පසුව වලානේ හිමියන් ඉගෙනුම අවසන් කොට රත්මලානට වැඩම කළ අතර වස්කඩුවට වැඩමකර සිටි සුභූති හිමියන් නැවත පැල්මඩුල්ලට පැමිණ ඉඳුරුවේ හිමියන් වෙතින් පාලි සංස්කෘත හැදෑරූ බවද සඳහන් වෙයි. 1826 දී ආරම්භ කරන ලද පිරිවෙන 1868 දක්වා සුමංගල නාහිමි විසින් පවත්වාගෙන ගොස් තිබේ.

**හයවන මහා ධර්ම සංගායනාව**

සබරගමු පළාතේ වර්තමානයේ අනුමත පිරිවෙන් අනූ එකක් අතුරින් පැරණිම පිරිවෙන වන පැල්මඩුල්ල පිරිවෙන් ආයතනයයේ ශාස්ත්‍රීය ප්‍රබෝධයේ උච්චතම මෙන්ම අසහාය පූජනීය අවස්ථාව වන්නේ මෙම අවධියයි. එනම් 1864/1868 වර්ෂවලදී මෙම විහාරස්ථානය කේන්ද්‍ර කොටගෙන පැවැත්වූ හයවන ධර්ම සංගායනාව විහාරස්ථානයෙන් මෙන්ම ඉන් පසුව බිහිවූ බොහෝ විද්‍යා ස්ථානයන්හි ආරම්භයට හේතු විය. ඒ අනුව ශ්‍රී ලංකාව පුරාම එවක පැතිරීගිය ධර්ම ශාස්ත්‍රීය පුනරුදය සමකාලීන සිංහල පුවත්පත්වල පවා පළ වී ඇත. එනම් මෙම සංගීතියේ මූලික අරමුණ වී ඇත්තේ පෘතුගීසි

[2]ශාස්ත්‍රවේදී පූජ්‍ය රන්වල පඤ්ඤානන්ද හිමි සමඟ කල සාකච්ඡා මගින්

ලන්දේසි ඉංග්‍රීසි පාලන තන්ත්‍ර වලින් ශ්‍රී ලංකාවේ භික්ෂු සමාජයටත් ධර්මශාස්ත්‍රීය අධ්‍යාපනයටත් බුදුදහම කේන්ද්‍ර කොටගත් සිංහල සංස්කෘතියටත් වැදී තිබුණු මරු පහරින් ජාතිය, ජාතික අධ්‍යාපනය ආරක්ෂා කරගැනීමයි.

මේ සඳහා ගාල්ලේ සිට පැල්මඩුල්ල දක්වා සංගායනාවට යෝග්‍ය ධර්මධර විනයධර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දින විස්සක් තිස්සේ මහ පෙරහරින් වැඩමවාගෙන පැමිණි බවත් සියම් හා අමරපුර යන නිකායන් දෙකේ භික්ෂූන් වැඩම කරවූ බවත් සඳහන් වෙයි. එලෙස පැමිණි භික්ෂූන් අතර

සියම් මහා නිකාය

- රත්මලාන පරමධම්මචේතිය පිරිවේනාධිපති ගණාචාර්ය වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- ගණාචාර්ය ගම්පොල ශ්‍රී රතනපාල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- හික්කඩුවේ ශ්‍රී සුමංගල ශ්‍රී පාදස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- ගණාචාර්ය යාත්‍රාමුල්ලේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- පුවක්දණ්ඩාවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අමරපුර නිකායෙන්

- බුලත්ගම ධම්මාලංකාර මහා ස්ථවිරපාදයන් වහන්සේ
- ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- රන්දොඹේ ශ්‍රී ධම්මාලංකාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- දොඩම්දූව ශ්‍රී පියරතන තිස්සාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- වැලිගම ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- වස්කඩුව ශ්‍රී සුභූති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යන හිමිවරු වෙති.

(මෙත්තානන්ද හිමි,2013)

අනූපමේය ශාසනික මෙන්ම ජාතික සේවයක් වෙනුවෙන් හෘදයාංගමව සිදුකර ඇති සංගායනාවේ උත්තේජනයක් වශයෙන් විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් දෙක ආරම්භ වූ බව සඳහන් වේ. (එම) එම පිරිවෙන් තත්කාලීන ලෝකයට විවෘත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාල බවට පරිවර්තනය වී ඇත. එනම් විද්‍යෝදය පිරිවෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙසත් විද්‍යාලංකාර පිරිවෙන කැලණිය විශ්වවිද්‍යාලය ලෙසත් වර්තමානය වන විට මහා ශාස්ත්‍රායතන බවට පත්ව තිබේ.

මෙම මහා සංගායනාව විනය සංගායනාවක් ලෙස ඇතැම් විචාරකයෝ පවසති. අටුවා සහිත විනය පිටකය සංගායනා කොට අවසන් කළ බවත් සෙසු සූත්‍ර හා අභිධර්ම පිටක දෙකේද පාඨ ශෝධනය කළබවත් සඳහන් වෙයි. තුන්පිටකයම සංගායනා කිරීමට මූලික අදහසක් පැවතුණ ද කාලයාගේ ඇවෑමෙන් ඇති වූ දුෂ්කරතා නිසා එය මගහැරී තිබේ. එසේ වුව ද විනය පිටකය සංගායනා කොට ඇත.

එවක ලක්දිව පැවතී ඇත්තේ සියම් අමරපුර යන නිකාය දෙක පමණි. කිසිම භේදභින්න තාවයකින් තොරව පාර්ශව දෙකේම භික්ෂූන් මේ සඳහා සහභාගි කොට ගැනීමට හැකි වූ බව සඳහන් වේ. ඒ අනුව සියම් නිකාය වෙනුවෙන් හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ද අමරපුර නිකාය වෙනුවෙන් අතිගරු ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද නායක හිමියන් ද මූලාසනය හොබවා ඇත. එතෙක් ශාසන ඉතිහාසයේ පැවැති පැවිදි පක්ෂය පමණක් සම්බන්ධ වූ සංගායනා අතරින් ගිහි පක්ෂය ද සහභාගි කොට ගත් එකම සංගායනාව ලෙස මෙම සංගායනාව හඳුන්වයි. එනම් එසේ සම්බන්ධ වී ඇත්තේ හසළ බුද්ධිමතකු වන බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමා ය. ලක්දිව එවකට සිටි ව්‍යක්ත, බහුශ්‍රැත, ධර්ම, විනයධර උගතෙකි.



සුදර්ශන ධර්ම මන්දිරය 2019.09.01

මෙම මහා සංගායනාව 1867 ජූලි මස 25 වනදා ආරම්භ කොට 1868 ජනවාරි 5 වැනිදා අවසන් කොට ඇත. මෙම උදාර කර්තව්‍යය කරඇත්තේ නවදුන් කුකුළු කෝරලයේ රට ලැබී කරවූ ඉද්දමල්ගොඩ අබයකෝන් අතපත්තු මුදියන්සේ රාළහාමි හෙවත් සබරගමු මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ තුමාය.

නිලමේතුමන් විසින් මෙම සංගායනාව සඳහා දර්ශනීය සුදර්ශන නම් වූ ධර්ම මන්දිරයක් ගොඩනගන ලදී. වර්තමානයේ ද විහාරස්ථානය මූලික කොටගෙන මෙම ධර්ම මන්දිරය වැජඹෙනු දැකගත හැකිය. මෙම දර්ශනීය ධර්ම මන්දිරය ගොඩ නැගීමෙහිලා පුරෝගාමී වී ඇත්තේ දොලොස්වල අධිකාරම්තුමාගේ ළඟම ඥාතිවරයෙකු වන වාරිගම නිළමේ තුමා විසිනි. අනතුරුව නිලමේතුමාගේ ළඟම ඥාතිවරයකු වන ඉද්දමල්ගොඩ බස්නායක නිළමේතුමා මෙය අංග සම්පූර්ණ කොට ප්‍රදේශයේම ඇති උසස් ම කලාත්මක නිර්මාණය හැටියට නිමාවට පත් කොට ඇත. ඒ අනුව සියලු අංගයන්ගෙන් සම්පූර්ණ වූ සංඝාවාස මන්දිරය 1865 අප්‍රේල් මස 20 ගාල්ලේ ලෝකෝපාකාර කන්තෝරුවේදී අච්චු ගසා බාරදී තිබේ.



ධර්ම මන්දිරයේ ඇතුලත සිතුවම් පලක 2019.09.01



ධර්ම මන්දිරයේ ඇතුලත සිතුවම් සහිත පිරිත් මණ්ඩපය සහ වියන 2019.09.01



ඉද්දමල්ගොඩ බස්නායක නිළමේතුමාගේ සුසානය

**මහා සංගායනාවට පසු අවධිය**

1868 දක්වා ඉඳුරුවේ සුමංගල නාහිමි විසින් අධිපති ධූරය දැරූ පැල්මඩුල්ල විහාරයේ ඉන් අනතුරුව රොටුඹ රේවත, කිරඹ රේවත, ගලගම අත්ථදස්සි, ඉඳුරුවේ පියදස්සි, වල්ගම සුවණ්ණජෝති, පුවක්දණ්ඩාවේ සුමංගල යන නාහිමිවරුන් අධිපති ධූරය දරා තිබේ. ඉන් අනතුරුව 1911 වනතෙක් ඉඳුරුවේ පියදස්සී නාහිමියන් විසින් පැල්මඩුල්ල වෙහෙර අධිපතිත්වය දරා ඇත. පියදස්සි හිමියන්ගේ අපවත් වීමෙන් 1918 දක්වා හාල්දඬුවන ශ්‍රී බුද්ධරක්ඛිත හිමියන් ද 1918 පටන් හාල්දඬුවන ශ්‍රී ධර්මරක්ෂිත හිමියන්ද අධිපතීත්වය දරා තිබේ.

ත්‍රිපිටකාචාර්ය සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක පදවිය දැරූහාල්දඬුවන ශ්‍රී ධර්මරක්ෂිත හිමියෝ නව අධ්‍යාපන ක්‍රම අනුව පිරිවෙන අනුබද්ධ ආයතනයක් වශයෙන් හා පැවිදි සිසුන්ට ඉගෙනුම ලබා දෙන විශේෂ වූ ස්ථානයක් සේ වැඩිදියුණු කළහ. අණ පනත් අනුව ලියාපදිංචි පිරිවෙනක් බවට

පත්වීමෙන් පසුව 1918 සිට පරිවේණාධිපතිත්වයේ එහිමියන් කටයුතු කොට තිබේ. කොළඹ මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙනින් උසස් අධ්‍යාපනය හැදෑරූ හිමියන් මිෂනාරී අධ්‍යාපනය පැවති යුගයක දේශීය අධ්‍යාපනය නගා සිටුවීම සඳහා මහත් වෙහෙසක් දරා තිබේ. මෙහිමියන් විසින් 1925 දී පමණ ශ්‍රී සුමංගල දහම් පාසල ආරම්භ කල අතර බෞද්ධ අධ්‍යාපනය ලබාදීම සඳහා භූමි භාගයක් හා ධනය පරිත්‍යාග කරමින් පැල්මඩුල්ල ගන්කන්ද ජාතික පාසල, පනාවැන්න ධර්මාරාම විද්‍යාලය, පාතකඩ බෞද්ධ විද්‍යාලය හා කාමරංගාපිටිය විද්‍යාලය යන විද්‍යාල ආරම්භ කරමින් ඒවා ඉදිරියට පවත්වාගෙන යාම සඳහා රත්නපුර බෞද්ධ සමිතියට බාරදී ලියාපදිංචි කොට ද තිබේ. පැල්මඩුල්ල මහා විහාර පිරිවෙන එවකට භාෂාන්තර විශාරදයෙකු වූ ඩැරල් පීරිස් මහතා හා එක්ව "රූපඅරුණ පිරිවෙන" නමින් විශ්වවිද්‍යාල අනුබද්ධ ආයතනයක් බවට පත්කිරීම උන්වහන්සේ වෙතින් සිදුව ඇත.ඒ අනුව මෙම කාලය තුළ ද විශාල ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසක් තැනුනහ. ඉඳුරුවේ පඤ්ඤාතිස්ස, වේහැල්ලේ ධම්මපාල පරවාහැර පඤ්ඤානන්ද, මුද්දුවේ පඤ්ඤාසේකර වැනි අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාකරන හිමිවරු රැසක් බිහිවූහ. ශාසනික සම්ප්‍රදායත්, බෞද්ධ උරුමයත් රැකගැනීමේ මහත් උතිසාහයක යෙදුණු කාල වකවානුවකි.[3]

මෙකල පිරිවෙනේ විභාග පරීක්ෂකවරු ලෙස අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්දමෛත්‍රී නාහිමියන් හා කඩවැද්දුවේ සිරිනිවාස හිමි ද, කටුකුරුන්දේ දේවානන්ද, ගනේගම ඉන්දසාර, හල්ගස්තොට දේවානන්ද වැනි හිමිවරුන් ද සහභාගී වී තිබේ.

ඉන් අනතුරුව උල්ලිඳුවාවේ ඤාණරතන, දම්පැල්ලේ ධම්මිස්සර, විල්ලඹියේ මලියදේව, තලගස්කන්දේ වජිර හා විල්ලඹියේ රාහුල යන හිමිවරුන් පරිවේනාධිපතිත්වය දරා තිබේ. 1981 වසරේ සිට මුද්දුවේ කීර්ති ශ්‍රී පඤ්ඤාසේකර නාහිමියන් පරිවේනාධිපතිධූරය දරා තිබේ. 2000 වසරේ සිට මේ දක්වා බෙංගමුවේ ශ්‍රී ධම්මදින්න මහනායක හිමියෝ පැල්මඩුල්ල රූප අරුණ පිරිවෙනේ අධ්‍යක්ෂ ධූරය හොබවති. උන්වහන්සේ රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති පදවිය, ශ්‍රී පාදස්ථානාධිපති පදවිය ඇතුළු වගකිවයුතු පදවි රාශියක් හොබවති.

රත්නපුර දිස්ත්‍රික්කයේ අද්විතීය ක්‍රියාකාරී පිරිවෙන් විද්‍යායතනයක් වශයෙන් වර්තමානය වන විටත් පවතින රූප අරුණ පිරිවෙන් විද්‍යායතනය උන්වහන්සේගේ නිරන්තර අධීක්ෂණය සහ මාර්ගෝපදේශනය යටතේ පවතී. වාස්තවික උන්නතීන් මැනවින් කළමනාකරණය කරගෙන ඉගෙන ගන්නා ගිහි, පැවැදි දූපුතුන් දෛනිකව සා පිපාසාවෙන් මුදවා අනාගත ලෝකයට ජයග්‍රාහී පිරිසක් බිහි කිරීම පෙර සේම අදත් මූලික අරමුණ කොට ගෙන තිබේ. සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාග මෙන්ම ප්‍රාචීන විභාග සඳහා ද වාර්ෂිකව විශිෂ්ට සාමාර්ථ ලබා ගන්නා සිසු පිරිසක් වසරක් පාසා බිහි කරන ආයතනයක් වෙයි. ඉගෙනුම ලබා උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබූ පිරිස ද බොහෝය.

වෙහෙරවිහාර මුල්කොටගෙන අධ්‍යාපන, ධර්ම, ශාස්ත්‍රීය සේවය ආරම්භ කළ යුගයේ සිටම අධ්‍යාපන ආයතනයක්ව පැවැති පැල්මඩුල්ල වෙහෙර සබරගමු පළාතේ පැරණිම අධ්‍යාපන ආයතනය යැයි පැවසිය හැකිය. 1751 වසර පමණ සිට වේහැල්ලේ ධම්මදින්න හිමිපාණන්ගේ මූලිකත්වයෙන් ජාතියත්, ආගමත්, ශාස්ත්‍රීය අධ්‍යාපනයත් නගාසිටුවීමේ නූතන අධ්‍යාපන ආයතනයක් ලෙස කාර්යය ආරම්භ කරන ලද අධ්‍යාපන ආයතනයයි. ධම්මදින්න හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත් කරතොට ධර්මාරාම, ගාල්ලේ මේධංකර, ඉඳුරුවේ සුමංගල යන හිමිවරු ශ්‍රීපාදස්ථායයේ අධිපති පදවියත්, සබරගමු මහා පදවියත්, පහතරට නායක පදවියත් දැරූ කීර්තිමත් පඬිවරුන් වෙයි.නන්දෙසින් පැමිණි පැවිදි ගිහි දෙපක්ෂයටම ධර්ම ශාස්ත්‍ර ශබ්දාලංකාර ඉගැන්වූ මූලස්ථානය වන පැල්මඩුල්ල වෙහෙරේ වලානේ සිද්ධාර්ථ, දොඩම්පහල දීපංකර, වස්කඩුවේ සුභූති යන හිමිවරු ද අධ්‍යාපනය ලැබූහ. ඒ අතරින් වලානේ සිද්ධාර්ථ ස්වාමීන්ද්‍රයන් වහන්සේ රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන ඇරඹූ අතර එහි උගත් හික්කඩුවේ සුමංගල, රත්මලානේ ධම්මාලෝක යන හිමිවරුන් විද්‍යෝදය, විද්‍යාලංකාර මහා පිරිවෙන් දෙක පිහිටුවා මෙරට පමණක් නොව දේශ දේශාන්තරවල පවා අධ්‍යාපනික ශාස්ත්‍රාලෝකයේ ප්‍රසිද්ධ වූහ. 1867/1868 සිදුකෙරුනු මහා ධර්ම සංගීතිය එකී අධ්‍යාපනික කර්තව්‍ය සඳහා මහත් උත්තේජනයක් සැපයීය. ඒ අනුව සියවස් දෙකකටත් වැඩි කාලයක සිට ශාස්ත්‍රීය අධ්‍යාපනය බෙදා දීම උදෙසා ඇපකැප වූ පැල්මඩුල්ල පුරාණ වෙහෙර නූතන අධ්‍යාපන මූලස්ථාන ඇතිකර නූතන

[3]මුත්තෙට්ටුපොල සෝමානන්ද හිමි රචිත ලිපියක් ඇසුරින්

අධ්‍යාපනය බිහිකරලීමේ සබරගමු මූලස්ථානය වූ බවත් එමගින් ලංකා දීපයම ඒකාලෝක වූ බවත් දැක්විය හැකිය.

**මූලාශ්‍රය**


- ඥාණවිමල හිමි කිරිඇල්ලේ, (2001), සබරගමුවේ පැරණි ලියවිලි, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.
- ඥාණවිමල හිමි කිරිඇල්ලේ, (1967), සපරගමු දර්ශනය, රත්නපුර ශාස්ත්‍රෝදය මුද්‍රණාලය, රත්නපුර.
- අරුණෝදය ශාස්ත්‍රීය සංග්‍රහය, (2016), ශ්‍රී රූප අරුණ පිරිවෙන් විද්‍යායතන සභාව.
- මෙත්තානන්ද හිමි නෙල්ලිවල, (2013), ඓතිහාසික පැල්මඩුලු ධර්ම සංගායනාව හා සුධර්මෝදය පුරාවත, නවෝද්‍යා බුක් බයින්ඩර්ස්, විජේරාම.
- සබරගමු වංශ කතාව, (2003), 2 වෙළුම, ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, නො 27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

# කන්නන්ගර සංකල්පයෙන් නැවුම් මාවතකට පිවිසි තක්ෂිලා ගමන් මග....

**ඉසුරු ගුණතිලක**
අභ්‍යන්තර විගණක, ටවර් හෝල් රඟහල පදනම.
isurugunathilaka@gmail.com

**පේෂිකා මධූෂි**
සංවර්ධන නිලධාරී, විද්‍යා හා තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය.
peshikamadhushi@gmail.com

**මහේෂි සමරවික්‍රම**
තාවකාලික සහය කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
msarchi92@gmail.com

19 වන සියවස අගභාගයේදී ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික පුනර්ජීවන ව්‍යාපාරයන් ක්‍රියාත්මක වීමත් සමගින් බෞද්ධාගාමික අදහස් ලොව පුරා පැතිර ගියේය. යුරෝපීය ජන්මලාභියෙකු වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් ලංකාවේ මේවන විට ක්‍රියාත්මක වූ බෞද්ධාගාමික පුනරුදය කෙරෙහි පැහැදුණු සිතින් යුක්තව ලංකාවට පැමිණියේය. මෙය ශ්‍රී ලාංකේය අධ්‍යාපන ගමන් මඟෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට මග පෑදීය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මෙරට පිහිටවූයේ ඒ අනුවය. යුරෝපය හා උරෙන්උර ගැටෙමින් ඉංග්‍රීසි භාෂාවෙන් ද අධ්‍යාපනය ලබාදීම ආරම්භ වූයේ මෙම කාලවකවානුවේදීය. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් ඉංග්‍රීසි මාධ්‍ය- බෞද්ධ පාසල් පිහිටුවීමට පියවර ගන්නා ලදී. බාලාංශයේ සිට ලන්ඩන් මෙට්‍රිකියුලේෂන් දක්වා අධ්‍යාපනය ලැබීම සඳහා මෙහිදී සිසුන්ට හැකියාවක් ලැබිණි. සිසුන්ගෙන් ගාස්තු අයකිරීමෙ හේතුවෙන් ගැමි දරුවන්ට මෙම අධ්‍යාපන ක්‍රමයට පිවිසීමට බාධා එල්ල විය. මෙම පාසල් පිහිටුවීමේ ආරම්භක අවස්ථාවේදී ඒ සඳහා උචිත බිම්කඩක් හෝ ස්ථිර ගොඩනැගිලි කිසිවක් නොතිබීම නිසාවෙන් හොරණ නගරයේ පෞද්ගලික ස්ථානයන් කිහිපයක් එමේ සඳහා තෝරාගන්නා ලදී. එවකට සමාජ සේවකයෙකු වූ ආතර් වී දියෙස් මැතිතුමාගේ හොරණ ග්‍රේස්ලන්ඩ් වත්තේ නගරය දෙසට වන්නට පිහිටි බෑවුමෙන් අක්කර කාලක භූමිභාගයක් මේ සඳහා පරිත්‍යාග කළ අතර ඒ අනුව මෙහි ඉදිකළ තාවකාලික ගොඩනැගිලි කිහිපයක අධ්‍යාපන කටයුතු ආරම්භ කෙරිණි. 1935 වර්ෂයේ දී මෙහි විදුහල්පතිවරයා වශයෙන් පත්වන ඩබ්ලිව්. එෆ්. සිරිසේන මහතා විසින් ප්‍රදේශවාසීන්ගේ ආධාර එක්රැස් කර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අරමුදලක් පිහිටුවනු ලැබීය. සිරිසේන මහතා සිය රංගන කෞශල්‍ය ද එක්කර "වීදිය බණ්ඩාර" නම් නාට්‍ය විවිධ ප්‍රදේශවල ප්‍රදර්ශනය කර අරමුදල සඳහා මුදල් එක්රැස් කළේය. ඒ අනුව පාසල් භූමිය තුළ ඉදිකරන ලද ප්‍රථම පාසල් ගොඩනැගිල්ල 1940 ඔක්තෝම්බර් මස 03 වන දින විවෘත කෙරිණි. මෙම උත්සව අවස්ථාවේදී ඩබ්ලිව්. ජේ. එස්. ෆොන්සේකා මහතා ඉදිරිපත් කළ යෝජනාවකට අනුව විදුහල්පති වූ ඩබ්ලිව්. එෆ්. සිරිසේන මහතා විසින් මෙම පාසල සඳහා **"තක්ෂිලා"**යන නාමය ප්‍රසිද්ධ කරනු ලැබීය. හොරණ තක්ෂිලා ඉංග්‍රීසි විද්‍යාලය නමින් එතැන් සිට මෙම පාසල හැඳින්විණි. ආරම්භයේදී සිසුන් 400ක් මෙහි ඉගෙනුම ලැබූ අතරගුරුවරු 13 දෙනෙක් උගැන්වූහ. කනිෂ්ඨ අංශය හා ජ්‍යෙෂ්ඨ අංශය එක් අංශයක් ලෙසින් පවත්වාගෙන ගියේය. 1945 ජනවාරි මස 15 වන දින මෙහි ඉගැන්වීම් කටයුතු අංශ දෙකකට වෙන්කෙරිණි.

සී. ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර ශ්‍රීමතාණන් විසින් මෙරට නිදහස් අධ්‍යාපන සංකල්පය ව්‍යාප්ත තරන ලද්දේ මේ අවධිය තුළදීය. ඒ අනුව අඩු පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රදේශ ආවරණය කරමින් මධ්‍ය විද්‍යාල ආරම්භ කෙරිණි. මෙහිදී මධ්‍ය විද්‍යාල සංකල්පය අනුව පිහිට වූ මධ්‍ය විද්‍යාල 54න් එක් මධ්‍ය විද්‍යාලයක් හඳපාන්ගොඩ මාපුටුගල විද්‍යාලයේ පිහිටුවන ලදී. මෙම විද්‍යාලය තක්ෂිලා ඉංග්‍රීසි පාසල ආසන්නයේ පිහිටීමට ඉල්ලීම් ඉදිරිපත් කළ නමුදු පරම විඥාර්ථ බෞද්ධ සමාගම විසින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළේය.

මේ හේතුවෙන් එවකට තක්ෂිලා ඉංග්‍රීසි විද්‍යාලයේ විදුහල්පතිවරයා වූ ටාසි විටච්චි මහතාත්, ආචාර්ය මණ්ඩයේ පිරිසකුත්, ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා වූ ඩී. බී.කුරුප්පු, ලේකම්වරයා වූ කරුණාසේන ජයලත් සහ ඩබ්ලිව්. එල්. ධර්මදාස ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසකුත් එම මධ්‍ය විද්‍යාලය

තක්ෂිලාවට ලබාදෙන ලෙස ඉල්ලා පෙළපාලියක් ඇරඹුහ. මෙහිදී සී. ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර අමාත්‍යතුමාත් විරෝධතාකරුවනුත් අතර කළුතරදී ඇති වූ සාකච්ඡාවකින් පසු තක්ෂිලා විද්‍යාලය ආශ්‍රිතව එය පිහිටුවීමට එකඟ විය. ඒ අනුව තක්ෂිලා ඉංග්‍රීසි විද්‍යාලයට තක්ෂිලා මධ්‍ය විද්‍යාල තත්ත්වය ලබාදෙන ලදී.

ඒ අනුව 1946 වසර හොරණ තක්ෂිලා ගමන් මඟ නව මානයකට යොමු කරමින් මැයි 06 වන දින හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලය ස්ථාපිත කළේය. මේ සමගම එතෙක් පරම විඥාර්ථ බෞද්ධ සමාගමේ පාලන අධිකාරියට අවනත වූ තක්ෂිලාව එයින් ඉවත්කර රජයේ පාසලක් ලෙසින් හඳුන්වනු ලැබීය. මෙසේ ආරම්භ වූ හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ ආරම්භක විදුහල්පතිවරයා වූයේ, ටී. ද. සිල්වා මහතාය. මෙහිදී මාපුටුගල විද්‍යාලය මධ්‍ය විද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක වූ කාලයේදී බඳවා ගනු ලැබූ සිසුන් 90ක් හොරණ තක්ෂිලාවට ප්‍රථමයෙන් බඳවා ගනු ලැබිණි. මෙසේ මධ්‍ය විද්‍යාල ගමන් මගෙහි නිදහස් අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කරනු ලැබූ හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලය කළුතර දිස්ත්‍රික්කයේ සිසුන්ට පමණක් නොව විවිධ ප්‍රදේශවලින් පැමිණි දරුවන්ටද අධ්‍යාපනය ලබාදුන්නේය.

**මුල්ම ස්වර්ණමය යුගය**

හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ මුල්ම ස්වර්ණමය යුගය ආරම්භවන්නේ එවකට විදුහල්පතිවරයා වූ එඩ්මන් ඩයස් විදුහල්පතිතුමාගේ (1949-1954) සේවා කාලය තුළදීය. මේ වන විට සිසුහු 700ක් දක්වා සංඛ්‍යාවක් එහි ඉගෙනුම ලැබූහ. මේ හේතුවෙන් පන්ති කාමර හිඟයක් ඇතිවිය. සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර දෙවරු පාසලක් ලෙසින් ඉගැන්වීමේ කටයුතු ආරම්භ විය. තක්ෂිලා විද්‍යාලයේ මුල්ම ශිෂ්‍ය කණ්ඩායම 1948 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයට පෙනී සිටියහ. එම විභාගයෙන් සමත්ව ප්‍රථමයෙන් සරසවි වරම් ලබාගත් සිසුවා වූයේ ඒ. ඩී. සුගතදාස සිසුවා ය. ඒ අනුව තක්ෂිලාවෙන් බිහිවූ ප්‍රථම විශ්වවිද්‍යාල උපාධිධාරීයා ලෙසින් ඔහු හැඳින්විය හැකිය. ඒ අනුව,

- හේමපාල විජයවර්ධන
- සෝමා ඇග්නස් කන්නන්ගර
- එම්. එල්. සෙනෙවිරත්න
- කේ. පියසේන
- ඒ. ඩී. රුද්‍රිගෝ යන සිසුහු විශ්වවිද්‍යාල වරම් ලබාගත් මුල්පෙළ වූහ.

මෙතෙක් කුඩා ඉඩ ප්‍රමාණයක පවත්වාගෙන යනු ලැබූ තක්ෂිලාවට නව භූමි භාගයක් සහ ස්ථිර ගොඩනැගිලි හිමිවනුයේ ද මෙම කාලවකවානුවේදීය. මේ අනුව එවකට මුදල් අමාත්‍යවරයා වූ එම්. ඩී. එච්. ජයවර්ධන මහතා හමුවී පැවැති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙසින් පාසල සඳහා නව භූමි භාගයක් ලබාගැනීමට හැකිවිණි. ඒ අනුව හොරණ නගරාසන්නයේ පිහිටි රෝස් වුඩ් වත්තෙන් අක්කර 20ක කොටසක් රජයට පවරා ගනිමින් එම භූමි ප්‍රමාණයෙහි එවකට ලංකාණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා වූ සර් ජෝන් කොතලාවල මහතා විසින් 1945 මාර්තු මස 20 වන දින ගොඩනැගිලි තැනීම සඳහා මුල්ගල තබනු ලැබීය. මෙහිදී මධ්‍ය විද්‍යාල සැලැස්මට අනුව පංති කාමර ගොඩනැගිලි, ප්‍රායෝගික වැඩ සඳහා වන ගොඩනැගිලි, විද්‍යාගාර, ප්‍රධාන රැස්වීම් ශාලාව, නේවාසිකාර ගොඩනැගිලි, විදුහල්පති නිලනිවස, වැසිකිළි පද්ධතිය, ජලනළ පද්ධතිය, ක්‍රීඩාංගණය යනාදී සියලු අංගවලින් සමන්විත තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලැබිණි.

මෙම සමකාලීන අවධියේදීම විද්‍යාලයීය ලාංඡනය , අන්තර් නිවාස ක්‍රමය තිස්ස, විජය, ගැමුණු, පරාක්‍රම යන සිව් නිවාසයන් ද මුල්ම නිවාසන්තර ක්‍රීඩා උළෙල පවත්වනු ලැබිණි.

මේඅයුරින් ක්‍රමවත් අධ්‍යාපන ක්‍රමයකට යොමු වූ හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලය,

1959 - සමස්ත ලංකා අත්පන්දු ශූරතාවය,

1963 - සමස්ත ලංකා මළල ක්‍රීඩා තරඟාවලියේ සමස්ත ශූරතාවය අත්පත් කරගත්තේය.

1959දී එවකට රාජ්‍ය අනුග්‍රහය අනුව ස්වභාෂා අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ එතෙක් ඉංග්‍රීසි මාධ්‍ය පාසලක් ලෙස පවත්වාගෙන ආ තක්ෂිලා මධ්‍ය විද්‍යාලය සිංහල මාධ්‍ය පාසලක් බවට පත්කෙරිණි.

මෙම කාලසමය වනවිට ක්‍රීඩා ජයග්‍රහණයන් රැසක් අත්පත් කරගැනීමට සමත් වූ හොරණ තක්ෂිලා විද්‍යාලය සෞන්දර්ය අංශයට ලැදියාවක් සහිත සිසුහු පිරිසක් ද බිහිකළේය. රෝහණ බැද්දගේ මහතාගේ දායකත්වයෙන් නිර්මාණය කළ 'අලකලංචිය' ළමා නාට්‍යය සඳහා සමස්ත ලංකා පාසල් නාට්‍යය තරඟාවලියේ දී තෙවන ස්ථානය ලබාගැනීම මෙයට කදිම නිදසුනක් ලෙසින් පෙන්වා දියහැකිය.

1969 වර්ෂයේ ලංකාවේ අධ්‍යාපන සියවස සැමරුම නිමිත්තෙන් හොරණ ප්‍රදේශයේ සියවස අධ්‍යාපන පුස්තකාලය තක්ෂිලාව කේන්ද්‍ර කරගනිමින් ඉදිකරන ලදී. ඒ අනුව මෙම පුස්තකාලය 1969 මාර්තු මස 21 වන දින එවකට අධ්‍යාපන අමාත්‍යවරයා වූ අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමන් විසින් විවෘත කරන ලදී.

1969 වර්ෂයේ එවකට විදුහල්පතිතුමන් වූ ඩී.එස්. සේනානායක මහතාගේ මඟ පෙන්වීම මතතක්ෂිලාවේ නිල පුවත්පත ලෙස වශයෙන් "**තක්ෂිලා** " නමින් නිර්මාණ එකතුවක් 1969 ජුනි මස 19 වන දින ඊටින් මල්වත්තගේ සිසුවාගේ සංස්කාරත්වයෙන් නිකුත් කරන ලදී.

වෝල්ටර් සිල්වා මහතා (1975--‐1982) හොරණ තක්ෂිලාවේ විදුහල්පති වශයෙන් පත්වීමත් සමගින් තක්ෂිලාව සාධනීය ලකුණු පෙන්නුම් කළේය. ඒ අනුව 1976 වර්ෂයේ දී විද්‍යාලයීය බාලදක්ෂ ඒකකය ආරම්භ කෙරිණි. එහි ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ රෝහණ අමරතුංග ජනාධිපති බාලදක්ෂ වරම් ලැබීය.

1979 වර්ෂයේ දී ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානය ආරම්භ කළ අතර ඒ මඟින් නේවාසික පරිසර වැඩසටහන් වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. මේ කාලය තුළ අධ්‍යාපන, ක්‍රීඩා, විෂයය සමගාමී හා විෂයය බාහිර ජයග්‍රහණ සඳහා විශේෂ ජයග්‍රහණ කිහිපයක් අත්පත් කරගැනීමට සිසුහු සමත් වූහ. 1981 වර්ෂයේ පවත්වන ලද කළුතර දිස්ත්‍රික්කයේ හොඳම පාසල තේරීමේ තරගයෙන් තක්ෂිලා මධ්‍ය විද්‍යාලය ජයග්‍රහණය කළේය.

හොඳම පාසල වශයෙන් තක්ෂිලාව තේරීපත් වීමෙන් පසු අත්පත් කරගත් ජයග්‍රහණයන් කිහිපයක පහත පරිදි පෙළගැස්විය හැකිය.

- සමස්ත ලංකා සෞඛ්‍යදාන කඳවුරෙහි ප්‍රථම ස්ථානය තක්ෂිලාව අත්පත් කරගනු ලැබීය.
- 1985 වර්ෂයේ දී සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ කළ අතර එම වසරේම සමස්ත ලංකා අනුශූරතාව දිනා ගැනීම.
- 1991 වර්ෂයේ දී පැවති කළුතර දිස්ත්‍රික්කයේ ජනප්‍රියම හා හොඳම පාසල තේරීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මහජන බැංකුව හා ඒකාබද්ධව සංවිධානය කළ තරගාවලියේ දී කූපපත් 29,849ක් දිනාගනිමින් කළුතර දිස්ත්‍රික්කයේ ජනප්‍රියම පාසල බවට තක්ෂිලාව පත්විය.

පියසේන ගීගනගේ මහතා පාසල් නියමුවන් වශයෙන් තේරීපත් වීමෙන් අනතුරුව තක්ෂිලා සිසුහු අධ්‍යාපනික වශයෙන් සංවර්ධනාත්මක ජයග්‍රහණයන් රැසක් අත්පත් කරගත්හ.

- අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සවස පන්ති පැවැත්වීම විධිමත් ක්‍රියාවලියක් යටතේ සංවිධානය කරන ලදී.
- ජයග්‍රහණ ලබාගත් සිසුන් දිරිමත් ගැන්වීම සඳහා දීප්තිමත් ආදි ශිෂ්‍යයින් කැඳවා වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබීය.
- කරුණාසේන ජයලත් මහතාගේ මූලිකත්වයෙන් 1992 වසරේදී ආදි ශිෂ්‍ය සංගමය ආරම්භ කෙරිණි.
- තක්ෂිලා මධ්‍ය විද්‍යාලය ජාතික පාසලක් වශයෙන් නම් කරනු ලැබීය.

**විද්‍යාලයීය ලාංඡනය**

තක්ෂිලා මධ්‍ය විද්‍යාලයීය ලාංඡනය **තද නිල්, සුදු, අඳුරු රතු** යනුවෙන් වර්ණ තුනකින් සමන්විත විය. විද්‍යාලයීය ආදර්ශ පාඨය "**අප්පමත්තා න මියන්ති**" මෙම පාලි පාඨය විද්‍යාලයීය ලාංඡනයේ ඉහළ කොටසෙහි අර්ධ කවාකාරව සඳහන් කර ඇත. එය සූත්‍ර පිටකයට අයත් ධම්ම පදයෙහි අප්පමාද වග්ගයෙහි ප්‍රථම ගාථා ධර්මයෙහි තෙවැනි පදය වේ. ඒ අනුව මෙම පාඨයෙහි සරල අදහස වන්නේ, "**නොපමා වූවෝ නොමියෙත්**" යන්නයි.

විවිධ කාලවලදී මෙම ලාංඡනයෙහි හැඩය වෙනස්කම්වලට ලක්විය. වඩාත් උචිත ආකාරයට එය ප්‍රතිනිර්මාණය වූයේ ඩී. ජී. එල්. වෝල්ටර් සිල්වා විදුහල්පතිතුමාගේ වකවානුවේදීය. මෙම ලාංඡනය ඉතා අලංකාරවත් ලෙසින් සකස් කරන ලද්දේ එවකට තක්ෂිලා චිත්‍ර කලා ගුරුවරයා වූ එම්. සී. ජී. ප්‍රනාන්දු මහත්මා විසිනි.

ලාංඡනයෙහි සමස්තය පලිහක හැඩරුව ගනී. ඒ දෙපසින් ඉහළට නැගී ගිය ධාන්‍ය කරල් දෙකකි. සඵලත්වය, සශ්‍රීකත්වය, සෞභාග්‍ය ධාන්‍ය කරල්වලින් නිරූපිතය. ලාංඡනය මධ්‍යයේ දැක්වෙන වෘත්ත තුන සීල, සමාධි, ප්‍රඥා යන අරුත් සපයමින් මෙම පාසල බොදු හැදියාවෙන් සපිරි බෞද්ධ පාසලක් බව කියැවේ. ලාංඡනය මධ්‍යයේ ඇති සාම්ප්‍රදායික පොල්තෙල් පහනෙන් පාසලෙන් දරුවනට ලැබෙන"දැනුමට" එහා ගමන් කෙරෙන ප්‍රඥාසම්පන්නබව සනිටුහන් කරනු ලැබේ. පහනෙන් පහන් සිළු සතරක් විද්‍යාමාන වේ. කාලත්‍රයටම අයත්වන්නා වූ තක්ෂිලා සිසු දරු පරපුර ගුණ නැණින් පුබුදුවා යහමග ගන්වමින් සිව්දිසාවටම "ප්‍රඥාලෝකය" පතුරුවන බව සංකේතවත් කරනු ලැබේ.

**විද්‍යාලයීය ධජය**

ධජය තද නිල් , සුදු, අඳුරු , රතු වර්ණයන්ගෙන් යුක්තය. පසුබිම් වර්ණයක් දැකිය නොහැකිය. දිගු අතට සමාන්තරව විහිදී ගිය රේඛා තුනක් ලෙසින් ඉහත වර්ණයන්ගෙන් යුත් සම ප්‍රමාණික තීරු තුනකින් ධජය නිර්මිතය. මෙම වර්ණ තීරු එකිනෙකට බැඳී පවතී. ධජයේ සමස්ත දිග හා පළල 2 : 1 අනුපාතයකින් සමන්විතය. ධජයේ ඉහළ තීරුව හෝ පහළ තීරුව සඳහා යෙදිය යුතු තද නිල් හෝ අඳුරු රතු වර්ණ දෙකෙන් නිශ්චිත වර්ණයක් නොමැත. මධ්‍යයේ ඇති තීරුව සුදු පැහැතිය.

**තක්ෂිලාවෙන් බිහි වූ විශිෂ්ටයින්**

ශාස්ත්‍රඥයින්

- මහාචාර්ය එච්. එල්. සෙනෙවිරත්න මහතා (ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ මානව විද්‍යාව පිළිබඳ මහාචාර්ය)
- මහාචාර්ය හේමපාල විජේවර්ධන මහතා (සිංහල විෂය පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය.)
- මහාචාර්ය සිරිසේන තිලකරත්න (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ හිටපු සභාපති)
- වසන්ත ගුණතුංග මහතා (අංශ ප්‍රධාන වෛද්‍ය පීඨය , කොළඹ විශ්වවිද්‍යාලය)
- එම්. වී. එස්. උදයංග මහතා (පීඨාධිපති, ව්‍යාපාර අධ්‍යයනාංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- බැසිල් මාරසිංහ මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)

- ලලාන් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය)
- ජයන්ත සූරියආරච්චි මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය)
- ඡන්නා ජයසිංහ මහත්මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- නිල්වලා කෝට්ටේගොඩ මහත්මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- කුමුදිනී දිසානායක මහත්මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය)
- ප්‍රසාද් විමලරත්න මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය , පරිගනක ඒකකය , කොළඹ විශ්වවිද්‍යාලය)

වෛද්‍යවරු

- සුනිල් සේනානායක මහතා (විද්‍යාලයෙන් බිහිවූ ප්‍රථම වෛද්‍ය ශිෂ්‍යයා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු ආසියාන කලාපීය උපදේශක)
- නිහාල් අබේසිංහ ( විශේෂඥ වෛද්‍ය වසංගත රෝග ලෝක සෞඛ්‍ය සංවිධානයේ නව එන්නත් හඳුන්වා දීම පිළිබඳ දකුණු ආසියා කලාපීය වෛද්‍ය නිලධාරී )
- අජිත් රාජපක්ෂ මහතා ( විශේෂඥ වෛද්‍ය නාරි හා ප්‍රසව )
- පියන්ස් බන්දුජීව මහතා (විශේෂඥ වෛද්‍ය අස්ථි)
- අනෝමා සෙව්වන්දි මහත්මිය (විශේෂඥ වෛද්‍ය ව්‍යාධිවේදී කරාපිටිය ශික්ෂණ රෝහල)
- බන්දුල පෙරේරා මහත්මිය (විශේෂඥ වෛද්‍ය මූලික රෝහල , හොරණ)

දේශපාලනඥයෝ

- ජෝන් සෙනෙවිරත්න මහතා
- පාඨලී චම්පික රණවක මහතා (මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය)

ත්‍රිවිධ හමුදා සේවය

- මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ මහතා (යාපනයේ ආඥාපති)
- මේජර් ජනරාල් ඊ.කේ.ජේ.කේ. විජේසිරි මහතා
- රවි විජේගුණවර්ධන මහතා (නියෝජ්‍ය පොලිස්පති)
- නාවික කොමදෝරු රොහාන් කුලසේකර මහතා
- වින්ග් කමාන්ඩර් ගීතප්‍රිය මහතා ගුවන් හමුදාව

**කලාකරුවන් හා පුවත්පත් රචකයන්**

- කරුණාසේන ජයලත් මහතා (ප්‍රවීණ ලේඛක)
- මහාචාර්ය සරච්චන්ද්‍ර ජයකොඩි මහතා
- ඩබ්ලිව්. චූලානන්ද සමරනායක මහතා (ලේඛක හා භාෂා පරිවර්තක)
- ඩී. බී. කුරුප්පු මහතා (පුවත්පත් කර්තෘ හා ලේඛක)
- සුමුදු වෙත්තසිංහ මහතා ( පුවත්පත් කලාවේදී ප්‍රවීණ ගීත රචක)
- රෝහණ බැද්දගේ මහතා ( ජන සංගීතය පිළිබඳ ප්‍රවීණයෙකි. බාහිර කථිකාචාර්ය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)
- ඩී.කේ. හෙට්ටිආරච්චි මහතා (ප්‍රවීණ නර්තන ශිල්පියෙකි. කථිකාචාර්ය)
- ප්‍රසන්න ජයකොඩි මහතා (ජාත්‍යන්තර සම්මානලාභී චිත්‍රපට අධ්‍යක්ෂ හා ප්‍රවීණ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂ)
- වසන්ත කුමාර කොබවක මහතා (ප්‍රවීණ සම්මානලාභී ගීත රචකයෙකි.)

- උපාලි ගම්ලත් මහතා ( කෙටි වාර්තා චිත්‍රපට පිළිබඳ ජාත්‍යන්තර සම්මානලාභී)
- සමන් කුමාර ලියනගේ මහතා (ප්‍රවීණ සම්මානලාභී ටෙලි නාට්‍යය අධ්‍යක්ෂවරයෙකි.)
- ගාමිණී මාතරආරච්චි මහතා (ප්‍රධාන සංස්කාරක මණ්ඩලය රූපවාහිනී සංස්ථාව)
- සරත් කුලාංග මහතා (නාට්‍ය ශිල්පී)
- විනී වෙත්තසිංහ මහතා (නාට්‍ය ශිල්පී)
- රවීන්ද්‍ර යසස් කුමානායක (නාට්‍ය ශිල්පී)
- ඈර්නි රෝෂණී මහත්මිය (ගුවන් විදුලි නිවේදිකා, ටෙලි නාට්‍යය නිළි සහ වේදිකා නාට්‍යය නිළි )
- නදීකා චන්ද්‍රසේකර මහත්මිය (ටෙලි නාට්‍ය නිළි)

**ව්‍යාපාරිකයින්**

- ධම්මික පෙරේරා මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති)
- එම්. ඩී පියනන්ද කුලරත්න මහතා (සී/ස එම්. ඩී. කේ සමූහ ව්‍යාපාර අධිපති)
- ආචාර්ය රවීන්ද්‍ර ලියනගේ මහතා ( සී/ස රයිගම් කින්ඩම් ඔෆ් අධිපති)

**විවිධ**

- ජී.ටී. ධර්මසේන මහතා (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හිටපු ජල විද්‍යා අධ්‍යක්ෂ)
- මහින්ද විජේසිරි තෙන්නකෝන් (හිටපු විභාග කොමසාරිස්)
- ප්‍රදීප් හෙට්ටිආරච්චි මහතා ( ජීජී දූපත් වල ) මහ අධිකරණ විනිසුරු
- අරුණ අළුත්ගේ මහතා දිසා අධිකරණ විනිසුරු (බලපිටිය)
- ඩබ්ලිව්. ඩී. අයිලප්පෙරුම මහතා (හිටපු ස්ථිර ලේකම් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය)
- ශාන්ත වැලිකඩ මහතා (නියෝජ්‍ය සමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා ටෙලිකොම්)
- කෝලිය පුලසිංහ මහතා (වැඩබලන පීඨාධිපති, තොරතුරු තාක්ෂණ විද්‍යාතනය, මාලඹේ)
- ඩී.පී. ආර් සමරනායක මහතා (මිරිදිය වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂ, ධීවර අමාත්‍යාංශය)
- පියසිරි තිලකරත්න මහතා (නාවික ඉංජිනේරු අංශ ප්‍රධාන)

**මූලාශ්‍රය**

- විද්‍යාලයීය ලොග් පොත
- තක්ෂිලා ප්‍රතිපූජන

# අධ්‍යාපන සමාජ විද්‍යාව හා "ගුරු භූමිකාව"

**එච්. සචිනි නිසංසලා සිල්වා**
සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය
sachinisilva3@gmail.com

**හැඳින්වීම**

ලෝකයේ කවර රටක වුවද අධ්‍යාපනය තරම් විචාරයට බඳුන් වන අන් විෂයක් නොමැත. පාලකයන්ගේ මෙන්ම පාලිතයන්ගේද අවධානයට පාත්‍ර වන මාතෘකාවක් ලෙස අධ්‍යාපනය සමාජයේ ප්‍රචලිතය. අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ පූර්ණ මනුෂයෙකු බිහි කිරීමයි. මිනිසාගේ ජීවන තත්ත්වය සතුටුදායක මට්ටමක් පවත්වා ගැනීම, මිනිසා තුළ මානව සම්බන්ධතා, සංවර්ධනය කිරීම සහ මිනිසා තුළ සදාචාරාත්මක හෙවත් අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම යන පරමාර්ථ සාක්ෂාත් කරවීම සඳහා ශක්තිමත් පදනමක් අධ්‍යාපනය මඟින් සකස් විය යුතුය.

විවිධ කාලවකවානුවලදී ලොව පහළ වු බුද්ධිමතුන් විසින් අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශයට පත් කරන ලද මතිමතාන්තර බොහෝය. මිනිසාගේ බුද්ධි වර්ධනයත්, සදාචාර වර්ධයත්, අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය වශයෙන් සලකා අධ්‍යාපනය යන්න පෙරදිග ලෝකයේ හඳුන්වා ඇත්තේ "ශික්ෂණය" යනුවෙනි. එසෙත් නැතහොත් මානසික හා අධ්‍යාත්මික හික්මීම වශයෙනි. අධ්‍යාපනය යන වචනය වියුක්ත සංකල්පයකි. එහි ඉතා පුළුල් අදහස් ගැබ්වෙයි. Education-Educte-Educe යන වචනවල අරුත "bring out or develop from lafent or potential existen ceelicit" යනුවෙන් Consise Oxfor Dictionary" විස්තර වෙයි. නොපෙනී පවත්නා නෛසර්ගික ශක්තීන් මතුකොට පිටතට ගැනීම මතුකර දීම සහ භාවිතය මඟින් වර්ධනය යන අදහස ඉන් පසක් කර ගත හැකිවෙයි. (සිරිසේන,1999:11) රුසියානු ශබ්දකෝෂය තුළ අධ්‍යාපනය යනුවෙන් හඳුන්වා දී ඇත්තේ සංජානනය, ආවේදනය සහ චර්යා වර්ධනය සඳහා ක්‍රමානුකූල අධ්‍යාපනයක් ලෙස සඳහන් වෙයි.

යුනෙස්කෝ සංවිධානය මඟින් සකස් කරන ලද (දිවිපැත්ම සඳහා ඉගෙනීම 1978:144:157) නම් වාර්තාවේ සෑම රටකම අධ්‍යාපන ක්ෂේත්‍රයේ පහත සඳහන් පරමාර්ථ හතර තිබිය යුතු බව පෙන්වා දී තිබේ.

1. විද්‍යාත්මක මතවාදයක් කරා (Towards Scientific Humanism)
2. නිර්මාපණ ශක්තිය සඳහා (for creativity)
3. සමාජ වගකීම් වෙත (Towards social responsibility)
4. සුපිරි මිනිසා කරා (Towards the compete man)

ඕනෑම රටක සංවර්ධන ක්‍රියාවලියේදි අධ්‍යාපනයට හිමිවන්නේ සුවිශේෂි වු ස්ථානයකි. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඵලදායි අධ්‍යාපනයක් ව්‍යාප්ත කිරීම උදෙසා නිරන්තරයෙන් ම උත්සහ දරයි. විහාරස්ථාන කේන්ද්‍ර කොට ගනිමින් බිහි වු මෙරට අධ්‍යාපන ක්‍රමය යටත් විජිත ක්‍රමයේ මිෂනාරි අධ්‍යාපන රටාවත් සමග පෘථුල වෙනසකට භාජනය විය. ආර්ථිකයේ සිදුවන විපරිණාමයක් සමග අධ්‍යාපන ක්ෂේත්‍රය ද විවිධාකාරයේ වෙනසකම්වලට බඳුන් වී ඇති අයුරු දැකගත හැකිවිය. මෙකී වෙනසට ප්‍රධානතම හේතුව බවට පත්ව ඇත්තේ තාක්ෂණයේ දියුණුව බව පිළිගත යුතුය. වර්තාමනය වන විට අධ්‍යාපන ක්ෂේත්‍රය මහත් විප්ලවයකට පාත්‍ර වී තිබෙයි. ඉහත අරමුණු හා පරාමර්ථ ඉටු වු අනාගත විප්ලවයට මුහුණ දිය හැකි සිසු පිරිසක් නිර්මාණය කිරීම් වගකීම දරන්නන් ගුරුවරුන්ය. මෙම ගුරුවරුන්ගේ අපේක්ෂිත කාර්යභාරය සඵල කර ගැනීම සඳහා ගුරු අධ්‍යාපනයෙන් ඉටු විය යුතු කර්තවය අතිමහත්ය.

**අධ්‍යාපන සමාජ විද්‍යාව යනු**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි බලපාන්නා වූ පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන, අවස්ථා, සිද්ධි, ප්‍රතිපත්ති, රෙගුලාසි මෙන්ම සමාජ ආර්ථික මෙන්ම නවීකරණයන් පිළිබඳව සියුම්ව හා ගැඹුරින් හැදෑරීම අධ්‍යයන කරන විෂය අධ්‍යාපන සමාජ විද්‍යාවයි.

සමාජයේ ක්‍රියාත්මක වන ක්‍රියවලියක් වශයෙන් අධ්‍යාපනය හඳුනාගත් පුද්ගලයා වශයෙන් ජෝන් ඩුවී (John Dewey-1859-1952) දැක්විය හැකිය. ඔහු 1900 වර්ෂයේ අධ්‍යාපනය හා සමාජ විද්‍යාව අතර සම්බන්ධය පිළිබඳව ඉගියක් කර ඇත. (ජයසේන, 2010:16) ඩුවී මුල් වතාවට සමාජය හා පාසල අතර සම්බන්ධතාව අගය කරමින් එකළ පැවති පැරණි ජීවන ක්‍රමයක් කඩා වැටීගෙන යන බවත් සමාජ ව්‍යුහයද වෙනස් වන බවත් පාසල හෝ පල්ලිය ළමයා වටා වර්ධනය වෙමින් පවතින නව සමාජය පිළිබඳව දැනුවත් කිරීමක් නොකරන බව අවධාරණය කර ඇත. ගැමි ජිවිතයත් නගර ජිවිතයත් අතර තරමක දැඩි බවක් වර්ධනය වෙමින් පැවතුණ ද වැඩිහිටියන් ඒ පිළිබඳව දැනුවත් වී නොතිබිණි. ඩුවීට අනුව ගැමි ළමුන් පොළොවට සමීපව හැදී වැඩෙන අතර නාගරික ළමයා සංකීර්ණ සමාජයක වැඩුනද ඔහු භුක්ති විඳි ව්‍යුහයන් කෙසේ ගොඩනැගුණ ද යන්න නොදනී. නාගරික ළමුන් තමන් ඇද සිටි වස්ත්‍රය නිෂ්පාදන වූ ආකාරයවත් නොදනී. පාසල ළමයාට දෙවැනි නිවසක් විය යුතු බව හා අවසානයේදී ඒ සඳහා ස්ථානයක් ලබා දිය යුතු බව ඩුවී පෙන්වා දෙන ලදී.

අධ්‍යාපනය සමාජ ක්‍රියාවලියක් වේ. එමිල් ඩුර්කයිම් (Emile Durkheim 1858-1917) හා මැක්ස් වේබර් (Max Weber 1864-1920) සමාජ විද්‍යා එළඹුමකින් අධ්‍යාපනය හැදෑරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී.

සමාජ විද්‍යාවේ ඉගෙනීම තුළින් අධ්‍යාපනය දෙස සමාජ විද්‍යාවේ දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කර ඇත. අධ්‍යාපන සමාජීය කරුණක් බව දක්වන ඩුර්කයිම් සමාජය පවතින්නේ එහි සමාජිකයන් අතර යම් ආකාරයක සමතාවයක් පැවතුණහොත් බව අනාවරණය කර ඇත. මෙම හැඟීම් ළමයා තුළ ද ඇති කරමින් සමාජයේ පොදු ඉල්ලීම් ළමයා තුළ වර්ධනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර අනෙක් අතට විවිධත්වයෙන් තොර ව සාමූහිකත්වයක් නොපවතින බවත් ඩුකර්යම් විසින් පිළිගන්නා ලදී. මෙම විවිධත්වය අධ්‍යාපනයෙන් ලැබිය යුතු බවත් විවිධත්වය පුද්ගලයාගේ සමාජ හා ගැලපිය යුතු බවත් සඳහන් කළ ඩුර්කයිම් ඒ නිසා තමා වෙසෙන සමාජය තමා ලබන අධ්‍යාපනය තීරණය කරන බව අවධාරණය කරන ලදී. මේ අනුව වෙසෙන සමාජය තමා ලබන අධ්‍යාපනය තීරණය කරන බව අවධාණරය කරන ලදි. මේ අනුව ඩුර්කයිම් අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයේ වැදගත්කම අංශ කිහිපයක් ඔස්සේ පෙන්වා දී ඇත.

1. අධ්‍යාපනයේ ආරම්භය හා කාර්යභාරය යන දෙක ම සමාජීය පසුබිමක පිහිටා ඇති බව.

2. අධ්‍යාපන පද්ධතිය බොහෝ දුරට තීරණය වන්නේ ඒ ඒ සමාජවල ඇති සමාජ සංස්කෘතික මට්ටම් හා අවශ්‍යතා අනුව බව.

3. අධ්‍යාපනය අවශ්‍යතා හා කලානුරූපව නිරතුරුවම වෙනස් වෙමින් පවතින ක්‍රියාවලියක් බව.

"සමාජ විද්‍යාඥයෝ අධ්‍යාපනය සංස්කෘතියේ ගැබ් වූ ව්‍යුක්ත පරමාදර්ශ සාක්ෂාත් කර ගැනීමේ මාර්ගයක් එහි සලකන්නේ නැත. අධ්‍යාපනය අවබෝධය කර ගත හැකි වන්නේ කවර සමාජයකට සමාජ ස්ථානයක් ලබා ගැනීම සඳහා ළමුන්ට උගන්වන්නේ ද යන්න අවබෝධ කරගත්තොත් පමණි."
(Mannheim,1940:13)

අධ්‍යාපනය හා සමාජ විපර්යාසය (Education and Social Changer 1940) ග්‍රන්ථය තුළින් ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝෂණය මහගු සේවයක් සිදු වූ ආකාරය අවධාරණය කර ඇත. මැනින්තැම් (Mannheim 1993-1947) අධ්‍යාපනය හා සම්බන්ධව වී ඇත්තේ සමාජ විද්‍යාඥයන් වශයෙනි. ඔහුගේ මිනිසා සහ සමාජ (Man & Society යන කෘතියෙන් අධ්‍යාපනය යන්න හඳුනා ගත හැක්කේ කුමන සමාජ පරමාර්ථ සඳහා ද යන්න අවබෝධ කරගත් විට පමණක් බව පෙන්වා දෙයි.

ඒ අනුව ඔහු ගුරු භූමිකාව මුල්කර ගනිමින් ගුරු අධ්‍යාපන වැඩසටහන් සඳහා වන පාඨමාලාවන් සමාජ විද්‍යාවෙහි අන්තර්ගත විය යුතු සංවර්ධන තුනක් යෝජනා කර ඇත. අධ්‍යාපනික සමාජයක් යනුවෙන් ඔහු අදහස් කරන්නේ යම්කිසි ආකාරයක පුරවැසියෙක් නිෂ්පාදනය කිරීමයි.

A දැනුවත් කරන්නා (Educator) සඳහා සමාජ විද්‍යාව

- මානව ස්වභාවය සහ සමාජ පිළිවෙත (Human Nature and the social order)
- පුද්ගලයා කෙරෙහි සමාජ සමූහ කරන බලපෑම (The impact of social Groups Upon the Individual)
- සමාජ ව්‍යුහයක් (Social Strucfure)

B අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව

- පාසල හා සමාජය (School & Society)
- ඓතිහාසික ස්වභාවයන් අනුව අධ්‍යාපන සමාජ විද්‍යාව (Sociology of Education in Its Historical Aspects)
- පාසල හ පිළිවෙත (School the Social Order)

C ඉගැන්වීම පිළිබඳ සමාජ විදිය

- පාසල තුල සමාජ ජිවිතය පිළිබඳ සමාජ විද්‍යාත්මක අර්ථකථනය (Sociological Interpretation of Life In School)
- ගුරු ගෝල සබඳතාව (The Teacher-Public Relationship)
- පාසල් සංවිධානය හා බැදි ගැටලු (Problems of School Organization)

සමාජයට අවශ්‍ය පුද්ගලයින් සංවර්ධනාත්මක ක්‍රියාදාමයකින් බිහි කරන්නා වූ වැදගත් ස්ථානය වන්නේ පන්ති කාමරය හා පාසලයි. එබැවින් අධ්‍යාපන සමාජ විද්‍යාඥයා විසින් සමාජ පද්ධතියක් වශයෙන් පාසල හා බැඳුණු සුවිශේෂී සාධක, අන්තර් සම්බන්ධතා පිළිබඳ ව විමර්ශනය කිරීම වැදගත් වේ.

අධ්‍යාපන සමාජ විද්‍යා විෂයට ක්ෂේත්‍රයේ වර්ධනය තුළ ආරම්භක අවධිත් සමාජ ගැටලු, සමාජ විෂමතා අධ්‍යාපනය සමග සම්බන්ධවන ආකාරය අධ්‍යාපනඥයන් විසින් සොයා බලන ලදී. දෙවැනි ව සමාජානුයෝජන ක්‍රියාවලිය ගැන අවධානය යොමු කෙරිණ. වර්තමාන සමාජයේ සමාජ සමූහ පිළිබඳ විශේෂ අවධානයක් යොමුව ඇත. ඒ අනුව පාසල සමාජ සමූහයක් ලෙසත්, පාසල් සමූහය හා අනෙක් සමූහ අතර සබඳතා පිළිබඳවත් සොයා බැලේ. අධ්‍යාපන සමාජ විද්‍යාව ආරම්භ වූ මුල් යුගයේ දී සමාජ විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අධ්‍යාපන ක්‍රියාවලිය පරීක්ෂාවට ලක් කෙරිණි. නමුත් පසුකාලීන පරීක්ෂණ අනාවරණයක් කර ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනයට ආවේණික සමාජ විද්‍යාත්මක සංකල්ප මතුකර ගැනීමට හැකියාව ලැබිණ. එම සංකල්ප ඔස්සේ ද අධ්‍යාපන ක්‍රියාවලින් යථාර්තය පරීක්ෂාවට ලක් කිරීමෙන් අධ්‍යාපන සමාජ විද්‍යා (Sociology of Education)

පෝෂණය විය. මේ අනුව පාසල හා පාසල සමාජ සමූහයත් ලෙසත්, සමාජානුයෝජනය, අධ්‍යාපන කාරක, ගුරුභූමිකාව, අධ්‍යාපනය හා සමාජ පන්ති සමාජ වෙනස්වීම් හා අධ්‍යාපනය, සමකාලීන සමාජ ප්‍රශ්න හා අධ්‍යාපනය පාසල් සංස්කෘතිය, බහු සංස්කෘතික අධ්‍යාපනය යන ආදී ක්ෂේත්‍රයන් අධ්‍යාපන සමාජ විද්‍යාව තුළින් අධ්‍යනය කෙරේ. (ගලගම,2008:11) ඒ අනුව අධ්‍යාපන සමාජ විද්‍යාව තුළ එන ගුරු භූමිකාව පිළිබඳ එහි කාර්‍යය භාරයන් පිළිබඳ න්‍යායාත්මකව සාකච්ඡා කිරීම. වඩාත් කාලෝචිත වේ.

**ගුරු භූමිකාව**

සමාජය ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන භූමිකා රාශියකි. ගුරුවරයාගේ වෘත්තිය හා සමාජ භූමිකා අතීතයේ සිට වර්ධනය වී ඇති ආකාරය සහ සමාජය වෙනුවෙන් ඔවුන්ගේ වගකීම් සහ කාර්යභාරයන් කෙසේ විය යුතු ද යන්න මෙහි අන්තර් ගත වී ඇත. ඒ අනුව ගුරු භූමිකාවේ සංවර්ධනයට අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීමේ අවශ්‍යතාව පිළිබඳ අවධාරණය යොමු කරනු ලැබේ.

එදිනෙදා ජීවිතය තුළ දී විවිධ අවශ්‍යතා හා යුතුකම් වගකීම් වෙනුවෙන් අප භූමිකා අනුගමනය කරනු ලබයි. එක් එක් පුද්ගලයන් වෙන්වූ භූමිකා රාශියක් සමාජ තුළ දී අපට දැකගැනීමට ලැබේ. උදා:- මව/පියා/සහෝදර/සහෝදරී/ගුරුවරයා/වෛද්‍යවරයා වශයෙන් විවිධ අවස්ථාවන් වලදී අප රග දක්වන භූමිකාවන් වෙනස් වේ. මෙම භූමිකාවට පරිකල්පිත චර්යා ස්වරූපක් ඇත. ගැඹුරු අවබෝධය හා අරුත් නිර්මාණය කිරීමට නාට්‍ය හා නාට්‍යමය අවස්ථාවන් හිදී අපට යොදා ගත හැක්කේ මෙම පරිකල්පිත සමාජ චර්යාවන්ය.

කිසියම් වෘත්තියකට හෝ සේවාවකට අයත් වන තනතුරේ නොමැති නම් නිලයෙහි කාර්යභාරය "භූමිකාවට" අයත් වේ. ඒ නිලයට අයත් බලතල එම වෘත්තිකයාගේ කාර්යභාරය ඉටු කිරීමට වැදගත් වනවා සේම එයට වගකීම් යුතුකම් හා චර්යාවන් කොටසක්ද එකතු වේ. යම් කිසි වෘත්තියක් හෝ තනතුරක් මඟින් සමාජය අපේක්ෂා කෙරෙන තත්ත්වය භූමිකාවට අයත් වනු ලැබේ.

"ගුරු භූමිකාවට අයත් වන්නේ ගුරු තනතුරට අදාළ බලතල, වගකීම්, යුතුකම්, චර්යා ආදියටත් සමාජය ගුරුවරයාගෙන් අපේක්ෂිත තත්වයන්ටත් අනුකූල වූ කාර්යභාරයයි." (අධ්‍යාපන සමාජ විද්‍යාත්මක පදනම, 1991:34)

ගුරුවරයා පාසලේ පන්තිකාමරයට පමණක් සීමා නොවන මුළු මහත් සමාජයටම හා සමාජයේ සංවර්ධන කාර්යය සඳහා මූලිකවම වගකියන තැනැත්තෙකු වේ. පාසල පාඩම් උගන්වන ස්ථානයක් පමණක් නොවන බවත් ළමයා සමාජයට මෙන්ම සමාජ ජීවිතයට හුරුකරන බවත් සමාජ ජීවිතයේම කොටසක් බවත් ජොන් ඩුවී යන අධ්‍යාපනික දාර්ශනික චින්තකයා විසින් පවසා ඇත. ඔහුට අනුව ගුරුවරයා ළමයින් රැකබලා ගැනීම පමණක් නොව ළමයින්ගේ ස්වභාවික ආවේග හා ජීව විද්‍යාත්මක බලවේගයන් අතර සම්බන්ධය සෙවීම වන බවත්, ගුරුවරයා මාර්ගෝපදේශකයෙකු විය යුතු බවත් ගුරුවරයාගේ කාර්ය අණදීම හා පාඩම් ඉගැන්වීමට වඩා ළමයා වටහා ගෙන ඔහුගේ වර්ධනයට අවශ්‍යය අත්දැකීම් ඉදිරිපත් කිරීම බව ඩුවීගේ අදහසයි.

"ගුරුවරයා යනු (Teacher) ආචාර්යවරයා අනුපතයකවරයා, පුහුණු කරන්නා උගන්වන්න, වශයෙන් දක්වන ඇත" (මලලසේකර 1997:905)


ගුරු වෘත්තිය ලෝකයේ ඇති වෘත්තීන් අතුරින් ඉතා උතුම්ම වෘත්තියක් බව බොහෝ දෙනාගේ පිළිගැනීම වේ. නව සමාජයක් නව දර්ශනයක් බිහිකිරීමට ශාස්ත්‍රිය දැනුමෙන් හා වෘත්තිය පුහුණුවෙන් හා මනා පෞරුෂයක් හෙබි අයෙකු විය යුතුය.

රටක සමාජීය, දේශපාලන හා සංස්කෘතින් සංවර්ධනයට මග පාදන ප්‍රබල සාධකයක් ලෙසින් අධ්‍යාපනය සලකනු ලබයි. සමස්ත අධ්‍යාපන පද්ධතියේම ගුණාත්මක හා විධිමත් බව අධ්‍යාපන

නියමුවන් වන ගුරුවරයාගේ උත්සහාය හා කැපවීම මත තිරණය වෙයි. ගුරුවරයා රටක සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේම ප්‍රධානියාය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණවල සාර්ථකත්වය රඳා පවතින්නේද ගුරුවරයාත් නිපුණතාට හා කුසලතාවය අනුවය.

ප්ලේටෝ අධ්‍යාපනය වශයෙන් හඳුන්වනු ලබන්නේ මුල් කාලයේ ළමයින් තුළ ඇති වෙන ස්වභාවික ලැදිකම් යහපත් ක්‍රියා සඳහා නිසි සේ පුරුදු කිරීමෙන් ලැබෙන පුහුණුව වශයෙනි. ඒ අනුව ගුරුවරයා පුද්ගල චරිතය හැඩගස්වන සුචරිතවත් නැතැත්තෙක් වශයෙන්ද හඳුන්වා සිටිය හැක.

ගුරුවරයෙකු පන්තිකාමරයෙන් බැහැරට දෙමාපියන්, ප්‍රජාව සමග සහ අනෙක් ගුරුවරුන් සමග මෙන්ම වෙනත් නිලධාරීන් විවිධ කණ්ඩායම් විවිධ අවස්ථා සමග බැඳුණු කාර්යයන් ගුරු භූමිකාවට අයත් වේ.




(අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම 1991:36)

ගුරුවරයෙකුගේ කාර්යභාරය කෙරෙහි ඉහත දැක්වෙන රූප සටහනට අනුව ද බලපාන ලබන පුද්ගල ආයතන හා කණ්ඩායම් රැසක් දැකගත හැක. විවිධ කාර්යභාරයන් අතුරින් මූලිකව ගුරුවරයාගේ භූමිකාවට මුල් වනු ලබන සාධක වන්නේ,

01. රජයේ අපේක්ෂාවන්
02. පරිපාලකයින්ගේ අපේක්ෂාවන්

03. සිසුන්ගේ අපේක්ෂාවන්
04. දෙමව්පියන්ගේ අපේක්ෂාවන්

ඒ අනුව ගුරු භූමිකාව පන්ති කාමරය තුළින් පන්ති කාමරයෙන් බැහැර පාසල තුළත් පාසලින් බැහැර සමස්ත සමාජයටත් බලපෑම් කරනු ලැබේ.

ගුරුවරයාගේ කාර්යය ඉගැන්වීමට පමණක් සීමා නොවෙයි. එය වෘත්තිමය තත්ත්වය ඉක්මවා ගිය පුළුල් පරාසයක විහිදුණු ක්‍රියාවලියකි. ශිෂ්‍යයින්ගේ මුළු ජීවිත කාලයටම බලපාන වගකීම් රැසක් ගුරුවරයා වෙත පැවරී ඇත. එබැවින් ගුරු භූමිකාවට ළමයාගේ සමස්ත ජීවිතය පුරාවටත් ඉන්පසු සමස්ත සමාජයටත් බලපෑමක් කිරීමට පමණක් වන අන්දමේ භූමිකාවක් වශයෙන් ගුරු භූමිකාව හැඳින්විය හැකි වේ.

Teacher, Pupil and task යන ග්‍රන්ථ ගුරුවරයා හා සිසුන් අතර ඇති අන්තර් සබඳතා විග්‍රහ කරන ඕ.වී.ඔයිසර් (Oiseri, 1970) දක්වන්නේ ගුරු භූමිකාව තුළ ප්‍රධාන චරිතාංග හතක් දැකගත හැකි බවයි.

- උපදේශකවරයෙක් හා විශේෂඥයෙක්
- සාධනය මනින්නෙක් හා තක්සේරුකරුවෙක්
- ආචාරධර්ම ප්‍රකාශනයෙන් හා සදාචාරය රකින්නෙක්
- ව්‍යවස්ථාදායකයෙක්
- විනිශ්චයකරුවෙක්
- ආරක්ෂක නිලධාරියෙක්
- මිත්‍රයෙක් හා මාර්ගෝපදේශකයෙක්

සමාජය තුළ ගුරුවරයා සතු භූමිකාව වැදගත් මෙන්ම වටිනා එකක් බව සාහිත්‍ය විමර්ශන තුළ දී වුවද පැහැදිලි වේ. ගුරුවරයාට ඔවුන් විසින්ම සමාජයට බලපෑම් ඇතිකළ හැකිය. අන් කිසිදු පෞරුෂයකට ගුරුවරයෙකු තරම් විචක්ෂණ බලපෑමක් ඇතිකළ නොහැක. ගුරුවරයාගේ ආදරය හා දයාව මෙන්ම ඔවුන්ගේ චරිතය, නිපුණතාව හා සදාචාරාත්මක කැපවීම නිසා ශිෂ්‍යයින් ඉතා දැඩි බලපෑමකට ලක්වේ. ජනප්‍රිය ගුරුවරයෙක් තම සිසුන්ට ආකෘතියක් බවට පත්වේ. ශිෂ්‍යයන්ද ගති පැවතුම්, ඇඳුම්, සදාචාරාත්මක, පැවැත්ම සංවාද රටාව හා සුදානම අනුකරණයට උත්සහ දරනු ලැබේ. ශිෂ්‍යයන්ගේ පරමාදර්ශය වන්නේ ගුරුවරුන්ය, ශිෂ්‍යයන් ගුරුවරුන් සමග කෙරෙන සංවාද හා සාකච්ඡා ඇසුරෙන් මූලික අධ්‍යාපන අදියර තුළ සිය ජීවිත අරමුණු හා අනාගතය පිළිබඳ සැලසුම් නිර්ණය කිරීමේ හැකියාවෙන් යුක්ත වේ. මෙමගින් ඉදිරි දැක්මක් ඇති ගුරුවරයෙකුට තම සිසුන්ගේ අනාගතය සකස් කිරීමේ ප්‍රමුඛ භූමිකාවක් දැරිය හැකිවේ. ගුරුවරෙයකු විසින් සිදුකරන කාර්යන් හා භූමිකාවන් සංකීර්ණ වේ. එය කාලයෙන් කාලයට සමාජයකින් තවත් සමාජයකට වෙනස් වේ. නමුත් එම කාර්යන් තුළ ගැබ් වී ඇති හා ඉටු කිරීමට නියමිත කටයුතු සරළව දැකිය නොහැක. එනම් විටෙක

| | |
|---|---|
| සංවිධායක | : කණ්ඩායම් ක්‍රියා සංවිධානය කරයි. |
| උපදේශක | : සිසුන්ගේ ගැටලු ඔවුනට විසඳා ගන්නට සහය වෙයි. |
| මිත්‍රශීලි විවේචන | : ශිෂ්‍ය ක්‍රියාකාරකම්, සුහද ලෙසත් සංවර්ධනාමුවෙන් විවේචනය කරයි. |
| නියාමක | : ක්‍රියාවලි පිළිබඳව පරීක්ෂණ වෙමින් එය ඉලක්ක වෙත තල්ලු කරයි. |
| සම්පත්දායක | : අවශ්‍ය තැන්හිදි සංකල්ප කර දෙයි. |
| අන්තර් ක්‍රියා කළමණාකරු | : හැම ශිෂ්‍යයෙකුම කණ්ඩායම් ක්‍රියාවලියට සහභාගි වීම සහතික කරයි. අධිකාරි සාමාජිකයෙක් ආධිපත්‍ය පාලනය කරයි. |

සමාලෝචක : ක්‍රියාවලිය හා ප්‍රතිඵල සමාලෝචන භාජනය කරයි.
සුසාධකාරණ : ක්‍රියාවලිය ඉදිරිපිට ගලා යාම පහසු කරයි.
(තිලකරත්නබණ්ඩා,2007:171)

Teacher in the changing society ග්‍රන්ථය තුළ ඩී.ලින්ච් (D.Linch) හා ඩී.ප්‍රින් (D.Point) ට අනුව ගුරු භූමිකාව අයත් කාර්යයන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ හඳුනාගත හැකිවේ. එනම්

- සහායක සහ ආධාරක සේවාවන්ගේ උපරිම ප්‍රයෝජන ගත්තෙක්
- සම්ප්‍රදායානුකූල විෂය සීමා කඩුලු බිඳ දමා කණ්ඩායම් ඉගැන්වීම් යෙදෙන්නෙක්
- හැකියාවන් සහ සංඛ්‍යාවන් විවිධ වන ළමුන් කණ්ඩායම් නම්‍ය කාලසටහන් අනුව හසුරුවන්නෙක්
- නවතම ඉගැන්වීම් ආධාරක භාවිතා කරන්නෙක්
- වෙනත් වෘත්තීන් හි යෙදී සිටින විශේෂඥයන් සමග සහයෝගයෙන් පාඨමාලාශ්‍රිත ක්‍රියාකාරකම් සම්පාදනය කරන්නෙක්
- සිසුන් සඳහා ක්ෂේත්‍ර අත්දැකීම් සහ ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කරන්නෙක්
- දෙමාපියන් සමග සුහද සම්බන්ධතා වර්ධනය කරන්නෙක් විය යුතුය.

**සාරාංශය**

සියලුම චරිතාංග සැලකිල්ලට ගැනීමේදී ප්‍රධාන භූමිකා දෙකක් ඔස්සේ ගුරු භූමිකාව විග්‍රහ කළ හැකි වේ.

- වෘත්තිය භූමිකාව (ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා බැඳුණු භූමිකාව)
- සමාජ භූමිකාව (සමාජයේ විවිධ තනතුරු-සම්බන්ධතා දැරීම තුළින් ගොඩ නැගෙන්නා වු භූමිකාව)

ගුරුවරයා සමාජ සත්ත්වයෙකි. ඔහුගේ වෘත්තිය භූමිකාව මෙන්ම සමාජ භූමිකාව ද වැදගත් වේ. ඔහු විවිධ සමාජ වගකීම් දරනු ලැබේ. විවිධ පුද්ගලයන් හා කණ්ඩායම් සමග පත්ති කාමර තුළ පාසල තුළ මෙන්ම පාසලෙන් බැහැර වෙනත් පුද්ගල කණ්ඩායම් සමග සබඳතා පවත්වනු ලබන බව අවබෝධ කර ගත හැකිවේ. ඒ අනුව ගුරු භූමිකාව අධ්‍යාපන ක්‍රියාවලියේදීත් අධ්‍යාපන සමාජ විද්‍යාව තුලදීත් සාකච්ඡා කෙරෙන මූලික සංකල්පයක් බව හඳුනාගත හැකි වේ. ගුරු භූමිකාව මඟින් ඉටුවන කාර්යන් හා වගකීම් මඟින් අධ්‍යාපන ක්‍රියාවලිය පෝෂණය කරනු ලබයි. අධ්‍යාපන සමාජ විද්‍යාව මඟින් ගුරු භූමිකාවේ ක්‍රියාවලිය එහි හැසිරීම් සමාජයක හෙට දවස තිරණය කිරීමට කෙතරම් වැදගත් වේද යන්න සාකච්ඡා කරනු ලබයි. එමඟින් ගුරු භූමිකාව සමාජයටත් අධ්‍යාපනයේ ප්‍රගමනයටත් සුවිශේෂි කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

**මූලාශ්‍රය**


- අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම (1991). මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය ඃ පශ්චාත් ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
- අබේදීර පී. (2008) විධි එක්වන සිවයසට ගැලෙපෙන අධ්‍යඃපන අරමුණු ඃ නව යුගය.
- කාරියවසම්, සී (2007). ගුරුවරයා වෘත්තිය තත්ත්වයට පත් කිරීම කොට්ටාවඃ කතෘ ප්‍රකාශන.
- ගලගම, එස්. (1999) ශ්‍රී ලංකාවේ රජයේ පංසල්වල සිසිනුන්ගේ පුලුල් පසුබිම් (උසස් පෙළ) අධ්‍යාපනික වර්ණය අතර සම්බන්ධය පිළිබඳව අධ්‍යයනයත් අප අවධාපනය දර්ශනපති නිබන්ධනය කොළඹ විශ්ව විද්‍යාලය.

- ගලගමගේ, එස්. (2008) අධ්‍යාපන සමාජ පදනම් : කර්තෘ ප්‍රකාශන.
- ගුණසේක, එස්ඳ (1996). ගුරු සේවය හා වෘත්තියභාවය සහ නොමිනි මෙහෙවර නුගේගොඩ : සුනෙර ප්‍රකාශන
- තිලකරත්න බණ්ඩා, ඩී.එම් (1996). ප්‍රයෝගික මනෝ විද්‍යාව හා නූතන ව්‍යවහාරය : අධ්‍යාපන කළමනාකරණයට අත්වැලක්. කොළඹ:ගොඩගේ ප්‍රකාශන.
- තිලකරත්න බණ්ඩා, ඩී.එම් (2007) අධ්‍යාපනික තාක්‍ෂණ විද්‍යාව. වැල්ලවාය මුද්‍රණාලය.
- Bank, S.O. (1971). The Sociology Education. London: B.T Bust Ford Ltd.
- Collins English Dictionary. (2003). Harper Collins Publications.
- Mannerheim, K. (1940). Man & Society: in and Age of Reconstruction. London: Routledge Kegan Paal.

# නිදහස් අධ්‍යාපනයේ තිඹිරිගෙය
# සී.ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මධ්‍ය විද්‍යාලය - මතුගම

**ඩී. සෂික අනුශාන් මුණසිංහ**

ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගරයන් කියූ සැණින් හදවතට නැගෙනුයේ ගෞරව සම්ප්‍රයුක්ත කෘතවේදීත්වයකි. ඒ වත්මන් ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනා නිදහස් අධ්‍යාපනයේ දූ පුතුන් වීම නිසාවෙන් ය. එවකට පැවති ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය මෙරටට ආනයනය කරන ලද්දක් බැවින් ප්‍රයෝගික ලෙසින් එහි බොහෝ අඩුපාඩු තිබුනේය. මෙම අධ්‍යාපන ක්‍රමය කිසිසේත් මෙරටට ප්‍රමාණවත් නොවූ බවට ඉංග්‍රීසි අධ්‍යාපනඥයින් විසින් ම කරුණු ඉදිරිපත් කර තිබීම එයට ප්‍රධානතම සාධකයකි. තම ජනතාවගේ සම්ප්‍රදායික සංස්කෘතිය දෙස අවඥාසහගත ලෙස බැලීමට ද කාර්යාල දොරවල් අසල එල්ලී සිටින්නන් ලෙස තරුණ අය පුහුණු කරන ක්‍රමයක් ලෙස ද වෝල්ටර් සැන්ඩල් මෙය හඳුන්වා තිබේ. මේ අතර ලංකාවේ දරුවාගේ අධ්‍යාපන අවශ්‍යතා අනුව පාඨමාලා සබඳකම් තිබිය යුතු බව බ්‍රිජ් පෙන්වා දුන්නේය. සර් අයිවර් ජෙනින්ග්ස් ගේ වචන වලින් කිවහොත් ඉංග්‍රීසි අධ්‍යාපනයේ ප්‍රතිඵලය වුයේ ආණ්ඩුවේ තනතුරු දරමින් හෝ පොල්,තේ වලින් ලාභ උපයමින්, යුරෝපිය ඇඳුම් ඇඳ, යුරෝපිය ආහාර බුදිමින්, පල්ලියේ පුජා පවත්වමින් මේ සියල්ලටම වඩා ඉංග්‍රීසි දොඩමින් බටහිර අනුකරණය කළ විශේෂ සමාජ පන්තියක් බිහිවීම ය.

මෙම ඉංග්‍රීසි පාසැල් බොහොමයක් පිහිටුවා තිබුනේ නගරවල හෙයින් ඒවායේ ඵල ප්‍රයෝජන නාගරික හා ගම්බද ධනවත් පවුල් වල දරුවනට සීමා විය, කෙසේ වුවද සිවිල් , වෛද්‍ය , අධිකරණ ආදී කුමන හෝ වෘත්තීයක යෙදීමෙන් සමාජීය හා ආර්ථික අභිවෘද්ධිය සලසා ගැනීමේ ඒකායන මාර්ගය වුයේ මෙම පාසලක අධ්‍යාපනය ලැබීම ය. මෙම තීරණාත්මක අවධියේදී එවකට ව්‍යවස්ථාදායක සභාවේ අධ්‍යාපනය පිලිබඳ කාරකසභාවේ සභාපතිවරයා ලෙස පත් වූ ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගරයන් මෙය හොඳින් අවබෝධ කර ගත්තේ ය. පස්යොදුන් කෝරලයේ ලුල්බද්දුව ගම්මානයේ හැදී වැඩුන ද ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය වැනි ඉහළ පෙළේ ඉංග්‍රීසි පාසලක අධ්‍යාපනය ලැබීමේ විරල භාග්‍ය උදා විය. තමා ලද අධ්‍යාපනයත් දුප්පත් දරුවාට හිමි වූ ගම්බද පාසල් ඉගෙනීමත් විශ්ලේෂනාත්මකව සැලකිල්ලට ගත් කන්නන්ගර මහතාගේ සිහිනය වුයේ යම් දිනක , තමා ලද අධ්‍යාපනය සෙසු ගම්බද දරුවන්ට ද නොඅඩුව ලබා දීම ය. මෙම අත්දැකීම් අනුව යමින් ඔහු මධ්‍ය විද්‍යාල සංකල්පය ක්‍රියාත්මක කිරීමට උත්සුක විය. මධ්‍ය විද්‍යාල සංකල්පය යනු සෑම ග්‍රාමීය ප්‍රදේශයකම ප්‍රධාන නගරය කේන්ද්‍ර කරගෙන ඇති කරන ලද පාසලක් මගින් ග්‍රාමීය ඉගෙනුම් මධ්‍යස්ථාන සම්බන්ධ කිරීම යි. ග්‍රාමීය පාසල්වල දක්ෂතා දක්වන සිසුන් ද්විතීයක අධ්‍යාපනය සඳහා මධ්‍ය විද්‍යාලයට යොමු කර අතර ඔවුන් දුර බැහැර සිට පැමිණේ නම් නේවාසිකාගාර පහසුකම් ද සැලසීම සිදු විය. එහිදී පාසල් සමූහයක මධ්‍යයේ එක් මධ්‍ය විද්‍යාලයක් තිබිය යුතු වූ අතර ඒ පාසල් සමූහය හැකි තාක් දුරට මධ්‍ය පාඨශාලාව පෝෂණය කළයුතු විය. එම පාසල් වල ප්‍රථමික අධ්‍යාපනයෙන් අනතුරුව මධ්‍ය විද්‍යාල වල විශ්වවිද්‍යාල ප්‍රවේශය දක්වා සිසුන් පුහුණු කිරීම ආරම්භ කරයි. ඒ අතර වඩු වැඩ, ලෝහ වැඩ, පේෂකර්මය, ලාක්ෂා කර්මාන්තය මෙන්ම නැටුම්, සංගීතය ආදී විෂයයන් ද හැදෑරීමට අවස්ථාව ලැබුණි. මෙලෙස ලැබුණු පරිචය තුළින් සිසුන් ඇතැම් විට විශ්ව විද්‍යාලයන්ට නොතේරුණ ද ලබාගත් වෘත්තීය පුහුණුවෙන් සමාජයේ රැකියාවක යෙදීමට අවස්ථාව හිමි කර ගත්හ. එනිසා ග්‍රාමීයව හැඩගැසුණු ළමුන් ද්විතීයක උසස් අධ්‍යාපනයට සුදුසුකම් නොලැබුව ද ග්‍රාමීය රැකියා අවස්ථා හිමිකර ගත්හ.

එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයක් සඳහා මධ්‍ය විද්‍යාලය බැගින් පිහිටුවා අධ්‍යාපනය නොමිලයේ ලබා දීමට වර්ෂ 1937 වන විට සැලසුම් කරනු ලැබි ය. මෙම ව්‍යාපෘතිය සඳහා වර්ෂ 1940 දී පාඨශාලා එකොළහක් තෝරා ගනු ලැබී ය. නමුත් එවකට මුදල් ලේකම්වරයා වූ එච්. ජේ. හක්සහම් මහතා රාජකීය විද්‍යාලය වැනි මුදල් උපයන පාසල් ආරම්භ නොකොට මෙවන් පාසල් ආරම්භ කිරීමෙන් රජයට අදායම් නොලැබෙන බව පවසමින් මෙම සංකල්පයට ප්‍රතිගාමී අදහස් ඉදිරිපත් කරන්නට වූ අතර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බොහොමයක් ප්‍රකට දේශීය දේශපාලඥයින් පවා මෙම අදහස අවඥාසහගතව බැහැර කරන ලදී. ඉන් නොසැලුණු කන්නන්ගර මහතා වර්ෂ 1941 දී ලංකාවේ ප්‍රථම මධ්‍ය විද්‍යාලය ලෙස මතුගම මධ්‍ය විද්‍යාලය පිහිටුවනු ලැබී

ය. (1944 හැන්සාඩ් වාර්තාව) එයට අමතරව වේයන්ගොඩ, මාවතගමුව අකුරම්බොඩ, වීරකැටිය, කාත්තන්කුඩි හා ඉබ්බාගමුව යන නගරවලද මධ්‍ය විද්‍යාල ආරම්භ කරන ලදී. නමුත් මතුගම මධ්‍ය විද්‍යාලය මෙන්ම අනෙක් විද්‍යාලය න්ද රජයේ නිල අනුමැතිය ලබා ගන්නා ලද්දේ 1945 වර්ෂයේදී ය. එයට අදාළ ලොග් සටහනක් 1945. 01. 02 දාතමින් පාසලේ ඇත.

වර්ෂ 1880 දී පමණ ස්වභාෂා ප්‍රාථමික පාසැලක් ලෙස ආරම්භ කරන ලද වත්මන් මධ්‍ය විද්‍යාලය දැනට මතුගම පෞද්ගලික බස් නැවතුම්පොළ පිහිටි භූමියේ පොල් අතු ශාලාවක ක්‍රියාත්මක වී ඇත. වර්ෂ 1885 දී මෙම විද්‍යාලය ගුරුගොඩැල්ල නම් භූමියට ගෙන යන අතරම නාගහයට පාසැල නමින් ප්‍රචලිතව ඇත. පසුව 1920 පමණ වනවිට වර්තමානයේ පවත්නා භූමියට ගෙන එනු ලබන අතරම 1920 පමණ වනවිට ද්විභාෂා විදුහලක් ලෙසට ක්‍රියාත්මක වන වත්මන් මැදි විදුහල ආරම්භයේ නේවාසිකාගාරයක් සමගම වූයේ ගොඩනැගිලි පහකි. වර්ෂ 1927 දී නාගහයට පාසැල බාලිකා පාසලක් ලෙසට පරිවර්තනය කොට ඇති අතර එහි සිටි ශිෂ්‍යයන් ද්විභාෂා පාසලට අනුයුක්ත කරනු ලැබී ය. වර්ෂ 1941 දී මධ්‍ය විද්‍යාලයක් බවට පත් වූ මෙහි ප්‍රථම විදුහල්පති වූයේ පසු කලෙක අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු වූ ජී.ඩී.කුලතුංග මහතා ය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිධාරියෙකු වූ මෙතුමා කොළඹ සිට මෙහි ගෙන්වා නිල නිවාස ආදී සියලු පහසුකම් ලබාදෙමින් විදුහල්පති දුරය ලබා දී ඇත. කන්නන්ගර මහතා මධ්‍ය විද්‍යාලයන්හි අධ්‍යාපනයේ ගුණාත්මක අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. මධ්‍ය විද්‍යාල භාරව කටයුතු කරනු සඳහා විශේෂ අධ්‍යාපන නිලධාරියෙකු පත් කළ අතර, ඔහුගේ සහයට දිස්ත්‍රික් පරීක්ෂකවරු වූහ. විෂය නිර්දේශ සම්පාදනය හා අඛණ්ඩ අධීක්ෂණයක් තුළින් මධ්‍ය විද්‍යාල පිළිබඳ සියලු කටයුතු වැඩි සැලකිල්ලෙන් ඉටු කිරීමට මෙම නිළධාරීහු වග බලා ගත්හ. 1944 දී මතුගම මධ්‍ය විද්‍යාලයෙහි විෂය මාලාවට ලාක්ෂා කර්මාන්තය, යතුරු ලියනය, පේෂ කර්මාන්තය, ලෝහ වැඩ, වඩු කර්මාන්තය හා සෞන්දර්ය වැනි විෂයන්ද ඇතුළත් කරන ලදී. 1978 වර්ෂයේදී කේ.යු.එස් පෙරේරා මහතා විදුහල්පති ධූරය යුගයේ එවකට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ක/පාසල් 1/736 හා 1978.11.16 ලිපිය අනුව දින මතුගම මධ්‍ය විද්‍යාලය සි.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මධ්‍ය විද්‍යාලය නමින් නිල වශයෙන් නම් කරන ලද්දේය.

ප්‍රථම වරට අධ්‍යාපන අංශයේ සෞන්දර්ය විෂයයන් වූ සංගීත හා නැටුම් විෂය ආරම්භ වූයේ මතුගම මධ්‍ය විද්‍යාලයේය. ඒ සඳහා ආනන්ද සමරකෝන් වැනි සංගීතඥයන්ගේ උපදෙස් අවස්ථානුකූලව ලබා ගැනීමට එවකට විදුහල්පතිවරු සමත් වූහ.ඔහුගෙන් අනතුරුව ප්‍රකට සංගීතවේදී නිමල් වෙල්ගම මහතා පත් කරනු ලැබූ අතර ඔහුගෙන් පසු එම ස්ථානයට දේවප්‍රිය අතුකෝරල මහතා පත් විය. මෙහි සංගීත හා නැටුම් වැනි විෂයයන් කෙරෙහි කෙතරම් දැඩි කැපවීමක් වී ද යත් නිමල් වෙල්ගම මහතා විදුහලෙහි නිෂ්පාදනය කළ විදුර ජාතකය වැනි මුද්‍රා නාට්‍ය දිවයින පුරා ප්‍රසිද්ධියට පත් විය. ආචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් පවා මෙහි පැමිණ වෙල්ගම හා පර්යේෂණ කටයුතු වල නිරත විය.

මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අනුස්මරණීය සේවාවක් ඉටුකළ පුරෝගාමී අධ්‍යාපනඥයින් මෙහි විදුහල්පතිවරු ලෙස කටයුතු කළහ. 1941 ප්‍රථම විදුහල්පතිවරයා වූයේ පසු කලෙක අධ්‍යාපන අධ්‍යක්ෂක ධූරයට පත් ජී.ඩී. කුලතුංග මහතා ය. ඉක්බිති විභාග කොමසාරිස් ධූරය දැරූ එච්.එල්. විමලසූරිය මහතා ය. තෙවැනි විදුහල්පතිවරයා වූ ඊ. ජයසූරිය මහතා පසු කලෙක කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ප්‍රථම මහාචාර්යවරයා විය. සිව්වැනි විදුහල්පතිවරයා වූ ඩී.ඒ. වෙදගේ මහතා අධ්‍යාපන අංශයේ අධිකාරී වරයෙකු විය. පී. ජයරත්න, කීර්ති දිසානායක, බී. සිල්වා, ඩබ්ලිව්. එස්. එන්. දයානන්ද, ඩී. පී. සමරජීව, ඩබ්ලිව්.ඒ.ඩී.එස් ගුණතිලක, කේ.යු.එස්. පෙරේරා, ඩී. සී. ඒ. ගම්මන්පිල, කේ. ඒ. පියසේන කොඩිතුවක්කු, අනුරුද්ධ සමරදිවාකර, කේ. ඩී. කරුණාරත්න, ආර්. ඩබ්ලිව්. ආනන්ද විරවංශ ද සිල්වා, සුනීතා පුහාඹුගොඩ, කේ. ඒ. සෝමපාල, වසන්තා කුලසේකර හා වත්මන් විදුහල්පති සුසන්ත වීරසිංහ වැනි විදුහල්පතිවරුන්ගෙන් ඉටු වූ සේවය ප්‍රශංසනාත්මක ය. කිර්ති දිසානායක මහතා පසු කලෙක කැලණිය සරසවියේ මහාචාර්යවරයකු වූ අතර ඩබ්ලිව්.ඒ.ඩී.එස් ගුණතිලක මහතා අධ්‍යාපන අධ්‍යක්ෂක වරයෙකු විය. සෙසු විදුහල්පති වරුද අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනුණු තැනැත්තෝ වූහ. නියෝජ්‍ය විදුහල්පතිවරුන් ලෙසද ආචාර්යවරුන් ලෙසද , කටයුතු කළ බොහෝ දෙනෙක් මෙරට විවිධ වගකීම් භාරයන් දරනු යේ මෙහි ලැබූ අත්දැකීම් අනුසාරයෙනි.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ධර්මාචාර්ය වරයෙකු ලෙස භික්ෂූන් වහන්සේ නමක් පත් කිරීමේ ප්‍රථම අවස්ථාව ද මතුගම මධ්‍ය විද්‍යාලයට සම්බන්ධ වේ. පූජ්‍ය අගලවත්තේ චන්ද්‍රජෝති හිමියන් මතුගම මැදි විදුහලෙහි බුදු දහම ඉගැන්වීම සඳහා පත්කරනු ලැබූහ. එම හිමියන්ගෙන් විදුහල් මෑණියන් ලද පිටුවහල අද්විතීය ය. ආගමික ගුණ දහම් පුහුණුවෙන් පමණක් නොව විෂය බාහිර බොහෝ කර්තව්‍යයන් සංවිධානයෙන් එහිමියන් පෑ දස්කම් අති මහත් ය. පසු කලෙක ස්වකීය ධන පරිත්‍යාගයෙන් විදුහල සඳහා බුද්ධ ප්‍රතිමා ගෘහයක් ඉදි කළෝ එතුමන් ය. ඕවිටිගල ඊටීන් විජේගුණවර්ධන මහතා මෙම විදුහලෙහි ආරම්භක ඉංග්‍රීසි ගුරුවරයෙක් වුවා පමණක් නොව විජේගුණවර්ධන පවුල සතු කුඹුරු සහිත වටිනා භූමි භාගයක් විදුහලෙහි දියුණුව සඳහා පවරා දෙන ලදී. අද විදුහල සතු මහා ක්‍රීඩාංගනය එම බිම් කොටස් ගොඩ කිරීමෙන් ඉදි වූවකි. කෘෂිකර්මය වැනි විෂයයන් ඉතා සාර්ථක ලෙස පවත්වා ගෙන යා හැකි වූයේ පරිසරය ඒ සඳහා බෙහෙවින්ම අනුකූල වූ හෙයිනි. ආරම්භක කෘෂිකර්ම ආචාර්යවරයා වූයේ ජී.ආර්.පෙරේරා මහතා ය. ඉංග්‍රීසි විෂය කෙරෙහි කොතරම් වැඩි අවධානයක් යොමුවිද යත් දිවයිනේ හොඳම ඉංග්‍රීසි ආචාර්ය වරුන් මෙහි පත් කර එවීමට අමාත්‍යවරයා සැලකිලිමත් විය. ආචාර්ය හඳපාන්ගොඩ වීරකෝන් හා යාපනයේ එස්. සුබ්‍රමනියම් යන මහත්වරු ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්යවරු වූහ. උපාධිධරයෙකු වූ සිව සුබ්‍රමනියම් මහතා පසු කලෙක යාපනය මධ්‍ය මහා විද්‍යාලයෙහි විදුහල්පතිවරයා ලෙස දීර්ඝ කාලයක් සේවය කළේ ය. උපාධිධාරීන් හත් දෙනෙකු යම් පාසලකට පත් කර එවීම කාලයේ හැටියට පුදුම එළවන්නක් විය. 1945 - 46 වර්ෂයේ දී විවිධ අංශයන්හි නිපුණ උපාධිධාරී ආචාර්යවරුන් හත් දෙනෙකු ලබා ගැනීමෙන් මතුගම මධ්‍ය විද්‍යාලය ඓතිහාසික ජයග්‍රහණයක් ලැබී ය. පස්වැන්නේ ශිෂ්‍යත්වලාභීහු දිවයිනේ නං දිසාවන්හි සිට මෙහි පැමිණ නේවාසිකව ද්විතීය හා උසස් අධ්‍යාපනය හදාරන්නට විය. විවිධ විද්‍යාවන් ප්‍රගුණ කිරීමේ අවස්ථා වඩාත් පුළුල් වූයේ වර්ෂ 1947 දී පමණ අංගසම්පූර්ණ රසායනාගාරයක් හා විද්‍යාගාරයක් ඉදිකිරීම හේතුවෙන් ය. එය කන්නන්ගර මැතිඳුන්ගේ සුරතින් ම විවෘත විය.

වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු විද්‍යා, වාණිජ විද්‍යා හා කලා විෂයන්හි දස්කම් දක්වා මෙරට සංවර්ධන ක්‍රියාදාමයෙහි දායකත්වය දරන්නා වූ ගම්බද දරු දැරියනගේ චරිත හැඩ ගැස්වීමේ උදාර මෙහෙයක් මෙම විද්‍යාලය විසින් ඉටු කරනු ලබා ඇත. ක්‍රිකට් , අත් පන්දු , බොක්සිං හා පිටියේ තරඟවලින් වාර්තා හා සමග ශිෂ්‍යභට කණ්ඩය, අගලවත්තේ චන්ද්‍රජෝති හිමියන් නිසා පෙළ ගැසුණු බෞද්ධ ශිෂ්‍ය සංවිධාන මෙන්ම කථිකත්වය වර්ධනය කළ ශිෂ්‍ය සමිති ද විද්‍යා හා කලා ශිෂ්‍ය සංගම් ද ගෘහ විද්‍යා, හස්ත කර්මාන්ත හා සෙනෙවිරත්න වැනි ආචාර්යවරුන් මෙහෙය වූ ලෝහ කර්මාන්ත හා මෝටර් විද්‍යා වැනි විෂයානුබද්ධ ප්‍රදර්ශන ද බන්දු ගුණසේකර වැනි සංගීතාචාර්යවරුන්ගෙන් ඔප් නැංවුණු සෞන්දර්ය ද එම්.එම්.පුන්චිහෙට්ටි වැනි ආචාර්යවරුන්ගේ මග පෙන්වීමෙන් ගොඩ නැගුනු විදුහල් පාර්ලිමේන්තුව ද කැපී පෙනුණු නවාංග විය. වර්ෂ 1952 දී පමණ හිලරි සිල්වා වැනි ප්‍රවීණ ආචාර්යවරුන්ගේ මග පෙන්වීමෙන් ගොඩනැගුනු බාලදක්ෂ සමූහය වර්තමානය වනවිට කළුතර දිසාවේ ප්‍රමුඛතම සමූහය බවට පත්වෙමින් ජනාධිපති බාලදක්ෂයින් හා බාලදක්ෂ බාලිකාවන් 75 දෙනෙකු පමණ ද ලි පදක්කම්ධාරී බාලදක්ෂ ආචාර්යවරුන් 7 දෙනෙකු ද බිහි කිරීමට සමත්ව සිටියි.

මතුගම මධ්‍ය විද්‍යාලයෙන් බිහි වූ ප්‍රථම වෛද්‍ය සිසුවිය චන්ද්‍රානි වනිගසූරිය මහත්මිය වන අතරම රන්ජිත් සමරගේ මහතා ප්‍රථම වෛද්‍යවරයා විය. දයාරත්න සමරසේකර වැනි ශිෂ්‍යයෙකු ගිරාගම හා අනෙකුත් ගුරු අභ්‍යාස විද්‍යාලයන්හි සංගීත ආචාර්යවරයෙකු ලෙස පත් කර යවන ලද්දේ මෙම විදුහලෙන් ලබා තිබූ අපූර්ව කුසලතා නිසා ය. ප්‍රථම වරට මෙම විදුහලෙන් පේරාදෙණිය සරසවියට තේරී පත් වූ ශිෂ්‍යයා වනුයේ එවකට රාජ්‍ය භාෂා කොමසාරිස් ධුරන්දර අධිනීතිඥ නිමල් සමරසුන්දර මහතා ය. ඒ 1960 දීය එදා පටන් අද දක්වා රචකයා ද ඇතුළුව සරසවිය වෙත යොමු වූ මෙම විදුහල් මෑණියන්ගේ දරුවෝ අපමණ ය. මාලනී බුලත්ගම මහත්මිය වාණිජ අංශයෙන් විශ්ව විද්‍යාලයට තේරී පත්වූ ප්‍රථමයා වන අතරම ගාමිණී රණවීර මහතා මධ්‍ය විද්‍යාලයෙන් බිහි වූ ප්‍රථම ඉංජිනේරුවා වේ. ලයනල් ගුණරත්න මහතා කෘෂි විද්‍යා අංශයෙන් තේරී පත් වූ ප්‍රථමයා විය. මහාචාර්ය රන්ජිත් කුමාරසිරි, මහාචාර්ය ලංකා උඩවත්ත, මහාචාර්ය වසන්ත මාපේආරච්චි, ආචාර්ය රංගජීව විජේසිංහ, කථිකාචාර්යවරුන් වන මාලනී රණසිංහ, චමිල ලියනගේ, නිශෝක් සඳරුවන්, ඉෂාන්කා උදානි ගම්මන්පිල, ශ්‍රී ලංකාවේ ප්‍රථම හදවත් බද්ධ කිරීමේ සැත්කමේ

නිර්වින්දන වෛද්‍ය ජගති පෙරේරා, වෛද්‍ය නලින්ද ජයතිස්ස ආදී දහස් ගණනක් වූ රාජ්‍ය පරිපාලන නිලධාරීන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නීතිවේදීන් හා ව්‍යාපාරිකයන් බන්දු එස් කන්නන්ගර වැනි වාද්‍ය ශිල්පින්, ශ්‍රී නිමල් පද්මකුමාර, ලක්ෂ්මන් පියසේන වැනි මාධ්‍යවේදීන් බිහි කිරීමට මෙම උදාර වූ පුණ්‍ය භූමිය සමත් විය. වර්තමානයේත් අනාගතයේත් තව දුරටත් දැයේ දරුවන්ට ශාස්ත්‍රාලෝකය ලබාදෙමින් ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මැතිඳුන්ගේ සිහිනය සැබෑ කරමින් මතුගම මධ්‍ය විද්‍යාලය චිරාත් කාලයක් යෙහෙන් වැජඹෙනු ඇත.

"ශ්‍රීයෙන දින දින වැජඹේ මතුගම - මැදි මහා විදුහල් මාතා පෙම්බර"



*රූපය 1: මධ්‍ය විද්‍යාලය ආරම්භයට පෙර ද්විභාෂා පාඨශාලාව එදිරිසිංහ විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය හා සිසු පිරිස - වර්ෂ 1932 (මූලාශ්‍රය - ආවර්ජනා, 2018)*



*රූපය 2: මතුගම මධ්‍ය විද්‍යාලය ආරම්භක අවස්ථාවේ පැවති උත්සවයක් - වර්ෂ 1941 (මූලාශ්‍රය - මතුගම සෙනෙවිරුවන මහතාගේ ඡායාරූප එකතුව)*



*රූපය 3: පූජ්‍ය අගලවත්තේ චන්ද්‍රජෝති නාහිමියන් හා විදුහල්පති කීර්ති දිසානායක මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය - වර්ෂ 1956 (මූලාශ්‍රය - ආවර්ජනා, 2018)*



*රූපය 4: ආචාර්ය සී.ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා ක්‍රීඩා පිටියේ ක්‍රිකට් තරඟයකට සහභාගී වූ අවස්ථාවක් - වර්ෂ 1947 (මුලාශ්‍රය - දේශාන මිරාජිත් නාකන්දල මහතාගේ ඡායාරූප එකතුව)*



OFFICE MEMO.

From
THE MINISTER OF EDUCATION.

Dn Abraham [illegible] of
[illegible] Vice-Chairman of
The Village Committee of [illegible]
Pattu hails from one of the
chief families of [illegible]
in the Kalutara District. He is
an intelligent and educated
person who is much influential
and respected in the area.
He is honest, trustworthy and
loyal and bears a good
character

[illegible]
6 May [illegible]

*රූපය 5: ආචාර්ය සී.ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමාගේ අත් අකුරු (මුලාශ්‍රය - ආවර්ජනා, 2018)*



*රූපය 6: ද්විභාෂා පාඨශාලාවේ හා මධ්‍ය විද්‍යාලයේ අද දක්වා පවතින් ප්‍රධාන ශාලාව (මුලාශ්‍රය - දේශාන් මිරාජිත නාකන්දල මහතාගේ ඡායාරූප එකතුව)*



රූපය 7: ද්විභාෂා පාඨශාලාවේ බාලදක්ෂ සමූහය දොන් සේතන් නිවුන්හැල්ල මහතා සමග - වර්ෂ 1937 (මූලාශ්‍රය - ආවර්ජනා, 2018)



රූපය 8: 1978 නොවැම්බර් 20 දින ලොග් සටහන (මූ,ාශ්‍රය  ආවර්ජනා, 2018)